ගොඩ නගමු ශ්‍රී ලංකාව

Let's Build Sri Lanka

# ජාතික ප්‍රතිපත්ති මාලාව

National Intellectuals Organization

ජාතික විද්වත් සංවිධානය தேசிய புத்திஜீவிகள் அமைப்பு

**© ජාතික විද්වත් සංවිධානය**

**ISBN 978-955-8696-56-9**

**පළමු මුද්‍රණය:**
2019 පෙබරවාරි

**මුද්‍රණය:**
ලීඩ්ස් ග්‍රැෆික්ස්
356/**E**,
පන්නිපිටිය පාර,
තලවතුගොඩ.

**සියලු විමසීම්:**
නො.33
ශ්‍රී සුභූතිපුර මාවත,
බත්තරමුල්ල.

**දුරකතන:** 0112885686, 0777 199524, 0714458399, 0718449424
**ෆැක්ස්:** 0112885686
**eMail**: info@niosrilanka.org
**Web**: www.nio.lk

# පෙළගැස්ම

**සබුද්ධික ශ්‍රී ලංකාවක් .................................................. 06**

අධ්‍යාපනය

තොරතුරු තාක්ෂණය

විද්‍යා තාක්ෂණ, පර්යේෂණ හා සංවර්ධන

**සංතෘප්තිමත් ශ්‍රී ලංකාවක් .......................................... 26**

සෞඛ්‍යය

කලාව හා සංස්කෘතිය

ක්‍රීඩාව

නිවාස

**පවිත්‍ර ශ්‍රී ලංකාවක් ......................................................... 44**

පරිසරය

**කාර්යක්ෂම ශ්‍රී ලංකාවක් ............................................. 53**

ප්‍රවාහනය

රාජ්‍ය පරිපාලනය

අධිකරණය

පොලිස් සේවාව

පුරවැසි වගකීම

**නොසැලෙන ශ්‍රී ලංකාවක් ............................................ 63**

ආර්ථිකය

වැවිලි කර්මාන්තය

කෘෂිකර්මය

පශු සම්පත්

ධීවර හා ජලජ සම්පත් කර්මාන්තය

බලශක්තිය

විදේශ ප්‍රතිපත්තිය

ජාතික ආරක්ෂාව

**ආචාරධාර්මික ශ්‍රී ලංකාවක් ......................................... 91**

නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව

ජාතික සමගිය

කාන්තා අයිතිවාසිකම්

ළමා හා තාරුණ්‍යය

වැඩිහිටි ජනගහනය

සිරකරු සුභසාධනය

ආබාධ සහිත පුද්ගලයන්ගේ සුභසාධනය

සමරිසි ප්‍රජාව

ශ්‍රමයේ ගෞරවය

ජනමාධ්‍ය නිදහස සහ ප්‍රජාතන්ත්‍රවාදය

**නීතිගරුක ශ්‍රී ලංකාවක් ............................................ 108**

අල්ලස් දූෂණ

මත්ද්‍රව්‍ය

අපරාධ

# පූර්විකාව

ජාතික විද්වත් සංවිධානය පසුගිය වසර දෙකකට ආසන්න කාලය පුරාවට සිකළ අධ්‍යයන ප්‍රයත්නයක ප්‍රතිඵලයක් වශයෙන් මෙම ජාතික ප්‍රතිපත්ති සමුදාය ඔබ අතට මෙලෙස පත් කරන්නේ අතිශය බලාපොරොත්තු සහගතවය. ශ්‍රී ලාංකේය රාජ්‍යය ගොඩනැංවීමේ අභියෝගය මේ තුළින් අපි අප වෙතම පවරාගනිමින් සිටිමු. පශ්චාත් නිදහස් ශ්‍රී ලංකාව පත්ව ඇති දැවැන්ත සමාජ, ආර්ථික, දේශපාලනික හා සමාජීය අර්බුදයෙන් මුදා ගැනීමට නම් සැබැවින්ම මෙරටට ආදරය කරන හා ඒ සඳහා ස්වාර්ථයෙන් තොරව කැපවිය හැකි පිරිසකගේ දායකත්වයක් හා නිවැරදි දැක්මක් පැවතිය යුතුය. එම මැදිහත්වීම සඳහා අවශ්‍ය වන බුද්ධිමය හා චින්තනමය දායකත්වය ලබා ගැනීමට අවශ්‍ය ප්‍රබල බලවේගයක් පසුගිය කාලය පුරාවටම ජාතික විද්වත් සංවිධානය වටා ඒකරාශි වූ අතර ඔවුන්ගේ අප්‍රතිහත මැදිහත්වීම මෙම ප්‍රතිපත්ති ලේඛනය සම්පාදනයේ මූලික ශක්තිය විණි.

පවත්නා නව ලිබරල් වෙළෙඳ ආර්ථිකය හා එහි අමානුෂීය සමාජීය හා මානව බලපෑම අභිභවනය කිරීම ඉලක්ක කොටගත් සමාජීය චින්තනයකින් මෙම ප්‍රතිපත්ති පෝෂණය වන බව අපගේ විශ්වාසයයි. එසේම මෙම ප්‍රතිපත්ති සැකසීමේදී මීට පූර්වයෙන් මෙරට ක්‍රියාත්මක වූ ප්‍රතිපත්ති රාමු සේම ජාත්‍යන්තරව පවතින ප්‍රතිපත්තිමය එළඹුම් හා ගෝලීය ප්‍රතිමාන දෙසද අපගේ අවධානය යොමු විය. එලෙස පවත්නා හා පැවති  ප්‍රතිපත්ති රාමුවල පවතින ධනාත්මක ලක්ෂණ උකහා ගනිමින් හා ඒවායේ නිශේධනීය හා ගතානුගතික තත්වයන් මඟහරවා ගනිමින් මෙම ප්‍රතිපත්ති රාමුව ඔබ වෙතට සමීප කිරීමට අපට අවශ්‍ය විය. එහිදී, අපගේ විශ්ලේෂණයට බඳුන් වූ අනෙක් පැතිකඩ වන්නේ ජනතාවගේ අදහස් හා යෝජනාවන්ය.

අනෙක් අතට මෙම ප්‍රතිපත්ති මාලාව තවදුරටත් පුළුල්ව සාකච්ඡා විය යුතු හා විචාරයට හා සංකථනයට බඳුන් විය යුතු බවටද අපි විශ්වාස කරමු. එතුළින් මෙම සාරය පිළිබඳ මහජන කතිකාව පුළුල් කිරීමට හැකිවනු ඇත. ජාතික විද්වත් සංවිධානය සතුව පුළුල් දේශපාලනික හා සමාජීය අරමුණක් පවතින අතර එය හුදු දේශපාලන බලය පිළිබඳ අපේක්ෂාවකට වඩා සමාජීය පරිවර්තනය පිළිබඳ වුවකි. අප විශ්වාස කරන්නේ, ලාංකේය රාජ්‍යය ගොඩනැඟීමේ භාරදූර වගකීම ඉටුකිරීමට තවදුරටත් තට්ටුමාරු දේශපාලනයට කිසිදු හැකියාවක් හෝ අවංක අපේක්ෂාවක් නොමැති බවය. එම සම්ප්‍රදායික බල කඳවුරු විසින් ගොඩනඟා ඇති ව්‍යසනකාරීත්වය හමුවේ නව දේශපාලන මාවතක් හා දියුණු බුද්ධිමය හා සංස්කෘතික නායකත්වයක් හා පුළුල් මහජන බලවේගයක් ගොඩනඟා ගැනීමේ අභියෝගය අප සියලු දෙනා හමුවේම පවතින අතර මෙම ජාතික ප්‍රතිපත්ති සමුදාය ඊට පදනමක් සපයනු ඇතැයි අපි අපේක්ෂා කරමු.

# සබුද්ධික ශ්‍රී ලංකාවක්

අපගේ සමස්ත දේශපාලන ප්‍රයත්නයේ ප්‍රධානතම අපේක්ෂාවක් වූ කලී සබුද්ධික ශ්‍රී ලංකාවක් ජනිත කර ගැනීමයි. ඥානය, විද්‍යාව, තාක්ෂණය, අධ්‍යාපනය, තොරතුරු තාක්ෂණය හා පර්යේෂණ ආදී ක්ෂේත්‍රවල දියුණු සහ සැලසුම් සහගත වැඩපිළිවෙළක් තුළින් ලාංකේය මානව සම්පත වගකීම් සහගත පුරවැසියෙක් ලෙස නිර්මාණය කර ගැනීමට හැකිවනු ඇති බව අපගේ විශ්වාසයයි. සමස්ත ප්‍රජාවම ලබන ප්‍රශස්ත අධ්‍යාපනය මගින් සබුද්ධික ශ්‍රී ලංකාවක් ගොඩනැගීම අපගේ අරමුණයි.

# අධ්‍යාපනය

## අර්බුදයේ ස්වභාවය

අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ අර්බුදයේ දිග, පළල, සාධක සහ එය විසඳිය හැක්කේ කෙසේද යන්න පිළිබඳ විවිධ මතවාදය පැවතියද, අධ්‍යාපන ක්ෂේත්‍රයේ බරපතළ අර්බුදයක් ඇති බවත්, එයට ඉක්මන් හා සාධනීය ප්‍රතිචාර දැක්වීම අත්‍යවශ්‍ය කාරණයක් බවත් සෑම දෙනෙක්ම පිළිගනිති. අධ්‍යාපනය මානව අයිතිවාසිකමකි. ශ්‍රී ලංකාවේ නිදහස් අධ්‍යාපනය පිළිබඳ අපි ආඩම්බරයෙන් කතා කරමු. එහෙත් දැනට පවතින ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ක්‍රියාවලිය තුළ අතරමැද පිටමං වන ප්‍රතිශතය ඉතා ඉහළ අගයකි. පාසල් යා යුතු වයසේ පසුවන ළමුන්ගෙන් ප්‍රාථමික අධ්‍යාපනය සඳහා ඇතුළු වන ප්‍රතිශතය 97% වුවද පස්වන වසර සඳහා ඇතුළත් වන්නේ 94%ක් පමණි. ඉන් 10 වසර දක්වා අධ්‍යාපනය ලබන්නේ 87%ක් පමණක් වන අතර අ.පො.ස.(සා./පෙ.) සමත්ව උසස් පෙළ අධ්‍යාපනය සඳහා පිවිසෙන්නේ 51%ක් පමණි. එයිනුත් විශ්වවිද්‍යාල සඳහා වරම් ලබා ගනුයේ 3%ක් පමණි. එහිදී විශ්වවිද්‍යාලවලට ඇතුලත්වීම සඳහා සුදුසුකම් ලබන අයගෙන් 17% පමණක් විශ්වවිද්‍යාලවලට ඇතුලත්වීමට වරම් ලැබීම කැපී පෙනේ. වයස අවුරුදු 20ට වඩා වැඩි ජනගහනයෙන් 26.3%ක් විධිමත් වෘත්තීය පුහුණුවක් ලබා නොමැත. පළමු වසරට ළමුන් ඇතුළත් කිරීමේදී දෙමාපියන් මුහුණ දෙන දුෂ්කරතා සහ එම ක්‍රියාවලියෙහි පවතින දූෂිත බව පිළිබඳ ඇති විවේචනය ඉතා බරපතළය. එහෙත් පවතින පාසල් 10,194න් 5161ක්ම (49%ක්) ළමුන් 200ට වඩා අඩු පාසල් වීම මගින් පෙනී යන්නේ පාසල් පද්ධතිය තුළ විෂමතාව සහ එම විෂමතාව පිළිබඳ සමාජය දක්වන සංවේදීතාවයි. එමෙන්ම "නිදහස්" අධ්‍යාපනය ඇතැයි කියන රටක අධ්‍යාපනය වෙනුවෙන් පෞද්ගලිකව දරන්නට සිදුවී ඇති වියදම විශාලය. උදාහරණයක් ලෙස ද්විතීයික අධ්‍යාපනයේ යෙදෙන දරුවකුට මාසිකව අවම වශයෙන් රු 13,000ක් පමණ පෞද්ගලික පංතිවලට සහ පොත්පත් සඳහා වැය කිරීමට සිදුවේ. මාසික ආදායම රු.11,000ට වඩා අඩු 42%ක් වන ජනගහනයට මෙය කිසිසේත් දරාගත නොහැක. ලබා ගත හැකි අධ්‍යාපනයේ ගුණාත්මක තත්වය පමණක් නොව අධ්‍යාපනයට ප්‍රවේශ වීමට ඇති අවස්ථාව  පවා කෙනෙකුගේ ආර්ථික මට්ටම මත රඳා පවතින බව රහසක් නොවේ. යෝජනා වන ඕනෑම ප්‍රතිපත්තියක් හා වැඩපිළිවෙළක් සකස් විය යුත්තේ දැනට පවතින අධ්‍යාපන අර්බුදයට පිළියමක් සෙවීම සහ නිදහස් අධ්‍යාපනයේ අරමුණු වන සමානාත්මතාව සම අයිතිය සහ සම අවස්ථා තහවුරු වන පරිදිය.

එය කිරීමට සිදු වන්නේ අධ්‍යාපනය විකෘති වී ඇති තත්වයක් තුළ බවත් එය කෙටි කාලීනව වෙනස් කළ නොහැකි බවත් අපි දනිමු. මෙම ප්‍රතිපත්ති රාමුව  සකස් කොට ඇත්තේ, කොතරම් දුෂ්කර වුවද එම දීර්ඝකාලීන හා තිරසර ඉලක්ක වෙත ළඟා වීමට අවශ්‍ය පදනම සකස් වන පරිදිය.

අධ්‍යාපනය වෙළඳ භාණ්ඩයක් කිරීම හෝ වෙළඳපොළ තර්කය තුළ ක්‍රියාත්මක වීම මගින් අධ්‍යාපනයේ සැබෑ අරමුණ ඉටු කර ගත නොහැකි යැයි අපි විශ්වාස කරමු. යෝජිත වැඩපිළිවෙළ තුළින් පෞද්ගලික ක්ෂේත්‍රය විශේෂයෙන් ලාභය සඳහා සකස්වුණු අධ්‍යාපන ආයතනවල අවශ්‍යතාවය ක්‍රමිකව අඩුවී යනු ඇතැයි  බලාපොරොත්තු වේ. එහෙත් එම වැඩපිළිවෙළ සම්පූර්ණ වීම සඳහා කිසියම් කාලයක් ගතවනු ඇති බවත් එම නිසා එම කාල සීමාව අන්තර්කාලීන (Transitional phase) ලෙස හඳුනා ගැනීමට සිදු වනු ඇත. මෙම අන්තර්කාලීන අවස්ථා තුළ පෞද්ගලික අධ්‍යාපන ආයතන නියාමනය කිරීම සඳහා තාවකාලික ආයතනික ව්‍යුහයන් ඇති කිරීමට සිදු වනු ඇත.

# ප්‍රතිපත්ති යෝජනාවලිය සඳහා පදනම් වූ මූලධර්ම

## නිදහස් අධ්‍යාපනය

අධ්‍යාපනය විශ්ව සාධාරණ මානව හිමිකමකි. භේදයකින් තොරව සෑම පුද්ගලයකුටම අධ්‍යාපනයට නිදහසේ ප්‍රවේශවීම සඳහා සාධාරණ අවස්ථාව සැලසිය යුතුය. සියලු ජාතිකත්වයන් සහ විශේෂ අවශ්‍යතා ඇති පුද්ගලයන් මෙන්ම නොසලකා හැර ඇති සමාජ කොටස් පිළිබඳ විශේෂ අවධානයකින් කටයුතු කළ යුතුය. පෙරපාසල් අධ්‍යාපනයේ සිට තෘතීයික අධ්‍යාපනය දක්වා අවශ්‍ය අරමුදල් රාජ්‍යය විසින් ආයෝජනය කරනු ලැබිය යුතු අතර නිදහස් අධ්‍යාපන ක්‍රියාවලිය පවත්වාගෙන යාම සහ එය නියාමනය කිරීම සඳහා අවශ්‍ය මානව සහ භෞතික සම්පත් ඇතුළු යටිතල පහසුකම් සහතික කිරීම රජයේ වගකීම වේ.

## සාධාරණතාව (Equity)

සීමා කිරීමකින් තොරව සමාජයේ සියලු කණ්ඩායම්වලට සිය සුදුසුකම් හා කුසලතා අනුව අධ්‍යාපනය සඳහා එක හා සමානව ප්‍රවේශවීම සඳහා අවස්ථාව තිබිය යුතුය. සමාජයේ ආන්තික කොටස් අධ්‍යාපන ක්‍රියාවලිය තුළට අනුගත කිරීම සඳහා විශේෂ වැඩපිළිවෙළක් තිබිය යුතුය.

## අදාළතාව (Relevance)

වගකීම් සහගත පුරවැසියකු ලෙස සමාජ ප්‍රතිමානයන් පිළිගනිමින් සහ ඒවාට ගරු කරමින් කටයුතු කිරීමටත් අවශ්‍ය දැනුම, කුසලතා, ආකල්ප, පරිචයන් සහ අගය කිරීම් අධ්‍යාපනය විසින් ලබා දිය යුතුය. එය හුදෙක් රැකියා වෙළඳපොළ සහ කර්මාන්ත අවශ්‍යතාව මත පමණක් පදනම් නොවිය යුතු වුවද සමාජ අවශ්‍යතාව සහ ඵලදායිතාව ඉහළ නැංවීමට සමත් සේවා නියුක්තියක් ලබා ගැනීම සඳහා අධ්‍යාපනය දායක විය යුතුය.

## පිළිගත හැකි බව (Acceptability)

අධ්‍යාපනයේ අන්තර්ගතය සියලු ජාතිකත්වයන් ඇතුළු සංස්කෘතීන් සියල්ලට පිළිගත හැකි, කිසිදු සමාජ කණ්ඩායමකට වෙනස් ලෙස නොසලකන, සියලු කණ්ඩායම්වලට ආරක්ෂාව සපයන ගුණාත්මක් වූවක් විය යුතුය.

## වගකීම (Responsibility)

අධ්‍යාපනය යනු පවත්නා දැනුම ලබා ගැනීමත් එම දැනුම සන්නිවේදනය කිරීමත් එමෙන්ම නව දැනුම නිෂ්පාදනයත් අන්තර්ගත වූ ක්‍රියාවලියකි. එම නිසා පුද්ගලයකු අධ්‍යාපනය තුළින් ලබා ගන්නා සියලු සංවර්ධනයන් පවතින සියලු සංස්කෘතීන්ට ඉමහත් දායකත්වයක් දක්වයි. එමෙන්ම සමාජය විසින් සිය පුරවැසියන්ට අධ්‍යාපනය වෙනුවෙන් ඉතා ඉහළ පිරිවැයක් දරයි. ඒ අනුව අධ්‍යාපනය විසින් සමාජයට වගවන පුරවැසියන් බිහි කළ යුතුය.

## ධරණීයභාවය (Sustainability)

සමාජීය, ආර්ථික සහ පාරිසරික ක්ෂේත්‍රයන්හි කල්පැවැත්ම සහ ගුණාත්මකභාවය වර්ධනය කිරීම අධ්‍යාපනයේ මූලික අරමුණුවලින් එකක් විය යුතුය. ගෝලීය හා දේශීය අවශ්‍යතා අනුව සම්පත් පරිභෝජනය කරන අතරම අනාගතය සඳහා ඒවා ආරක්ෂා වන පරිදි කටයුතු කිරීමට සහ නවෝත්පාදන ක්‍රියාමාර්ග ප්‍රවර්ධනය කිරීමට අධ්‍යාපනය සමත් විය යුතුය.

## යාවජීව අධ්‍යාපනය (Lifelong Learning)

අධ්‍යාපනය නිශ්චිත වයස් කාණ්ඩයකට සීමා වන්නක් නොවේ. එමෙන්ම එය එකවර සම්පූර්ණ කළ හැකි ක්‍රියාවලියක්ද නොවේ. එම නිසා ලබා ඇති ඉහළම අධ්‍යාපන සුදුසුකම කුමක් වුවත් නියැලෙන වෘත්තිය කුමක් වුවත් ජීවිත කාලය තුළම අධ්‍යාපනය ලබා ගත හැකිවන පරිදි එම ක්‍රියාවලිය සකස් වී තිබිය යුතුය.

## අනුවර්තයතාව (Adaptability)

අධ්‍යාපන අඩංගුව කාලීන හා සමාජ අවශ්‍යතාවන්ට ගැලපෙන පරිදි යාවත්කාලීන විය යුතු අතර ගෝලීය හා දේශීය අවශ්‍යතාවන්ට උපයෝගී වන පරිදි වෙනස් කරලීමේ හැකියාව පැවතිය යුතුය.

## සාකල්‍ය අධ්‍යාපනය (Holistic Education)

ඉගෙනුම් පරිසරය තුළ මූලික මානව සාරධර්ම සහ සබඳතා මෙන්ම අනුභූතික ඉගෙනීම් ප්‍රවර්ධනය කිරීම මගින් පුද්ගලයා තුළ ජීවිතය පිළිබඳ ගැඹුරු අර්ථයක්, ප්‍රජාව සහ ලෝකය පිළිබඳ පුළුල් දැක්මක් ඇති කිරීම මගින් ඉගෙනුම පිළිබඳ ලාලසාවක් ජනනය කළ යුතුය.

ඉහත දැක්වෙන අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා අධ්‍යාපන ක්‍රියාවලිය පහත දැක්වෙන ව්‍යුහයන්ගෙන් සමන්විත විය යුතුය.

### දැනුම (Knowledge)

නව දැනුම නිෂ්පාදනය ඉලක්ක කරගත් පර්යේෂණ දිරිගැන්වීම, නවෝත්පාදනය, අධීක්ෂණය සහ ඇගයීම, දැනුම බෙදා හැරීම සහ අත්පත් කර ගැනීම, තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය යොදා ගැනීම මගින් නව දැනුම අත්පත් කර ගැනීම සහ බෙදා හැරීම

### උපදේශනය (Advocacy)

නායකත්වය සහ ආචාරධාර්මික බව, සාකල්‍යතාව, සමාජ සංචලනය සහ ප්‍රජා සහභාගිත්වය (social mobilization & community engagement) බහුවිධ සමාජ කොටස් සහභාගිත්වය වර්ධනය කිරීම සහ ඵලදායී සන්නිවේදනය

### ශක්‍යතාව (Capacity)

අධ්‍යාපන වෘත්තීය සංවර්ධනය, විෂයමාලා සහ ශික්ෂණ විද්‍යාව (curriculum pedagogy) නිරන්තරයෙන් යාවත්කාලීන කිරීම, යටිතල පහසුකම් පවත්වාගෙන යාම සහ වර්ධනය කිරීම, ප්‍රමිතීන් සහ තත්ව නියාමනය (standards & accreditation), කාර්ය මණ්ඩල කළමනාකාරිත්වය

### පරිපාලනය (Governance)

දේශපාලන අභිප්‍රාය, නීති සම්පාදනය, ප්‍රතිපත්ති සහ නියාමනය, මූලෝපායික සැලසුම් සකස් කිරීම, මූල්‍ය සම්පාදනය,සංවිධාන ව්‍යුහය, තත්වාරක්ෂණ සහ පිළිගැනීම, වගවීම

# ක්‍රියාමාර්ග

## 01. පූර්ව ළමාවිය සංවර්ධන අධ්‍යාපනය

පූර්ව ළමාවිය සංවර්ධනය යනු හුදෙක් සම්මත රාමුවකට යටත් වූ අධ්‍යාපනයක්ම නොව දරුවාට පවුල් පරිසරයේ සිට සමාජ ජීවිතයට පිවිසීමට අවශ්‍ය වන මූලික පහසුකම් සපයන ක්‍රියාවලියකි. ඒ අවස්ථාව ලබා දීම හා ඒ අවධිය තුළ සමාජයීය වස්තුවක් ලෙස දරුවා ආරක්ෂා කොට ඇතිදැඩි කිරීම සමාජ වගකීමකි.

- අවුරුදු 03 සිට 05 දක්වා වන වයසේ සිටින සියලු දරුවන් සඳහාම විධිමත් මුල් ළමාවිය සංවර්ධන අධ්‍යාපනයක් නොමිලේ ලබාදීම රජයේ වගකීමක් බව පිළිගැනීම
- සෑම දරුවකුටම සිය නිවසේ සිට හෝ දෙමාපියන්ගේ සේවා ස්ථානයේ සිට කි.මී. 02ක් ඇතුළත වන පෙර පාසලක අධ්‍යපනය ලැබීමට හැකි වන පරිදි පිළිගත් ප්‍රමිතීන්ට අනුව සැකසුණු මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන පද්ධතියක් ඇති කිරීම
- අවිධිමත් විෂයමාලා හා ක්‍රියාකාරකම් වෙනුවට දරුවන්ගේ කායික හා මානසික තත්වයන්ට ගෝචර වන පරිදි හා සමාජ ජීවිතයට පිවිසීමට අවශ්‍ය වන යහපත් පුරුදු, ආකල්ප හා ආචාරධර්ම වර්ධනය කරන ක්‍රියාකාරකම් ඇතුළත් වන වැඩසටහනක් හඳුන්වා දීම

මෙහිදී ආත්ම විශ්වාසයකින් යුතුව එදිනෙදා ජීවිතයට සහ අවට පරිසරට අනුගතව වැඩකිරීමට ඇති හැකියාවන් වර්ධනය කිරීම කෙරෙහිද සැලකිල්ලට ගත යුතුය

- මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන, ජාතික මුල් ළමාවිය සංවර්ධන අධිකාරියක් මගින් නියාමනය කිරීම
- මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන පාලිකාවන් සහ ගුරුවර ගුරුවරියන් සඳහා අවම අධ්‍යාපන සුදුසුකම් සහ අනිවාර්ය වෘත්තීය පුහුණුව හඳුන්වා දීමට කටයුතු කිරීම සහ එම සේවය වෘත්තීය මට්ටමින් පිළිගැනීමක් ලැබෙන අයුරින් අවම වැටුපක් නිර්ණය කිරීම
- මුල් ළමාවිය සංවර්ධන වෘත්තිකයන් පුහුණු කිරීම සඳහා විධිමත් ජාතික ආයතනයක් සහ ඊට අනුබද්ධ ශාඛා පද්ධතියක් දිවයින පුරා ඇතිකිරීම මගින් ඔවුන්ගේ වෘත්තීය පිළිගැනීම සහතික කිරීම
- මව් භාෂාවට අමතරව කථන සන්නිවේදන භාෂා ලෙස අනෙක් ජාතික භාෂා සහ ඉංග්‍රීසි භාෂාව පිළිබඳ අත්දැකීම දරුවන්ට ලබා දීම සඳහා අවශ්‍ය වැඩසටහන් සෑම මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානයකම ක්‍රියාත්මක කිරීම
- බහු ආගමික බහුවාර්ගික හා බහුසංස්කෘතික විවිධත්වයට අනුගතව එම විවිධත්වය ගරු කරමින් කටයුතු කිරීමට දරුවා හුරු කරවන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම අනිවාර්ය කිරීම
- දරුවන්ගේ සෞඛ්‍යය හා පෝෂණ තත්වය වර්ධනය කිරීම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම හා ඒවා නියාමනය කිරීම
- දැනට පවතින පෙර පාසල් සියල්ල සඳහා අවශ්‍ය පහසුකම් සපුරා දී ඉහත සඳහන් මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන පද්ධතිය වෙත අනුයක්ත කිරීමට කටයුතු කරනු ඇත. එමෙන්ම ඒවායේ සේවයේ යෙදී සිටින මූලික සුදුසුකම් සහිත අය සඳහා පෙරපාසල් පිළිබඳව වෘත්තීය පුහුණුව ලබා දී ජාතික පෙර පාසල් වෘත්තීය සේවය වෙත අනුයුක්ත කෙරේ

## 02. ප්‍රාථමික හා ද්විතීයික අධ්‍යාපනය

### පාසල් වර්ගීකරණය

සෑම දරුවෙකුමට වසර 13ක ශාස්ත්‍රීය හෝ වෘත්තීය පාසල් අධ්‍යාපනයක් අනිවාර්ය වන පරිදි පාසල් පද්ධතිය ප්‍රතිව්‍යුහ ගත කළ යුතුය. එමෙන්ම පාසල් ආගමික, වාර්ගික හෝ ස්ත්‍රී පුරුෂභාවය පදනම්ව වෙන් නොකිරීම සහතික විය යුතුය. සියලු දරුවන්ට පහසුකම් සහිත පාසලකට තරගකාරිත්වයකින් තොරව ඇතුළත් වීමට හැකිවන පරිදි ප්‍රාථමික පාසල් පද්ධතියක් සහ ප්‍රාථමික පාසල් 02 හෝ 03ක් ආවරණය වන පරිදි කනිෂ්ඨ ද්විතීයික පාසල් පද්ධතිය හා ජ්‍යෙෂ්ඨ ද්විතීයික පාසල් පද්ධතිය සකස් කෙරේ. ජ්‍යෙෂ්ඨ ද්විතීයික පාසල් පද්ධතිය තුළ ශාස්ත්‍රීය මෙන්ම වෘත්තීය අධ්‍යාපන ක්‍රියාත්මක කෙරේ. එමෙන්ම අවශ්‍ය වන පරිදි ශාස්ත්‍රීය හෝ වෘත්තීය අධ්‍යාපනයේ එක් එක් ක්ෂේත්‍ර වෙනුවෙන් විශේෂීකරණය වූ පාසල් පැවතිය හැකිය.

සියලු පාසල් කාණ්ඩ පහත පරිදි වර්ගීකරණය කෙරේ.

- ⋆ පළමු වසර සිට 5 වසර දක්වා ප්‍රාථමික පාසල්
- ⋆ 6 වසර සිට 9 වසර දක්වා වන කනිෂ්ඨ ද්විතීයික පාසල්
- ⋆ 10 වසර සිට 13 වසර දක්වා ජ්‍යෙෂ්ඨ ද්විතීයික පාසල්

### පළමු වසර සිට පහ වසර දක්වා වන ප්‍රාථමික පාසල් අධ්‍යාපනය

- ▪ සෑම දරුවකුටම සිය නිවසේ සිට හෝ දෙමාපියන්ගේ සේවා ස්ථානයේ සිට කි.මී. 04ක් ඇතුළත වන පාසලක අධ්‍යාපනය ලැබීමට හැකි වන පරිදි පිළිගත් ප්‍රමිතීන්ට අනුව සැකසුණු රජයේ පාසල් ව්‍යුහයක් ඇති කිරීම. ප්‍රදේශයේ ජන ඝනත්වය සහ භූගෝලීය පිහිටීම සැලකිල්ලට ගනිමින් මෙම පාසල් ව්‍යුහය සකස් කළ යුතුය. අවශ්‍යතාවන්ට හා පිළිගත් ප්‍රමිතීන්ට අනුකූලව පාසල් ප්‍රවාහන පද්ධතියක් ස්ථාපිත කොට පවත්වාගෙන යාමට ඒ ඒ පළාත් පාලන ආයතන විසින් කටයුතු කිරීම
- ▪ සෑම පාසලකම තිබිය යුතු අවම පහසුකම් හඳුනා ගැනීමට කටයුතු කිරීම සහ එම අවම පහසුකම් පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය භෞතික සහ මානව සම්පත් සැපයීම රජයේ වගකීමක් ලෙස හඳුනා ගැනීම
- ▪ පංති කාමරයක් තුළ සිටිය යුතු උපරිම ශිෂ්‍ය සංඛ්‍යාව සහ තිබිය යුතු අවම පහසුකම් නිර්ණය කිරීම
- ▪ ළමාවියට බාධාවක් නොවන පරිදි ඒ ඒ වයස් කාණ්ඩයන්ට ගැලපෙන ලෙස හා අනවශ්‍ය බරක් නොපැටවෙන පරිදි විෂයමාලාව සකස් කිරීම

### කනිෂ්ඨ ද්විතීයික අධ්‍යාපනය

06 වසර සිට 09 වසර දක්වා වන වසර හතර කනිෂ්ඨ ද්විතීයික අධ්‍යාපන අවධිය ලෙස හඳුනා ගැනේ. යහපත් පුරවැසියෙක් නිර්මාණය කිරීමට අවශ්‍ය සාක්ෂරතා, විද්‍යා හා ගණිත, සමාජ, තාක්ෂණික හා සෞන්දර්ය මෙන්ම භාෂා දැනුම ඇතුළු පොදු අධ්‍යාපනයක්, ලබාදීම මෙන්ම ජ්‍යෙෂ්ඨ ද්විතීයික අධ්‍යාපනය අවශ්‍ය පසුබිම සකස්වන අධ්‍යාපනයක් ලබා දීම කනිෂ්ඨ ද්විතීයික අධ්‍යාපනයේ අරමුණයි. එම අරමුණ සඳහා සුදුසු සමෝධානික විෂය මාලාවක් සකස් කොට ක්‍රියාත්මක කළ යුතුය.

- ප්‍රාථමික පාසල් දෙකක් හෝ තුනක් ආවරණය වන පරිදි මෙම කනිෂ්ඨ ද්විතීයික පාසල් පද්ධතිය ස්ථාපනය කෙරේ.
- සිසුන්ගේ වයස කාණ්ඩ සහ ඊට අදාළ බුද්ධිමය තත්වයන් වර්ධනය වන පරිදි විෂයමාලා නැවත සකස් කෙරේ.
- දරුවන්ගේ හැකියාවන් සහ විශේෂ කුසලතාව අනුව උසස් අධ්‍යාපනය හෝ වෘත්තීය අධ්‍යාපනය තෝරා ගත හැකි වන පරිදි 06 වසර සිට 09 වසර දක්වා ඉගැන්විය යුතු ප්‍රධාන විෂයයන් හඳුනා ගැනේ.
- ළමුන්ගේ සමාජ සාරධර්ම සහ පුරවැසි වගකීම් සංවර්ධනය කිරීම සහතික කරන අමතර විෂයයන් හා ක්‍රියාකාරකම් හඳුන්වාදීම අනිවාර්ය කෙරේ.
- සෑම දරුවෙකුටම සිය ආගම පිළිබඳව මෙන්ම ශ්‍රී ලංකාවේ ප්‍රධාන ආගම් පිළිබඳව තුලනාත්මක අධ්‍යාපනයක් ලැබෙන ආකාරයට ආගම විෂය හඳුන්වා දෙනු ලැබේ.
- ඒ ඒ වයස් කාණ්ඩයන්ට ගැලපෙන පරිදි ලිංගික හා ප්‍රජනන සෞඛ්‍යය පිළිබඳ අධ්‍යාපනය ලබා දීමට කටයුතු කෙරේ.
- පරිසර හිතකාමිත්වය හා සොබාදහමේ පැවත්ම පිළිගන්නා ආකල්ප සංවර්ධනය වන වැඩසටහන් අනිවාර්ය කෙරේ.

## ඇගයීම් ක්‍රියාවලිය

### පාසල් මට්ටමේ විභාග

- පළමු වසර සිට පහ වසර දක්වා පීඩාකාරී විභාග මගින් ළමුන් ඇගයීම් වෙනුවට එක් එක් ළමයාගේ කුසලතා මට්ටම් වෙන වෙනම හඳුනාගැනීමට (Feedback) සහ ඒ අනුව විශේෂ පියවර ගැනීමට කටයුතු කෙරේ.
- 06 වසර සිට 09 වසර දක්වා පවත්වනු ලබන විභාග මත ළමුන් වර්ගීකරණය (rank) කිරීමට කටයුතු නොකෙරේ. ළමුන්ගේ පුද්ගලික කුසලතා ප්‍රශස්ත මට්ටමේ සන්තතිකව පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය ඇගයීම් ක්‍රම ක්‍රියාත්මක කෙරේ.
- එක් එක් වර්ෂය අවසානයේදී ප්‍රජානන හැකියා අනුව විශේෂ අවධානයට ලක්විය යුතු ළමුන් හඳුනාගෙන ඔවුන් වෙනුවෙන් සුදුසු වැඩසටහන් ක්‍රියාත්මක කෙරේ.

### ජාතික මට්ටමේ විභාග

- පීඩාකාරී පහ වසර ශිෂ්‍යත්ව ක්‍රමය අහෝසි කිරීමට කටයුතු කිරීම
- සියලු තාක්ෂණික සහ අනෙකුත් භෞතික පහසුකම් සහිත ජාතික විභාග අගැයීම් මධ්‍යස්ථානයක් ඇති කිරීම
- අ.පො.ස. (සා./පෙ.) සහ අ.පො.ස. (උ./පෙ.) ඇගයීම් කටයුතු මසක් ඇතුළත අවසන් කිරීමට හා ප්‍රතිඵල ලබා දිය හැකි වන පරිදි වාර්ෂික පාසල් අධ්‍යාපන දින දර්ශනය සකස් කිරීම

- ඒ ඒ විෂය පාසල්වල උගන්වන ගුරුවර ගුරුවරියන්ට ඇගයීම් ක්‍රියාවලිය පිළිබඳ පුහුණුවක් ලබා දී ඔවුන් ඇගයීම් ක්‍රියාවලියට සම්බන්ධ වීම අනිවාර්ය කිරීම
- උපරිම කාර්යක්ෂමතාවෙන් හා නිරවද්‍යතාවෙන් යුතුව ඇගයීම් ක්‍රියාවලියෙහි යෙදෙන පරීක්ෂකවරුන් පිළිබඳ වාර්ෂික වාර්තා විධිමත් කිරීම හා ඔවුන් ශ්‍රේණිගත කොට දිරි දීමනා ලබා දීම

### ශාරීරික සෞඛ්‍යය

- ළමුන්ගේ ශාරීරික හා මානසික සමබරතාවයන් පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය වැඩසටහන් පවත්වාගෙන යාමට පියවර ගැනේ.
- ළමුන්ගේ මානසික හා ශාරීරික සෞඛ්‍යය සමබරව පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය ක්‍රීඩා සහ අනෙකුත් වැඩසටහන් අනිවාර්ය කරනු ඇත. ඒ සඳහා අවශ්‍ය ක්‍රීඩා පිටි, නානකාමර ආදී යටිතල පහසුකම් සෑම පාසලකම ඇති කරන අතර ඊට ගැලපෙන පරිදි පාසල් කාලසටහන සකස් කළ යුතුය.
- ද්විතීක පාසල්වල සමාජ යහපැවැත්ම වර්ධනය කිරීම සහ ඊට අදාළ ගැටලු පිළිබඳ කටයුතු කිරීම සඳහා වෘත්තීය නිපුණතාව සහිත මානව සම්පත් සහ තාක්ෂණික භාවිතය සහිත ඒකක පිහිටුවීම මත්ද්‍රව්‍ය භාවිතය සහ ස්වයං හිංසනය ආදී ගැටලු වැළැක්වීම පිළිබඳව විශේෂයෙන් කටයුතු කිරීම
- විශේෂයෙන් අධ්‍යාපනික ආයතන අවට මත්ද්‍රව්‍ය අලෙවි කිරීම බෙදා හැරීම වැළැක්වීම සඳහා ඒකාබද්ධ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම

## ජ්‍යෙෂ්ඨ ද්විතීයික අධ්‍යාපනය

සමාජ පුරවැසියකු ලෙස කටයුතු කිරීමට අවශ්‍ය මූලික දැනුම සහ ආභාෂය ලබා ගැනීම ජ්‍යෙෂ්ඨ ද්විතීයික අධ්‍යාපනයේ අරමුණ වේ. එමෙන්ම තෘතීයික අධ්‍යාපනයට පදනම් වන ශාස්ත්‍රීය හෝ වෘත්තීය දැනුම සහ භාවිතාවන් පිළිබඳ අවධානය යොමු කරමින් විෂයධාරා සහ විෂයමාලා සකස් විය යුතුය. එම නිසා ද්විතීයික අධ්‍යාපනයෙන් පසු ශාස්ත්‍රීය හෝ වෘත්තීය උසස් අධ්‍යාපනයට යොමු වන සිසුන්ට අවශ්‍ය කෙරෙන මූලික දැනුම මෙන්ම සෘජුව වෘත්තීන් වෙත යොමු වන සිසුන්ට අවශ්‍ය මූලික අධ්‍යාපනික පදනමද සකස් කිරීම මෙම අවධියේදී සිදු කළ යුතු වේ.

නවය වසරේදී පවත්වනු ලබන ජාතික මට්ටමේ විභාගයෙන් පසු සිසුන් සිය කුසලතා සහ කැමැත්ත මත ශාස්ත්‍රීය (විද්‍යා, කලා, වාණිජ වැනි විෂයධාරා) හෝ වෘත්තීය විෂය ධාරාව (සෘජුවම කිසියම් වෘත්තියකට අදාළ වන) තෝරා ගනු ඇත. ද්විතීයික ජ්‍යෙෂ්ඨ අධ්‍යාපනයේ මුල් වසර දෙක තුළ සිය අභිමතය පරිදි එක් විෂයධාරාවකින් තවත් විෂයධාරාවකට මාරුවිය හැකි පරිදි විෂයමාලා සහ එහි බර තැබීම් ක්‍රියාත්මක කළ යුතුය.

10 වසර සිට 13 වසර දක්වා වන පාසල්




| විෂය සංකලන බර තැබීම් (ප්‍රතිශතයක් ලෙස) | | | |
|---|---|---|---|
| | A | B | A-විෂය ධාරාවට අදාල විශේෂිත විෂයන් |
| 10 වසර | 20-30 | 80-70 | |
| 11 වසර | 30-40 | 70-60 | B- පොදු විෂයයන් |
| 12 වසර | 60-70 | 30-40 | |
| 13 වසර | 70-80 | 20-30 | |

- නවය වසර අවසානයේදී තෝරාගත් ප්‍රධාන විෂයයන් සඳහා ජාතික මට්ටමින් පවත්වනු ලබන විභාගයක් සහ පාසල් පාදක ඇගයීම මගින් දරුවන්ගේ විශේෂත්වයන් සහ ඊළඟ අධ්‍යාපන ධාරාව තෝරා ගැනීමට අවශ්‍ය වන විභවයන් හඳුනා ගැනේ.
- ඒ ඒ ශිෂ්‍යයාගේ විභවයට සහ රුචිකත්වයට සරිලන පරිදි විෂයධාරා තෝරා ගැනීමට ඉඩ ප්‍රස්ථා ලබා දෙනු ඇත.
- ශාස්ත්‍රීය සහ වෘත්තීය පදනම සපයන ඒ ඒ විෂයධාරාවන්ට විශේෂිත වූ විෂයයන් මෙන්ම පොදු නිපුණතා වර්ධනය වන තාක්ෂණික සාක්ෂරතාව, ජීවන නිපුණතා, සාහිත්‍ය රස වින්දනය, මූලික නීතිය ආදී විෂයයන්ද හඳුන්වා දෙනු ඇත. එහිදී 10 සිට 13 වසර දක්වා යාමේදී ක්‍රමිකව අදාළ විෂය ධාරාවට අදාළ දැනුමෙහි ගැඹුර වැඩි වන පරිදි විෂය මාලාව සකස් කෙරෙනු ඇත.
- 11 වසර අවසානයේදී සිය අභිමතය පරිදි එක් විෂයධාරාවකින් තවත් විෂයධාරාවකට මාරු විය හැකි පරිදි විෂයමාලා සුනම්‍ය විය යුතුය.
- ලංකාවේ ආගමික, වාර්ගික හා සංස්කෘතික විවිධත්වයන්ට අනුගතව එම විවිධත්වය ගරු කරමින් කටයුතු කිරීමට ළමුන් හුරුකරවන ඉගෙනුම් පරිසරයක් ඇතිකිරීමට සහ වැඩසටහන් පාසල් තුළ ක්‍රියාත්මක කිරීම අනිවාර්ය කෙරෙනු ඇත.
- ජීවන නිපුණතා හා සමාජානුයෝජනයට අවශ්‍ය දැනුම හා ප්‍රායෝගික කුසලතා සංවර්ධනය කිරීමට අවශ්‍ය වැඩසටහන් ක්‍රියාත්මක කිරීම අනිවාර්ය කෙරේ.

- ළමුන්ගේ ශාරීරික හා මානසික සමබරතාවන් පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය වැඩසටහන් තවදුරටත් ක්‍රියාත්මක කිරීමට පියවර ගැනේ.
- තාරුණ්‍යයට ගැලපෙන පරිදි ලිංගික හා ප්‍රජනන සෞඛ්‍යය පිළිබඳ අධ්‍යාපනය තවදුරටත් ලබා දීමට කටයුතු කෙරේ.
- පාසල් ජීවිතයේ සිට වැඩිහිටි ලෝකයට එළඹෙන පරිවර්තනීය යුගයට මුහුණ දීමට අවශ්‍ය දැනුම, ආකල්ප, සහ නිපුණතා ලබා දිය හැකි ඉගෙනුම් පරිසරයක් ලබා දෙනු ඇත. (වගකීම් දැරීම, නායකත්වය, සහකම්පනය, සමාජ සබඳතා පවත්වා ගැනීම, ගැටලුවලට මුහුණදීමට සහ අවශ්‍ය විටකදී සමාජ ආධාර පද්ධති වෙත යෑමට ඇති දැනුම)

## පාසල් අධ්‍යාපන පරිපාලනය

- අධ්‍යාපන ක්ෂේත්‍රයේ බඳවා ගැනීම්, උසස්වීම් සහ මාරුවීම් සහ අනෙකුත් වෘත්තීය කටයුතු සඳහා ස්වාධීන අධ්‍යාපන පරිපාලන සේවා කොමිෂන් සභාවක් පත්කිරීම මගින් නිර්දේශපාලනීකරණයට ලක්කිරීම
- පාසල් ආයතනවල ඇතිවන සියලු පුරප්පාඩු මාස 02ක් ඇතුළත පිරවීම සඳහා කටයුතු කිරීම
- ප්‍රාථමික හා ද්විතීයික අධ්‍යාපනය සඳහා එකම අමාත්‍යංශයක් ඇති කිරීම

## මානව සම්පත් ප්‍රවර්ධනය කිරීම සහ පවත්වාගෙන යාම

- ගුරු වෘත්තියට පිවිසෙන සෑම අයකුම අධ්‍යාපනය පිළිබඳ උපාධිධාරීන් වන පරිදි අවශ්‍ය මානව සහ භෞතික සම්පත් ලබා දෙමින් සියලු ගුරු අභ්‍යාස විද්‍යාල සහ අධ්‍යාපන විද්‍යාපීඨ උපාධි ප්‍රදාන ආයතන ලෙස උසස් කිරීම හා නියාමනය කිරීම
- ගුණාත්මක අධ්‍යාපන ක්‍රියාවලියක් පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය මානව සම්පත් බඳවා ගැනීමටත් ඔවුන් රඳවා ගැනීමටත් ශ්‍රී ලංකාවේ ඉහළම වැටුප් ලබන වෘත්තීන් 10 අතරට ගුරු වෘත්තීය ඇතුළත් වන පරිදි  ගුරු වැටුප් ප්‍රතිව්‍යුහගත කිරීම
- ගුරු වෘත්තීයට පිවිසීමට පෙර අවම වශයෙන් වසරක වෘත්තීය පුහුණුවක් අනිවාර්ය කිරීම
- විෂය මාලා වෙනස් වීම් සහ ක්ෂේත්‍රයේ නව ප්‍රවණතා පිළිබඳ සෑම වසර තුනකට වරක් පුහුණු වැඩසටහන් අනිවාර්ය කිරීම
- අධ්‍යාපනය පිළිබඳ පර්යේෂණ සහ කාර්යසාධන විශ්ලේෂණවල නිරත වීමට අවශ්‍ය පහසුකම් ලබා දීම සහ එම කටයුතුවල නියැළෙන අයට දිරි දීමනා ලබා දීම
- සෑම වසර හතරකට වරක් විෂයමාලා යාවත්කාලීන කිරීම
- පාසල් පද්ධතිය තුළ සියලු ප්‍රජාව මුහුණ දෙන ලිංගික හෝ වෙනත් හිංසනයන් පිටු දැකීම සඳහා ශක්තිමත් ව්‍යුහයක් සෑම ආයතනයකම ඇතිකිරීම සහ ඒ සඳහා අවශ්‍ය පුහුණු මානව හා භෞතික සම්පත් ලබා දීම
- විෂයමාලා සංවර්ධනය, පෙළ පොත් සම්පාදනය සහ ඇගයීම් ක්‍රියාවලිය එකිනෙක සම්බන්ධ කොට පවත්වාගෙන යාමට හැකි වන පරිදි එකම ආයතනික ව්‍යුහයක් ඇති කිරීම

## 03. තෘතීයික අධ්‍යාපනය

මෙහිදී තෘතීයික අධ්‍යාපනය යන්නට වෘත්තීන් සඳහා වූ විශේෂ පුහුණුව, දැනුම් නිෂ්පාදනය සහ බෙදා හැරීම හා දැනුම අත්පත්කර ගැනීම යන සංඝටක ඇතුළත් වේ. වෘත්තීන් සඳහා වූ විශේෂ පුහුණුව යටතේ විශේෂ පුහුණුව ඇතුළත් වන ඕනෑම වෘත්තිය ක්ෂේත්‍රයක් (උදා.- වෛද්‍ය, ඉංජිනේරු, නීති, ගුරු, කාර්මික සේවා, සංචාරක සේවා, මූල්‍ය සේවා, කලා හා සංස්කෘතික...) ඇතුළත් වේ. සහතික පත්‍ර මට්ටමේ සිට පශ්චාත් උපාධි දක්වා ඕනෑම මට්ටමක අධ්‍යාපනයක් මේ යටතට අදාළ වේ. දැනුම නිෂ්පාදනය යනුවෙන් අදහස් වන්නේ, සමාජයීය වශයෙන් අවශ්‍ය කරන ඕනෑම නව දැනුමක් නිෂ්පාදනය කිරීමය. දැනුම අත්පත් කරගැනීම යන්නට සමාජයේ බුද්ධිමය නායකත්වය ගත හැකි පිරිස් නිර්මාණය කිරීම සහ දැනුම නිෂ්පාදනය සදහා අවශ්‍ය පිරිස් බිහි කිරීම ඇතුළත් වේ.

තෘතීයික අධ්‍යාපනයට විවිධ වර්ගයේ ආයතන ඇතුළත් විය හැකිය. වෘත්තීය පුහුණුව විශ්වවිද්‍යාලයට පිටතින් සංවිධානය විය හැකිය. නමුත් දැනුම නිෂ්පාදනය, සමාජයේ බුද්ධිමය නායකත්වය ගත හැකි පිරිස් නිර්මාණය කිරීම, සහ දැනුම නිෂ්පාදනය සදහා අවශ්‍ය පිරිස් බිහි කිරීම යන අංශ තුන විශ්වවිද්‍යාලයක් තුළ අනිවාර්යයයෙන්ම තිබිය යුතුය. විශ්වවිද්‍යාලයක් යනුවෙන් අදහස් වන්නේ මෙම අංග තුනම සාකල්‍ය ලෙස ඇතුළත් කරගන්නා ආයතන වේ.

### වැඩපිළිවෙළ

- පළමු වසරට ඇතුළත් වන අයගෙන් අවම වශයෙන් 50%ක් වත් ශාස්ත්‍රීය, වෘත්තීය හෝ තාක්ෂණික උසස් අධ්‍යාපනය තුළින් උපාධිය දක්වා අධ්‍යාපනය ලැබීමට කුසලතාව මත පදනම් වූ සම අවස්ථා ලබා දිය හැකි වන ආකාරයට තෘතීයික අධ්‍යාපන ක්ෂේත්‍රය ප්‍රසාරණය කිරීම
- තෘතීයික අධ්‍යාපන කොමිසමක් මගින් තෘතීයික අධ්‍යාපනය නියාමනය කිරීම
- ඒ ඒ වෘත්තීය ක්ෂේත්‍රවලට ඇතුළත් සියලු සේවා සදහා අවශ්‍ය තෘතීයික අධ්‍යාපන සුදුසුකම් ලබාගැනීමට අවශ්‍ය පාඨමාලා වර්ධනය කිරීම
- තෘතීයික අධ්‍යාපන ආයතනවල පවතින පහසුකම් වර්ධනය කිරීම පිණිස පහත සඳහන් අංග කෙරෙහි විශේෂ අවධානය යොමු කිරීම වැදගත් වේ. නේවාසිකාගාර, දේශනාගාර සහ පර්යේෂණාගාර, සෞඛ්‍යය, ක්‍රීඩා, සාහිත්‍යය, පොදු ශිෂ්‍ය ක්‍රියාකාරකම්, පුස්තකාල, අන්තර්ජාල ප්‍රවේශය සහ සියලු ප්‍රජාවට භාවිතා කළ හැකි ප්‍රමිතීන්ට අනුකූල ආපනශාලා
- තෘතීයික අධ්‍යාපන ආයතනවල සිදුවන හිංසනය වැළැක්වීමේ ඒකාබද්ධ ව්‍යුහයක් සකස් කිරීම
- තෘතීයික අධ්‍යාපන ආයතනවල ශාස්ත්‍රීය නිදහස තහවුරු කිරීම
- විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයන්ට කිසිදු වෙනස් ලෙස සැලකීමකින් තොරව තෘතීයික අධ්‍යාපනයට ඇතුල් වීමට අවස්ථා සැලසීම සහ ඊට අදාළ මානව සහ භෞතික පහසුකම් ලබා දීම

- දැනට පවතින විශ්වවිද්‍යාල පනත යෝජිත ප්‍රතිපත්ති හා වැඩපිළිවෙළට ගැලපෙන පරිදි යාවත්කාලීන කිරීම

  තෘතීයික අධ්‍යාපන ආයතනවල අධ්‍යයන ස්වාධීනත්වය තහවුරු කිරීම

  පරිපාලන ආයතනවල ස්වාධීනත්වය සහ ප්‍රජාතන්ත්‍රවාදය තහවුරු කිරීම

  අධ්‍යයන අනධ්‍යයන බඳවා ගැනීමේ පටිපාටිය නිර්දේශපාලනීකරණය කිරීම

  පරිපාලන සහ අනෙනකුත් වෘත්තීය ගැටලු පිළිබඳ ලැබෙන පැමිණිලි විමර්ශනය කිරීම සඳහා විධිමත් හා ස්වාධීන ව්‍යුහයක් සෑම තෘතීයික අධ්‍යාපන ආයතනයක් තුළම ස්ථාපිත කිරීම

- ජාතික හා ප්‍රාදේශීය අවශ්‍යතා සැලකිල්ලට ගනිමින් තෘතීයික අධ්‍යාපන ආයතන තුළ පාඨමාලා හා පර්යේෂණ පවත්වාගෙන යාම ධෛර්යමත් කිරීම
- පශ්චාත් උපාධි අධ්‍යයන සහ පර්යේෂණ ශක්තිමත් කිරීම සඳහා අවශ්‍ය මූල්‍ය හා භෞතික සම්පත් වර්ධනය කිරීම. ඒ සඳහා අවශ්‍ය ව්‍යුහාත්මක වෙනස්කම් ඇති කිරීම
- විද්‍යා හා තාක්ෂණික ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධි අධ්‍යාපනය ශක්තිමත් කිරීම සඳහා එම ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධි සඳහා වෙන්වුණ හා දේශීය හා විදේශීය කර්මාන්ත සමග පර්යේෂණ ක්‍රියාත්මක කිරීමට පහසුකම් ඇති විශ්වවිද්‍යාල පද්ධතියක් ඇති කිරීම
- ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට ජාත්‍යන්තර විශ්වවිද්‍යාලවල පශ්චාත් උපාධි අධ්‍යාපනය ලබා ගැනීම සඳහා අවශ්‍ය ඉංග්‍රීසි භාෂා ඇතුළු අනෙකුත් මූලික සුදුසුකම් ලබා ගැනීම සඳහා සෑම තෘතීයික අධ්‍යාපන ආයතනයකම විශේෂ ඒකක පිහිටුවීම සහ එම ඒකක මගින් ජාත්‍යන්තර විශ්වවිද්‍යාලවල පශ්චාත් උපාධි අධ්‍යාපනය අවස්ථා ලබා ගැනීමට අවශ්‍ය සබඳතා පුළුල් කිරීම

## තෘතීයික අධ්‍යාපනයට ප්‍රවේශය

- ඒ ඒ පාඨමාලාවේ අවම සුදුසුකම් හඳුනාගෙන ඒ සුදුසුකම් සපුරාලන සියලු දෙනාට අධ්‍යාපනය ලැබීමට අවස්ථාව ලැබෙන පරිදි තෘතීයික අධ්‍යාපන පද්ධතිය ක්‍රමිකව පුළුල් කිරීම
- වෘත්තීය පාඨමාලා සඳහා පාර්ශ්වික ඇතුළත්වීම් (Lateral Entries) ක්‍රමිකව හඳුන්වා දීමට කටයුතු කිරීම
- මූලික පියවරක් ලෙස විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා දැනට ඇති දිස්ත්‍රික් කෝටා ක්‍රමය සංශෝධනය කර, කලාප අධ්‍යාපන කොට්ඨාස වැනි වඩා කුඩා අධ්‍යාපන ඒකක මත පදනම් වූ කෝටා ක්‍රමයක් හඳුන්වා දීම

  එහිදී එම ඒකකය තුළින් ඒ ඒ විෂය ධාරාවට පෙනී සිටි උසස් පෙළ අයදුම්කරුවන් ගණන සහ එම ඒකකයට අයත් ජනගහනය සැලකිල්ලට ගනු ඇත.

## 04. වැඩිහිටි අධ්‍යාපනය

වැඩිහිටි අධ්‍යාපනය යනුවෙන් අදහස් කරන්නේ දියුණු සමාජ, දේශපාලනික හා සංස්කෘතික අවබෝධයන් සහිතව ආචාරධාර්මික හා වගකීම් සහගතව ප්‍රජා ජීවිතය පෝෂණය කොට යහපත් පුරවැසියකු නිර්මාණය කිරීම සඳහා අවශ්‍ය වන විධිමත් ප්‍රජා කේන්ද්‍රීය අධ්‍යාපනය වේ. මෙහිදී විවිධ හේතූන් මත විධිමත් අධ්‍යාපන ක්‍රමයෙන් විවිධ අවස්ථාවලදී ඉවත් වීමට සිදු වූ සෑම අයකුම පරිපූර්ණ පුරවැසියකු බවට පත්කිරීමට අවශ්‍ය වන සමාජ, දේශපාලනික සහ සංස්කෘතික අධ්‍යාපනය ලබා දීම පිළිබඳ විශේෂ අවධානය යොමු කෙරේ.

- සෑම ප්‍රාදේශීය ලේකම් බලප්‍රදේශයක් තුළම ප්‍රජා අධ්‍යාපනික මධ්‍යස්ථාන පිහිට වනු ලැබේ. මෙම මධ්‍යස්ථාන ප්‍රදේශයේ අධ්‍යාපනික ආයතන, පුස්තකාල, සංස්කෘතික මධ්‍යස්ථාන සමග ඒකාබද්ධව කටයුතු කෙරේ.
- සෑම පුරවැසියකුටම සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂා හැකියාවන් ලබා දීම සඳහා පාඨමාලා ඇති කරනු ඇත.
- මූලික නීතිය, තොරතුරු තාක්ෂණය හා තාක්ෂණික මෙවලම් භාවිතය පිළිබඳ අධ්‍යාපනික වැඩසටහන් ක්‍රියාත්මක කෙරේ.

## 05 විවෘත හා දුරස්ථ අධ්‍යාපනය

විවිධ වෘත්තීන්හි නියලී සිටින සහ විවිධ අවස්ථාවල තෘතීයික අධ්‍යාපනය සම්පූර්ණ කිරීමට පෙර විධිමත් අධ්‍යාපනයෙන් ඉවත්වීමට සිදු වූ අයට තෘතීයික අධ්‍යාපනය ලබා දීම මෙයින් අදහස් කෙරේ. ඒ අනුව සිය සේවා තත්වය හෝ භූගෝලීය සාධක පදනම් කරගෙන බාධා ඇති නොවන පරිදි උසස් අධ්‍යාපනයට ප්‍රවේශ විය හැකි අවස්ථා පුළුල් කෙරේ.

- විවෘත හා දුරස්ථ අධ්‍යාපනය තෘතීයික අධ්‍යාපනයේ කොටසක් බව පිළි ගැනේ.
- ප්‍රාදේශීය හා විවෘත අධ්‍යාපනික ක්ෂේත්‍රයේ මෙම අරමුණ ඉටු කර ගැනීම සඳහා දැනට පවතින ආයතනික ව්‍යුහයන් පුළුල් කොට ශක්තිමත් කෙරේ.

## 06 අධ්‍යාපන ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය වන රාජ්‍ය ව්‍යුහය

- යෝජිත අධ්‍යාපනික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දේශපාලනික අධිකාරියේ වුවමනාව සහ කැපවීම අත්‍යවශ්‍ය වන අතර එම වැඩපිළිවෙළ ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය වන පරිපාලනමය හා ව්‍යුහාත්මක වෙනස්කම් සුදුසු පරිදි ඇති කළ යුතුය. විශේෂයෙන්ම අධ්‍යාපනයට අදාළ සියලු ආයතන එකම අමාත්‍යාංශයකට ඇතුළත් කළ යුතුය.

# තොරතුරු සන්නිවේදන තාක්ෂණය

සබුද්ධික ශ්‍රී ලංකාවක් ගොඩනැගීම සඳහා වන උසස් මානව සම්පත මනා තොරතුරු තාක්ෂණ නිපුණතාවක් සහිත ප්‍රජාවක් බවට පත් කරවීමත් ලොව තොරතුරු තාක්ෂණ විසඳුම් සැපයීමේ ප්‍රමුඛයා බවට ශ්‍රී ලංකාව පත් කිරීමත් එම අවකාශය තුළින් ජාතික ආර්ථිකයට ප්‍රබල දායකත්වයක් ලබා දීමත් අනෙකුත් ක්ෂේත්‍ර තුළ තොරතුරු තාක්ෂණය උපයෝගී අවස්ථා අඛණ්ඩව නිර්මාණය කිරීමත් එහි ප්‍රතිලාභ ජනතාවට අත්කර දීමත් අරමුණ වේ.

ලෝකයේ සියලු ක්ෂේත්‍රවල සම්ප්‍රදායික මෙවලම් හා යෙදවුම් තොරතුරු තාක්ෂණය මත පදනම් වූ සුහුරු මෙවලම් සහ යෙදවුම් මගින් ප්‍රතිෂ්ඨාපන වීම සීඝ්‍රයෙන් දක්නට ලැබෙන අතර ඒ සඳහා විශාල වෙළඳපොළ ඉල්ලුමක්ද පවතී. ලෝකය තුළ ICT යෙදවුම් හා භාවිතාවන් සඳහා වැයකරන මුදල ඉතා සීඝ්‍ර ලෙස වැඩි වී ඇති අතර සැලසුම් සහගත වැඩපිළිවෙළක් හරහා එම වෙළඳපොළට පිවිසීමේ විභවතාවක් ශ්‍රී ලංකාව සතුව පවතී. World Economic Forum විසින් රටවල්වල තොරතුරු තාක්ෂණ විභවය ඇගයීමකට ලක්කරන සමීක්ෂණ වාර්තාව අනුව නිසි රාජ්‍ය මැදිහත්වීමක් හා වැඩපිළිවෙළක් නොමැතිව වුවද ශ්‍රී ලංකාව 2016 වසරේදී 63 වන ස්ථානයේ පසු විය. ඉන්දියාව සහ වියට්නාමය වැනි ආසියානු කලාපයේ අනෙකුත් රටවල් සිටින්නේ අපට පිටුපසිනි. ලොව හොඳම මෘදුකාංග ඉංජිනේරුවන් සිටින රටවල් අතර ශ්‍රී ලංකාව 49 වන ස්ථානයේ සිටින අතර Distributed System ක්ෂේත්‍රයේ අංක එක ලබා සිටින්නේ ශ්‍රී ලංකාවයි. ICTA වාර්තා අනුව 2018 වසර වන විට ලංකාව එම ක්ෂේත්‍රයෙන් ඩොලර් බිලියනයක විදේශ ආදායමක් උපයා ඇත.

නිසි වැඩපිළිවෙළක් සහ රාජ්‍ය මැදිහත්වීමක් සහිතව අපගේ සීමිත ස්වාභාවික සම්පත් හා මානව ප්‍රාග්ධනය තිරසර ලෙස යොදා ගැනීම මගින් ශ්‍රී ලංකාව ලොව අංක එකේ තොරතුරු තාක්ෂණ විභවය සහිත රට බවට පත් කළ හැකිය.

## උපායමාර්ගික අරමුණු

- තොරතුරු තාක්ෂණ නව විෂය නිර්දේශ හා ක්‍රමවේද අධ්‍යාපන පද්ධතිය තුළ ස්ථාපිත කිරීම
- ව්‍යාපාරික ස්ථාන, පර්යේෂණ, උපකරණ සහ මධ්‍යස්ථාන සහ වේගවත් අන්තර්ජාල සම්බන්ධතා වැනි තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් ඉහළ නැංවීම
- නව්‍ය නිෂ්පාදන හා විසඳුම් සංවර්ධනය සඳහා වැඩි ප්‍රමුඛතාවයක් ලබාදීම සඳහා වූ කුසලතා, කැපවීම් හා ආචාර ධර්ම ගුණාංග සහිත සැපයුම්කරුවකු ලෙස දකුණු ආසියාවේ තොරතුරු තාක්ෂණික කේන්ද්‍රය බවට ශ්‍රී ලංකාව පත් කිරීම
- කලාපීය හා ගෝලීය වශයෙන් ව්‍යාපාර සම්බන්ධතා ගොඩනැගීම සඳහා ව්‍යාපාර ක්ෂේත්‍රය තුළ තොරතුරු තාක්ෂණ භාවිතයන් පුළුල් කිරීම මගින් එම ප්‍රජාවන්ට නව ව්‍යාපාරික අවස්ථාවන් ගවේෂණය කිරීමට හා ඒවා දියුණු කිරීමට අවස්ථාව සැලසීම
- ගෝලීය සැපයුම් ජාලය තුළ නව්‍ය දැනුම සහ කුසලතා ඇති ශ්‍රමිකයන් හා නව මානයක නිෂ්පාදන සපයන්නෙකු ලෙස ශ්‍රී ලංකේය වෙළඳ සන්නාමය ස්ථාන ගත කිරීම
- ඉදිරි වසර පහ තුළ ප්‍රධානතම විදේශ ආදායම් මාර්ගයක් බවට තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රය පත් කිරීම

- රටේ එදිනෙදා ජන ජීවිතයේ තොරතුරු තාක්ෂණයේ භාවිතයන් වැඩිකිරීම සඳහා සුහුරු පුරවැසියන් (Smart Citizen) සිටින සුහුරු සමාජයක් (Smart Society) බිහිකිරීම
- සියලු සංවර්ධන ව්‍යාපෘති සැලසුම්කරණයේදී තොරතුරු තාක්ෂණ යෙදවුම් මගින් සුහුරු නගර හා ගම් නිර්මාණය කිරීම
- සන්නිවේදන ක්ෂේත්‍රයේ සියලු අංශ ආවරණය වන පරිදි සමස්ත ප්‍රතිපත්ති රාමුව නිර්වචනය කිරීම හා එක් එක් අංශය යටතේ ප්‍රධාන සැලසුම්වල ප්‍රගතිය සමාලෝචනය සඳහා අධීක්ෂණ රාමුවක් සකස් කිරීම

# ක්‍රියාමාර්ග

## තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය සඳහා වූ ව්‍යුහය

- ක්ෂේත්‍රය තුළ නීතිමය තත්වයන් යාවත්කාලීන කිරීමේ අවශ්‍යතාව හා ඒ සඳහා උපදේශනයන් රජයට හා මහජනතාවට ලබා දීම සඳහා නීති උපදේශන කොමිසමක් ස්ථාපිත කිරීම
- තොරතුරු තාක්ෂණ අවශ්‍යතා සහ යෙදවීම් කටයුතු කාර්යක්ෂම කිරීම සඳහා අදාළ අමාත්‍යාංශ ලේකම් අනුකමිටුවක් පිහිටු වීම
- ජාතික සහ ව්‍යාපාරික වුවමනාවන් සඳහා නිදහස් හා විවෘත මෘදුකාංග නිර්මාණය, සේවා සැපයීම, සයිබර් ආරක්ෂණ ක්‍රමවේද සැකසීම, විධිමත් හා අවිධිමත් අධ්‍යාපන කටයුතු සඳහා උපදේශාත්මක මැදිහත් වීම, නව නිර්මාණ සදහා අනුග්‍රහයන්, පහසුකම් සැපයීම හා සම්මතයන් සකස් කිරීම සඳහා ජාතික මෘදුකාංග පදනමක් ඇති කිරීම
- ව්‍යාපාර පවත්වාගෙන යාම සහ නව ව්‍යාපාර ආරම්භ කිරීම සඳහා වන තොරතුරු තාක්ෂණික අවශ්‍යතාවන් හා සේවාවන් ප්‍රමාණයන්හි ප්‍රමුඛතා නිර්ණය කිරීම සඳහා තොරතුරු තාක්ෂණ ව්‍යාපාරික සභාව (Owners Forum) පිහිටුවීම
- දැනුම, බුද්ධිය හා දියුණු වූ නිර්මාණශීලීත්වයෙන් යුතු වෘත්තිකයින් බඳවා ගැනීම හා ඔවුන් රඳවා ගැනීම සඳහා වූ තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍ර වෘත්තික සභාව (Professionals Forum) පිහිටුවීම
- ප්‍රජාවට තොරතුරු තාක්ෂණය පිළිබඳ සිය අදහස් සෘජුවම ලබාදීමට සහ හුවමාරු කර ගැනීමට අවස්ථාව සැලසෙන විවෘත සභාවක් (Open Forum) ඇති කිරීම
- පවත්නා නීති රීති ශක්තිමත් කොට ඵලදායීතාව ඉහළ නැංවීම සඳහා විදුලි සංදේශ නියාමන කොමිසම (TRC) අවශ්‍ය නෛතික ව්‍යුහාත්මක වෙනස්කම් ඇති කිරීම
- රාජ්‍ය දෙපාර්තමේන්තු, සංස්ථා, ව්‍යවස්ථාපිත ආයතන තුළ ටෙන්ඩර් හා ප්‍රසම්පාදන ක්‍රියා පටිපාටි විධිමත් කිරීම ඇතුළු ආයතන කාර්යක්ෂමතාව සහ විනිවිදභාවයන් ඇතිකිරීම සඳහා තොරතුරු තාක්ෂණය භාවිත කිරීමට අදාළ ප්‍රධාන තාක්ෂණ නිලධාරි තනතුරක් (CTO) ඇති කිරීම

## IT Park සහ නගර

ප්‍රධාන තොරතුරු තාක්ෂණික නගරයක් පිහිටවනු ලබන අතර ඊට අමතරව තොරතුරු තාක්ෂණික උද්‍යාන (IT Park - Incubators) කොළඹ, නුවර, මාතර, අනුරාධපුර, යාපනය, මඩකලපුව ආශ්‍රිතව පිහිටුවා නව ව්‍යාපාර හා තාක්ෂණික ප්‍රවේශ සඳහා නොමිලේ හෝ සහනදායී අය කිරීම් මත ලබා දීම

## ක්ෂේත්‍රය තුළ වැඩි ව්‍යාපාර අවස්ථා ජනිත කිරීම

- තොරතුරු තාක්ෂණයට අදාළ නීති සම්පාදනය කඩිනම් කරගැනීමට නීතිපති දෙපාර්තුමේන්තුවේ වෙනම ඒකකයක් ඇති කිරීම
- නවෝත්පාදක ඉලෙක්ට්‍රොනික යෙදවීම් සඳහා වන අමතර කොටස්, මෘදුකාංග කර්මාන්තය සඳහා පරිගණක සහ ජාලකරණ උපකරණ සඳහා බදු සහන ලබා දීම සහ අන්තර්ජාල පහසුකම්වලට අදාළ බදු ඉවත් කිරීම
- නව ව්‍යාපාර අරම්භ කිරීම සඳහා සියලු තාක්ෂණික හා අනෙකුත් යටිතල පහසුකම් සහිත ව්‍යාපාරික මධ්‍යස්ථාන පළමු වසර තුළ නොමිලේ ලබා දීම සඳහා කොළඹ, නුවර, මාතර සහ යාපනය සහ අනුරාධපුරය යන ප්‍රදේශවල තොරතුරු තාක්ෂණ උද්‍යාන පද්ධතියක් පිහිටුවීම
- වසරකින් පසුව අදාළ ව්‍යවසායකයාට සිය අවශ්‍යතාව මත එම ගොඩනැගිලි තුළම කුලී පදනම මත සිය ව්‍යාපාරය පවත්වාගෙන යාමට ඉඩදීම හා මෙම මධ්‍යස්ථාන අනෙකුත් ප්‍රධාන නගරවලට ව්‍යාප්ත කිරීම
- කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යාපාරිකයන් සඳහා ක්ෂේත්‍රයටම අනන්‍ය වූ අවශ්‍යතා සපුරාගැනීම සඳහා පොලි රහිත/ සහනදායී පොලී මත ණය පහසුකම් ලබාදීම
- නව ව්‍යාපාර ආරම්භ කිරීමට අවස්ථාව සැලසෙන පරිදි දේශීය හා විදේශීය ආයෝජකයින් සමග නව නිපැයුම්කරුවන් සම්බන්ධ කෙරෙන මණ්ඩප (Venture Capital Forums) පිහිටුවීම සඳහා රජය මැදිහත්වීම
- ඕනෑම අවශ්‍යතාවක් සඳහා වඩාත් යෝග්‍ය තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානය ලෙස ශ්‍රී ලාංකේය වෙළඳනාම අනන්‍යතාවක් ගොඩනැගීම සහ නව තාක්ෂණික ඉදිරිපත් කිරීම හා යෙදවීම් හා ජාතික ශ්‍රම බලකාය පිළිබඳ තොරතුරු ජාත්‍යන්තර වශයෙන් ප්‍රචලිත කිරීම සඳහා සන්නිවේදන මධ්‍යස්ථානයක් ඇති කිරීම

## සුහුරු ආණ්ඩුකරණය (Smart-Governance)

- අධිකරණ, පොලිසිය, බැංකු, මෝටර් රථ දෙපාර්තුමේන්තුව, වරාය, රේගුව හා බන්ධනාගාර ආදී රාජ්‍ය ආයතන ඒවායේ අදාළත්වය පරිදි ජාලකරණය කිරීම
- විවිධ අංශයන් තුළ පවතින දත්ත හඳුනා ගැනීම, ඒවා අධ්‍යයනය කිරීම, තීරණ ගැනීම පහසු කිරීම, සමාජ සුභසිද්ධිය සඳහා කෘත්‍රිම බුද්ධිය උපයෝගී කර ගැනීමට අනෙකුත් මෘදුකාංගයන්ට සේවා දිගුවක් සහිත නව මෘදුකාංග පද්ධතියක් ස්ථාපිත කිරීම
- දේශීය හා විදේශීය මෙන්ම පුද්ගල තොරතුරුද දේශපාලනික, ව්‍යාපාරික ප්‍රවණතා හා සේවාවන් පිළිබඳ තොරතුරු හුවමාරු කරගනිමින් ආචාරධාර්මික හා වගකීමක් සහිත භාවිතයක් ඇති ජාතික සමාජ ජාලයක් නිර්මාණය කිරීම

- කෘෂි නිෂ්පාදිතයින් හා වෙළඳ මධ්‍යස්ථාන අතර සෘජු සබඳතා හා ගනුදෙනු සකසමින් ස්ථාවර මිලක් ඇතිකිරීමත්, ඉදිරි තත්වයන් පිළිබඳ රජයට අවශ්‍ය දත්ත සහ අනුමාන ලබාදීමත් අවිධිමත් අධිනිෂ්පාදනය වැළක්වීම, පසු අස්වනු හානි අවම කිරීම, දේශගුණික හානි අවම කිරීම ආදිය සඳහා පූර්ව වගා කාලය තුළ තොරතුරු දත්ත විශ්ලේෂණය, හුවමාරුව හා තීරණ ගැනීම සඳහා IOT, Bigdata, AI වැනි තාක්ෂණයන්ගෙන් යුත් යෙදවුම් නිර්මාණය කිරීම
- නිෂ්පාදන ඵලදායීතාව වැඩි කිරීම සඳහා අර්ධ හා ස්වයංක්‍රීය කෘෂිකාර්මික භූමි නිර්මාණ කිරීමට Drone, IOT, MR, Robo වැනි තාක්ෂණික භාවිතාවන් ගොවියාට හඳුන්වාදීම සඳහා විශේෂ වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කිරීම
- පවතින ආපදා කළමනාකරණ පද්ධතිය ඉලෙක්ට්‍රොනික අන්තර්ජාල භාවිතාවන් (IOT) හා ස්වයංක්‍රීය දත්ත විශ්ලේෂකයන් දක්වා දිගුකරමින් ලොව කාර්යක්ෂම ආපදා කළමනාකරණ පද්ධතියක් ලෙස වසර 02ක් තුළ වැඩිදියුණු කිරීම
- කාර්යක්ෂම හා යහපත් සෞඛ්‍ය සේවාවක් පවත්වා ගැනීම සඳහා Mixed Reality (MR) and Extended Reality (XR), IOT, BigData වැනි නව මානයන් උපයෝගී කරගනිමින් සෞඛ්‍ය සේවා සහ කළමනාකරණ කටයුතු සඳහා මෘදුකාංග පද්ධතියක් සකස් කිරීම
- පුද්ගලයාගේ උපත ලියාපදිංචි වන අවස්ථාවේදී ලබා දෙන පරිගණක අංකයක් මගින් ඡන්ද නාමලේඛන ලියාපදිංචිය, පුද්ගල හැඳුනුම්පත, ගමන් බලපත්‍ර ආදී පුද්ගල කටයුතුවලට අවශ්‍ය තොරතුරු ස්වයංක්‍රීයව ලබා ගැනීම සඳහා ජාලගත තොරතුරු පද්ධතියක් ඇති කිරීම

## මානව සම්පත් සංවර්ධනය හා පවත්වාගෙන යාම

- තොරතුරු තාක්ෂණයේ මූලික සාක්ෂරතාව සියලු සිසුන්ට අනිවාර්ය කිරීම සහ අධ්‍යාපනයේදී තාක්ෂණික යෙදවුම් භාවිතය සියලු පාසල්වලට හඳුන්වා දීම
- තොරතුරු තාක්ෂණයේ නිර්මාණාත්මක භාවිතය සහ IQ අගය ඉහළ නැංවීම ඉලක්ක වන පරිදි පාසල් තොරතුරු තාක්ෂණ විෂය මාලාව සංශෝධනය කිරීම
- සියලු පාසල් සදහා ගණිත විද්‍යාගාර ලබා දීම සහ ගණිතය නිර්මාණාත්මක විෂයක් ලෙස ඉගැන්වීම සඳහාද කලා විෂයයන් සමග සුදුසු පරිදි ගණිතය ඉගැන්වීම සඳහාද විශේෂ පුහුණු සැසි ආරම්භ කිරීම
- තොරතුරු තාකෂණය ප්‍රචලිත කිරීම සඳහා පාසල් මට්ටමේ නිර්මාණාත්මක තරග ඇති කිරීම
- අධ්‍යාපනික ආයතන තුළ නිර්මාණාත්මක කුසලතා ඔප්නැංවෙන හා තොරතුරු තාක්ෂණය ප්‍රචලිත කිරීම අරමුණෙන් නිර්මාණාත්මක තරග ඇති කිරීමට අවශ්‍ය අනුග්‍රාකත්ව ලබා දීම
- විශ්වවිද්‍යාල හා උසස් වෘත්තීය පුහුණු ආයතන වැනි තෘතීයික අධ්‍යාපන ආයතන තුළ අධ්‍යාපන කටයුතුවලට තොරතුරු තාක්ෂණය උපයෝගී කර ගැනීම සඳහා විශේෂ ඒකක පිහිටුවීම අනිවාර්ය කිරීම
- දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ආයතනවල ඉගැන්වීම සඳහා හා දැනුම සන්නිවේදනය කරන මාධ්‍යයක් ලෙස තොරතුරු තාක්ෂණය භාවිත කිරීම

- වෘත්තිකයින් සඳහා නව තාක්ෂණික භාවිතයන්ට අවශ්‍ය වන ගණිතමය සහ කලාත්මක කුසලතා ඔප්නැංවෙන සැසි අනිවාර්ය කිරීම සහ ඊට අදාළ ආයතනික පහසුකම් ලබා දීම අනිවාර්ය කිරීම
- නිදහස් වෘත්තිකයින් හට සිය දැනුම පුළුල් කරගැනීමට හා අත්දැකීම් ලබාගැනීමට IT නගර හා උද්‍යානවල පහසුකම් සලස්වන අතර ඔවුන්ගේ සේවාවන් හා හැකියාවන් තහවුරු කිරීමට අවස්ථාවන්ද ඒවා තුළ ලබා දීම
- රට තුළ නවෝත්පාදන ව්‍යාපාර බිහිකිරීම සීඝ්‍ර කිරීම අරමුණින් නව සොයා ගැනීම් සඳහා සහ ඊට අදාළ පේටන්ට් බලපත්‍ර ලබා ගැනීම සඳහා දිරිගැන්වීම
- තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයේ වෘත්තිකයින් බඳවා ගැනීමට සහ ඔවුන් රට තුළ රඳවා ගැනීමට හැකිවන පරිදි අවශ්‍ය වන පහසුකම් හා දිරි ගැන්වීම් ලබා දීම
- ඉහත ක්‍රියාමාර්ග තුළින් වසර පහක් තුළ කෘත්‍රිම බුද්ධි, යන්ත්‍ර ඉගෙනුම් යෙදවුම්, පද්ධති හා දත්ත ආරක්ෂණය, අන්තර්ජාල භාවිතය විසල් දත්ත හැසිරවීම හා විශ්ලේෂණය ආදී ක්ෂේත්‍රවල කටයුතු කරන මෘදුකාංග ඉංජිනේරුවන්, සැලසුම්කරුවන්, පරිශීලක අත්දැකීම් ඇති නිර්මාණකරුවන්, ව්‍යාපාර විශ්ලේෂකයන්, ව්‍යාපෘති කළමනාකරුවන් 300,000ක් ක්ෂේත්‍රයට දායක කරගැනීම

## සුහුරු පුරවැසියෙක් (Smart-Citizen)

- සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකම ඇති කෙරෙන ප්‍රජා අධ්‍යාපනික මධ්‍යස්ථාන මගින් එදිනෙදා භාවිතා කරන සුහුරු තාක්ෂණික මෙවලම් පිළිබඳ අවබෝධය ලබා දෙන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
- විශේෂ අවශ්‍යතා ඇති අයගේ එදිනෙදා කටයුතු පහසු කරන තාක්ෂණික මෙවලම් හඳුන්වාදීම, දිරි ගැන්වීම සහ ඔවුන්ගේ පරිශීලනය සඳහා රට තුළ ක්‍රියාත්මක වන වෙබ් අඩවි සඳහා WCAG 2.1 තාක්ෂණය යොදා ගැනීම දිරිගැන්වීම

## විද්‍යාව, තාක්ෂණය, පර්යේෂණය හා සංවර්ධනය

විද්‍යා, තාක්ෂණය සහ පර්යේෂණ හා සංවර්ධන ධාරාව ශ්‍රී ලංකාවේ සමාජ හා ආර්ථික සංවර්ධනයේදී නොසලකා හරින ලද ක්ෂේත්‍රයකි. රජය ඒ සඳහා වාර්ෂිකව දළ ජාතික නිෂ්පාදිතයෙන් 0.16%ක් පමණක් වෙන් කිරීමෙන් මෙය මනාව පිළිබිඹු වේ. ඒ හේතුව නිසාම ජන විඥානයේ පසුගාමීත්වය මෙන්ම ආර්ථික ක්‍රියාදාමයේ නිෂ්පාදනයන්හිද ප්‍රාථමික බවක් ප්‍රබලව දක්නට ලැබේ. අනෙක් අතින් මෙම ක්ෂේත්‍රයේ කෙරෙනු ලබන පර්යේෂණද හුදෙක් අධ්‍යාපනික අරමුණුවලට පමණක් ලඝු වීම ප්‍රබලව දක්නට ලැබෙන අතර එම පර්යේෂණයන්හි ප්‍රතිඵල ජන ජීවිතය ඉහළ නැංවීමට හෝ ආර්ථික ක්ෂේත්‍රයේ තත්වය ඉහළ නැංවීමට ප්‍රබල දායකත්වයක් සපයන්නේ නැත.

ජන සමාජයේ පරිකල්පන ශක්තිය ඉහළ නංවමින් උසස් මානව සමාජයක් ඇති කිරීමටත් ආර්ථික නිෂ්පාදනයන්හි ගුණාත්මකභාවය හා ඵලදායීතාව ඉහළ නැංවීමටත් විශේෂයෙන් ප්‍රාථමික නිෂ්පාදනයන්හි එකතු කළ අගයන් වැඩිකිරීම තුළින් එහි වටිනාකම් ඉහළ නැංවීමටත් විද්‍යා තාක්ෂණය සහ පර්යේෂණ හා සංවර්ධන ක්ෂේත්‍රය ප්‍රබල ලෙස උපයෝගී කරගත හැකි බව අපගේ විශ්වාසයයි.

## අරමුණ

- සමාජ හා ආර්ථික සංවර්ධන උදෙසා විද්‍යාව, තාක්ෂණය සහ පර්යේෂණ හා සංවර්ධන ක්ෂේත්‍රය ප්‍රබල දායකත්වය සපයන ධාරාවක් බවට පත් කිරීම
- විද්‍යාත්මක හා තාක්ෂණික ක්ෂේත්‍රයේ ගුණාත්මක පර්යේෂණ සංස්කෘතියක් ඇතිකොට එහි ප්‍රතිඵල සමාජ සංවර්ධනයට ඵලදායී ලෙස උපයෝගී කර ගැනීම
- විද්‍යාව, තාක්ෂණය සහ පර්යේෂණ හා සංවර්ධන ක්ෂේත්‍රය ජන ජීවිතයේ කාර්යක්ෂමතාව සහ නිෂ්පාදනයන්හි ඵලදායීතාව ඉහළ නැංවීම සඳහා යොදා ගැනීම මගින් යහපත් ජීවන තත්වයක් ඔවුනට ලබා දීම

# ක්‍රියාමාර්ග

වාර්ෂිකව අවම වශයෙන් දළ ජාතික නිෂ්පාදිතයෙන් 2% ක් විද්‍යාව, තාක්ෂණය සහ පර්යේෂණය සහ සංවර්ධනය යන අංශ වෙත වෙන් කිරීම ඉලක්ක කර ගනිමින් ආරම්භයේදී දළ ජාතික නිෂ්පාදනයෙන් 0.75% වෙන් කිරීම

- රාජ්‍ය හා පෞද්ගලික අංශයේ දායකත්වයෙන් විද්‍යා, තාක්ෂණ, පර්යේෂණ හා සංවර්ධන කටයුතු සඳහා වෙනම අරමුදලක් ඇති කිරීම
- විද්‍යා, තාක්ෂණ, පර්යේෂණ හා සංවර්ධන කටයුතු උපදේශනය නියාමනය සහ ප්‍රවර්ධනය සඳහා විද්‍යා තාක්ෂණ හා පර්යේෂණ ඒජන්සිය නමින් නව ආයතනයක් ස්ථාපිත කිරීම
  - විද්‍යා, තාක්ෂණ සහ පර්යේෂණ ක්ෂේත්‍ර සහ කර්මාන්ත අතර මනා සම්බන්ධීකරණයක් ඇති කොට විද්‍යාත්මක පර්යේෂණ රටේ ආර්ථික සංවර්ධනයට සහ රැකියා උත්පාදනයටත් ග්‍රාමීය සහ නාගරික ජන ජීවිතවල ගුණාත්මක තත්වය ඉහළ නැංවීමටත් ඵලදායීතාව ඉහළ නැංවීමටත් තිරසර සංවර්ධනයටත් එම ඒජන්සිය උපයෝගී කර ගැනීම
  - විදේශගතව සිටින කීර්තිමත් විද්‍යාඥයින්ට සහ පර්යේෂකයින්ට යළි මව් රටට පැමිණෙන ලෙසත් ඒජන්සිය සමග එක්ව කටයුතු කරන ලෙසත් ආරාධනා කොට ඔවුන්ට අවශ්‍ය සියලු පහසුකම් ලබා දීම
  - ක්ෂේත්‍රයේ පර්යේෂණ ප්‍රතිඵල ලබා ගැනීමට හැකිවන පරිදි නව නිෂ්පාදන ඇති කිරීම හා නිෂ්පාදනයන්හි ගුණාත්මකභාවය වැඩි කිරීම සඳහා රාජ්‍ය හා පෞද්ගලික අංශයේ දායකත්වය ලබා දීමට මැදිහත් වීම
  - කෘෂිකර්මාන්තය, ධීවර වැනි ක්ෂේත්‍රවලට නව තාක්ෂණය හඳුන්වාදීමට සහ ඒවායේ නිෂ්පාදන ඵලදායීතාව ඉහළ නැංවීමට අවශ්‍ය පර්යේෂණ වේගවත් කිරීම
  - ඉදිරි වසර 10ක කාලය ක්ෂේත්‍රයේ ඉලක්ක සහ වැඩපිළිවෙළ හඳුනාගෙන එම වැඩපිළිවෙළ ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය මානව හා භෞතික සම්පත් සහ අනෙකුත් යටිතල පහසුකම් ලබා දීම
  - දැනට පවතින සියලු පර්යේෂණ ආයතනයන්හි කටයුතු ඒවායේ ස්වාධීනත්වයට හා අනන්‍යතාවලට බාධාවක් නොවන පරිදි ඒකාබද්ධ කිරීම මගින් පොදු ජාතික වැඩපිළිවෙළක් වෙත ඉලක්ක ගත කිරීම

- රාජ්‍ය හා පෞද්ගලික අංශයට භාවිත කළ හැකි නවීනතම විද්‍යාගාර සහ පර්යේෂණ පහසුකම් සහිත ආයතන සෑම දිස්ත්‍රික්කයකම පිහිටුවීම
- විද්‍යා, තාක්ෂණ සහ පර්යේෂණ අංශය දිරිගැන්වීම සඳහා ව්‍යාපාර ලෙස විද්‍යාගාර හා පර්යේෂණ පහසුකම් පිහිටුවීම සඳහා බදු සහන ඇතුළු දිරි ගැන්වීම් ලබා දීම
- විශ්වවිද්‍යාලවල ඇතුළු තෘතීයික අධ්‍යාපන ආයතනවල සිදුකෙරෙන විද්‍යාත්මක පර්යේෂණවලට සහය ලබාදීම සඳහා ලබා දෙන අරමුදල් වැඩිකිරීම
- විද්‍යාත්මක දැනුම පුරවැසියන් අතරට ගෙනයාමටත් එමගින් සමාජ සංවර්ධනයට බාධා කරන මිථ්‍යා මත දුරු කිරීමටත් කටයුතු කිරීම
- විද්‍යා හා තාක්ෂණික දැනුම හා පර්යේෂණ ප්‍රතිඵල ඵලදායී ලෙස ජනතාවට සන්නිවේදනය කිරීම් සඳහා මාධ්‍යවේදීන් පුහුණු කිරීම ඇතුළු නව ක්‍රමවේද හඳුන්වා දීම

■ බුද්ධිමය දේපළ අයිතිය තහවුරු කිරීම සඳහා දැනට පවතින නීතිවල අඩුපාඩු සකස්කිරීමත් නව නීති හඳුන්වා දීමත් පේටන්ට් අයිතිය ලබාගැනීමට සහය දීමත් රටට ආවේණික ස්වාභාවික සම්පත්වල පේටන්ට් අයිතිය තහවුරු කිරීමත් සඳහා කඩිනම් ක්‍රියාමාර්ග ගැනීම

■ විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ හා සංවර්ධන ක්ෂේත්‍රවල සුවිශේෂී දක්ෂතා සහ සොයාගැනීම් සිදුකරන විද්‍යාඥයින් දිරිගන්වා ඇගයීම සඳහා ජාතික තාක්ෂණ සම්මාන ප්‍රදානය වාර්ෂිකව සිදුකිරීම

# සංතෘප්තිමත් ශ්‍රී ලංකාවක්

අප සමාජය ගොඩනැංවීමට සමාජයේ සියලු මනුෂ්‍ය ප්‍රජාව තෘප්තිමත්, පරිපූර්ණ ජනකොටසක් විය යුතුය. ඒ සඳහා නිරෝගිමත් හා මනා පුද්ගල පෞරුෂත්වයෙන් යුත් කලා සංස්කෘතික භාවිතයන් හා රසවින්දනය සහිත සමාජයක් බවට පත් කළ යුතුය. ඒ අරමුණ සාක්ෂාත් කරගැනීම සඳහා අවශ්‍ය සමාජීය කුළුණු වන කලාව, ක්‍රීඩාව, සෞඛ්‍යය, ජනමාධ්‍ය ආදී ක්ෂේත්‍ර නිරවද්‍ය අර්ථකතනයකින් යුක්තව සහ උසස් භාවිතයකින් ගොඩනැගීම මගින් පසුතැවිලිවීම් සහ බිඳවැටීම්වලින් තොර සංතෘප්තිමත් ප්‍රජාවක් නිර්මාණය කළ හැකි බව අපේ විශ්වාසයයි.

# සෞඛ්‍යය

## අර්බුදයේ ස්වභාවය

ඕනෑම ජන සමාජයක පුරවැසියාගේ ජීවන තත්වයේ උසස් බව මැනීමේදී ඔහුගේ නීරෝගීකම ප්‍රධාන සාධකයකි. සෞඛ්‍ය සම්පන්න පුරවැසියකු යහපත් පවුලක් තුළ ප්‍රීතිමත් ජීවිතයකට හිමිකම ලැබීම මගින් සමාජ සංවර්ධනයට දායකත්වයක් සපයයි. නමුත් වර්තමානයේ අපේ සෞඛ්‍ය ක්ෂේත්‍රය නිරෝගීමත් පුරවැසියකු බිහිකිරීමට අසමත්ව අර්බුද රැසකට මුහුණ දී ඇත.

ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව 2016 හිදී කළ සමීක්ෂණයට අනුව ශ්‍රී ලංකාවේ උපදින දරුවන්ගෙන් 15.7%ක් සම්මත උපත් බරට වඩා අඩුවෙන් උපදී. වයසට සරිලන උස අඩු දරුවන්ගේ ප්‍රමාණය 17.3%ක් වූ අතර කෘෂ දරුවන් ප්‍රමාණය 15.1%කි.

බෝවන රෝග පාලනය කිරීමට ඵලදායී පියවර ගැනීමට අපොහොසත් වීම නිසා බොහෝ වර්ෂවල එම රෝග වසංගත තත්වයට වර්ධනය වේ. 2017 වසරේ පමණක් 186,000 කට වඩා රෝගීන්ද 400කට වඩා මරණද ඩෙංගු රෝගය නිසා වාර්තා විය. අවුරුදු 20ට වැඩි පුරවැසියන්ගෙන් 25%ක් කුමන හෝ බෝ නොවන රෝගයකින් පෙළෙන බව හා අවුරුදු 60ට වඩා වැඩි ජනගහනයෙන් 7.7%කට කිසියම් හෘද රෝගයක්ද, 30%කට අධි රුධිර පීඩනයද 17.3%කට දියවැඩියාවද වැළඳී ඇති බව සමීක්ෂණ වාර්තා පෙන්වා දෙයි. 1990 සිට උතුරු මැද ඌව සහ නැගෙනහිර වැනි පළාත්වල නිදන්ගත වකුගඩු රෝගය වැළඳුන අය පිළිබඳ වාර්තා ඉහළ යමින් පැවතියද තවමත් එම රෝගය වැළඳීමට බලපාන ස්ථිර හේතුසාධක හෝ රෝගය වැළැක්විය හැකි ප්‍රතිකාර ක්‍රම නිශ්චිතව හඳුනාගෙන නැත. නිදන්ගත වකුගඩු රෝගය පිළිබඳව ඇති විද්‍යාත්මක තොරතුරුද තවමත් අසම්පූර්ණය.

උග්‍ර සෞඛ්‍ය ගැටලු විසඳීම සඳහා ක්‍රමවත් සැලැස්මක් නොමැති වීම නිසාත් ඒවා විසඳීම සඳහා වන රාජ්‍ය මැදිහත්වීම කිසිසේත්ම ප්‍රමාණවත් නොවන නිසාත් පැනනැගී ඇති අර්බුදය විවිධ අංශ විසින් සිය ව්‍යාපාරික අරමුණු ඉටුකර ගැනීම සඳහා භාවිත කර ගනිමින් තිබේ. අවම අවදානමක් සහිතව පහසුවෙන් අධික ලාභ ලැබිය හැකි ක්ෂේත්‍රයක් ලෙස සෞඛ්‍යය ආයෝජකයින් විසින් හඳුනා ගනු ලැබ ඇත. නිදහස් සෞඛ්‍යයක් පිළිබඳ ඉහළින් කතා කළද සෞඛ්‍යය සඳහා යන වියදමින් 38.43%ක් මහජනතාව සිය පුද්ගලික වියදමින් දරන බව හෙළි වී ඇත. ලෝක සෞඛ්‍ය සංවිධානයේ නිර්දේශවලට අනුව සෞඛ්‍යය සඳහා දළ දේශීය නිෂ්පාදිතයෙන් වාර්ෂිකව වෙන් විය යුතු ප්‍රමාණය අවම වශයෙන් 5%ක් පමණ වුවද ශ්‍රී ලංකා රජය ඒ සඳහා වැයකරන ප්‍රමාණය ක්‍රමයෙන් අඩු කරමින් සිටී. 2007දී එය 1.68%ක් වූ අතර 2017දී එය 1.48%ක් දක්වා අඩු විය.

පවතින සීමිත රාජ්‍ය හා පෞද්ගලික සෞඛ්‍ය සේවාවන්ද නගරවලට කේන්ද්‍රගත වීම කැපී පෙනෙන ගැටලුවකි. නගරයෙන් ඈතට යත්ම වෛද්‍යවරු, ඖෂධ, උපකරණ සහ අනෙකුත් යටිතල පහසුකම් නොමැතිවීම නිසා බොහෝ රෝගීන් ප්‍රාථමික සෞඛ්‍ය ආයතන (ග්‍රාමීය සහ අර්ධ නාගරික) මඟහැර ද්විතියික සහ තෘතීයික සෞඛ්‍ය ආයතනවලට (ප්‍රධාන නගරවල) පැමිණීම නිසා එම ආයතන අධික ලෙස රෝගීන්ගෙන් පිරී තිබේ.

සෞඛ්‍යය වෙළඳ භාණ්ඩයක් කිරීම තුළින් සෞඛ්‍යයේ සැබෑ අරමුණ ඉටුකරගත නොහැකි යැයි විශ්වාස කරන අපි යෝජිත වැඩපිළිවෙළ මගින් පෞද්ගලික සෞඛ්‍ය සේවයේ අවශ්‍යතාව ක්‍රමිකව අඩුවී යනු ඇතැයි බලාපොරොත්තු වෙමු. එම කාල සීමාව තුළ පෞද්ගලික සෞඛ්‍ය ආයතන නියාමනය කිරීම සඳහා අන්තර්කාලීන වැඩපිළිවෙළක් ඇති කිරීමට අවශ්‍ය වනු ඇත.

### කාර්යක්ෂම හා ඵලදායී සෞඛ්‍ය සේවයක් සඳහා මූලධර්ම

- සෑම පුරවැසියෙකුටම නිරෝගී සම්පන්න ජීවිතයක් ලබා දීමට හැකිවන පරිදි ගුණාත්මක හා කාර්යක්ෂම සෞඛ්‍ය සේවයක් ඇති කිරීම
- පුරවැසියාට රෝගවලට ප්‍රතිකාර කිරීමට වඩා රෝග නිවාරණය අරමුණු කරගත් යහපත් දිවි පැවැත්මක් සහතික කිරීම
- සෑම පුරවැසියෙකුටම සමාජමය හෝ භූගෝලීය අසමානකම්වලින් තොරව යහපත් සෞඛ්‍ය සේවාවක් සඳහා සම ප්‍රවේශය සහතික කිරීම
- විශ්වාසවන්ත රාජ්‍ය සෞඛ්‍ය සේවාවක් සහතික කිරීම

## මූලික ක්‍රියාමාර්ග

- නිරෝගිමත් ජීවිතයකට අවශ්‍ය වන මූලික සෞඛ්‍ය සේවාවන් ලබා ගැනීමට ඇති අයිතිය මූලික මිනිස් අයිතිවාසිකමක් ලෙස ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ඇතුළත් කිරීම
- බටහිර සහ ආයුර්වේද, හෝමියෝපති, සිද්ධ, යුනානි හා දේශීය සෞඛ්‍ය සේවාවන් පාලනය එක් අමාත්‍යංශයක් යටතට පත් කිරීම
- සෞඛ්‍යය සඳහා දළ ජාතික නිෂ්පාදනයෙන් 5%ක් ආයෝජනය කිරීම ඉලක්ක කර ගනිමින් ඉදිරි වසර පහ තුළ එය 3% දක්වා වැඩි කිරීම
- මහජන සෞඛ්‍ය සේවාවන්ට අදාළ සියලු අණපනත් යාවත්කාලීන කිරීම
- ඖෂධ පනත වඩාත් ජනතා හිතවාදීව සංශෝධනය කර බලාත්මක කිරීම
- රෝගීන්ගේ අයිතිවාසිකම් පිළිබඳ ප්‍රඥප්තියක් සකස් කොට එය බලාත්මක කිරීම (Patient Charter)
- රාජ්‍ය ප්‍රතිපත්තීන් ක්‍රියාවට නැගීමේදී ජනතාවගේ සෞඛ්‍ය අවශ්‍යතා තහවුරු වන බව සහතික කිරීමට අදාළ අමාත්‍යංශ සම්බන්ධීකරණය කෙරෙන ජාතික සෞඛ්‍ය ප්‍රවර්ධන කාර්යංශයක් පිහිටුවනු ලැබීම (National Health Promotion Bureau)
- රෝහල් සේවා නියාමනය සඳහා ස්වාධීන අධිකාරියක් පත්කිරීම (Indipendent Health Service Accreditation Council)
- ප්‍රාථමික රෝහල්, ප්‍රාදේශීය, මූලික, පළාත් මහ රෝහල් සහ ශික්ෂණ රෝහල් අතර මනා සම්බන්ධීකරණයක් පවතින සේ සහ ප්‍රතිකාර සේවාවන් සඳහා යොමු කිරීම් වඩා ක්‍රමවත් කිරීමට සහ විශේෂඥ සේවාවන් ලබා දීමට යාන්ත්‍රණයක් සකස් කිරීම (Satellite Specialized Services)
- රෝගීන්ට ප්‍රතිකාර කිරීමේදී පිළිපැදිය යුතු සායනික මර්ගෝපදේශන සංග්‍රහයක් (Clinical Guidelines) හඳුන්වාදීම
- කර්මාන්තශාලාවල සහ සේවා ස්ථානවල සිදුවන රැකියාවට සම්බන්ධ අනතුරු සහ සෞඛ්‍ය ගැටලු නියාමනයට සහ වැළැක්වීම සඳහා ක්‍රියාමාර්ග ගැනීමට අධිකාරියක් ස්ථාපිත කිරීම (Occupational Health Authority)

- හඳුනාගත් ප්‍රාථමික ද්විතීයික සහ තෘතීයික රෝහල් එකිනෙකට සම්බන්ධ කර ඒවායෙහි ඇති පහසුකම් සහ විශේෂඥ සේවාවලින් වඩා කාර්යක්ෂම සේවාවක් ලබා ගැනීමට හුවමාරු ක්‍රමයක් ස්ථාපිත කිරීම (Shared Care Cluster System)
- හදිසි අවස්ථාවල රෝගීන් නිවෙස්හි සිට ප්‍රවාහනය සඳහා පවතින ගිලන් රිය සේවාවන් වැඩි දියුණු කිරීම සහ එයට හදිසි අනතුරු කළමනාකරණය සඳහා තාක්ෂණ නිලධාරියෙකු සහිත කණ්ඩායමක් හඳුන්වාදීම (Emergency Medical Technician)
- සෑම පුද්ගලයෙකුටම වගකියන පවුල් වෛද්‍යවරයෙකු ඇතුළු කණ්ඩායමක ආවරණය ලබාදීම සඳහා වැඩපිළිවෙළක් හඳුන්වාදීම (Family Doctor with a Supporting Team)
- සියලු සෞඛ්‍ය සේවා නිලධාරීන්ගේ කාර්ය සාධනය ඇගයීමට වැඩපිළිවෙළක් හඳුන්වාදීම සහ රෝග පාලනයට ලබාදෙන දායකත්වය අනුව ත්‍යාග සහ දිරි දීමනා ලබාදීම (Apprasial System and Rewarding Mechanism)
- සෞඛ්‍ය සේවය වැඩි දියුණු කිරීමට අදාළ පර්යේෂණ ආයතන සම්බන්ධීකරණය කිරීමට සෞඛ්‍ය අමාත්‍යංශයට සම්බන්ධව ඒකකයක් ඇති කිරීම
- බටහිර, ආයුර්වේද, හෝමියෝපති, සිද්ධ, යුනානි හා දේශීය වැනි විවිධ වෛද්‍ය ක්‍රම විද්‍යාත්මක පදනමක් මත ඒකාබද්ධ සේවාවන් ලෙස ජනතාවට ලබාදීම
- සියලු ප්‍රතිකාර සේවාවන් සහ ඖෂධ වර්ග ප්‍රමිතිගත කිරීම තවදුරටත් පුළුල් කිරීම
- දේශීය හා පාරම්පරික වෛද්‍ය ක්‍රම පිළිබඳව පුළුල් අධ්‍යයනයක් කර එම දැනුම සංරක්ෂණය කිරීම

## ප්‍රාථමික සෞඛ්‍ය සේවාවන්

- රෝහල්/සෞඛ්‍ය ආයතනවලින් ලබාගත හැකි සේවාවන් පිළිබඳ අන්තර්ජාලයෙන් හා දුරකථන මගින් තොරතුරු දැන ගැනීමට පහසුකම් සැලසීම
- වැඩකරන ජනතාවට බාහිර රෝගී සහ සායන ප්‍රතිකාර ලබා ගැනීම පහසු වන සේ සතියේ දිනවල උදෑසන 8.00 සිට රාත්‍රී 8.00 දක්වා සහ ඉරිදා දිනයන්ද ආවරණය වන සේ එම සේවාවන් දීර්ඝ කිරීම
- එක් එක් බාහිර රෝගීන් සඳහා ප්‍රතිකාර ගැනිමට නිශ්චිත කාලවේලාවක් ලබාදී එම කාලය තුළ අදාළ වෛද්‍යවරයා වෙත යොමු කිරීම
- රෝහලට නේවාසිකව ඇතුළත් වන සෑම රෝගියකුටම ඇඳක් සැපයීම තහවුරු කිරීම
- රෝගියෙකු පරීක්ෂා කළ යුතු ආකාරය පිළිබඳ ආචාරධර්ම පද්ධතියක් සකස් කිරීම සහ එය මහජනතාවගේ දැනගැනීම සඳහා ප්‍රදර්ශනය කිරීම
- රෝග ප්‍රතිකාර ලබන සැලැස්ම හා පරීක්ෂණ ප්‍රතිඵල රෝගියාට පැහැදිලි කිරීම අනිවාර්ය කිරීම
- සියලු රෝහල් රසායනාගාර සඳහා අන්තර්ජාතික වර්ගීකරණ ක්‍රමයක් හඳුන්වාදීම (ISO Standards)

- සෑම රෝහලකම සෞඛ්‍ය සේවාවල තත්වාරක්ෂණය නියාමනය සඳහා ඒකකයක් ඇතිකිරීම අනිවාර්ය කිරීම (Internal Quality Assurance Unit)
- රෝගියෙකු රෝහලකට පැමිණ ප්‍රතිකාර ලබාගෙන පිටව යාම දක්වා සියලු පියවර, රෝග ඉතිහාසය, පරීක්ෂණ, රෝග විනිශ්චය, ප්‍රතිකාර සහ පසු විපරම් සැලසුම පිළිබඳ තොරතුරු වාර්තා කිරීම සඳහා පරිගණක අංකයක් ලබාදීම (e-health Technology)
- රෝහල් පරිශ්‍රය පිරිසිදු හා ප්‍රසන්න ස්ථාන බවට පත් කිරීම සහ රෝගීන්ට කියවීම රසවින්දනය, සෞඛ්‍ය තොරතුරු දැනගැනීම ආදී ක්‍රියාකාරකම් සඳහා අවශ්‍ය පහසුකම් ඇතිකිරීම
- රෝහල් සේවය පිළිබඳ පසු මහජන ප්‍රතිචාර ලබා ගැනීමටත් ඒවා පිළිබඳ කටයුතු කිරීමට ඇති ව්‍යුහයන් තවදුරටත් ශක්තිමත් කිරීම

## හදිසි ප්‍රතිකාර

- හදිසි සෞඛ්‍ය අවශ්‍යතා සඳහා තොරතුරු ලබා දීමට විශේෂයෙන් වෙන්වූ පැය 24 පුරා ක්‍රියාත්මක දුරකථන අංකයක් සියලු දිස්ත්‍රික්ක, මූලික සහ පළාත්බද රෝහල් සඳහා හඳුන්වාදීම
- පාසල්, කාර්යාල, වැඩබිම් සහ මහජනයා වැඩිපුර ගැවසෙන ස්ථානවලට ප්‍රථමාධාර ඒකක අනිවාර්ය කිරීම

## ඖෂධ සහ පරීක්ෂණ

- සියලුම රෝහල් සඳහා අත්‍යවශ්‍ය ඖෂධ ලැයිස්තුවක් හඳුන්වා දීම
- ඖෂධ හා උපකරණ දේශීයව නිෂ්පාදන ආයතන වැඩි කිරීම සඳහා කටයුතු කිරීම
- ඖෂධවල තත්ව පරීක්ෂණය සඳහා රසායනාගාර පහසුකම් පුළුල් කිරීම
- පහසු මිලට ගුණාත්මක ඖෂධ ජනතාවට ලබාගත හැකිවන පරිදි සෑම නගරයකම රාජ්‍ය ඔසුසැල් ඇති කිරීම

## නිදන්ගත රෝග සඳහා ප්‍රතිකාර

- වයස අවුරුදු 40ට වැඩි සියලුම පුද්ගලයින් අවම වශයෙන් වසරකට වරක් පූර්ණ වෛද්‍ය පරීක්ෂණයකට ලක් කිරීම අනිවාර්ය කොට රෝගීන් පිළිබඳ පසු විපරම පවුල් වෛද්‍යවරයා මගින් සිදු කිරීම
- බෝ නොවන රෝග (හෘද රෝග, අධි රුධිර පීඩනය, දියවැඩියාව, කොලෙස්ටෙරෝල් වැඩිවීම) නිසා සිදුවන සංකූලතා අවම කිරීමට ප්‍රජා මූලික වැඩපිළිවෙළක් හඳුන්වා දීම
- වකුගඩු සහ පිළිකා රෝග පිළිබඳ අදාළ පර්යේෂණ සඳහා ජාත්‍යන්තර සහයෝගය ලබාගෙන එම කටයුතු විධිමත් කිරීම

## රෝග වැළැක්වීම

- මාතෘ, ළමා සහ නිවාරණ සෞඛ්‍යය පිළිබඳ මූලික සෞඛ්‍ය අධ්‍යාපනය අනිවාර්ය කිරීම
- සෑම පාසල් සිසුවකුම වාර්ෂිකව වෛද්‍ය පරීක්ෂණයකට ලක් කොට විධිමත් වාර්තා පවත්වාගෙන යාම
- ඩෙංගු වැනි වසංගත රෝග පාලනය කිරීමට ප්‍රමුඛත්වය ලබාදෙන අතර ප්‍රජා මූලික ව්‍යාපෘති මගින් මදුරු ඝනත්වය අවම කර තබා ගැනීම පළාත් පාලන ආයතනවල ප්‍රමුඛ කාර්යයක් බවට පත්කර එය නියාමනය කිරීම සෞඛ්‍ය අමාත්‍යංශයේ මූලිකත්වයෙන් සිදු කිරීම
- මත්ද්‍රව්‍ය නිවාරණය සඳහා දැඩි නීති පද්ධතියක් හඳුන්වාදීම
- සෑම නගරයකම සහ මහජන ආයතනයකම ප්‍රමිතියෙන් යුත් පොදු වැසිකිළි පද්ධතියක් ඇති කිරීම අනිවාර්ය කිරීම සහ පළාත් පාලන ආයතන මගින් ජනතාව වැඩිපුර ගැවසෙන ස්ථානවල පොදු වැසිකිළි පද්ධති ඉදි කිරීම
- හදිසි හා මාර්ග අනතුරු නිසා සිදුවන ආබාධ, මරණ අවම කිරීමට අදාළ ආයතන සම්බන්ධීකරණය කර ස්ථිරසාර වැඩපිළිවෙළක් සකස් කිරීම
- අක්ෂි රෝග වැළැක්වීම සඳහා සෞඛ්‍ය අමාත්‍යංශයේ බෝ නොවන රෝග ඒකකය තුළ වෙනම අංශයක් ස්ථාපනය කිරීම
- ලෝක සෞඛ්‍ය සංවිධානයේ Framework for Convention of Tobacco Control අනුව කටයුතු කර ජාතික දුම්කොළ හා මධ්‍යසාර අධිකාරී පනත තවදුරටත් ශක්තිමත් කිරීම
- සෞඛ්‍යාරක්ෂිත ආහාර ප්‍රවර්ධනය කිරීම අධ්‍යාපනික, කෘෂිකාර්මික හා වෙළඳ ප්‍රතිපත්තීන්වල ප්‍රධාන අරමුණක් බවට පත් කොට නිවැරදි ලේබල් කිරීම, චර්යාධර්මයන්ට අනුකූල ප්‍රචාරණය, සංයුතිය පිළිබඳ නිවැරදි තොරතුරු පාරිභෝගිකයින්ට ලබා දීම සහතික කිරීම
- අධ්‍යාපන, ක්‍රීඩා හා ප්‍රවාහන ප්‍රතිපත්තීන් තුළ ශාරීරික ක්‍රියාකාරිත්වය වැඩි දියුණු කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ඇතුළත් කර පළාත් පාලන ආයතන හා රැකියා ස්ථානවල සහයෝගය ඇතිව ඇවිදීම, බයිසිකල් පැදීම හා විවිධ ක්‍රීඩා සඳහා පහසුකම් හඳුන්වා දීම

## මානසික සෞඛ්‍යය

- මානසික සෞඛ්‍ය ප්‍රවර්ධනය හා මානසික රෝග වැළැක්වීම සඳහා ක්‍රමවත් වැඩපිළිවෙළක් සකස් කිරීම
- මානසික රෝගීන්ගේ මානව අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට පියවර ගනු ලැබීම
- මානසික රෝගවලට ප්‍රතිකාර කිරීමේදී ප්‍රජා මූලික ප්‍රතිකාර සඳහා ප්‍රමුඛතාව ලබා දීම

## ආහාර සහ පෝෂණය

- පළතුරු සහ එළවළු නිෂ්පාදනයේදී, බෙදාහැරීමේදී සහ අලෙවියේදී සෞඛ්‍යාරක්ෂිත බව සහ නියමිත ප්‍රමිතීන් ආරක්ෂා කිරීමට අදාළ නීති හඳුන්වා දීම
- ආපනශාලා සඳහා නියමිත ප්‍රමිතීන් හඳුන්වා දීම සහ එම ප්‍රමිතීන් පවත්වාගන යාම සහතික කිරීම
- විධිමත් සහ අවිධිමත් ස්ථානවල විකිණීමට ඇති ආහාර සහ පානීය ජලය නියමිත තත්වාරක්ෂණයෙන් යුතු බවට සහතික කිරීම සඳහා අවශ්‍ය ක්ෂේත්‍රගත නිලධාරීන් සහ පර්යේෂණාගාර ඇතුළු වෙනත් පහසුකම් වැඩි දියුණු කිරීම
- කෙටි හා දිගු කාලීන මන්ද පෝෂණයෙන්, ස්ථූලභාවයෙන් පෙළෙන දරුවන්/පුද්ගලයින් හඳුනාගැනීම සඳහා ප්‍රජා මූලිකව වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

## වයස්ගතවීම නිසා මුහුණදෙන ගැටලු

- විශ්‍රාමික දිවිය සෞඛ්‍ය සම්පන්නව ගත කිරීම සඳහා පූර්ව විශ්‍රාමික උපදේශන සේවාවන් ආරම්භ කිරීම
- ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සඳහා දිවා සුරැකුම් වැඩපිළිවෙළක් සහ රෝගී දුබල වූ වැඩිහිටියන්ට නේවාසික පහසුකම් සැලසිය හැකි ප්‍රජා මූලික ව්‍යාපෘති හඳුන්වා දීම

## මානව සම්පත් සංවර්ධනය

- වෛද්‍ය අධ්‍යාපනය රාජ්‍ය විශ්වවිද්‍යාල මගින් පවත්වාගෙන යාම
- සෞඛ්‍ය සේවාවේ හඳුනාගත් වෘත්තීන් පුහුණු කරන ආයතන උපාධි ප්‍රදානය කරන ආයතන බවට උසස් කොට එම සේවාවන්හි වෘත්තීය පිළිගැනීම සහතික කිරීම
- වෛද්‍ය, හෙද සභාවන්හි ස්වාධීනත්වය, බලතල සහ පහසුකම් පුළුල් කිරීම
- පශ්චාත් වෛද්‍ය සහ සෞඛ්‍යයට අදාළ අනෙකුත් තාක්ෂණික/උසස් අධ්‍යාපන ආයතනවල පාඨමාලා ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය සේවා සැපයීම සඳහා වඩාත් උචිත ලෙස සංවර්ධනය කිරීම
- හඳුනාගත් සේවාවන්ට විධිමත් පශ්චාත් අධ්‍යාපන අවස්ථා ඇති කිරීම
- සෞඛ්‍ය සේවයේ සියලු බඳවාගැනීම් සහ උසස්වීම් ඍජු හා විනිවිද පෙනෙන ලෙස පිළිගත් නිර්ණායකයන්ට අනුව සිදු කිරීම
- සෞඛ්‍ය සේවයේ වැටුප්, දීමනා, නිල නිවාස හිඟය, ප්‍රවාහන දුෂ්කරතා සුභසාධන දුර්වලතා ඇතුළු වෘත්තීය ගැටලුවලට සාධාරණ විසඳුම් ලබා දීම

# කලාව සහ සංස්කෘතිය

ප්‍රාදේශීය සහ ජාතික සංස්කෘතික උරුමය විචාරාත්මකව ආරක්ෂා කොට උකහා ගන්නා අතරම, ලෝකයේ කොතැනක වුවත් පහළ වන විශිෂ්ට සංස්කෘතික ජයග්‍රහණ විචාරාත්මකව ස්වසන්තක කරගැනීමේ බුද්ධිය සහ නිර්මාණශීලීත්වය සහිත වූද, තම සංස්කෘතික උරුමය පිළිබඳ ගෞරවයක් ඇති නමුත් අනෙක් මනුෂ්‍යයන්ගේ සංස්කෘතික අයිතිය ආරක්ෂා කිරීමේ සුබනම්‍යතාව ඇත්තා වූද, පොදු මනුෂ්‍ය ගැටලු ගැන අන්තවාදීද ප්‍රාදේශීයවාදීද නොවූ පෘථුල දෘෂ්ටියකින් වටහා ගැනීමේ විශිෂ්ටත්වය සහිත වූද, සංස්කෘතිය යනු මනුෂ්‍ය සමාජය බාහිර වශයෙන්ද මනුෂ්‍ය විඥානය අභ්‍යන්තර වශයෙන්ද වගා කිරීමේ මෙවලමක් බව දන්නා වූද පොදු මානව විමුක්තිය පිණිස සංස්කෘතිය අලුතින් නිර්මාණය කිරීම උදෙසා ආවේශය සහ නිර්මාණ ශක්තිය ඇත්තා වූද සංස්කෘතිකවත් පුරවැසියෙකු නිර්මාණය කිරීම මගින් චිරපවත්නා වූද ධරණීය වූද සංවර්ධනය මගින් සෑම මනුෂ්‍යයෙකුගේම අයිතීන් සහ අභිමානය සුරකින සාමකාමී සහජීවනය සහිත රටක් නිර්මාණය කිරීමට දායක වීම සංස්කෘතික ප්‍රතිපත්තියේ කේන්ද්‍රීය අරමුණ වේ.

## සංස්කෘතිය පිළිබඳ සංකල්පීය ප්‍රවේශය

සංවර්ධිත වූද සමෘද්ධිමත් වූද ප්‍රජාතන්ත්‍රවාදී වූද සමාජයක් ගොඩනැගීමේ කාර්යයේදී කලා සංස්කෘතික ක්ෂේත්‍රයට විශාල කාර්යභාරයක් පැවරේ. මූලික මනුෂ්‍ය අවශ්‍යතාවලින් සම්පූර්ණ වූ, සමානත්වයෙන් සහ සාධාරණයෙන් යුක්ත වූ සමාජයක් ගොඩනැගීමෙහිලා ආර්ථික වර්ධනයද, මූලික මනුෂ්‍ය අවශ්‍යතා ඉක්ම වූ කායික, බුද්ධිමය හා ඥානමය සංවර්ධනය උදෙසා අධ්‍යාපනය සහ සෞඛ්‍ය වැනි ක්ෂේත්‍රවල සිදුවන වර්ධනයද ඉතා වැදගත් වේ. මනුෂ්‍ය සමාජය සංවර්ධනයේදී හුදෙක් ආර්ථික මානය පමණක් නොසලකන සාකල්‍යවාදී සංවර්ධන ප්‍රවේශයකදී සංස්කෘතිය සහ සංස්කෘතිකවත්භාවය වර්ධනය කිරීමද අත්‍යවශ්‍ය වේ.

සංස්කෘතිය යනු මිනිසා ලෝකය තුළ පෙනී සිටීමේ විධියක් වන හෙයින් යම් ප්‍රජාවක අනන්‍යතාවේ 'මුහුණුවර' සංස්කෘතික ස්වභාවයක් ගනියි. ඒ නිසාම, රටක වසන සියලු ප්‍රජාවන්ගේ සංස්කෘතිය ආරක්ෂා කරගැනීම වෙනුවෙන් පෙනී සිටිය යුතුය. ගෝලීයකරණය වන ලෝකයක යම් අධිපති සංස්කෘතිවල ආක්‍රමණයෙන් යම් ප්‍රජාවන්ගේ සංස්කෘතික අනන්‍යතා අතුරුදහන් වීම වැළැක්වීම ලෝක පරිමාණවද, ජාතික වශයෙන්ද ප්‍රතිපත්තියෙහි කොටසකි.

එහෙත් සංස්කෘතිය යනු අනන්‍යතාව පමණක් නොවන අතර සංස්කෘතික අනන්‍යතාව යනුද ඉතා ගතික වූවකි. දේශීය වශයෙන්ද, ගෝලීය වශයෙන්ද සෑම ප්‍රජාවකගේම සංස්කෘතික අනන්‍යතා විකාශනය වෙමින් පවතින්නක් වන හෙයින් සෑම ප්‍රජාවකගේම සංස්කෘතික අනන්‍යතා සංරක්ෂණයේ අයිතියත් පරිණාමයේ අයිතියත් පිළිගනිමින් ඒ ඒ ප්‍රජා තුළින්ම පැනනගින සංවාදය ඔස්සේ එම සංරක්ෂණය සහ පරිණාමය පිළිබඳ තීරණ ගැනීමේ අයිතිය තහවුරු විය යුතුය.

“සංස්කෘතිකවත්භාවය” ගොඩනැගීම යනුද සංස්කෘතියෙහි එක් වැදගත් අංගයකි. එනම්, යම් ප්‍රජාවකට උරුම යැයි සැලකෙන සංස්කෘතියෙහි ඇති සීමා පිළිබඳ එම ප්‍රජාව සවිඥානක වන විට එම සීමාවලින් නිදහස සහ විමුක්තිය වෙත වර්ධනය වීමට ඇති අයිතිය පිළිගැනීම කළ යුතුය. එනම්, මානව නිදහස සහ සංස්කෘතිය අතර ගැටුම් පවතින විට වඩා නිදහස් සංස්කෘතියක් පරිකල්පනය කිරීමද සංස්කෘතියෙහිම කොටසක්ය යන අවබෝධය ප්‍රතිපත්තියෙහි කොටසක් විය යුතුය.

සංස්කෘතිය යන්නෙන් "වගා කිරීම," "ශික්ෂණය කිරීම" යන අර්ථ අදහස් වන අතර මනුෂ්‍යයාගේ බාහිර සමාජයද මනුෂ්‍ය අභ්‍යන්තරද වගා කළ යුතු බවත්, ශික්ෂණය කළ යුතු බවත් විශ්වාස කෙරෙයි. සංස්කෘතිකවත් මිනිසෙකු ගොඩනැගීමෙහිලා කලාවට කළ හැකි කාර්ය අපමණ හා අද්විතීය වේ.

දේශීය සේම විදේශීය සංස්කෘතික ඥානය අත්පත් කරගෙන ශිෂ්ට පුරවැසි ජීවිතයක් ගත කළ හැකි, දැනුම්වත්, සබුද්ධික, භාවමය ධාරිතාවෙන්, වින්දන ශක්තියෙන්ද සමබර මනසින්ද, සුහදශීලීත්වයෙන්ද යුතු ප්‍රතිපත්තිගරුක මිනිසෙකු ගොඩනැගීම කලාවේ කාර්යයයි. දේශීය සංස්කෘතිවලට අයත් ගැඹුරු සංකල්පවලින්ද සංස්කෘතිකවත්භාවය පිළිබඳ ජාත්‍යන්තර කතිකාවෙහි පැනෙන සංකල්පවලින්ද ජන සමාජය එළිය ලබයි.

"සංස්කෘතිය" යන සංකල්පය තුළ පවතින ආත්ම පරීක්ෂා මානයද ප්‍රජාවක සංස්කෘතියෙහි නිරන්තරයෙන් පැවතිය යුතුය. එනම් යුක්තිය, සාධාරණය, සහ සදාචාරසම්පන්නභාවය පිළිබඳ මූලික සම්ප්‍රදායන්ටවත් අදාළ පුරවැසියන් ගරු කරන්නේද යන්න ගැන නිරන්තර අවධානයකින් පසුවීමය. කලාව වූ කලී මෙකී ආත්ම පරීක්ෂාවේ මෙවලමකි.

සංස්කෘතිකවත් මිනිසා තුළ සංස්කෘතික අභිමානයක් පැවතිය යුතුය. තම සංස්කෘතිය පිළිබඳ විචාරාත්මක ගෞරවය සහ ලෝක මානව සංස්කෘතියෙහි උත්තමාංග අත්පත් කරගැනීමේ විවෘතභාවය යන දෙකින්ම සෑදී තිබීම අද දවසේ අත්‍යවශ්‍ය දෙයකි.

සංස්කෘතිය යනු අධිරාජ්‍යවාදී බලවේග විසින් තම බල ව්‍යාප්ති පිණිස භාවිත කරන අඩවියක්ය යන කාරණය ගැනද යටත්විජිතවාදය සහ සංස්කෘතිය අතර පැවති සම්බන්ධය ගැනද බෙහෙවින් සවිඥානකව ගෝලීය ධනවාදය විසින් ලාබ ඉපයීමේ තර්කනයට සංස්කෘතිය නම් අඩවිය යටත් කරන අවස්ථා කෙරෙහි විචාරාත්මක වූ පුරවැසියෙකු ගොඩනගන්නට කැපවිය යුතුය. එහෙත්, විදේශීය සංස්කෘතික ජයග්‍රහණ සියල්ලම අධිරාජ්‍යවාදයේ හෝ විදේශිකත්වයේ නාමයෙන් ප්‍රතික්ෂේප කිරීම ප්‍රතිපත්තිය නොවිය යුතුය. ලෝකයේ කවර තැනක පහළ වුවත් මනුෂ්‍යයාගේ සංස්කෘතික ජයග්‍රහණ අපගේද ජයග්‍රහණ වන්නේය.

එහෙයින්ම විදේශික සංස්කෘතික අංග "විදේශික" වන නිසාම ඒවා සැක නොකරන, ඒවා නිසා තර්ජනයට ලක් නොවන සුබනම්‍ය විඥානයෙන් යුතු පුරවැසියෙකු නිර්මාණය කිරීමට සහ එවැනි පුරවැසි සංස්කෘතියක් නිර්මාණය කිරීමට අපි කැපවෙමු. අපගේ ජාතික සංස්කෘතිවල එන විශිෂ්ටාංග ලෝකය සමග බෙදා ගැනීමේ ආවේශය සහ කුසලතාව ඇති පුරවැසි සංස්කෘතියක් ගොඩගැනීමටද අපි කැපවෙමු.

සංස්කෘතිය යන්න නොවෙනස් වූද ස්ථිතික වූද දෙයක් නොවන බෙහෙවින් ගතිකවත් වූද විකාශනීය වූද ගම්‍යතාවෙන් යුතු වූද දෙයක් සේ සලකා සංස්කෘතික පරිණාමය ආරක්ෂා කළ යුතුය. එහිලා රාජ්‍යයට යම් කාර්යයක් ඇති අතර සංස්කෘතික විකාශනය පිණිස නිදහස සහිත සමාජයක් පැවතිය යුතුය.

ජාතික රාජ්‍යය තුළ වසන සියලු මනුෂ්‍යයන්ගේ සංස්කෘතික අනන්‍යතාවලට සමාන පිළිගැනීමක් ලැබෙන, සංස්කෘතික බහුවිධතාවය අගය කරන සමාජයක් ගොඩනැගීම අවශ්‍ය වේ. එසේම ඒ ඒ ජනවාර්ගික කණ්ඩායම් අතර පමණක් නොව අභ්‍යන්තරයෙහිද සංස්කෘතික විවිධතාවට ඇති ඉඩ ආරක්ෂා කරන සංස්කෘතික සුබනම්‍යතාවක් පැවතිය යුතුය.

මෙකල සෑම ප්‍රජාවක් තුළම පැතිරෙමින් පවත්නා ආගමික අන්තවාදයට මුහුණ දීමේදී සංස්කෘතික සුබනම්‍යතාව අවශ්‍ය වන අතර සංස්කෘතික ප්‍රතිපත්තිය මෙම කාරණය කෙරෙහිද අවධානය යොමු කර ඇත. ඕනෑම ප්‍රජාවකගේ ආගමික අනන්‍යතාව පිළිගත්තද ජීවිතයේ සෑම අඩවියක් වෙතම

ආගමික අන්තවාදය පැතිරීම වැළැක්වීම සඳහා උචිත වන සංස්කෘතික වැඩපිළිවෙළක් ගොඩ නැගිය යුතුය.

එමෙන්ම, එක් ජන පිරිසකගේ සංස්කෘතික ජයග්‍රහණවලට තවත් ජන පිරිස් දායක වී තිබිය හැකි බව නියම සංස්කෘතිකවත් මිනිසාගේ අවබෝධයෙහි කොටසක් විය යුතුය. සිංහල ජනයාගේ සංස්කෘතික ජයග්‍රහණවලට සිංහල නොවන මනුෂ්‍යයන් දායක වී ඇත්තේ කෙසේද, දෙමළ ජනයාගේ සංස්කෘතික ජයග්‍රහණවලට දෙමළ නොවන ජනයා දායක වී ඇත්තේ කෙසේද, යනාදී වශයෙන් මනුෂ්‍ය සංස්කෘතිය නිර්මාණය කිරීමේ කතාව වඩා සාකල්‍යවාදී ලෙස අවබෝධ කරගැනීම වැදගත් වේ.

එසේම, ඒ ඒ සංස්කෘතියෙහි ඇති වටිනා ඥාන පද්ධති, ජීවන දෘෂ්ටි අභාවයට යා නොදී ඒවා ඇසුරෙන් වර්තමාන ඥානය පෝෂණය කරගත හැකිද යන්න පරීක්ෂා කිරීම අවශ්‍ය වේ.

සංස්කෘතිය නම් අඩවිය තුළ සංස්කෘතියෙහි නාමයෙන්ම පවතින විවිධ හිංසන, වෙනස් කොට සැලකීම් සහ කොන් කිරීම් වැනි අගතීන් වැළැක්වීම පිණිස නිරන්තර සංස්කෘතික විචාරය අවශ්‍ය වේ.

ජනරජයෙහිත් පොදු සමාජයේත් ස්ත්‍රීන් තමන්ගේ ලිංගික අනන්‍යතාව නිසාම හිංසනයට ලක්වන්නේද යන්න ගැන නිරන්තර සුපරීක්ෂාවෙන් පසුවීම සංස්කෘතිකවත්භාවයෙහි ලක්ෂණයක් යැයි සලකා අනෙකුත් ලිංගික අනන්‍යතා සහිත මනුෂ්‍යයන්ටද සම්පූර්ණ මනුෂ්‍යයන් සේ අභිමානයෙන් සැලකීම සංස්කෘතික ප්‍රතිපත්තියෙහි කොටසක් විය යුතුය.

"සංස්කෘතිය" යන්නෙන් හුදෙක් ආගමික චාරිත්‍ර විධි සහ ආගමික ඇදහිලි පමණක් සැලකීම වැරදි යැයි පිළිගනිමින් සංස්කෘතිය යන්නෙහි ඇති ගැඹුරු ලෞකික අර්ථය අවධාරණය කර විවිධ ලෞකික සංස්කෘතික අංග, සංස්කෘතික අවස්ථා, සංස්කෘතික ඇවතුම් පැවතුම් යනාදියෙහි පැවැත්මේ අයිතිය පිළිගනී.

එසේම, එක් සමාජ පන්තියක, කණ්ඩායමක හෝ ප්‍රදේශයක "සංස්කෘතිය" යැයි ගැනෙන දේ අනෙකුත් සංස්කෘතිවලට සාපේක්ෂව ආධිපත්‍යයට පත්වීම වැළැක්වීමද ප්‍රතිපත්තිය වේ. සංස්කෘතික කාරණා සම්බන්ධයෙන් ජනයා අතර අධිමානය හෝ හීනමානය පැවතීම අර්ථවත් ප්‍රජාතන්ත්‍රවාදී රටක නොපැවතිය යුතුය.

ඇතැම් සංස්කෘතික ප්‍රකාශන පමණක් "ප්‍රබුද්ධ" හෝ "විශිෂ්ට" යැයි සලකා අධිනිශ්චය කිරීමත් ඇතැම් කලාත්මක ප්‍රකාශන "අප්‍රබුද්ධ" යැයි සලකා අවතක්සේරු කිරීමත් ප්‍රවේශය නොවිය යුතුය. සියලු සංස්කෘතික ප්‍රකාශනවල සාපේක්ෂ අගය අවබෝධ කරගන්නා සුඛනම්‍ය විඥානය දියුණු මිනිස් සමාජයක පැවතිය යුතය.

ජනප්‍රිය සංස්කෘතිය යනුවෙන් හැඳින්වෙන අඩවිය තුළ ප්‍රකාශයට පත්වන මනුෂ්‍ය නිර්මාණ ශක්තියට ගරු කොට ඇතැම් නිර්-ප්‍රභූ කලා ප්‍රකාශන ජනප්‍රිය සංස්කෘතිය තුළ පවතින බවත්, ඒ නිර්-ප්‍රභූ ජනපිරිස්වල නිර්මාණ ශක්තිය සහ නිර්මාණක ශ්‍රමය වෙත නිසි ඇගයීම ලැබිය යුතුය. එසේම, "ජනප්‍රිය සංස්කෘතිය" සහ "වාණිජ සංස්කෘතිය" යන දෙක අතර ඇති වෙනස අවධාරණය කරගත යුතුය.

හුදෙක් ලාභ ඉපයීම පිණිස පවතින සංස්කෘතික නිෂ්පාදන විශිෂ්ට සංස්කෘතික නිෂ්පාදනවලින් වෙන් කොට හඳුනා ගත හැකි "සංස්කෘතික සාක්ෂරතාව" වර්ධනය කිරීම ප්‍රතිපත්තියෙහි කොටසකි.

එසේම වර්තමාන ජනමාධ්‍ය මගින් ඉතා සියුම් ලෙසද, ආක්‍රමණශීලී ලෙසද සුඛපරමවාදය සහ පුද්ගලවාදය කේන්ද්‍රකරගත් පරිභෝජනවාදයක් පතුරුවා පවත්වාගෙන යයි. එහෙයින් ශිෂ්ට

මනුෂ්‍ය හර පද්ධති වටා සාමූහිකත්වයේ සංස්කෘතියක් යළි ගොඩනැගීමට සංස්කෘතිය නම් අඩවිය භාවිත කළ යුතුය.

එසේම සංස්කෘතික ධනය හෙවත් සංස්කෘතික නිෂ්පාදිතය සාපේක්ෂ සාධාරණත්වයකින් බෙදී යා යුතු අතර විවිධ භාෂා, දැනුම් පද්ධති, කලාත්මක උරුමය ආදී දේ සමාජයක වසන සෑම දෙනාටම ප්‍රවේශ විය හැකි මට්ටමකින් පැවතිය යුතුය.

සංස්කෘතික සංවර්ධනය උදෙසා රාජ්‍යයට සුවිශාල වැඩකොටසක් පැවරෙන නමුදු සංස්කෘතිය නම් අඩවිය රාජ්‍යයෙන් සාපේක්ෂ වශයෙන් නිදහස් වීම අවශ්‍ය වේ. සංස්කෘතිය යනු රාජ්‍යයෙහි දේශපාලන හෝ දෘෂ්ටිවාදී ආධිපත්‍යයට යටත් වූවක් නොවන අතර කලාවෙහි වර්ධනය උදෙසාද එම නිදහස අත්‍යවශ්‍ය බව අවධාරණය කළ යුතුය.

සාරවත් මනුෂ්‍ය ජීවිතය පිණිස අර්ථවත් සංස්කෘතික ජීවිතයක්ද තිබිය යුතු යැයි විශ්වාස කරන අතර මනුෂ්‍යයන්ගේ භාවමය, බුද්ධිමය සහ රස වින්දනමය ධාරිතාව වර්ධනය කිරීමෙහි වැදගත්කම අවධාරණය කරමු. මනුෂ්‍යයන් තම තම වෘත්තීන්වල ශ්‍රමය වගුරමින් කරන ආර්ථික කාර්ය වෙත නිසි වටිනාකම දෙමින් නිසි අයුරින් සංවර්ධනය වූ රටක මනුෂ්‍යයාට අර්ථවත් විවේකයක්ද තිබිය යුතු යැයි විශ්වාස කරමු.

රටෙහි මූලික නීති පද්ධතියට ගරු කිරීම, ඒවා විචාරාත්මකව පරීක්ෂා කොට සංශෝධනය, ව්‍යවස්ථාමය සදාචාරය යනාදියෙන් සැදි ප්‍රතිපත්තිගරුකභාවය සංස්කෘතික මිනිසාගේ ලක්ෂණයක් බව පිළිගනිමින් ඒ සංස්කෘතික විඥානය වර්ධනය කරන්නට ප්‍රයත්න දරමු.

එහෙයින්ම, සංස්කෘතිකවත් පුරවැසියෙකු නිර්මාණය කිරීම යනු දේශපාලන අරගලයක් යන්න අවධාරණය විය යුතු අතර ඒ ගැන බෙහෙවින්ම සවිඥානක වී වෙනුවෙන් කැප වී කටයුතු කළ යුතුය.

## පොදු ක්‍රියාමාර්ග

- අධ්‍යාපන ක්ෂේත්‍රය යනු සංස්කෘතික පුරවැසියා ගොඩගැනීම සඳහා පදනම දැමීමේ මූලික අවස්ථාව සේ පිළිගනිමින් පාසැල්, ගුරු විද්‍යාල සහ විශ්වවිද්‍යාල ඇසුරු කරගෙන සංස්කෘතිකවත්භාවය වර්ධනය කිරීමෙහිලා වැඩසටහන් මාලාවක් දියත් කිරීම සහ ඒවා සක්‍රීයව පවත්වා ගැනීම
- ෆේස්බුක් වැනි සමාජ මාධ්‍ය ජාලා භාවිත කර පොත පත කියවීම, කලා රසවින්දනය පිළිබඳ මහජන අවකාශයෙහි කතිකාව තීව්‍ර කරමින් විසි එක්වැනි සියවසෙහි සංස්කෘතිකවත් පුරවැසියා නිර්මාණය කිරීම සඳහා කටයුතු කිරීම
- යෞවන ලාංකිකයා වෙත සමීප වන උපක්‍රම පරිකල්පනය කර පාසල් පද්ධතිය සමග කළ හැකි ක්‍රියාකාරකම් සැලසුම් කරමින් ක්ෂණික පරිභෝජනීය ප්‍රීතිය ජීවන පරමාදර්ශය බවට පත් කරගනිමින් සිටින බව පෙනෙන යෞවන ජනයා නව සංස්කෘතික පුරවැසියෙකු බවට පරිවර්තනය සඳහා පියවර ගැනීම
- නිල අධ්‍යාපන පද්ධතිය තුළ කලා-සංස්කෘතික විෂයයන් ඉගැන්වීම ආකර්ෂණීය වූද බුද්ධි ප්‍රබෝධනයට තුඩු දෙන්නා වූද ආකාරයට ඉගැන්වීම පිළිබඳ ක්‍රමවත් පුහුණුවක් ගුරුවරුන්ට ලබා දීම උදෙසා වැඩමුළු සහ සම්මන්ත්‍රණ මාලා පවත්වාගෙන යාමට ආයතන ආරම්භ කිරීම

- සංස්කෘතිය ලෞකික අඩවියක්ද වන බව පෙන්වා දෙන අධ්‍යාපන ප්‍රතිපත්තියක් පෙර පාසල්වල භාවිතයට නගන සේ විෂය නිර්දේශ ප්‍රසාරණය කිරීම
- සෞන්දර්ය විෂය ආශ්‍රිත අවිධිමත් අධ්‍යාපන අවස්ථා ඇති කිරීම මගින් පාසැල් ගුරුවරුන් වැනි අයට දැනුම් අවස්ථා බිහි කිරීම
- කලා-සංස්කෘතික ක්ෂේත්‍රයෙහි රාජ්‍ය ආයතන ගන්නා තීරණ, ඒ ආයතනවල ප්‍රතිපත්තිමය එළඹුම් ගැටලුකාරී බවට අදහස් පළවන අවස්ථාවල වහාම විකල්ප යෝජනා ඉදිරිපත් කොට ඒ ආශ්‍රිත කතිකා ඇති කිරීම
- කලා මණ්ඩලය, එහි අනු මණ්ඩල, චිත්‍රපට සංස්ථාව, ටවර් හෝල් රඟහල පදනම ඇතුළු සංස්කෘතික කටයුතු හෝ ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍යාංශයන් යටතේ පවතින තදානුබද්ධ ආයතන ඵලදායී ලෙස පවත්වාගෙන යාම  පිළිබඳ අවසන් තීන්දුවක් ගනු ලබන තෙක් ඒවා සොයා බැලීම සඳහා අධීක්ෂණ මණ්ඩලයක් පත්කිරීම
- විවිධ පළාත්වල ඉදිරිපත් කළ හැකි කලා-සංස්කෘතික වැඩසටහනක් වහාම ගොඩනගා එය ගමින් ගම ගෙන යෑමට යාන්ත්‍රණයක් ඇති කිරීම
- සෑම ප්‍රධාන නගරයකම කලා-සංස්කෘතික කටයුතු උදෙසා ආයතන පිහිටි කලාපයක් ගොඩනගා එම කලාපය වෙත පුරවැසියන් නිරන්තරයෙන් ආකර්ෂණය කරගැනීම
- සෑම නගරයකම ජාතික භාෂා සහ ජාත්‍යන්තර භාෂා ඉගෙනීමේ අවස්ථා ඇති කිරීම අවශ්‍ය බැවින් ඒ සඳහා "රාත්‍රී භාෂා පාසැල්" පද්ධතියක් ඇති කිරීමෙන් වැඩිහිටි ප්‍රජාවටද භාෂා ඉගෙනීමේ අවස්ථා ඇති කිරීම
- ආකර්ෂණය දිනා ගැනීම අරමුණින් සියලු කලා ක්ෂේත්‍ර අළලා ජාතික විද්වත් සම්මාන උත්සවයක් සංවිධානය කිරීම
- සියලු ලලිත කලාවලට අවශ්‍ය උපකරණ ආදිය වෙත පනවන බදු අවම කරමින් රාජ්‍යයේ ආධාර ඒ කලා ක්ෂේත්‍ර වෙත ලබාදීම
- සියලු කලා ක්ෂේත්‍රවල ප්‍රවීණයන් සහ විශ්‍රාමිකයන්ගේ සුබසාධනය පිණිස වැඩපිළිවෙළක් සංවිධානය කිරීම
- සියලු කලා ක්ෂේත්‍ර අළලා ත්‍රෛභාෂික ශාස්ත්‍රීය ප්‍රකාශන පළ කිරීම සඳහා පහසුකම් සැපයීම
- රජයේ ලියාපදිංචි කලායතන ජාලය ගොඩනැගීම සඳහා විශේෂ මෙහෙයුම් කාර්යාලයක් ගොඩනැගීම හා වාර්ෂික ආධාර ලබාදීම

## ඒ ඒ කලා ක්ෂේත්‍රවල වර්ධනයට ගන්නා පියවර

### සාහිත්‍ය ක්ෂේත්‍රය

- සාහිත්‍යයෙහි වර්ධනයට අවශ්‍ය ද්‍රව්‍යමය පහසුකම් සපයාදීම කඩදාසි සහ අනෙකුත් මුද්‍රණ අමුද්‍රව්‍ය සඳහා සාහිත්‍ය ග්‍රන්ථ නිෂ්පාදනයෙහිදී බදුවලින් නිදහස් කිරීම
- වාර්ෂිකව පළ වන සාහිත්‍ය කෘතිවලින් කලාත්මක වශයෙන් උසස් කෘති මිල දී ගෙන පාසල් පුස්තකාල සහ මහජන පුස්තකාල වෙත බෙදා හැරීමට දායක වීම
- සෑම නගරයකම හෝ උප නගරයකම පාහේ දියුණු පුස්තකාල ඇති කොට සක්‍රීය පාඨක සමාජ පිහිටුවීම
- සෑම නගරයකම වාර්ෂික හෝ අර්ධ වාර්ෂික සාහිත්‍ය දින සංවිධානය කොට ඒ අවට සාහිත්‍ය කලා රසිකයන්ගේ සාහිත්‍ය කලා රසිකත්වය වර්ධනය කිරීම
- දරුවන් ඉලක්ක කරගත සාහිත්‍ය රුචි අභිවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
- සාහිත්‍ය විචාරය සහ රස වින්දනය සඳහාම වෙන් වූ සඟරා සංස්කෘතියක් යළි ඇති කිරීම
- පාසැල් ගුරුවරුන් සහ ශිෂ්‍යයන් ඉලක්ක කරගත් සාහිත්‍ය රසවින්දන වැඩසහටහන් සංවිධානය මගින් අලුත් රසික පිරිසක් ගොඩනැගීම
- ළමා මනස සත්‍ය හඳුනාගන්නට විවෘත කරන්නා වූද මිත්‍යාවේ ග්‍රහණයට හසු නොවන්නට තුඩු දෙන්නා වූද විශ්ව සාහිත්‍ය කෘති තෝරා සිංහල සහ දෙමළ භාෂාවලට පෙරළීම
- සාහිත්‍ය ගුරුකුලවලට සහ මතවාදවලට ඵලදායක ලෙස ගැටෙන්නට අවශ්‍ය අවකාශය නිර්මාණය කිරීම
- ලෝක පරිමාණයෙන් පළ වෙන විශිෂ්ට සාහිත්‍ය කෘති සිංහල සහ දෙමළ භාෂාවලට නැගීමේ වැඩසටහන් ඇති කිරීම සහ එවන් පරිවර්තනවල යෙදෙන අයට දිරි දීම
- දිස්ත්‍රික් සහ ජාතික ලේඛක නාමාවලියක් විධිමත්ව පවත්වා ගනිමින් ඔවුන්ගේ සහභාගිත්වය ඇති සාහිත්‍ය කලා සංවාද ආදිය ඇති කිරීම

### නාට්‍ය ක්ෂේත්‍රය

- නාට්‍ය නිෂ්පාදනය සහ ප්‍රදර්ශනය සඳහා මූල්‍යාධාර ලබාදීම
- සෑම ප්‍රධාන නගරයකම නාට්‍ය රංග ශාලා ඇති කිරීම සහ පවතින රංග ශාලාවලට යන වියදම ආවරණය කරගැනීමට සහන සැපයීම; ආරම්භයක් වශයෙන් දිස්ත්‍රික් රංග ශාලා පද්ධතියක් ඇති කිරීම
- පහසු මිලකට ලබා ගත හැකි ආකාරයෙන් ප්‍රධාන නගරවල හා වැඩි වශයෙන් නාට්‍ය නිෂ්පාදනය වන අගනුවර තුළ නාට්‍ය පුහුණුවීමේ ස්ථාන ඇති කිරීම
- කාලීන ලෝක නාට්‍ය පරිවර්තනය සහ නිෂ්පාදනයට දිරි දීම
- නාට්‍ය කලා රසිකත්වය වර්ධනය කිරීමේ වැඩසටහන් සෑම නගරයකම ඇති කිරීම
- නාට්‍ය නිෂ්පාදනය සහ ප්‍රදර්ශනය ආශ්‍රිත බදු අඩු කිරීම

- සමකාලීන නාට්‍ය කලාව පිළිබඳ ජාතික පර්යේෂණ හා පුහුණු ආයතනයක් ස්ථාපිත කිරීම
- ශ්‍රී ලංකාව පුරා විසිර ඇති සංස්කෘතික මධ්‍යස්ථාන ජාලය ප්‍රතිව්‍යුහගත කිරීම
- ජාත්‍යන්තර සංස්කෘතික සම්බන්ධතා වැඩි දියුණු කිරීම ඉලක්ක කරගත් විදේශ සංචාර හා පුහුණුවීම් සඳහා වැඩි අවස්ථා නිර්මාණය කිරීම

## සිනමාව සහ ටෙලි නාට්‍ය

- සෑම සිනමා කෘතියක්ම බෙදා හැරීමේදී ප්‍රසිද්ධ රැඟුම් පාලක මණ්ඩල සහතිකයෙහි සඳහන් වන දිනය ප්‍රමුඛතාව ලෙස සැලකීම
- සිනමා ශාලා තාක්ෂණය සහ සුවපහසුව අතින් වැඩි දියුණු කිරීමට ප්‍රතිපාදන සැලසීම සහ සංවර්ධනය
- වාර්ෂික අන්තර්ජාතික සිනමා උළෙලක් පැවැත්වීම
- විශිෂ්ට සිනමා කෘති ප්‍රදර්ශනය කිරීමේ මධ්‍යස්ථාන ග්‍රාමීය මට්ටමෙන් ඇති කොට ඒ ඇසුරින් නිරන්තර සිනමා කලා සංවාද ඇති කිරීම
- ආධුනික සිනමාකරුවන් වෙනුවෙන් ජාතික සිනමා අධ්‍යයන ආයතනයක් ස්ථාපිත කිරීම
- ටෙලි නාට්‍ය ක්ෂේත්‍රය ප්‍රමිතිගත කිරීමට ආයතන ස්ථාපිත කිරීම සඳහා කලාකරුවන් පිරිසක් විසින් දැනටමත් සකසනු ලැබ ඇති ටෙලි නාට්‍ය ප්‍රමිතිකරණ හා සංවර්ධන ආයතනය පිළිබඳ පනත බලගැන්වීම පිළිබඳව සාකච්ඡා ආරම්භ කිරීම

## නැටුම්

- සාම්ප්‍රදායික නර්තනය සුරැකීම හා ප්‍රවර්ධනය මූලික කරගත් ආයතනයක් ස්ථාපිත කිරීම
- ලාංකේය ජන නර්තන පර්යේෂණ ප්‍රවර්ධනය කිරීම
- සංස්කෘතික අනන්‍යතාවක් සහිත නර්තන සම්ප්‍රදායන් ප්‍රවර්ධනය කිරීම
- විෂයමාලා සංවර්ධනය කරන අවස්ථාවලදී නර්තන අධ්‍යාපන සම්බන්ධ ආයතන හා ප්‍රවීණයන් සම්බන්ධ කරගැනීමේ යාන්ත්‍රණයක් නිර්මාණය කිරීම
- නව නර්තන ප්‍රවණතා පිළිබඳව අධ්‍යයන හා සංරක්ෂණ ඒකකයක් පිහිටුවීම
- නර්තනය පිළිබඳ ජාත්‍යන්තර අධ්‍යයන අවකාශ සලසා දීම

## චිත්‍ර කලාව සහ ඡායාරූප කලාව

- චිත්‍ර සහ දෘශ්‍ය කලාවේ නූතන ප්‍රවණතා අධ්‍යයනය කිරීම සදහා ආයතනයක් ස්ථාපිත කිරීම
- විවිධ ක්ෂේත්‍ර තුළ ප්‍රචලිත දෘශ්‍ය කලා ක්ෂේත්‍ර හඳුනා ගැනීම හා ප්‍රවර්ධනය කිරීම
- පළාත්බද කලාගාර ස්ථාපිත කිරීම හා නිර්මාණ ප්‍රදර්ශනය සඳහා සහන මිලකට කලාගාර ලබාදීම

- ජාත්‍යන්තර සම්මන්ත්‍රණ හා ප්‍රදර්ශන සඳහා නිර්මාණකරුවන් යොමු කොට ආධාර සැපයීම
- දෘශ්‍ය කලා නිර්මාණ අලෙවිය සඳහා ජාතික හා ජාත්‍යන්තර නිර්මාණ වෙළඳපොළ වර්ධනය
- සංස්කෘතික මධ්‍යස්ථාන ජාලය විධිමත්ව ක්‍රියාත්මක කිරීම
- සමකාලීන නිර්මාණකරුවන්ගේ පර්යේෂණ සඳහා නූතන කලාගාරයක් නිර්මාණය කිරීම

**සංගීතය**

- සංගීත සම්ප්‍රදායන් සුරැකීම හා ප්‍රවර්ධනය සඳහා ජාතික ගුවන් විදුලි සංස්ථාව මූලික වූ ආයතනයක් ස්ථාපිත කිරීම
- ලාංකේය ජන සංගීත පර්යේෂණ ප්‍රවර්ධනය කිරීම
- විෂයමාලා සංවර්ධනය කරන අවස්ථාවලදී සංගීත අධ්‍යාපන සම්බන්ධ ආයතන හා ප්‍රවීණයන් සම්බන්ධ කරගැනීමේ යාන්ත්‍රණයක් ඇති කිරීම
- නව සංගීත ප්‍රවණතා පිළිබඳව අධ්‍යයන හා සංරක්ෂණ ඒකකයක් පිහිටු වීම
- ගීත හා සංගීතය පිළිබඳ බුද්ධිමය දේපළ නීති රීති සංවර්ධනය කිරීම
- ජාත්‍යන්තර අධ්‍යයන සඳහා අවකාශ සලසා දීම
- රාජ්‍ය සංගීත කණ්ඩායම සංගීත ක්ෂේත්‍රයේ නව පර්යේෂණාත්මක නිර්මාණ සඳහා යොමු කිරීම

# ප්‍රජාව සඳහා ක්‍රීඩාව

වර්තමානයේ ක්‍රීඩාව රැකියාවක් සදහා සුදුසුකමක් ලෙස පමණක් සැලකෙන අතර නිරෝගී පුරවැසියෙක් බිහිකිරීම සදහා ක්‍රීඩාවේ දායකත්වය නොසලකා හරිනු ලැබ තිබේ. මේ නිසාම රට තුළ ක්‍රීඩා සංස්කෘතියක් බිහිවීමට අවශ්‍ය පරිසරය නිර්මාණය වී නැත. ශාරීරික අධ්‍යාපනය වත්මන් අධ්‍යාපනයේ කොටසක් බවට පත්කර නොමැති අතර බිම් මට්ටමේදී හඳුනා ගන්නා අංකුර ක්‍රීඩකයින් ජාතික තලය දක්වා ගෙන ඒම සදහා අවශ්‍ය කරන සැලසුම් සහගත වැඩපිළිවෙළක්ද නොමැත. පවත්නා අසංවිධානාත්මක ක්‍රමය මගින් සමහර ක්‍රීඩා ක්ෂේත්‍ර හා ක්‍රීඩකයින් පෞද්ගලික හිමිකරුවන්ගේ ග්‍රහණයට නතුකරනු ලැබ ඇත. සම්පත් නාගරිකව සංකේන්ද්‍රණය වී ඇති අතර ග්‍රාමීය ක්‍රීඩක ක්‍රීඩිකාවන් නොසලකා හරිනු ලැබීම හේතුවෙන් බොහොමයක් දක්ෂ ක්‍රීඩා හැකියාවන් ඇති ක්‍රීඩක ක්‍රීඩිකාවෝ බිම් මට්ටමට පමණක් සීමාවී සිටිති. ක්‍රීඩා ක්ෂේත්‍රයේ අකාර්යක්ෂම කළමනාකරණය සහ දේශපාලන මැදිහත්වීම් ක්‍රීඩාවේ සංවර්ධනයට ප්‍රබල බාධාවන් පමුණුවා ඇත. මෙම ක්‍රියාවලියේ ප්‍රතිඵල ලෙස ක්‍රීඩාව ඉතා සුළු පිරිසක් අතර කේන්ද්‍රගතව එම ක්ෂේත්‍ර තුළම කඩාවැටෙමින් පවතී.

### අරමුණු

නිරෝගිමත්, විනයගරුක හා බුද්ධිමත් ජන සමාජයක් බිහිකර ගැනීමේ ක්‍රියාවලියේදී ක්‍රීඩාව සමස්ත ප්‍රජාව සඳහාම විය යුතුය. ක්‍රීඩාව හා ශාරීරික යෝග්‍යතාවය පොදු සමාජ ව්‍යුහය තුළ අත්‍යවශ්‍ය අංගයක් බවට පත්කර අපට අහිමි වී ඇති ක්‍රීඩා උරුමය රට තුළ රෝපණය කිරීම මෙම ක්‍රීඩා ප්‍රතිපත්තියේ ප්‍රධාන අරමුණයි.

- නිරෝගිමත් පරපුරක් බිහිකිරීම උදෙසා ක්‍රීඩා සංස්කෘතියක් ස්ථාපිත කිරීම
- පාසලේ සිට ජාත්‍යන්තරය දක්වා දිවෙන සැලසුම් සහගත සංයුක්ත ක්‍රීඩා වැඩපිළිවෙළක් නිර්මාණය කිරීම
- ශාරීරික අධ්‍යාපනය හා ක්‍රීඩාව තුළින් සමාජීය වටිනාකම් සහිත මිනිසුන් ගොඩනැගීම
- මානව සම්පත් සංවර්ධනය හා කළමනාකරණය තුළින් වෘත්තීය නිපුණතාවයෙන් යුතු ක්‍රීඩක ක්‍රීඩිකාවන් බිහිකිරීම
- ක්‍රීඩා ක්ෂේත්‍රයද ආර්ථිකයේ සැලකිය යුතු පංගුකරුවෙකු ලෙස දායක කර ගැනීම
- ජාත්‍යන්තර සබඳතාවයන් ගොඩනගා ගැනීමේදී ක්‍රීඩාව සක්‍රීය ලෙස උපයෝගී කරගැනීම

## විසඳුම් ක්‍රියාමාර්ග

- විද්‍යාත්මකව පුහුණු කරන ලද පුහුණුකරුවන් හා ශාරීරික අධ්‍යාපන ගුරුවරුන් සියලුම පාසල්වලට අනුයුක්ත කිරීම
- ක්‍රීඩා යටිතල පහසුකම් සංවර්ධනය කඩිනම් කරමින් පළාත් ක්‍රීඩා සංකීර්ණ, දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ක්‍රීඩාංගණ සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම
- දිවයිනේ සියලුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස ආවරණය වන පරිදි ශාරීරික ප්‍රජා සුවතා මධ්‍යස්ථාන 1000ක් ස්ථාපනය කිරීම

- ප්‍රජාවගේ සෞඛ්‍ය සම්පන්න බව තහවුරු කරන සහතිකයක් වාර්ෂිකව ලබාදීම හා එම යෝග්‍යතා සහතිකයට විශ්වවිද්‍යාලවලට ඇතුළත් කර ගැනීමේදී, රැකියාවක් ලබාගැනීමේදී, උසස්වීම් ලබා ගැනීමේදී හා රක්‍ෂණාවරණයක් ලබා ගැනීමේදී ප්‍රතිලාභ හිමි කර දීම
- ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ ක්‍රීඩා කටයුතු සංවර්ධනයට හා ක්‍රීඩාවේ සංවර්ධනයට අවශ්‍ය පහසුකම් සපුරාලීමට රජයේ දායකත්වය හා විවිධ පාර්ශවයන්ට ආධාර කළ හැකි ක්‍රීඩා සංවර්ධන අරමුදලක් පිහිටුවීම
- ජාතික පුහුණු සංචිතයන්හි සිටින ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ සුදුසුකම් අනුව අධ්‍යාපන හා උසස් අධ්‍යාපන හෝ වෘත්තීය පුහුණු පාඨමාලා සඳහා යොමු කිරීමට අවශ්‍ය වැඩපිළිවෙළක් ආරම්භ කිරීම
- ජාතික කණ්ඩායම් නියෝජනය කළ හා නියෝජනය කරන සියලු ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට විශ්‍රාම වැටුපක් ලබාදීම සහ රක්‍ෂණ ක්‍රමයක් හඳුන්වාදීම
- ජාතික ක්‍රීඩාවන්ගෙන් ජයග්‍රහණ හිමිකරගන්නා ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ උසස් අධ්‍යාපන අවස්ථා සඳහා පහසුකම් සැපයීම
- ක්‍රිකට් ක්‍රීඩාවේ ප්‍රාදේශීය ක්‍රීඩකයින්ට අවශ්‍ය පහසුකම් දියුණු කිරීම සඳහා පළාත් ක්‍රිකට් ක්‍රීඩාංගණ 09ක් ජාත්‍යන්තර මට්ටම දක්වා දියුණු කිරීම
- සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකම ප්‍රජාවට පොදුවේ පරිහරණය කිරීම සඳහා පහසුකම් සහිත ක්‍රීඩාංගණ 10 බැගින් ඉදිකිරීම
- සෑම ක්‍රීඩාවක් සඳහාම රාජ්‍ය මැදිහත්වීමෙන් පහසුකම් සහිත ක්‍රීඩා සංකීර්ණ ඉදිකිරීම සහ ඒවා පවත්වාගෙන යාම අදාළ ජාතික සංගම්වලට පැවරීම
- ජාතික ක්‍රීඩා පුහුණු පාසලක් කේන්ද්‍ර කොටගනිමින් පළාත් 09 සඳහාම ක්‍රීඩා පාසල් ජාලයක් ඇති කිරීම
- ජාතික ක්‍රීඩා සම්මේලනය/සංගම් සඳහා ක්‍රීඩා සංවර්ධනයට මුදල් ලබාදීම සහ ජාතික හා ජාත්‍යන්තරව ලැබෙන පරිත්‍යාග හා ආධාර අදාළ ක්‍රීඩාවේ සංවර්ධනය සඳහා යෙදවීම
- ක්‍රීඩාවේ හා ශාරීරික අධ්‍යාපනයේ අවශ්‍යතාවයන් සඳහා දායකත්වයන් හා ආයෝජනයන් සිදුකරනු ලබන පාර්ශවයන්ට බදු සහන ලබාදීම
- ජාත්‍යන්තර ක්‍රීඩා සම්මේලන විසින් පවත්වාගෙන යනු ලබන විශේෂඥ ක්‍රීඩා පුහුණු මධ්‍යස්ථානවල පුහුණුව ලැබීමට සුදුසුකම් ලබන ක්‍රීඩක ක්‍රීඩිකාවන් සඳහා ශිෂ්‍යත්ව වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කිරීම
- ක්‍රීඩා පුහුණුකරුවන්ට හා තාක්ෂණික නිලධාරීන්ට යාවත්කාලීන දැනුම හා පුහුණුව ලබාදීම
- සෑම ක්‍රීඩාවක් සඳහාම ජාතික පුහුණු සංචිත ආරම්භ කර අඛණ්ඩව පුහුණු කටයුතු පවත්වාගෙන යාම
- ක්‍රීඩා ක්ෂේත්‍රයේ විද්‍යාත්මක පර්යේෂණ සඳහා පර්යේෂණ ආයතනයක් පිහිටුවා පවත්වාගෙන යාම
- ක්‍රීඩා ආචාරධර්ම පද්ධතියක් හඳුන්වාදීම හා ක්‍රීඩා නීති යාවත්කාලීන කිරීමට මැදිහත් වීම
- ජන ක්‍රීඩා හා සංස්කෘතික ක්‍රීඩා සංවර්ධනය හා සංරක්ෂණය

- ක්‍රීඩා සංවර්ධනය සඳහා සම්බන්ධ ආයතන හා පාර්ශවකරුවන් විසින් ගනු ලබන මෙහෙයුම් ක්‍රියාවලිය හා සම්බන්ධ ක්‍රියාමාර්ගවලට අදාළ ආයතන හා ප්‍රතිපත්තිමය තීරණ පිළිබඳ සමාලෝචනය, විමර්ශනය හා පසුවිපරම් සිදුකර අවශ්‍ය සංශෝධනයන් කරමින් නිරතුරුවම යාවත්කාලීනව පවත්වාගෙන යාම

# නිවාස

ශ්‍රී ලාංකේය ප්‍රජාවගේ සමාජ ආර්ථික පසුබිම නිරූපනය කෙරෙන දර්ශකයක් බවට නිවාස පත්වී තිබේ. එහෙත් වර්තමානයේ ලංකාවේ ජීවත් වන පවුල් 6,094,115 ක් අතරින් කුමන මට්ටමක හෝ නිවාස ඇත්තේ පවුල් 5,277,408කට පමණි. ඒ අනුව තමන්ගේම වාසස්ථානයක් අහිමි පවුල් අට ලක්ෂයකට වැඩි ප්‍රමාණයක් ජීවත් වෙති. රටේ පවුල් ඒකකවලින් ලක්‍ෂ තුනකට ආසන්න ප්‍රමාණයක් ජීවත් වන්නේ, තාවකාලික නිවාසවලය. එම තාවකාලික නිවාසවලින් 30% කොළඹ නගරයේ පිහිටා තිබේ.

සමස්ත නිවාසවලින් 1% ක් පොල් අතු සෙවිලි කළ නිවාස වන අතර තහඩු සෙවිලි කළ නිවාස ප්‍රමාණය 8% කි. මෙයින් වැඩිම ප්‍රමාණය ඇත්තේ නුවරඑළිය දිස්ත්‍රික්කයේය.

## ක්‍රියාමාර්ග

- නිවාස නොමැති සියලු පවුල් ඒකක සඳහා ජලය, විදුලිය, සනීපාරක්ෂක පහසුකම් ඇතුළු වාසය සඳහා වඩාත් හිතකර නිවාස ලබාදීමේ දීපව්‍යාප්ත වැඩපිළිවෙළක් ක්‍රියාවට නැංවීම
- අඩු ආදායම්ලාභී දුප්පත් ජනතාවට නොමිලේ පහසුකම් සහිත නිවෙස් ඒකක ලබාදීම
- මධ්‍යම සහ පහළ වැටුප් ලබන රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ රැකියා නියුක්තිකයන්ට වටිනාකමින් 50% ක මුදලකට නිවාස සැපයීමේ වැඩසටහන් ක්‍රියාවට නංවනු ලැබේ
- රාජ්‍ය නිලධාරීන් සඳහා නිල නිවාස ලබාදීමේ වැඩසටහනක්ද ඒ යටතේ අදාළ නිල නිවාස, මහල් නිවාස, වැඩසටහන් යටතේ සේවා ස්ථාන සමීපව ඉදිකිරීම
- විදේශ සේවා නියුක්තිකයන් වෙනුවෙන්ද නිවාස ව්‍යාපෘති ක්‍රියාත්මක කරනු ලබන අතර රජයේ වගකීමක් ලෙස ඔවුන්ට සහනදායී මිල ගණන් යටතේ නිවාස සැපයීම හා එම නිවාස සඳහා ඔවුන් සේවයේ නියුතු රටවල මුදල් ඒකක මගින් වාරික ගෙවීමේ ක්‍රමවේදයක් හඳුන්වා දීම
- නාගරික සහ අර්ධ නාගරික ප්‍රදේශවල සියලු රාජ්‍ය නිවාස ව්‍යාපෘති මහල් නිවාස ක්‍රමයට සිදු කිරීම
- දැනට දේශපාලනීකරණය කොට ඇති නිවාස වැඩපිළිවෙළ, නිවාස නොමැති ජනතාවට නිශ්චිත කාල වකවානුවක් තුළ නිවාස සැපයෙන වැඩපිළිවෙළක් බවට පත් කිරීම
- නිවාස ව්‍යාපෘති ආශ්‍රිතව, නිවැසියන්ට හා ළමුන්ට අධ්‍යාපනය, ආරක්ෂාව, ජලය හා සෞඛ්‍ය පහසුකම් මෙන්ම විනෝදාස්වාද පහසුකම් ඇති කිරීම
- වසර 05ක කාලයක් ඇතුළත සියලු මුඩුක්කු, පැල්පත්, ලයින්කාමරවල ජීවත්වන ජනතාව වෙනුවෙන් නිවාස සැපයීම සහතික කිරීම

# පවිත්‍ර ශ්‍රී ලංකාවක්

සදාහරිත බව, සිසිල, සෞන්දර්ය පිරි ශාක හා සත්ව විවිධත්වයක් සහිත මෙම රාජ්‍යය පවිත්‍ර ආහාර, ග්‍රාමීය හා නාගරික අලංකරණය, අවකාශය සංවිධානය කිරීම ආදි අඩවි සියල්ලම මනා පවිත්‍ර හා ප්‍රශස්ත දර්ශකයක තබා නඩත්තු කිරීම අපගේ වගකීම වේ. පුරවැසියාට දිවිගෙවීමට ඇති මෙම අවකාශීය මහපොළව හා ශාක ජීවිත සුරැකීම තුළ ගෝලීය උණුසුම පිළිබඳ ගැටලුව අවම කරගත් සුන්දර වටපිටාවක් අපට ශේෂ වනු ඇත.

# පරිසරය

පිරිසිදු භූමියක, නිල්වන් ජල පද්ධතියක්, සුපවිත්‍ර වායුගෝලයක්, සුරක්ෂිත වූද පිරිසිදු වූද ආහාරපානවලින් සමන්විත පවිත්‍ර වාසස්ථානයක් හා සේවා ස්ථානයක් නිර්මාණය කිරීමටත්, පිවිතුරු සුන්දර පරිසරයක් නිර්මාණය කිරීමටත් පවතින අභියෝගය හඳුනා ගනිමු.

පවිත්‍ර ශ්‍රී ලංකාවක් ගොඩනැඟීමට වටිනාම ප්‍රාග්ධනයක් ලෙස අප හඳුනාගත යුතු, වර්ග කිලෝමීටර් 65,610කින් සමන්විත විවිධ භූ විෂමතා සහිත ගොඩබිමක්ද, එමෙන් හත් ගුණයක් ඉක්ම වූ සම්පත්වලින් අනූන සාගර කලාපයක්ද, ගොඩබිම හා සාගරය ඇතුළත විවිධාකාර වූ පාරිසරික පද්ධතිවලින් අන්තර් සම්බන්ධතාවයක් සහිත තනි පරිසර පද්ධතියකි.

## අභියෝග හඳුනා ජයග්‍රහණයට මඟතනමු

- පරිසර සුරක්ෂිතතාව වෙනුවෙන් ශ්‍රී ලංකාව ජාත්‍යන්තර ප්‍රඥප්ති සැලකිය යුතු සංඛ්‍යාවකට එළඹ තිබියෙදීත් අණ පනත් 100කට වැඩි සංඛ්‍යාවක් සම්මත කොට පැවතියෙදීත්, විවිධ වූ පාරිසරික ප්‍රතිපත්තීන් 10කට වැඩි සංඛ්‍යාවක් තිබියෙදීත් පවිත්‍ර ශ්‍රී ලංකාවක් ගොඩනැඟීමට මෙතෙක් අපි අපොහොසත් වී සිටිමු.
- විද්‍යානුකූලව සැකසූ ජාතික භූමි පරිහරණ සැලැස්මක් ක්‍රියාවට නොනැඟීමේ වරදින් රට තුළ මීටර 04ක පමණ දළ ඝනකමකින් යුත් සාරවත් පාංශු ස්ථරයක් මේ වන විට දැඩි අනතුරකට මුහුණ පා තිබේ. දැඩි පාංශු ඛාදනයත්, අවිධිමත් ඉදිකිරීම් හා භූමියේ ඛනිජ සම්පත් අවභාවිතය තුළ නාය යාම් බහුල වීමත්, නිසරු පොළොවක් මෙන්ම කාන්තාරීකරණයේ මූලික ලක්ෂණ සමහර ප්‍රදේශවලින් මතුවීමත් බලවත් අභියෝගයකි.
- සක්‍රීය මෝසම් වැසි දෙකකින් හා අන්තර් මෝසම් වැසි දෙකකින් සමන්විත, අප දිවයින වසරකට වර්ෂාපතනයෙන් දළ වශයෙන් ජල කියුබික් මීටර මිලියන 111,250 කට උරුමකම් කියයි. ඒ මත රඳන ගංගා ද්‍රෝණි 103ක් අපට උරුම වී ඇත. විටෙක දැඩි හානි පමුණුවන ගංවතුරට හා තවත් විටෙක දැඩි නියඟයට ගොදුරුවීමත්, අගනා සම්පතක් වූ ජලය දූෂිත වී විපතක් ආකාරයට බලපෑම් එල්ලකිරීම දක්වා වර්ධනය වීමත් තවත් අභියෝගයකි.
- මානව හා ජීවී පැවැත්මට මහත් පිටුවහලක් වන වායුගෝලය අවිධිමත් කාර්මීකරණයෙන් නිකුත් වන හරිතාගාර හා දූෂිත වායු හේතුවෙන් සහ අවිධිමත් ප්‍රවාහන පද්ධතියක ප්‍රතිඵලයෙන් නිකුත්වන විෂකාරක හේතුවෙන්ද, ගිනි තැබීම් මෙන්ම ගිනි ගැනීම් බහුල වීමෙන් සිදුවන බලපෑමෙන්ද ගෝලීය උෂ්ණත්වය ඉහළ දැමීමට අපිදු දායක වී සිටිමු. එයට ප්‍රතිචාර ලෙස දෛනික වාෂ්පීකරණය දෙගුණ වීම, පරිසර උෂ්ණත්වය ඉහළ යාම, නියඟය නිර්මාණය වීම, ක්ෂණික විශාල වැසි කුඩා භූමි ප්‍රමාණයකට පතිත වීමද, ස්වාභාවික ආපදා හා සෞඛ්‍යමය තර්ජනයන්ට ලක්වීමද පවිත්‍ර ශ්‍රී ලංකාවක් ගොඩනැඟීමේදී අභියෝග වේ.
- රට තුළ පවතින භූ විෂමතාවත්, අපට හිමි වර්ෂාපතනයේ ව්‍යාප්තියත් අනුව සුවිශේෂ පරිසර පද්ධති කිහිපයක් පවතී. ඒ නිසාම විශාල ජෛව විවිධත්වයක් පැවැතීම මහා දායාදයක් කොට සැලකිය යුතුය. රට තුළ හඳුනාගත් සුපුෂ්පික ශාක විශේෂ 3,150ක්ද, ඉන් අපටම ආවේණික වූ ශාක විශේෂ 894ක්ද, ශ්‍රී ලංකාව තුළ හඳුනාගත් සත්ව විශේෂ 972ක්ද, ඉන් අපටම ආවේණික විශේෂ 330ක්ද ඊට අයත් වේ.

පවිත්‍ර ශ්‍රී ලංකාවක් ගොඩනැගීමේදී මෙම ජෛව විවිධත්වය මහා ධනයක් ලෙස සලකා අප රට තුළ සිදු කෙරෙමින් පවතින වන විනාශයත්, පවත්වාගෙන යන කොල්ලකාරී ආර්ථික ක්‍රමය තුළ සිදුවන ජාන මංකොල්ලයත්, අපගේ වන වැස්මට මෙන්ම ජීවීන්ගේ පැවැත්මට අයහපත් ලෙස බලපෑම් කරන ආක්‍රමණික ශාක හා සත්ව ව්‍යාප්තියත්, පාරිසරික අසමතුලිතතාවයන් නිර්මාණය කරමින්, පරිසරය තුළ සිදුවන විනාශය සමඟ වන සතුන් ගොවිබිම්, නගර දක්වා සංක්‍රමණය වීමත්, පාරිසරික තුලිතතාවය බිඳ දැමීමෙන් විවිධ සත්ව කාණ්ඩවල ගහනය අධිකවීමත් අභියෝගයක් ලෙස හඳුනා ගැනේ. මෙය පාරිසරික ආර්ථික, සමාජයීය අර්බුද මතුවීමටද බලවත් හේතුවක් වී ඇත.

- සාගර කලාපය හඳුනාගැනීමේදී වර්ග කිලෝමීටර 18,060ක ප්‍රාදේශික සාගර කලාපයක්ද, වර්ග කිලෝමීටර 19,620ක යාබද සාගර කලාපයක්ද දැනට හඳුනාගෙන උරුමවී ඇති වර්ග කිලෝමීටර 437,400ක අනන්‍ය ආර්ථික සාගර කලාපයක්ද අපට හිමිය. මෙම සමස්ත සාගර කලාප හා ඉන් ඔබ්බට ඇති සාගරයේ අතිමහත් ශාක හා සත්ව මෙන්ම අධි සාන්ද්‍ර ඛනිජ නිධිද හිමි මුත්, ඒ පිළිබඳ නිසි අධ්‍යයනයක් මෙතෙක් සිදුකර නොමැත. නිදන්ගත මෙවැනි ධනයකට හිමිකම් කියන අප එහි නිසි ලෙස සීමා නිර්ණය කර මෙතෙක් අයිතිය තහවුරු කර නොගැනීම බලවත් අඩුවකි. වෙරළ ආශ්‍රිතව ක්‍රියාත්මක වන විවිධ වූ කාර්යයන්ද, මානව ක්‍රියාකාරිත්වය හේතුවෙන් සාගරයට මුදාහරින අපද්‍රව්‍ය හේතුවෙන්ද සාගරය හා ගොඩබිම අතර විශාල අස්ථායීතාවක් නිර්මාණය කරමින් පැවතීම විශාල අභියෝගයකි.
- රටක් ලෙස අප මුහුණ දෙන අභියෝග අතර, පාලකයන් නිරුත්තර කළ කුණු කසළ අපද්‍රව්‍ය බරපතළ අර්බුදයක් බවට පත්කර ඇත. අසංවිධිත සැලසුම් හා නූතන ජීවන රටාවේ සංකීර්ණභාවයත්, ලාභ ඉපැයීම මූලික අරමුණ කරගත් ආර්ථික ක්‍රියාවලියත් හේතුවෙන්, ලංකාවේ දෛනික කසළ ජනනය මෙට්‍රික් ටොන් 7000කට ආසන්නව පවතී. ජලය, වායුව, පස දූෂණය වී පාරිසරික, ආර්ථික, සෞඛ්‍යමය හා සමාජයීය ගැටලු මේ තුළින් නිර්මාණය කිරීම පවිත්‍ර ශ්‍රී ලංකාවක් ගොඩනැගීමේදී තවත් අභියෝගයකි.
- ශ්‍රී ලංකාවට අවේණික අලි විශේෂය පරිසරයට ආභරණයක් ලෙසද, ආර්ථිකයට ධනය උපයන මාර්ගයක් ලෙසද, යොදා ගැනීමට හැකියාව තිබියෙදී අලින් අතින් එක් මිනිසෙකු ඝාතනය වන විට මිනිසුන් අතින් අලි තිදෙනෙකු ඝාතනය වීමේ අනුපාතය දක්වා ප්‍රශ්නය උග්‍ර වී තිබීමත්, රට පුරා ගැටලුව ව්‍යාප්ත වීමත්, ඒ සඳහා ගනු ලබන ක්‍රියා මාර්ගවල පවතින අසාර්ථකභාවයත් පවිත්‍ර ශ්‍රී ලංකාවක් ගොඩනැගීමේදී අපේ අභියෝග වේ.
- දීර්ඝ කාලයක් පරිසරයත් සමඟ ප්‍රතිවිරෝධාත්මක ගනුදෙනුවක නියැලීමේ වරද දසතින් පෙන්නුම් කරන මොහොතක් ලෙස වර්තමානය අප හඳුනාගන්නා අතර, රටේ ගොඩබිම සිසාරා පැතිරෙන මාරාන්තික වකුගඩු රෝගයත්, ඩෙංගු වසංගතයත්, පිළිකා, ශ්වසන ආදී රෝගත් හුදු සෞඛ්‍යමය ගැටලු අභිභවා ගිය, වැරදි පරිසර භාවිතයන් තුළ පැන නැඟුණු අභියෝගයකි.

## අරමුණු

1. ශ්‍රී ලංකාවේ සමාජ ආර්ථික සංවර්ධනය සහ පරිසරය අතර සමතුලිතතාව රැකෙන පරිදි ස්වභාවික සම්පත් සහ පරිසර කළමනාකරණය වැඩිදියුණු කිරීම
2. පරිසරය හා ස්වභාවික සම්පත් තිරසාර ලෙස කළමනාකරණය කිරීමේදී හා සැලසුම් කිරීමේදී ඒකාබද්ධ ප්‍රවේශය (Integrated Approach) භාවිතයට ගැනීම

3. පරිසර සුරක්ෂිතතාව වෙනුවෙන් ආයතන අතර මනා සම්බන්ධීකරණය සහ යහපාලන මූලධර්ම ක්‍රියාත්මක කිරීම තුළින් පාරිසරික නීතිමය සහ ආයතනික ව්‍යුහය ශක්තිමත් කිරීම
4. පරිසර කළමනාකරණයේදී වර්තමානයේ මුහුණ පා තිබෙන දිළිඳුකම තුරන් කිරීම හා දේශගුණික වෙනස්වීම්වල ප්‍රතිඵලයක් වශයෙන් නිර්මාණය වී ඇති විවිධ වූ පාරිසරික අර්බුද අවම කිරීම සහතික කිරීම
5. පරිසරයේ සුරක්ෂිත බව තහවුරු කිරීම උදෙසා දැනුම ආකල්ප ගොඩනැඟීම අරමුණ කරගත් දියුණු මානව සංස්කෘතියක් ගොඩනැඟීම

## මූලධර්ම

**පාරිසරික යුක්තිය:** ශ්‍රී ලංකාවාසී සෑම පුරවැසියෙකුගේම වගකීමක් වනුයේ පරිසරය ආරක්ෂා කිරීම සහ පිරිපුන් පරිසරයක් ඇති කිරීමය. එහි ප්‍රතිලාභ ලෙස මානව හා ජීවීන්ගේ අනාගත පැවැත්ම තිරසර කර ගැනීම

**පරිසරය සහ සංවර්ධනය අතර සමබරතාව රැකගැනීමට ක්‍රියාකිරීම:** සංවර්ධන ව්‍යාපෘතිවලදී පරිසරයට ඇති වන බලපෑම් අවම කිරීම සහ සම්පත් තිරසාර ලෙස සහ කාර්යක්ෂමව භාවිතයට ගැනීම සහතික වීම

**පරිසර පද්ධතික ප්‍රවේශය:** පාරිසරික සම්පත් සංවර්ධනය, කළමනාකරණය සහ සංරක්ෂණයේදී ඒකාබද්ධ පරිසර පද්ධති ප්‍රවේශය භාවිතයට ගැනීම

**තිරසාර සම්පත් භාවිතය:** පාරිසරික සම්පත් භාවිත කිරීමේදී ඒවායේ ගුණාත්මක තත්වය හා වටිනාකම අඩු නොවන සේ හා අනාගත මානව පැවැත්ම සුරක්ෂිත වන අයුරින් භාවිතයට ගැනීම

**සාධාරණත්වය:** ස්වභාවික සම්පත් භුක්ති විඳීමේදී මානව තුලිතතාව පවත්වා ගත යුතු අතරම කිසිදු ජීවියෙකුගේ පැවැත්ම අවදානමකට ලක් නොකිරීම

**මහජන සහභාගිත්වය:** පරිසර ආරක්ෂාව හා කළමනාකරණයේදී සහභාගිත්ව ප්‍රවේශය වැඩිදියුණු කිරීම

**පූර්වාරක්ෂක ක්‍රමවේදය:** කිසියම් ක්‍රියාකාරකමක් නිසා සම්පූර්ණ වශයෙන් තක්සේරු කළ නොහැකි පාරිසරික අවදානමක් පවතින විට එය ක්‍රියාත්මක කිරීමට පෙර එම ක්‍රියාකාරකම තහනම් කිරීමට හෝ සීමා කිරීමට පියවර ගැනීම

**දූෂකයා ප්‍රතිපූර්ණය කළ යුතුය: (Polluter Pays Principle)** පරිසරය අපිරිසිදු කරන කවරෙකුට වුවද එම අපවිත්‍රතාව ඉවත් කිරීමේ වගකීම පැවරීම

**පාරිසරික යහපාලනය:** පරිසර නීති, පාරිසරික කළමනාකරණ ආයතන, විනිවිද බව, වගවීම, මානව අයිතීන්වලට ගරු කිරීම, ප්‍රජා සහභාගිත්වය යනාදිය පරිසර කළමනාකරණයේදී අන්තර්ග්‍රහණය කිරීම සහතික වීම

**ප්‍රජාව සවිබල ගැන්වීම:** පරිසරය පද්ධති සමග ජීවත්වන ප්‍රජාවට අවශ්‍ය දැනුමත් ඒ සඳහා වන සංස්කෘතියක් ගොඩනඟමින් තිරසාර පැවැත්ම තහවුරු කිරීම

**පාරිසරික ආරක්ෂාව:** මානව ක්‍රියාකාරකම් හා ස්වාභාවික ක්‍රියාවලින් පැන නගින පාරිසරික උවදුරුවලින් පරිසර පද්ධති ආරක්ෂා කිරීම

# ක්‍රියාකාරකම්

## නෛතික අණ පනත් හා ප්‍රඥප්ති

- පරිසර සුරක්ෂිතභාවය තහවුරු කිරීම සඳහා දැනට පනවා ඇති පනත්වල දුර්වලකම්, අඩුපාඩු, ඌනතාවයන් ඉවත් කිරීම උදෙසාත්, අවශ්‍ය නව පනත් සම්පාදනය උදෙසාත්, ඒ ඒ ක්ෂේත්‍රවල ප්‍රවීණයන්ගෙන් සමන්විත මූලික කොමිසමක් ස්ථාපිත කොට ජනතා අදහස්, යෝජනා එක් කිරීමේ යාන්ත්‍රණයක් සකස් කිරීම
- ජාත්‍යන්තරය සමඟ එළඹ ඇති ගිවිසුම් හා ප්‍රඥප්ති මඟින් පවිත්‍ර ශ්‍රී ලංකාවක් ගොඩනැඟීම සඳහා සිදුවන බාධා ඉවත් කර ගැනීමටත්, පාරිසරික සුරක්ෂිතතාව තහවුරු කර ගැනීම උදෙසාත්, කරුණු සොයා බැලීම අරමුණු කර ගනිමින් ඒ සඳහා සුදුසුකම් සපුරන සභාවක් මඟින් සමාලෝචනය කිරීම සහ එම වාර්තාව පදනම්ව පෙර අරමුණු සපුරා ගැනීම වෙනුවෙන් ක්‍රියාමාර්ග ගැනීම

## සැලසුම්සහගත භූමි

- කෘෂිකාර්මික කටයුතු හේතුවෙන් සිදුවන පාංශු ඛාදනය වැළැක්වීම අරමුණු කර ගනිමින් ගොවීන් සමඟ  සම්බන්ධ වන විශේෂ ව්‍යාපෘතියක් ඇති කිරීම
- සංවර්ධන ව්‍යාපෘති හා අනෙකුත් ඉදිකිරීම්වලදී සිදුවන පාංශු ඛාදනය වැළැක්වීමට එම ව්‍යාපෘති සැලසුම් කිරීමේදීම නව රීතීන් හා කොන්දේසි පැනවීම
- වැලි, පස් හා ඛනිජ කැණීම්හිදී සිදුවන පාංශු ඛාදනය වැළැක්වීම  අරමුණු කර ගනිමින් කැණීමේ  මූලික සැලසුම්වලදීම අදාළ නව නීති හා කොන්දේසි ඇතුළත් කිරීම
- මේ වන විට පාංශු ඛාදනය වීම හේතුවෙන්  නිසරු වූ  හා විනාශ වූ බිම් නැවත ප්‍රතිස්ථාපනය කිරීම රජයේ මූලික වගකීමක් ලෙස ක්‍රියා කිරීම
- පාංශු ඛාදනය සඳහා දැඩි ලෙස බලපෑම් වන, රටට ආවේණික නොවන වගාවන් ක්‍රමානුකූලව ඉවත් කිරීම සහ එම බිම් තුළ ස්වාභාවික වන වැස්මක් ස්ථාපිත කිරීම
- ගංගා ද්‍රෝණි හා වාරිපෝෂිත ප්‍රදේශවල පාංශු ඛාදනය වැළැක්වීම අරමුණු කරමින්, රටට ආවේණික ස්වභාවික වන වැස්මක් ඇති කිරීම
- රටේ ඉදිරි ගොඩනැඟීම් අරමුණු කර ගනිමින්, පාෂාණ කලාප හා පසේ රසායනික සංයුති විද්‍යාත්මක ලෙස හඳුනාගැනීම
- උග්‍ර පාංශු ඛාදනයට හා උග්‍ර නායයාම්වලට ගොදුරුව ඇති රටේ වටිනාම භූ කලාපයක් වන මධ්‍යම කඳුකරයේ සුරක්ෂිතභාවය තහවුරු කිරීම උදෙසා විද්‍යාත්මක ගවේෂණයක් සිදු කරනු ඇත. ඒ අනුව නව රක්ෂිත වනාන්තර, සංරක්ෂිත භූමි ස්ථාපිත කිරීම
- විද්‍යානුකූල භූමි පරිහරණ සැලැස්මක් අනුව රටේ සමස්ත භූමියම සැලසුම් කරමින් කළමනාකරණය කිරීම

## ජලය

- ගංගා ද්‍රෝණි හා මධ්‍යම කඳුකරයේ වැසි ජලය ගබඩා කර ගත යුතු ජලධරයන් ප්‍රමාණය ගණනය කරන අතර ඒ සඳහා අවශ්‍ය වන සුදුසු වන ගහනයක් ඒ තුළ ස්ථාපිත කිරීම
- ශ්‍රී ලංකාවේ සියලුම ජල මූලාශ්‍ර අධ්‍යයනයකින් පසු මැනුම් කටයුතු කොට, ගැසට් කර සංරක්ෂණය කිරීම
- එල්ලංගා පද්ධති සක්‍රීය කළ හැකි ගංගා ද්‍රෝණි, සක්‍රීය කිරීමෙන් ක්ෂණික ගංවතුරෙන් හා නියඟයෙන් සිදුවන බලපෑම අවම කිරීම
- මතුපිට හා භූ අභ්‍යන්තර ජලය දූෂණයට ලක්වන සියලුම මූලාශ්‍ර හඳුනාගෙන විද්‍යානුකූල විධිමත් ක්‍රම මඟින් දූෂණය වැළැක්වීම
- කාර්මික, කෘෂිකාර්මික හා සේවා ස්ථානවල භාවිත කර පරිසරයට මුදාහරිනු ලබන ජලය නිවැරදි විද්‍යානුකූල ක්‍රමයකට පිරිපහදු කර පරිසරයට බැහැර කිරීම අනිවාර්ය කිරීම
- ජල පරිහරණයේදී සිදුවන නාස්තිය හා දූෂණයත්, අධික ලෙස භූගත ජල පරිහරණය තුළින් මතුවිය හැකි අර්බුද කළමනාකරණය උදෙසාත් විද්‍යාත්මක, පාරිසරික ජල කළමනාකරණ සැලැස්මක් සකස් කොට ක්‍රියාවට නැගීම
- ශ්‍රී ලංකාවේ ආර්ථික, සමාජ ඉතිහාසය සැකැස්මේ සුවිශේෂීතාව වන වාරි ශිෂ්ටාචාරය අනාගත පරපුර වෙනුවෙන් සංරක්ෂණය කිරීම අරමුණු කරගෙන විධිමත් වාරි කෞතුකාගාරයක් නිර්මාණය කිරීම

## ජෛව විවිධත්වය

- වන ජීවී හා වන සංරක්ෂණ දෙපාර්තමේන්තු විසින් අවසන් වරට ගැසට් කර ඇති භූමි කලාපයන්හි මානව ක්‍රියාකාරකම් හේතුවෙන් අවදානමකට ලක්වී ඇති ප්‍රදේශ හඳුනා ගෙන නැවත එම ප්‍රදේශ අදාළ කලාප තුළට අන්තර්ග්‍රහණය කර සංරක්ෂණය කිරීම
- ජාත්‍යන්තර පරිසර ප්‍රඥප්තිවලට අනුගතව කාර්මික, නාගරික, ජනාවාස හා කඳුකර ප්‍රදේශවල වෙන් වෙන්ව පැවතිය යුතු වන ඝනත්වයන්ගේ ප්‍රතිශත පවත්වා ගැනීම වෙනුවෙන් නව වන බිම් ස්ථාපිත කොට සංරක්ෂණය කිරීම
- සමස්ත ලාංකේය පරිසර පද්ධතියේ ජීවී පැවැත්මට අනතුරුදායක තත්වයක් ගෙන එන ආක්‍රමණික ශාක හා සත්ව විශේෂ රට තුළට ඇතුල්වීම වැළැක්වීමට විද්‍යානුකූල විධිමත් නිරෝධායන ක්‍රියාවලියක් ක්‍රියාත්මක කිරීම
- ශ්‍රී ලංකාව තුළ සුවිශේෂී වටිනාකම් ගෙන එන ශාක හා සත්ව ජාන විවිධ පටු ආර්ථික අවශ්‍යතාවයන් වෙනුවෙන් සුළු පිරිසකගේ අභිවෘද්ධිය තකා සිදුවන පැහැර ගැනීම අහෝසි කිරීමට කටයුතු කරන අතර එය රාජ්‍ය ජාතික වටිනාකමක් ලෙස තක්සේරු කිරීම
- ශ්‍රී ලංකාවට ආවේණික සත්ව හා ශාක ප්‍රජාව මානව ක්‍රියාකරකම් හේතුවෙන්ද, ස්වාභාවික පාරිසරික ක්‍රියාවලි හේතුවෙන්ද අවදානමකට ලක්වීම හා වඳවීමේ තර්ජනයට මුහුණ දීමේ අවදානම අහෝසි කිරීමට සැලසුම් කරන අතර එම ශාක හා ජීවීන් මතු පරපුර වෙනුවෙන් සංරක්ෂණය කිරීමේ ක්‍රියාවලියක් ක්‍රියාත්මක කිරීම

- පාරිසරික සමතුලිතතාව බිඳහෙළමින් සත්ව විශේෂ කිහිපයක සිදුවන ඝනත්වයන්ගේ සීඝ්‍ර වැඩිවීම පාරිසරික ගැටලුවක් ලෙස හඳුනාගන්නා අතර එසේ වැඩිවීමේ ජීව විද්‍යාත්මක හේතුන් අධ්‍යයනය කර ස්වාභාවික වරණ ක්‍රියාවලිය මඟින් විද්‍යානුකූලව පාලනය කිරීමට සැලසුම් ක්‍රියාත්මක කිරීම
- මානව පැවැත්ම සහ පරිසරය තිරසර කිරීමේ අරමුණින් නව සංකල්පයක් ලෙස පාරිසරික ජනාවාසකරණය හා පාරිසරික නාගරීකරකණය යන සංකල්ප හඳුන්වා දෙන අතර පළමු වසර 05 තුළ තෝරාගත් නගර 05ක් හා ඒ ආශ්‍රිත ගම්මානයන් මේ සම්බන්ධයෙන් විශේෂඥයින්ගේ සැලසුම්වලට අනුව ආදර්ශයක් ලෙස ඉදිකර ජනතා අයිතියට පත් කිරීම
- සමස්ත ජීවී පැවැත්ම සඳහා පාංශුගෝලය හා වායුගෝලය තුළ ජෛව ජීර්ණ ක්‍රියාවලිය මනා ලෙස පවත්වා ගැනීමට අති විශාල කර්යභාරයක් සපුරන ක්‍ෂුද්‍ර ජීවී ගහනයන් අවදානමට ලක් කරමින්, මිනිස් ක්‍රියාකාරකම් මත මුදා හරින කෘත්‍රිම රසායනිකයන් පරිසරයට බැහැර කිරීම විද්‍යානුකූල විධිමත් වැඩපිළිවෙළක් මගින් පාලනය කිරීමට සැලසුම් කිරීම

## වායු ගෝලය

- සියලු මිනිස් ක්‍රියාකාරකම් නිසා වායු ගෝලයට විමෝචනය වන සියලු වායු වර්ගයන් හා ක්‍ෂුද්‍ර ඝන අංශු පිළිබඳව විගණනයක් සිදුකිරීම සඳහා අවශ්‍ය පාරිසරික විගණන ඒකකයක් ස්ථාපිත කිරීම
- වායු ගෝලයට විමෝචනය වන දූෂණකාරක වායු වර්ග එම ස්ථානයේදීම අතුරු නිෂ්පාදනයන් බිහිකරලීමේ හෝ බැහැර කරලීමේ නව තාක්‍ෂණයන් හඳුන්වා දීම හෝ විමෝචනය සිදු නොවන ක්‍රමවේදයන්වලට ප්‍රවිෂ්ට වීම සඳහා රාජ්‍ය අනුග්‍රහය ලබා දෙමින් පාලනය කිරීමට සැලසුම් කිරීම
- වායු ගෝලය තුළ ප්‍රකාශ රසායන ධූමිකාව නිර්මාණය වෙමින් මිනිසාගේ ජීවත්වීම අභියෝග යට ලක් කරමින් වායු දූෂණය උච්ඡ අවස්ථාවකට ළඟා වී ඇති නගර හඳුනා ගෙන කඩිනමින් එම ධූමිකාව ඉවත් කිරීම සඳහා නව තාක්‍ෂණික ක්‍රම භාවිත කිරීම
- වායු ගෝලයේ හරිත වායු අවශෝෂණ හා විමෝචන ක්‍රියාවලිය සමතුලිතතාවයේ පවත්වා ගැනීම සඳහා කාබන් උරා ගැනීමේ උපරිම හැකියාව ඇති ක්‍ෂණික වර්ධනයක් ඇති පාරිසරික යෝග්‍ය දැව වර්ගයන් හඳුන්වා දෙන අතර එමගින් වාණිජ නිෂ්පාදනය කරන කර්මාන්ත සඳහා රාජ්‍ය අනුග්‍රහයද ලබාදීම

## වෙරළ හා සාගරය

- වෙරළ තීරයට හෝ සාගරයට සෘජුව හෝ වක්‍රව අපද්‍රව්‍ය බැහැර කිරීම පූර්ණ ලෙස නතර කිරීම
- වෙරළ කලාපයේ අධි සංවේදී පරිසර පද්ධති හඳුනා ගෙන එම පරිසර පද්ධති සුරක්ෂිත කිරීම සඳහා අවශ්‍ය අවම සීමාව තුළ මානව ක්‍රියකාරකම් අත්හිටුවීම

- අනෙකුත් වෙරළ කලාපයන්හි වෙරළ සංරක්ෂණ අවම සීමාව විද්‍යානුකූලව තීරණය කරන අතර, එය නිවැරදිව නිරවුල්ව මිනුම් කටයුතු කර සලකුණු කර එම සීමාව තුළ නව ඉදිකිරීම් අත්හිටුවීම සහ පවතින ඉදිකිරීම් ක්‍රමනුකූලව විකල්ප හඳුන්වා දෙමින් ඉවත්කිරීමට කටයුතු කිරීම
- මත්ස්‍ය සම්පත ඇතුළු ගැඹුරු මුහුදේ පවතින ස්වභාවික සම්පත් භාවිතයට ගැනීමට හා එම සම්පත් සුරක්ෂිත කිරීම වෙනුවෙන්ද සාගර දූෂණය අවම කිරීම වෙනුවෙන්ද ජාත්‍යන්තර නීතින්වලට සමගාමීව පාරිසරික නීති පද්ධතියක් සැකසීම
- ශ්‍රී ලාංකේය ජනතාවත් සමඟ සංස්කෘතිකව බැඳී ඇති මුහුදු වෙරළේ තෝරා ගත් කලාප කිහිපයක සියලු පහසුකම් සහිත සුන්දර පාරිසරික තීරයන් ගොඩ නැගීම

## කසළ කළමනාකරණය

- මූලික කසළ කළමනාකරණය කසළ ජනනය වන ස්ථානවලින්ම ආරම්භ කිරීමට විධිමත් සැලැස්මක් සකස් කිරීම
- නිෂ්පාදකයා, ව්‍යාපාරිකයා, පාරිභෝගිකයා එක්ව පරිසරයට බැහැර කරන කසළ සමාජ වගකීමක් සහිතව බැහැර කරලීමේ ක්‍රමවේදයකට යටත් කිරීම
- සෑම දිස්ත්‍රික්කයකම ඉලෙක්ට්‍රෝනික හා විද්‍යුත් අපද්‍රව්‍ය ඇතුළත් ඝන අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීයකරණය සඳහා තෝරා ගත් ස්ථාන කිහිපයකම මධ්‍යස්ථාන පිහිටුවීම
- සෑම පළාත් පාලන ආයතනයකම රාජ්‍ය හා පෞද්ගලික අංශ දායක කර ගනිමින් ජෛව රසායනික කසළ කළමනාකරණ කර්මාන්ත ශාලා ස්ථාපිත කරන අතර කොම්පෝස්ට් පොහොර හා බලශක්ති නිෂ්පාදනයටද අවතීර්ණ වීම

## ගැටලු දුරලමු

- රටේ පවතින ප්‍රධාන වන ජීවී හා වන සංරක්ෂණ කලාප ඒකාබද්ධ කළ හැකි ස්ථාන හඳුනාගෙන සත්ව සංසරණ නවීන මංකඩවල් ස්ථාපිත කිරීමට සැලසුම් කිරීම
- වන අලින් හා වන සතුන් සඳහා වනාන්තරවල පවතින ආහාර අවශ්‍යතා සැපිරීම වෙනුවෙන් අදාළ පාරිසරික පද්ධති නිර්මාණය කිරීමට සැලසුම් කිරීම
- අලි ඇතුන්ගේ ඇත් දළ, ගජමුතු, කෙඳි පිළිබඳවත් අනෙක් සතුන් සම්බන්ධයෙන්ද පවතින සමාජ මිථ්‍යාවන් හා වටිනාකම් අහෝසි කිරීම සඳහා අවබෝධය ලබාදීමට කටයුතු කිරීම
- වන අලින් ගම් නගරවලට පිවිසීම වැළැක්වීම සඳහා විධිමත් විදුලි වැට පද්ධතියක් ස්ථාපිත කරනු ලබන අතර ඒ සඳහා වූ ඒකකයක් පිහිටුවීම
- ජීව විද්‍යාත්මක හා නව තාක්ෂණික ක්‍රමවේද භාවිත කරමින් ජන සහභාගිත්ව වැඩසටහන් මගින් අලි මිනිස් ගැටුම් පාලනය කිරීම
- පරිසර හිතකාමී මානව පැවැත්මකට ක්‍රමානුකලව සමාජය අනුගත කරගනිමින් පරිසරය විසින් මානවයාට එල්ල කර තිබෙන වකුගඩු, ඩෙංගු, පිළිකා, ශ්වසන රෝග ආදී සෞඛ්‍ය ගැටලු තුරන් කිරීමට අධ්‍යාපනික මෙන්ම පාරිසරික සංස්කෘතියක් ගොඩනැඟීමට සැලසුම් කිරීම

- මානව වාසස්ථාන වන නිවාස හා වැඩ බිම් සෞඛ්‍යාරක්ෂිතව පරිසර හිතකාමී ප්‍රියමනාප ස්ථාන බවට පත්කිරීම සඳහා ප්‍රජා සහභාගිත්වයක් සහිත රාජ්‍ය මැදිහත්වීමක්ද ඇතුළත් සැලසුමක් සකස් කිරීම
- ජනතාවගේ පරිභෝජනය සඳහා පිරිසිදු ගුණාත්මක ආහාර මෙන්ම අනෙකුත් භෞතිකමය භාණ්ඩ හා ද්‍රව්‍ය පරිසර හිතකාමී පරිභෝජන රටාවකට ගෙන ඒම සඳහා දැනුම ලබාදීමත් ඒ සඳහා වූ සංස්කෘතියක් ගොඩනැගීමටත් සැලසුම් කිරීම

# කාර්යක්ෂම ශ්‍රී ලංකාවක්

කාර්යක්ෂම රාජ්‍ය සේවයක් සහිත රටක පුරවැසි සංතෘප්තිය ඉහළ අගයක් ගනී. එහි පරිපාලන ව්‍යුහය මනාව සංවිධාන ගත කර, තාක්ෂණයේ ආධාර සහිතව කාලය, ධනය, ශ්‍රමය ශේෂ කෙරෙන, කාර්යක්ෂම හා ප්‍රගතිශීලී තැනකට පත්කිරීම අත්‍යවශ්‍යව ඇත. රටෙහි අධිකරණ පද්ධතිය, පරිපාලන සේවය ආදිය මෙම කාර්යක්ෂමතාවයට යොමු විය යුතු අතර පුරවැසියා රාජ්‍ය නිලධාරියාට සම්මුඛ වන අවස්ථාවේ ඉතාම සුහදශීලී, මිත්‍රශීලී, ප්‍රතිචාර සහිත ගනුදෙනුවක් ජනිත කිරීමද අප අරමුණු කර ඇත. පුරවැසියා තුළ රාජ්‍ය කාර්යක්ෂමතාව ඒත්තු යන සුළු පරිදි තහවුරු වී තිබිය යුතු අතර රටෙහි ආණ්ඩුව තමා වෙනුවෙන් පවතින්නක් ලෙස එවිට ඔවුන් විශ්වාස කරනු ඇත.

# කාර්යක්ෂම ප්‍රවාහන සේවාවක්

රටක කාර්යක්ෂමතාව නිර්ණය කිරීමේදී එහි මහජන ප්‍රවාහන පද්ධතියේ කාර්යක්ෂමතාව ප්‍රධාන සාධකයකි. අපේ ප්‍රවාහන සේවය පිළිබඳ ඇති ගැටලු අතර එහි අකාර්යක්ෂමතාව, අවිධිමත් බව, විශේෂ අවධානයට ලක් කළ යුතු පිරිස් පිළිබඳ නොසලකා හැරීම හා අනාරක්ෂිත බව ප්‍රධාන තැනක් ගනී. කොළඹ වැනි නාගරික තදබදය ඇති ප්‍රදේශවල මෝටර් රථයකින් ගමන් කිරීමේ සාමාන්‍ය වේගය පැයට කි.මී. 5 - 15 වැනි ඉතා පහළ අගයක් ගැනීමෙන් ප්‍රවාහන පද්ධතියේ අකාර්යක්ෂමතාව කැපී පෙනේ. තදබදය අඩු ප්‍රදේශවලදී වැඩි මගීන් ප්‍රමාණයක් ලබා ගැනීමට පොදු මගී ප්‍රවාහන සේවා මන්දගාමීව ධාවනය කිරීම නිසා ගමනට අධික කාලයක් ගතවේ.

ප්‍රවාහන සේවයේ අවිධිමත් බව පෙන්වන ප්‍රධාන දර්ශක ලෙස නියමිත කාලසටහනකට අනුව ධාවනය නොවීම, ලාභ ඉලක්ක කරගනිමින් ක්‍රියාත්මක වීම නිසා විශේෂයෙන්ම සවස් කාලයෙන් පසුව පොදු ප්‍රවාහන සේවා ක්‍රියාත්මක නොවීම, ඇතැම් ග්‍රාමීය ප්‍රදේශවල පොදු ප්‍රවාහන සේවා ක්‍රියාත්මක නොවීම සහ ප්‍රවාහන සේවාවන් අතර නිසි සම්බන්ධීකරණයක් නොමැති වීම සැලකිය හැකිය. විශේෂ අවධානයට ලක් කළ යුතු වූ ජනතාවගෙන් අඩකටත් වැඩි ප්‍රමාණයක් වන කාන්තාවන් මෙන්ම ළමුන්ද ලිංගික හා වෙනත් හිංසනයන්ට ලක්වීමත්, 14%ට ආසන්න වන වැඩිහිටි ජනගහනය මෙන්ම ජනගහනයෙන් 8%ක් පමණ වන ආබාධ සහිත පුද්ගලයින්ද ඔවුන්ටම සුවිශේෂී වූ ගැටලු රාශියකට පොදු ප්‍රවාහන සේවාවන්හිදී මුහුණදීමත් සුලභව වාර්තා වේ. වසරකට මාර්ග අනතුරු 30,000ක් පමණ වාර්තා වීමත් ඉන් 3000ක පමණ ජීවිත ප්‍රමාණයක් අහිමි වීමත් මගින් ප්‍රවාහනයේ අනාරක්ෂිත බව හා එහි තීව්‍රතාවය පෙන්නුම් කරයි.

පොදු ප්‍රවාහනය බිඳවැටීම හේතුකොට ගෙන ප්‍රවාහන අවශ්‍යතාවයෙන් 48%ක් පෞද්ගලික රථ වාහන මගින් සේවා සපයා ගැනීම නිසා ඔවුන්ට තම ආදායමෙන් විශාල කොටසක් ප්‍රවාහනය වෙනුවෙන් වැය කිරීමට සිදුව ඇත. එමගින් අධික මාර්ග තදබදයක්ද නිර්මාණය කර ඇත.

මේ අනුව ප්‍රවාහන ක්ෂේත්‍රයේ ව්‍යුහාත්මක වෙනසකින් තොරව මෙරට ජනතාව මුහුණ දෙන ප්‍රවාහන අර්බුදයට විසඳුම් සෙවිය නොහැක. ඒ අනුව ඉදිරිපත් කරනු ලබන ජාතික ප්‍රවාහන ප්‍රතිපත්තියෙහි දර්ශනය වනුයේ "පොදු ජනතාවගේ ප්‍රවාහන අවශ්‍යතා සමස්තයක් ලෙස ඉලක්ක කරගත්, පරිසර හිතකාමී ප්‍රවාහන පද්ධතියක් දක්වා ක්‍රමිකව පරිවර්තනය වීමේ දැක්මක් ඇතිව, රාජ්‍ය මැදිහත්වීම අවධාරණය කරන, කාර්යක්ෂම, විශ්වසනීය, ආරක්ෂාකාරී, ගෞරවාන්විත, ප්‍රවාහන සේවයක් ස්ථාපනය කිරීමය."

## ප්‍රතිපත්ති සඳහා පදනම් වූ මූලධර්ම

- කාර්යක්ෂම හා ගුණාත්මක පොදු ප්‍රවාහනය හුදු ලාභය අපේක්ෂාවෙන් ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපාරයකට වඩා මහජන සේවාවක් ලෙස පවත්වාගෙන යාම රජයේ වගකීමක් වීම
- ප්‍රවාහන මාධ්‍යයන් අතර අන්තර් සම්බන්ධීකරණයක් ඇති කිරීම හා ඒවා නියාමනය කිරීම
- කාන්තාවන්, වයස්ගත පුද්ගලයින්, ළමයින් සහ ආබාධ සහිත පුද්ගලයින් වැනි මගී සංයුතියේ විවිධත්වය අනුව ඔවුන්ගේ ප්‍රවාහන අවශ්‍යතාවලට අනුකූල ප්‍රවාහන සේවාවක් පවත්වාගෙන යාම
- ප්‍රවාහන සේවාවන් අනාගත මතු පරපුරටද එකසේ භුක්ති විඳීමට ඇති අයිතිය පිළිගනිමින් පරිසර හිතකාමී හා තිරසර ප්‍රවාහන සේවාවක් පවත්වාගෙන යාම

# ක්‍රියාමාර්ග

## ප්‍රධාන පොදු ප්‍රවාහන මාධ්‍ය ශක්තිමත් කිරීම

- ඉදිරි වසර 10 තුළ ජනතාවගේ ප්‍රවාහන අවශ්‍යතාවලින් 80%ක් පොදු ප්‍රවාහන සේවා මගින් සැපයීම
- අඛණ්ඩ සහ කාර්යක්ෂම මගී ප්‍රවාහනයක් සඳහා ප්‍රවාහන සේවා සම්බන්ධීකරණ ආයතනයක් පිහිටුවීම
- ආරම්භයේ සිට ගමනාන්තය දක්වා දුම්රිය හා බස්රිය ධාවන කාලසටහන් සම්බන්ධීකරණය කිරීමෙන් අඛණ්ඩ බව සහතික කිරීම
- ප්‍රවාහන සේවයේ නියුතු සියලුම වෘත්තිකයින්ට වෘත්තීය නිපුණතාවය හා ආචාරධර්ම පිළිබඳ පුහුණුව අනිවාර්ය කිරීම
- ප්‍රවාහන සේවාවල සිදුවන සියලු ආකාරයේ හිංසනයන්ට එරෙහිව ක්ෂණිකව ක්‍රියාත්මක වීමට ඒකකයක් හා අදාළ පැමිණිලි ලබා දීම සඳහා යෙදවුම් මෘදුකාංගයක් හඳුන්වාදීම
- සෑම දුම්රිය හා බස් නැවතුම්පොළකම පිරිසිදු සනීපාරක්ෂක පහසුකම් හා ආහාර පාන සපයන මධ්‍යස්ථාන ඇති කිරීම

## දුම්රිය සේවාව

- ඉදිරි වසර පහ තුළ ප්‍රවාහන ක්ෂේත්‍රයේ දුම්රිය සේවාවේ දායකත්වය 20% දක්වාත් ඊළඟ වසර 5ක් තුළ එය 50% දක්වාත් වර්ධනය කිරීම
- අබලන් තත්වයේ ඇති සියලුම දුම්රිය මාර්ග නවීකරණය කිරීම සහ ස්වයංක්‍රීය සංඥා පද්ධතියක් හඳුන්වා දීම
- ප්‍රධාන දුම්රිය මාර්ග සියල්ල මංතීරු දෙකේ මාර්ග ලෙසටත්, ප්‍රධාන නගර ආශ්‍රිතව මංතීරු තුනේ මාර්ග ලෙසටත් සංවර්ධනය කිරීම
- දැනට දුම්රිය මාර්ග ජාලය මගින් ආවරණය නොවන ප්‍රදේශ දක්වා දුම්රිය මාර්ග දීර්ඝ කිරීම
- දුම්රිය මැදිරි වැඩිපුර යෙදවීම හා දුම්රිය ගමන් වාර වැඩිකිරීම මගින් කාර්යක්ෂම දුම්රිය සේවයක් නඩත්තු කිරීම
- නගරාන්තර සීඝ්‍රගාමී දුම්රිය සේවා වාර ගණන වැඩි කිරීම
- මගී ජනතාව භාවිතා කරන පුද්ගලික වාහන (උදා.- මෝටර් රථ, මෝටර් බයිසිකල් හා පාපැදි) ගාල් කිරීම සඳහා දුම්රිය ස්ථාන ආසන්නව නැවතුම් පහසුකම් ඇති කිරීම
- තදාසන්න ප්‍රදේශවල ගමනාගමනය සඳහා විදුලි බලයෙන් ක්‍රියාත්මක කෙරෙන නගරාන්තර සැහැල්ලු දුම්රිය සේවයක් හඳුන්වා දීම. විශේෂයෙන්ම මෙම දුම්රිය සේවය පිටත වටරවුම් අධිවේගී මාර්ගයේ ප්‍රවේශ මාර්ගවල සිට කොළඹ නගරය ආවරණය වන පරිදිත් මහනුවර ප්‍රදේශයේදී පේරාදෙණිය, කටුගස්තොට, කුණ්ඩසාලේ වැනි ප්‍රදේශවල සිට මහනුවර නගරය ආවරණය වන පරිදිත් ක්‍රියාත්මක කෙරේ.

- ඉන්ධන, සිමෙන්ති, පිටි වැනි පාරිභෝගික භාණ්ඩද නිෂ්පාදන අමුද්‍රව්‍යද එළවළු, පලතුරු වැනි දෑද ප්‍රවාහනය සඳහා දුම්රිය සේවය කාර්යක්ෂම ලෙස භාවිතයට ගැනීම

### බස් මගී සේවාව

- මගී ගමනාගමනය සඳහාම නිෂ්පාදිත පහසුකම් සහිත බස් රථ හඳුන්වා දීම
- අර්ධ නාගරික හා ග්‍රාමීය මාර්ගයන්හිද රාත්‍රි කාලයේද ප්‍රවාහනය විධිමත් කරනු පිණිස බස් සේවාව ශක්තිමත් කිරීම
- මගීන් ප්‍රමාණය අඩු කලාපයන්හි පොදු ප්‍රවාහනය අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා බදු සහන සහ අවශ්‍ය අවස්ථාවන්හිදී දිරි දීමනා ලබා දීමට කටයුතු කිරීම
- මගී ජනතාව භාවිතා කරන පුද්ගලික වාහන (උදා. මෝටර් රථ, මෝටර් බයිසිකල් හා පාපැදි) ගාල් කිරීම සඳහා බස් නැවතුම්පොළ ආසන්නව නැවතුම් පහසුකම් ඇති කිරීම

## විධිමත් හා අනිවාර්ය කාලසටහන් ක්‍රමය

- මගී ප්‍රවාහන සේවය සඳහා අනිවාර්ය කාලසටහන් ක්‍රමයක් හඳුන්වා දීමට පියවර ගැනීම
- දියුණු තොරතුරු තාක්ෂණය භාවිත කර සකස් කරනු ලබන කාලසටහන් ඕනෑම අයෙකුට අන්තර්ජාලයේ පිරික්සිය හැකි දත්ත ගබඩාවක් ලෙස ස්ථාපනය කිරීම
- විශේෂයෙන්ම දුර ගමන් සේවාවන්හිදී කල් ඇතිව ආසන වෙන් කර ගැනීමට මගී ජනතාවට අවස්ථාව උදාකර දීම
- සෑම දුම්රිය හා බස් නැවතුම්පළකම ධාවන කාලසටහන් ප්‍රදර්ශනය කරනු ලබන අතර එම කාල සටහන්වලට අනුවම ධාවනය අනිවාර්ය කිරීම

### ග්‍රාමීය ප්‍රවාහනය

- ප්‍රජා කළමනාකාරීත්ව ක්‍රමයක් මගින් උචිත තාක්ෂණය භාවිත කරමින් දැනට අබලන් තත්වයේ පවතින සියලුම ග්‍රාමීය මාර්ග ප්‍රතිසංස්කරණය කර නඩත්තු කිරීම
- ග්‍රාමීය ජනතාවගේ අත්‍යවශ්‍ය සේවාවන් වන පාසල්, රෝහල්, වෙළඳ මධ්‍යස්ථාන මෙන්ම රාජ්‍ය ආයතනද සැලසුම් සහගත ක්‍රමයක් තුළින් ජනතාව වෙත සමීප කිරීම
- ග්‍රාමීය ප්‍රජාවගේ නිෂ්පාදන හා භාණ්ඩ ප්‍රවාහනය සඳහා විශේෂ සේවාවන් ක්‍රියාත්මක කිරීම

### පාපැදි මංතීරු

- මාර්ග තදබදය ඇති ප්‍රධාන නගර තුළ හා ප්‍රධාන නගර අවට ප්‍රදේශවල සිට එම ප්‍රධාන නගර දක්වා ආරක්ෂාකාරී පාපැදි මංතීරු ඇති කිරීම
- පාපැදි භාවිතය සීමා කෙරෙන නීති රීති හා භාවිතාවන් ඉවත් කිරීම

### පදික මංතීරු

- කෙටි දුර ගමනාගමනය සඳහා පයින් යෑම දිරිමත් කිරීම සඳහා ජනාකීර්ණ නගර මධ්‍යයේ මෙන්ම අනෙකුත් ප්‍රධාන හා අතුරු මාර්ගවලට යාව පදික මංතීරු ඇති කිරීම
- හැකි සෑම ස්ථානයකම මාර්ගය දෙපස සෙවණ ලබාදෙන වන රෝපණයක් හඳුන්වා දීමට කටයුතු කිරීම

### භාණ්ඩ හා මගී ප්‍රවාහනය සඳහා ජල මාර්ග භාවිතය

- ශක්‍යතා අධ්‍යනයකින් පසු හඳුනාගනු ලබන සෑම ජල මාර්ගයකම ප්‍රවාහන සේවාවන් ක්‍රියාත්මක කිරීම

### ගුවන් සේවාව

- පළාත් 09ම ආවරණය වන පරිදි අභ්‍යන්තර ගුවන්තොටුපළ සංවර්ධනය කර අභ්‍යන්තර ගුවන් ගමන් සේවාවක් ස්ථාපනය කිරීමට කටයුතු කිරීම හා එයට සමගාමීව ජාත්‍යන්තර ගුවන්තොටුපොළ 05ක් සංවර්ධනය කිරීම

### වැඩිහිටි හා ආබාධිත ප්‍රජාවගේ ප්‍රවාහන අවශ්‍යතා

- දුම්රිය සහ බස් රථ වැනි පොදු ප්‍රවාහන රථවලට ආබාධ සහිත ප්‍රජාවට සහ වැඩිහිටි පුද්ගලයින්ට ප්‍රවේශ පහසුකම් ලබා දීම අනිවාර්ය කිරීම
- දුම්රිය සහ බස්රථ නැවතුම්පොළවල්ද ආබාධ සහිත ප්‍රජාවට සහ වැඩිහිටි පුද්ගලයින්ට සුදුසු ප්‍රවේශ මාර්ග ඉදිකිරීම

### මගීන් සංවිධානය

- මගී ජනතාව දුම්රිය මගීන්, බස් මගීන්, ත්‍රීරෝද රථ මගීන්, පදිකයින්, පාපැදිකරුවන් ලෙස සංවිධානය වීම දිරිගැන්වීම
- ප්‍රවාහන ක්ෂේත්‍රයේ තීන්දු ගැනීමේදී අදාළ මගී සංවිධාන පාර්ශවකරුවන් ලෙස සහභාගි කරවා ගැනීම

ප්‍රවාහන සේවයේ ගැටලු දිගුකාලීනව සහ තිරසර ලෙස විසඳීමට නම් ජනතාවගේ ප්‍රවාහන අවශ්‍යතා අවම වන පරිදි රටේ ආර්ථික ප්‍රතිපත්තීන්ට අනුකූලව ජනාවාස, සේවා සහ නාගරික සැලසුම්කරණය අනිවාර්ය විය යුතුය.

# රාජ්‍ය පරිපාලනය

රටක සමාජ හා ආර්ථික දියුණුව හා සංවර්ධනය සැලකීමේදී එම රටේ පුරවැසියන්ට අවශ්‍ය සේවාවන් කාර්යක්ෂමව හා විධිමත්ව සැපයීමට සමත් රාජ්‍ය සේවයක් පවතින්නේද යන්න වැදගත් සාධකයකි. එහෙත් ශ්‍රී ලංකාවේ වත්මන් රාජ්‍ය සේවයේ අකාර්යක්ෂමතාව පිළිබඳ බරපතළ විවේචනයක් පවතී. මේ වන විට රාජ්‍ය සේවයේ භෞතික සම්පත් මෙන්ම මානව සම්පත් සැලකිය යුතු වශයෙන් සංවර්ධනය වී තිබුණද ඊට සාපේක්ෂව ජනතාවට ලබාදෙන සේවාවල කාර්යක්ෂමතාව ඉහළ මට්ටමක නොපවතී. බොහෝ විට සේවා සම්පාදනයේදී දේශපාලන හෝ වෙනත් සමාජ සම්බන්ධතාවයකින් හෝ අල්ලස් ලබා දීමකින් තොරව සේවාවක් ඉටුකර ගැනීම අතිශය දුෂ්කර කටයුත්තකි. ජනතාවගේ එදිනෙදා ප්‍රශ්න පිළිබඳ කටයුතු කරන ප්‍රධාන පෙළේ මහජන සේවා සම්පාදනය කරන ආයතන තුළත් මේ තත්වය බරපතළ ලෙස පවතී. වත්මන් රාජ්‍ය සේවයේ ව්‍යුහයත් එය තුළ තහවුරු වී ඇති නිලධාරිවාදයත් සේවාවන් කාර්යක්ෂමතාවයෙන් පවත්වාගෙන යාමට බාධා ඇතිකරයි. වත්මන් රාජ්‍ය සේවයේ ව්‍යුහය යළි සකස් කොට පොදු ජන සේවාවන් කාර්යක්ෂමව සිදු කෙරෙන ව්‍යුහයක් බවට පත් කළ යුතුය.

## ක්‍රියාමාර්ග

- කැබිනට් මණ්ඩලය සතු රාජ්‍ය සේවයේ නිලධාරීන් බඳවා ගැනීම්, උසස්වීම් හා සේවා දීර්ඝකිරීම් පිළිබඳ බලතල 19වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ ස්ථාපිත කොට ඇති ස්වාධීන කොමිෂන් සභාවලට ලබාදී රාජ්‍ය සේවයේ ස්වාධීනත්වය තහවුරු කිරීම
- සියලුම අර්ධ රාජ්‍ය ආයතනවල සියලු බඳවා ගැනීම්, උසස්වීම් හා සේවා දීර්ඝකිරීම් සඳහා ස්වාධීන කොමිෂන් සභාවක් පත් කිරීම
- රාජ්‍ය හා අර්ධ රාජ්‍ය සේවාවල සේවකයින්ගේ දක්ෂතාව, නිපුණතාව සහ ඉහළ සුදුසුකම් පිළිබඳ වාර්ෂික වාර්තා පවත්වාගෙන යමින් උසස්වීම්වලදී ඒවා සැලකිල්ලට ගැනීම
- රාජ්‍ය හා අර්ධ රාජ්‍ය සේවාවල සියලු බඳවා ගැනීම් තරග විභාගවලින් පමණක් සිදු කිරීම
- වසරක් ඇතුළත විවිධ රාජ්‍ය ආයතන තුළ අවිධිමත් ලෙස බඳවාගෙන ඇති හා ඌන සේවා සපයන කාර්ය මණ්ඩල පිළිබඳ විධිමත් සමීක්ෂණයක් සිදු කොට ඔවුන් සුදුසු සේවා ස්ථාන වෙත අනුයුක්ත කිරීම
- රාජ්‍ය සේවයේ වැටුප් විෂමතා ඉවත් කර සරල හා විද්‍යාත්මක වැටුප් ව්‍යුහයක් සකස් කිරීම සඳහා වන පූර්ණ බලැති කොමිසමක් පත් කිරීම
- රාජ්‍ය සේවයේ අල්ලස, දූෂණය හා වංචාව ඇතුළු සියලු මූල්‍ය අවභාවිතයන් වැළැක්වීම සඳහා පූර්ණ බලැති දූෂණ විමර්ශන මධ්‍යම කාර්යාංශයක් ස්ථාපිත කිරීම
- වාර්ෂික විගණන පරීක්ෂණ වාර්තා අනුව සියලු රාජ්‍ය ආයතනවලට අල්ලස් දූෂණ හා වංචා පිළිබඳ දර්ශකයක් ලබා දීම
- අල්ලස් දූෂණ හා වංචා පිළිබඳ චෝදනා නොලබා එලදායී ලෙස සේවයේ යෙදෙන රාජ්‍ය සේවකයින් ඇගයීමට ලක් කොට ත්‍යාග සහ දීමනා ලබා දීම

- තොරතුරු දැනගැනීමේ පනත ක්‍රියාත්මක කිරීමේදී ඇති බාධා ඉවත් කිරීම සඳහා අවශ්‍ය ව්‍යුහාත්මක වෙනස්කම් ඇති කිරීම
- රාජ්‍ය සේවයෙන් සිදුවන මූලික අයිතීන් උල්ලංඝනය වෙනුවෙන් ක්‍රියාත්මක වීම සඳහා නීති ආධාර සහ සහාය ලබාදෙන ස්වාධීන ආයතනයක් ස්ථාපිත කිරීම
- රාජ්‍ය ආයතනයක් මගින් ඉටු කරන සෑම අත්‍යවශ්‍ය මහජන කාර්යයක් සඳහාම යන උපරිම දින ගණනක් නියම කිරීම

# අධිකරණය

කාර්යක්ෂමව හා ස්වාධීනව යුක්තිය පසිඳලීමත් එලෙස යුක්තිය ඉටු කර ගැනීමේ ක්‍රියාවලියට කිසිදු සීමා කිරීමකින් තොරව මහජනතාවට ප්‍රවිෂ්ඨ වීමට ඇති හැකියාවත් ගුණාත්මක අධිකරණ සේවයකින් බලාපොරොත්තු වේ. එහෙත් නඩුකරයක් අවසන් වීම සඳහා දීර්ඝ කාලයක් ගතවීමත් ඒ සඳහා දැරිය යුතු මිල සාමාන්‍ය ජනතාවට දැරිය නොහැකි වීමත් එම ක්‍රියාවලිය මහජනතාවට සමීප නොවන්නක් සේ හැඟීයාමත් වත්මන් අධිකරණ ක්ෂේත්‍රය පිළිබඳ පවත්නා බරපතළ විවේචනයන් වේ.

## ක්‍රියාමාර්ග

- අධිකරණ කටයුතුවලට දේශපාලන මැදිහත්වීමකින් තොරව පවත්වාගෙන යාමටත් පත්වීම්, උසස්වීම් ලබාදීම දක්ෂතාව හා සුදුසුකම් මත පමණක් සිදු කිරීමටත් ඉඩකඩ ලැබෙන පරිදි වත්මන් අධිකරණ සේවා කොමිෂන් සභාව ස්වාධීන හා ශක්තිමත් කොට ස්ථාපිත කිරීම
- මූලික අයිතිවාසිකම් කඩවූ අවස්ථාවලදී රටේ ඕනෑම පුරවැසියෙකුට ශ්‍රේෂ්ඨාධිකරණයේදී නඩු පැවරීමට හැකි අයුරින් එහි කටයුතු විමධ්‍යගත කෙරෙන අතර ඊට අවශ්‍ය නීතිඥ සහය නොමිලේ ලබාදීමේ වැඩසටහනක් ක්‍රියාවට නැංවීම
- නඩු කල්යාම නිසා ජනතාව පීඩාවට පත්වීමත්, නඩු භාණ්ඩ දිරාපත්වීමෙන් ඇතිවන නාස්තියත්, අහිමි වන කාලයත්, ශ්‍රමයත් හේතුකොට ගෙන ඉතා කෙටි කාලයකින් අධිකරණ කටයුතු අවසන් කිරීමට කාර්යක්ෂම අධිකරණ පද්ධතියක් ස්ථාපිත කිරීම
- මේ යටතේ ඉඩම්, අපරාධ, මත්ද්‍රව්‍ය, ස්ත්‍රී දූෂණ, බාල අපරාධ ආදී විවිධ නඩු වර්ගය අනුව විසඳීමට ගත වන කාලසීමාව අවම කිරීම සඳහා අවශ්‍ය වන නීතිමය සංශෝධන ගෙන ඒම
- එසේම එම ක්‍රියාමාර්ග සාර්ථක කර ගැනීම සඳහා පොලීසිය, බන්ධනාගාරය, නීතිපති දෙපාර්තමේන්තුව, අධිකරණය සහ යුක්තිය පසිඳලීමේ ආයතන අතර ඒකාබද්ධ ප්‍රවේශයක් හා සංයුක්ත ව්‍යුහයක් සකස් කිරීම
- සියලුම ආකාරයේ අභියාචනා තීන්දු, මූලික අයිතිවාසිකම් නඩු තීන්දු මාස 05ක කාලයක් ඇතුළත අවසන් කිරීමට අදාළව අධිකරණ පද්ධතිය පුළුල් කිරීම

- අධිකරණයේ ස්වාධීනත්වය තහවුරු කරන අතර මූලික අයිතීන් උල්ලංඝනය රජයට එරෙහිව පමණක් නොව පෞද්ගලික අංශය හා වෙනත් ආයතනවලට එරෙහිවද කටයුතු කිරීමට පුරවැසියන්ට අයිතිය ලබාදීමේ නීති සංශෝධනය කිරීම
- නීති ආධාර දෙපාර්තමේන්තුවක් ස්ථාපිත කිරීම
- දැනට ගොඩගැසී ඇති අභියාචනා හා ශ්‍රේෂ්ඨාධිකරණ නඩු සියල්ල වසර 03ක කාලයක් ඇතුළත විසඳා අවසන් කිරීමට අවශ්‍ය විධිවිධාන සැලැස්වීම
- සාමාන්‍ය රථවාහන වැරදි, නව තාක්ෂණය යොදාගනිමින් හඳුනාගැනීමටත් ඒවා සම්බන්ධව අධිකරණයට නොගොස් දඩයක් පැනවීම මගින් විසඳා ගැනීමටත් කටයුතු කිරීම
- අධිකරණවල නඩු විසඳීම සඳහා ජාතික භාෂා යොදා ගැනීම සහ නඩු තීන්දු තමන් කැමති භාෂාවකින් ලබා ගැනීමට පාර්ශවකරුවන්ට අයිතිය ලබාදීම
- දිසා අධිකරණයට යොමු කරන නඩු කාර්යක්ෂමව විසඳීම සඳහා ක්‍රමවේදයක් ඇති කිරීම

# පොලිස් සේවාව

නීතිය සහ සාමය පවත්වා ගෙනයාමේදී මහජනතාවට වඩාත් සමීප ආයතනයක් ලෙස පොලීසිය ඉතා වැදගත් කාර්යයක් ඉටුකරයි. එමෙන්ම සමාජයක නීතියේ ආධිපත්‍යය තහවුරු වී ඇත්ද යන්න නිරූපනය වීමේදී පොලීසියේ ස්වාධීන ක්‍රියාකාරිත්වය අතිශය වැදගත් වේ. නමුත් වර්තමානයේ ශ්‍රී ලංකා පොලීසියෙන් ඉටුවන සේවාවන් පිළිබඳ ඇත්තේ තියුණු විවේචනයකි. දේශපාලන හෝ වෙනත් සමාජ සම්බන්ධතාවයක් හෝ මුල්‍ය ප්‍රදානයක් නොමැතිව පොලීසිය තුළින් සේවය ලබා ගැනීම අපහසුයැයි සමාජය දරන මතය නිසා පොලිස් සේවයේ ගෞරවනීය බව ගිලිහී ගොස් ඇත. ශ්‍රී ලංකා පොලිස් සේවය වඩාත් මහජනතාවට සමීප සේවාවක් බවට පත්කිරීමට හා එහි කාර්යක්ෂමතාව ඉහළ දැමීම තුළින් මිත්‍රශීලී පොලිස් සේවයක් නිර්මාණය කිරීමට පියවර ගැනීම අත්‍යවශ්‍ය වේ.

- පොලීසිය මහජනතාව සමග සමීප සම්බන්ධතාවක් ඇතිකිරීම සඳහා 'පොලිස් මහජන සබඳතා කමිටු' පිහිටුවීම
- පොලිස් සේවයේ සියලු පත්වීම්, උසස්කිරීම්, ස්ථාන මාරු දේශපාලනීකරණයෙන් තොරව සිදුකිරීම සඳහා පොලිස් කොමිසමට බලය පැවරීම
- පොලීසියට ලැබෙන සියලු පැමිණිලි මාස 06කට පෙර විමර්ශනය කර අවසන් කිරීම සහ එසේ කළ නොහැකි ලිපිගොනු පිළිබඳව පොලිස් කොමිසමට වාර්තා කිරීම
- අපරාධ විමර්ශනය සඳහා විද්‍යාත්මක පුහුණුව, නව තාක්ෂණික මෙවලම් සහ තොරතුරු තාක්ෂණය උපයෝගී කර ගැනීම
- පොලිස් සේවාව වෘත්තීමය පොලිස් සේවාවක් බවට පත්කිරීම සඳහා අවශ්‍ය දැනුම හා පුහුණුව ලබාදීම සඳහා පොලිස් විශ්වවිද්‍යාලය කඩිනමින් ස්ථාපිත කොට අපරාධ විද්‍යාව සහ අපරාධ යුක්තිය, පොලිස් මහජන සම්බන්ධතාවයන්, උපදේශනය, මනෝ විද්‍යාව වැනි ක්ෂේත්‍ර පිළිබඳව උපාධි පුහුණු පාඨමාලා හැදෑරීමට ඉඩ ප්‍රස්ථාව සලසා දීම

- වැටුප් හා දීමනා සමස්ත රාජ්‍ය සේවයට සමානුපාතිකව ඉහළ දැමීමටත්, අල්ලස්, දූෂණ, වංචාවන් පොලිස් සේවය තුළින් ඉවත්කිරීම සඳහා විශේෂ විමර්ශන ඒකකය වඩාත් ශක්තිමත්ව පොලිස්, සිවිල්, නීති යන ක්ෂේත්‍ර නිලධාරීන්ගෙන් සමන්විතව පිහිටුවීම සඳහා නීති සම්පාදනය කිරීමටත් කටයුතු කිරීම
- අනීතික අයුරින් මහජනතාවට සිදුකරනු ලබන බලපෑම්, පහරදීම්, බොරු පැමිණිලි සකස් කොට සිරගත කිරීම්, සහ දේශපාලන අවශ්‍යතා මත ජනතාවට සිදුකරනු ලබන හිරිහැර කිරීම්වලදී ඊට එරෙහිව ක්‍රියාත්මක වීමට නව අයුරින් ස්ථාපිත කරනු ලබන පොලිස් කොමිසම යටතේ ක්‍රියාත්මක පොලිස් විශේෂ විමර්ශන ඒකකයට බලය ලබාදීම
- දක්ෂ පොලිස් නිලධාරීන් ඇගයීම, මුදල් ත්‍යාග හා සහතිකපත් ලබාදීමේ වැඩපිළිවෙළක්ද, ඔවුන් හට විදේශ පුහුණුව ලබාදීමේ වැඩසටහනක්ද ක්‍රියාවට නැංවීම
- නිවසක හිමිකමක් නොමැති සියලු පොලිස් නිලධාරීන් හට නිවාස ලබාදීමේ වැඩසටහනක් ක්‍රියාවට නැංවීම

# පුරවැසි වගකීම

දියුණු ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක් නිර්මාණය කිරීමේ ක්‍රියාවලියේදී පුරවැසියා සක්‍රීයව රාජ්‍ය ක්‍රියාවලිය හා සම්බන්ධවීම අත්‍යවශ්‍ය වේ. පුරවැසිභාවය අර්ථ දැක්වීමේදී රාජ්‍යය තුළ නෛතිකව පුරවැසි හිමිකම ලබන සියලුම දෙනා සමාන පුරවැසියන් වන්නේය යන කරුණ අවධාරණය කරනු ලැබ ඇති අතර, දෙවන මට්ටමේ පුරවැසියන් සිටින රාජ්‍යයක් තුළ මානව ගෞරවය ආරක්ෂා නොවිය හැකිය යන්නත් අවධාරණය කරනු ලැබ ඇත.

## යෝජනා

- සෑම පුරවැසියෙක්ම තමන් සතුව පවත්නා විභවතාව සහ ශක්තීන් උපයෝගී කරගනිමින් ඒවා උද්දීපනය සහ ප්‍රවර්ධනය කර ගැනීම සඳහා අධ්‍යාපනයේ උපරිම ඵලය ලබාගත යුතුය. එබැවින් අධ්‍යාපනය ලැබීම හා දැනුමින් නිරන්තරයෙන් පොහොසත්වීම පුරවැසියාගේ යුතුකමක් හා වගකීමක් ලෙස පිළිගන්නා අතර ඒ සඳහා රාජ්‍ය නිදහස් අධ්‍යාපන ක්‍රියාවලිය භාවිත කිරීමට සෑම පුරවැසියෙකුටම ඇති අයිතිය තහවුරු කිරීම
- පුරවැසියාට සමාජයේ ගැටුම් අවම වන පරිදි හා ජාතීන් අතර සාමය ඇතිවන පරිදි ක්‍රියා කිරීමේ වගකීම හා යුතුකම පවතී. එම නිසා බහු සංස්කෘතික පරිසරයක වෙසෙන පුද්ගලයාගේ වගකීමක් වන්නේ සියලු සංස්කෘතීන්ට ගරු කරමින් සමාජීය සංහිඳියාව තහවුරු වන පරිදි කටයුතු කිරීම

- පුරවැසියා හා දේශපාලන පද්ධතිය අතර පවතින්නේ අන්‍යෝන්‍ය සම්බන්ධයක් බැවින් දේශපාලන ක්‍රියාවලිය ප්‍රජාතන්ත්‍රීයකරණයෙහිලා පුරවැසි වගකීම සුවිශේෂී වේ. දේශපාලන හා සමාජීය පද්ධතිය වඩාත් යහපත් කර ගැනීම සඳහා ප්‍රජාතන්ත්‍රවාදීව මැතිවරණ ක්‍රියාවලියට දායකවීම, නිවැරදි අපේක්ෂකයන් තෝරා පත්කිරීම, දේශපාලන පද්ධතියේ වංචාව, හා දූෂණයට එරෙහිව කටයුතු කිරීම ආදී කාර්යයන් පුරවැසියාගේ වගකීමක් වශයෙන් පිළිගනිමින් ඒ සඳහා ඔවුන් සක්‍රීය ලෙස දායක කර ගැනීම
- පුරවැසියා ධරණීය ආර්ථික හා පාරිසරික ක්‍රියාවලියට දායක කර ගැනීම; රාජ්‍යයේ සම්පත් හා ස්වභාවික පරිසරය අනාගත පුරවැසියන්ටද භාවිතයට ගැනීමට හැකි වන ආකාරයෙන් ප්‍රයෝජනයට ගැනීම හා පාරිසරික තුල්‍යතාව හා ආර්ථික යුක්තිය සැමට හිමිවන ආකාරයෙන් ක්‍රියාකිරීමේ වගකීමක් පුරවැසියන් සතුය

# නොසැලෙන ශ්‍රී ලංකාවක්

තිරසර ආර්ථිකයක් ගොඩනැගීමත් එහි ප්‍රතිලාභ ජනතාව අතර සාධාරණව බෙදාහැරීමත් නොසැලෙන ශ්‍රී ලංකාවක් ගොඩනැගීමේ පදනම වනු ඇත. කෘෂි, ධීවර, පශු, වැවිලි හා කර්මාන්ත ගොඩනැගීමේදී අනාගත අවශ්‍යතා සැලකිල්ලට ගනිමින් ලෝකය අත්පත් කරගෙන ඇති නවීන දැනුම හා තාක්ෂණය එම ක්ෂේත්‍ර තුළට කැඳවා ගත යුතුව ඇත.

ලෝකය හමුවේ අභිමානවත් රටක් බවට ශ්‍රී ලංකාව ඔසවා තැබීමේදී අපට ශක්තිමත් විදේශ ප්‍රතිපත්තියක්ද රජයේ දේශසීමා හා ජනතාවගේ ආරක්ෂාව පිළිබඳ නව අර්ථදැක්වීමක් සහිත ජාතික ආරක්ෂක ප්‍රතිපත්තියක්ද අවශ්‍යව තිබේ.

මෙම සියලු ක්ෂේත්‍රයන් තුළ අත්පත් කරගන්නා ජයග්‍රහණ විසින් නොසැලෙන ශ්‍රී ලංකාව ගොඩනැගෙනු ඇත.

# ගුණාත්මක ජීවිතයක් උදෙසා ප්‍රජා මූලික පරිසර හිතකාමී, තාක්ෂණය හා බද්ධ වූ නොසැලෙන ආර්ථිකයක්

## වත්මන් ආර්ථික අර්බුදයේ ස්වභාවය

නිදහසින් පසු වසර 71ක කාලය තුළ බලයට පත් වූ ආණ්ඩු අනුගමනය කළ විවිධ ආර්ථික ප්‍රතිපත්ති අපට උරුම කර දී ඇත්තේ විශාල ණය බරක් සහිත, ආර්ථික අසමානතාවයන්ගෙන් පිරි, තම ජීවිතය ගැටගසා ගැනීමට අප්‍රමාණව වෙර දරන, දරිද්‍රතාවයෙන් පෙලෙන, විදේශයන් මත යැපෙන, සමාජ, සංස්කෘතික හා පාරිසරික වටිනාකම් අලෙවි වන පරාධීන ආර්ථිකයකි.

1977 දී හඳුන්වාදුන් විවෘත ආර්ථික ප්‍රතිසංස්කරණවලින් පසුව විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කළද ඒවා හුදු ප්‍රලාප බවට පමණක් පත්වී ඇත. මෙහි අහිතකර ප්‍රතිඵල, මන්දගාමී ආර්ථික වර්ධනය, ආදායම් බෙදීයාමේ විෂමතාවය, දළ දේශීය නිෂ්පාදිතයට ප්‍රාදේශීය විෂම දායකත්වය, අහිතකර විදේශ විනිමය අනුපාතය, රැකියා වියුක්තිය, උද්ධමනය වැනි ආර්ථික දර්ශක මඟින් මනාව නිරූපනය වේ. 2017 වසරේදී ශ්‍රී ලංකාවේ ඒක පුද්ගල දළ දේශීය නිෂ්පාදිතය ඇමෙරිකානු ඩොලර් 4,065ක් වුවද මීට දශක පහකට පෙර අප හා සමාන ඒක පුද්ගල ආදායමක් ලැබූ දකුණු කොරියාව, සිංගප්පූරුව වැනි රටවල් එම අගයන් පිළිවෙළින් ඇමෙරිකානු ඩොලර් 30,000 හා 55,000 ඉක්මවා ඇත. ආදායම් බෙදී යාමේ විෂමතාවය සලකා බලන කල මුළු ජාතික ආදායමෙන් හරි අඩකට වැඩි ප්‍රමාණයක් එනම් 50.8% බෙදී යන්නේ රටේ ජනගහනයෙන් ධනවත්ම 20%ක ජනතාවක් අතරේ වන නමුත් දිළිඳුම 20%ක ජනතාවට හිමි වන්නේ 4.8%ක ඉතා කුඩා ප්‍රතිශතයකි. පවුල් ලක්ෂ 14කට වැඩි ජනතාවක් තවමත් සමෘද්ධි ප්‍රතිලාභ මත යැපීම මෙම තත්වය මනාව පැහැදිලි කරයි.

1955දී ආණ්ඩුවේ අයවැය රුපියල් මිලියන 117ක අතිරික්තයක් වාර්තා කළද 2017 වසර වන විට එය රුපියල් මිලියන 733,494ක හිඟයක් දක්වා පසුබෑමකට ලක්වී ඇත්තේ වැරදි ආර්ථික ප්‍රතිපත්ති, අකාර්යක්ෂම රාජ්‍ය මූල්‍ය කළමනාකරණය, නාස්තිය, වංචා හා දූෂණ හේතුවෙනි. රාජ්‍ය ආදායම, එහි පුනරාවර්තන වියදම පියවා ගැනීමට ප්‍රමාණවත් නොවන තත්වයකට පත්වී ඇත. අයවැය හිඟය හා ගෙවුම් ශේෂ හිඟය පියවා ගැනීමට හා ණය බේරුම් කිරීමට අඛණ්ඩව ණය ගැනීම නිසා නොපියවූ මුළු රාජ්‍ය ණය ප්‍රමාණය මේ වනවිට රුපියල් බිලියන 11,000 (රුපියල් කෝටි 1,100,000) ඉක්මවා ගොස් රට ඉතා බරපතළ ණය අර්බුදයක සිර කර ඇත. ඒ අනුව රටේ සැම පුරවැසියෙක්ම රු.525,000ක ණයකරුවෙක් බවට පත් කර ඇත. 2017 වසරේදී රජයේ ණය පොලිය හා වාරික ගෙවීම රුපියල් බිලියන 1,603ක් වූ අතර එය රජයේ මුළු ආදායමෙන් 90%කට ආසන්න ප්‍රමාණයකි. එවිට අධ්‍යාපනය, සෞඛ්‍යය, ආරක්ෂාව, සංවර්ධනය ඇතුළු අනෙකුත් සියලු වියදම් සඳහා ඉතිරි වන්නේ ආදායමෙන් 10%ක් තරම් වූ සුළු ප්‍රමාණයකි.

ප්‍රමාණවත් විදේශ විනිමයක් ඉපයීමට සමත් නිෂ්පාදන ආර්ථිකයක් නොතිබීම, අපනයනය මෙන් දෙගුණයක් ආනයනය කිරීම, විදේශ සංචිත ප්‍රමාණය ක්‍රමයෙන් පහළ යාම හේතුවෙන් රුපියලේ විදේශ අගය අඛණ්ඩව පිරිහෙමින් පවතී. මෙම තත්වය සෘජුවම විදේශ ආයෝජන දිරිමත් නොකිරීමටත් උද්ධමනය වර්ධනය කිරීමටත් බලපා ඇත. පාලනය නොකරන ලද උද්ධමනය හේතුවෙන් මූර්ත වේතනද සීඝ්‍රයෙන් පහළයමින් පවතී.

## ආර්ථික ප්‍රතිපත්ති පදනම් කරගන්නා මුලධර්ම

- අභිමානවත් පුරවැසියන් ලෙස ජාතික ආර්ථිකයට දායක වීම සඳහා අවස්ථා නිර්මාණය කිරීම සහ ආර්ථික ප්‍රතිලාභ මහජනතාව අතර සාධාරණ ලෙස බෙදාහැරීම
- ප්‍රාදේශීය ආර්ථික විෂමතාවයන් හා ආදායම් බෙදීයාමේ විෂමතාවය අවම කිරීම
- සමාගම් හෝ පුද්ගලයන් කිහිපදෙනෙක් අතර ආර්ථික බලය සංකේන්ද්‍රණය වීම වෙනුවට නිදහස හා සමානාත්මතාව මත පදනම් වූ ආර්ථික ප්‍රජාතන්ත්‍රවාදය ස්ථාපිත කිරීම
- ආහාර සුරක්ෂිතතාවය ඇති කිරීමේ, ණය විෂම චක්‍රයෙන් මිදීමේ හා ජාතික නිෂ්පාදනය වර්ධනය කිරීමේ හා ආරක්ෂා කිරීමේ ප්‍රතිපත්ති මඟින් ආර්ථික ස්වාධිපත්‍යය තහවුරු කිරීම
- ජෛව විවිධත්වය සහ පරිසර පද්ධතිය ආරක්ෂා කර ගනිමින් ස්වාභාවික සම්පත් තිරසාර ලෙස ප්‍රයෝජනයට ගැනීම
- මහජන ජීවිතය පහසු කිරීම හා ඵලදායිතාව වැඩි දියුණු කිරීම සඳහා උචිත තාක්ෂණය (Appropirate Technology) හා සුහුරු පාලන ක්‍රමවේද (Smart Governance Systems) මගින් ආර්ථික මෙහෙයුම් ඩිජිටල්කරණය කිරීම
- නිර්මාණශීලී බව, නවෝත්පාදනය, සමාජය හා මහජනතාව සතු ආවේණික දැනුම (Tacit Knowledge) සහ නිපුණතා (Competencies) නිෂ්පාදන ක්‍රියාවලිය තුළ යෙදවීම
- බාහිරව හා අභ්‍යන්තර ඇතිවන ඕනෑම පීඩනයකට ඔරොත්තු දිය හැකි නොසැලෙන ආර්ථිකයක් ගොඩනැගීම

## කර්මාන්ත

- කර්මාන්තයක නියැළීම සඳහා අවශ්‍ය ආර්ථික ප්‍රජාතන්ත්‍රවාදය සහතික කිරීමටත් ජෛව විවිධත්වය සහ පරිසර හිතකාමී බව සුරැකීමටත් උචිත කර්මාන්ත ආචාරධර්ම පද්ධතියක් සහ පරිචයක් හඳුන්වා දීම
- ආර්ථික සංවර්ධනයේ ගාමක බලවේගය ලෙස දේශීය ව්‍යවසායකත්වය සහිත ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ කර්මාන්ත ප්‍රවර්ධනය කිරීම
- කර්මාන්ත සංවර්ධනය සඳහා විශ්වවිද්‍යාල, රාජ්‍ය හා පෞද්ගලික පර්යේෂණ ආයතන සහ කර්මාන්ත ක්ෂේත්‍රයේ ප්‍රවීණයන් ඒකාබද්ධ කරමින් 'සමායෝජන පර්යේෂණ හා සංවර්ධන ආයතනයක්' පිහිටුවීම
- කාර්යක්ෂමතාවය, ඵලදායීතාවය සහ ගුණාත්මකභාවය වර්ධනය කිරීම, කර්මාන්තකරුවන්ගේ අවශ්‍යතාවය, ධාරිතාවය හා නිපුණතාවය පදනම් කර ගනිමින් උචිත තාක්ෂණය අත්පත් කරගැනීම සඳහා අවශ්‍ය රාජ්‍ය මැදිහත් වීම
- කර්මාන්ත ක්ෂේත්‍රය සඳහා නිෂ්පාදන, වෙළෙඳපොළ, තාක්ෂණය, අනාගත ප්‍රවණතා, පිරිවැය, ප්‍රාග්ධන අවශ්‍යතා, අවදානම් සහ වෙනත් ආර්ථික තොරතුරුවලින් සමන්විත 'මධ්‍යගත මාර්ගගත තොරතුරු පද්ධතියක්' (Centralized Online Information System) පිහිටුවීම
- අවශ්‍ය යටිතල පහසුකම් ලබාදෙමින් ගොවිපොළේ සිට කර්මාන්ත සම්බන්ධ කරන 'කෘෂි පාදක කර්මාන්ත ජාලයන්' (Agro Based Industry Networks) ප්‍රවර්ධනය කිරීම

- කෘෂි නිෂ්පාදන සහ මැණික් ඇතුළු ඛනිජ සම්පත් අමුද්‍රව්‍ය ලෙස අපනයන කිරීම වෙනුවට වටිනාකම් එකතු  කරන නව අපනයන නිෂ්පාදන කර්මාන්ත ස්ථාපිත කිරීම
- ගෝලීය සැපැයුම් දාමයන් (Global Supply Chains) සමග සම්බන්ධ වෙමින් ඉලෙක්ට්‍රොනික්, මෝටර් රථ හා පරිගණක මෘදුකාංග ක්ෂේත්‍රයන්හි ප්‍රමුඛස්ථානයක් අත්පත් කර ගැනීමට අවශ්‍ය පියවර ගැනීම
- ධීවර කර්මාන්තයේ නියැළෙන්නන් සැපයුම් දාමයකට සම්බන්ධ කර ගනිමින් හා අවශ්‍ය යටිතල පහසුකම් ලබාදෙමින් කර්මාන්තය සංවර්ධනය කිරීම
- කෘෂිකර්මාන්තය, ධීවර කර්මාන්තය හා ඉදිකිරීම් යන ක්ෂේත්‍ර සඳහා අවශ්‍ය කරන යන්ත්‍රෝපකරණ නිෂ්පාදනය කිරීම
- විදේශීය වෙළෙඳපොළ ඉලක්ක කරගනිමින් ප්‍රජා මූලික 'නිෂ්පාදන කර්මාන්ත ගම්මාන' පිහිටුවීම
- කාර්යක්ෂමතාවය හා ඵලදායීතාව වැඩි කිරීම සඳහා සේවකයින්ට අයිතිය ලබාගත හැකි පරිදි සේවක සමූපකාර (Worker Coops) ආයතන ව්‍යුහය හඳුන්වා දීම
- සේව්‍ය සේවක සහජීවනය තුළින් කාර්මික සමගිය තහවුරු කරන පාර්ශ්වකාර කළමනාකරණය (Stakeholder Management) සංකල්පය හඳුන්වාදීම
- නැව් ඉදිකිරීම හා ප්‍රතිසංස්කරණය සඳහා අවශ්‍ය යටිතල පහසුකම් ලබාදීම
- දැනට වසා දමා ඇති දේශීය කර්මාන්ත ශක්‍යතා අධ්‍යයන සිදු කොට නවීන තාක්ෂණය යොදා ගනිමින් නැවත ආරම්භ කිරීම
- තෙල් පිරිපහදුව වෙනම කර්මාන්තයක් ලෙස දියුණු කිරීම හා ඒ ආශ්‍රිත නිෂ්පාදන සඳහා කර්මාන්ත ජාලයක් පිහිටුවීම
- නවීන දැනුම හා තාක්ෂණය උපයෝගී කරගනිමින් තෝරාගත් ප්‍රාදේශීය සභා බල ප්‍රදේශ තුළ 'නිෂ්පාදන සැකසුම් හා වෙළඳ මධ්‍යස්ථාන 100ක්' පළමු වසර දෙක තුළ පිහිටුවීම
- රාජ්‍ය ආයතන සතු වාහන අලුත්වැඩියාව හා නඩත්තුව සඳහා නවීන තාක්ෂණය සහිත මධ්‍යස්ථාන පිහිටුවීම
- පවුල්-විනෝදාස්වාදය සඳහා වූ ජාත්‍යන්තර මට්ටමේ මධ්‍යස්ථාන (Theme Parks) පිහිටුවීම

## සේවා අංශය

### කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීම තුළින් වටිනාකම නිර්මාණය කිරීම.

- මධ්‍යගත තොරතුරු පද්ධතියක් තුළින් අවශ්‍ය පොදු සේවා පහසුකම් සැපයීම අධීක්ෂණය හා නියාමනය කිරීමට ආයතනික ව්‍යුහයක් ස්ථාපිත කිරීම හා එම සේවාවන්හි ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම සඳහා 'සමායෝජන සුහුරු පාලන පද්ධතියක්' (Integrated Smart Governance System) ස්ථාපිත කිරීම
- පොදු සේවා පහසුකම් වඩාත් කාර්යක්ෂමව සැපයීම සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධනය කිරීම

- මූල්‍ය, ප්‍රවාහනය, රක්ෂණය, පණිවිඩ හුවමාරුව, ලොජිස්ටික් කළමනාකරණය ඇතුළු අවශ්‍ය සේවා ක්ෂේත්‍රවලට විශේෂ අවධානය යොමුකරමින් ඒවා කෘෂිකාර්මික හා කර්මාන්ත ක්ෂේත්‍රයන් සමග සමායෝජනය කිරීම
- ජලය, විදුලිය, ඉන්ධන හා ගෑස් වැනි උපයෝගීතා සේවා අඛණ්ඩව, කාර්යක්ෂමව හා සාධාරණ මිල ගණන් යටතේ සැපයීම තහවුරු කිරීම
- යටිතල පහසුකම් සහ නවීන තාක්ෂණික අංගෝපාංගවලින් සමන්විත ගුණාත්මක හා කාර්යක්ෂම සේවා සපයනු ලබන ආර්ථිකයේ කේන්ද්‍රීය මෙහෙයුම් මධ්‍යස්ථානයක් ලෙස නාවුක කර්මාන්තය දියුණු කිරීම
- තාක්ෂණික පද්ධති (Technological Platforms) යොදාගනිමින් Business Process Outsourcing (BPO) මෙහෙයුම් වැඩි දියුණු කිරීම සඳහා අවශ්‍යම ගොඩනැගිලි හා ජාල සම්බන්ධතා ස්ථාපිත කිරීම

# වෙළෙඳාම

## සාධාරණ වෙළෙඳාම මගින් ආර්ථික ස්ථායීකරණය

- වෙළඳ ගිණුමේ පවතින විශාල හිඟය අවුරුදු පහක් ඇතුළත අතිරික්තයක් කරා ගෙන ඒම සඳහා උපායමාර්ග සැකසීම
- සුහුරු වෙළඳ පද්ධති (Smart Trading Platforms) ස්ථාපිත කිරීම මගින් අන්තර්ජාල වෙළෙඳාම හා M වාණිජ්‍ය (M Commerce) ප්‍රවර්ධනය කිරීම
- දේශීය නිෂ්පාදනවල ආරක්ෂාව, අත්‍යවශ්‍ය පරිභෝජනයට ප්‍රමුඛත්වය, ආහාර සුරක්ෂිතතාවය හා සාධාරණ වෙළඳාම යන මූලධර්ම මත පදනම්ව ආනයන වෙළඳ ප්‍රතිපත්ති සමාලෝචනය කිරීම සහ ප්‍රපාතන විරෝධී (Anti-Dumping) නීතිරීති ශක්තිමත් කිරීම සහ සාධාරණ වෙළෙඳාම (Fair -Trading) පිළිබඳව නව නීති රීති හඳුන්වාදීම
- පැය 24 පුරාවටම ක්‍රියාත්මක වන යටිතල පහසුකම්වලින් සමන්විත ප්‍රධාන වෙළඳ මධ්‍යස්ථාන අවශ්‍ය පරිදි සහ ක්‍රමෝපායික වශයෙන් වැදගත් ස්ථානවල ස්ථාපිත කිරීම
- අතරමැදි වෙළඳාමේදී සිදුවන අකාර්යක්ෂමතාවය සහ සූරාකෑම වැළැක්වීම සහ අතරමැදියා වටිනාකම් නිර්මාණය කරන්නකු බවට පරිවර්තනය කිරීම
- ප්‍රතිඅපනයන හා අන්තරාල වෙළඳාම (Entrepot Trade) අරමුණු කරගත් ආනයන සම්බන්ධයෙන් අගය එකතු කිරීමට මුල්තැන ලබා දෙන අතර දේශීය නිෂ්පාදනවල අනන්‍යතාවයට හානි නොවන පරිදි එම වෙළඳ කටයුතු මෙහෙයවීම
- ජාතික ආර්ථිකයට හානි නොවන පරිදි ජාත්‍යන්තර වෙළඳාමේදී සංසන්දනාත්මක තුලන වාසි (Comparative Advantages) ලබාගැනීමට කටයුතු කිරීම
- විශාල හා විවිධාකාර දත්ත විශ්ලේෂණය (Big Data Analytics) මගින් නව අපනයන වෙළඳපොළවල් සොයා ගැනීම, නව අපනයන භාණ්ඩ හඳුන්වා දීම, වෙළඳපළ ප්‍රවණතා, පාරිභෝගික මනාපයන් හා සැඟවුණු වෙළඳ රටාවන් හඳුනාගැනීම සහ ව්‍යවසායකයින් දිරිගැන්වීම
- උපායමාර්ගික භූගෝලීය පිහිටීම භාවිත කරමින් ඛනිජ තෙල් සහ ඒ ආශ්‍රිත නිෂ්පාදන වෙළඳපොළ සඳහා ආසියානු කේන්ද්‍රස්ථානය බවට ශ්‍රී ලංකාව පත් කිරීම

## ආයෝජනය

### 'සාධාරණ ප්‍රතිලාභයක් හා වටිනාකම් නිර්මාණය කිරීමක්'

- ආයෝජකයින් මුහුණ දෙන දුෂ්කරතාවයන් අවම කිරීම සඳහා වඩාත් කාර්යක්ෂම හා උසස් ගුණාත්මකභාවයකින් යුතු ක්‍රමවේදයක් හඳුන්වාදීම තුළින් ව්‍යාපාර කිරීමේ පහසුව (Ease of Doing Business) වැඩි දියුණු කිරීම
- හඳුනාගත් නව ව්‍යාපාර, රාජ්‍ය, පුද්ගලික හා ජනතා සහභාගිත්ව හවුල් ව්‍යාපාර (Public Private and People Partnerrships - 4Ps) ලෙස ස්ථාපිත කිරීමට අවශ්‍ය පහසුකම් සපයමින් ආයෝජන දිරිගැන්වීම
- උපායමාර්ගික වශයෙන් වැදගත් ක්ෂේත්‍ර සඳහා ප්‍රමුඛත්වය ලබා දෙමින් උචිත ආයෝජන ආකෘතීන් යටතේ විදේශ ආයෝජන කැඳවීම
- රජය සැලසුම් කරන ආර්ථික ඉලක්ක වෙත ළඟා වීමට දායක වන, ආර්ථිකයකට වටිනාකම් එකතු කරන ආර්ථික ක්‍රියාවලියට වගවන ක්‍රියාකාරී පාර්ශවකරුවෙක් ලෙස පෞද්ගලික අංශය හඳුනාගැනීම
- ශ්‍රී ලංකාව තුළ ඇති ආයෝජන අවස්ථාවන් ප්‍රවර්ධනය කිරීම සඳහා විදේශයන්හි සිටින ශ්‍රී ලාංකිකයන් සන්නාම ප්‍රවර්ධකයින් ලෙස ජාලගත ක්‍රමවේදයකට සංවිධානය කිරීම
- ජාතික ආර්ථිකය ශක්තිමත් කිරීමට උපායමාර්ගික වශයෙන් වැදගත් ක්ෂේත්‍රයන්හි ක්ෂුද්‍ර, සුළු හා මාධ්‍ය පරිමාණ කර්මාන්ත සඳහා ආයෝජකයින් දිරිමත් කිරීම
- ප්‍රාදේශීය සංවර්ධනය ඉලක්ක කරගනිමින් හා ආයෝජන විධිමත් ලෙස යොදා ගත හැකි අයුරින් දැනට පවත්නා විවිධ අරමුදල් ප්‍රතිව්‍යුහගත කිරීම තුළින් නව මධ්‍යගත සංවර්ධන අරමුදලක් පිහිටුවීම
- සමාගම්හි කොටස්වල ආයෝජනය කිරීම සඳහා එහි සේවකයින්ට අවස්ථාව ඇති විට එම කොටස් මිලදී ගැනීමට අවශ්‍ය ණය පහසුකම් ලබා දීම සඳහා විශේෂ ණය අරමුදලක් ඇති කිරීම
- පෞද්ගලික අංශයේ ආයෝජන ප්‍රසාරණය කිරීමේ ක්‍රමවේදයක් ලෙස 'සියයට එකක් (1%) - එක් හිමිකරුවෙක්' යන සංකල්පය යටතේ නව සමාගම් පද්ධතියක් ස්ථාපිත කිරීම

## මූල්‍යය

- පාරදෘශ්‍යභාවය හා මහජන වගවීම ආරක්ෂා වන ආකාරයෙන් දැනට ක්‍රියාත්මක මූල්‍ය අණ පණත් හා රෙගුලාසි, යාවත්කාලීන කිරීම හා නව ආර්ථික ප්‍රතිපත්තිවලට අනුකූලව නව නීති හඳුන්වාදීම මඟින් ශක්තිමත් මූල්‍ය විනයක් ඇති කිරීම
- ශ්‍රී ලංකා මහ බැංකුව සහ අනෙකුත් රජයේ මූල්‍ය ආයතන දේශපාලනීකරණයෙන් මුදවා ගැනීම හා එම ආයතනවලට සිදුකෙරෙන සියලු පත්කිරීම් දේශපාලන ඇඟිලි ගැසීම්වලින් තොරව වෘත්තීමය නිපුණතාවය සහ සුදුසුකම් මත සිදුකිරීම
- මහජනතාවගේ මූල්‍ය තැන්පතුවල සුරක්ෂිතභාවය තහවුරු කිරීමට සුවිශේෂී "තැන්පත් ආරක්ෂණ" ක්‍රමවේදයක් ක්‍රියාත්මක කිරීම හා එමගින් ඉතිරිකිරීම් දිරිගැන්වීම

- ආයෝජකයින් ආරක්ෂා කරගැනීමේ අරමුණෙන් ආයෝජන ආරක්ෂණ අරමුදලක් පිහිටුවීම
- විදේශීය රටවල සේවයේ නියුතු ශ්‍රී ලාංකිකයන් විදේශ මුදල් ලංකාවට ප්‍රේෂණය කිරීමේදී දැනට අයකරන බදු අහෝසි කිරීම හා ඒ වෙනුවට දිරිගැන්වීම් ලබාදීම
- උද්ධමනය කළමනාකරණය කිරීම හා මුදල් සැපයුම පාලනය කිරීමට පොලී අනුපාතයන් අඛණ්ඩව විමර්ශනය කිරීම; ඒවා උචිත පරිදි ගැලපීම හා බැංකු ක්‍රමය තුළ පොලී අනුපාත පරතරය නියාමනය කිරීම
- විනිමය අනුපාත අවදානම් අවම කිරීමට හා නව තාක්ෂණික වෙනස්වීම්වලට අනුකූල වන අයුරින් ක්‍රිප්ටෝ මුදල් වැනි අතත්‍ය (Vertual) ක්‍රමවේද හඳුන්වාදීමේ උචිත බව විමර්ශනය කිරීම හා ඒ අනුව ක්‍රියාමාර්ග ගැනීම
- ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත සහ කෘෂිකර්මාන්ත ක්ෂේත්‍ර සඳහා සහන පොලී අනුපාත යටතේ අවශ්‍ය ණය පහසුකම් හා උපදේශන සේවා ලබාදීමට විශේෂ බැංකු ජාලයක් ස්ථාපිත කිරීම
- ජනතාව අනවශ්‍ය ණයකරුවන් බවට පත් කරන සියලු ආකාරයේ අසංවිධිත ණය ක්‍රමවේද සහ ආයෝජනයන් (Ponzy Investment Schemes) වැළැක්වීම සඳහා කටයුතු කිරීම සහ ඒ වෙනුවට සංවිධිත අංශයේ ආයෝජන සහ ණය අවස්ථා පුළුල් කිරීම
- ප්‍රාග්ධන හා මූල්‍ය වෙළඳපොළ පුළුල් කිරීම, ස්ථාවර කිරීම, එහි ගනුදෙනුවල විනිවිදභාවය ආරක්ෂා කිරීම, අනිසි වෙළඳපොළ ක්‍රියාකාරකම්, අක්‍රමිකතාවන් හා දූෂණ ඉවත් කිරීම අරමුණු කරගනිමින් සුරැකුම්පත් හා විනිමය පනත හා අනෙකුත් නීති රීති යාවත්කාලීන කිරීම

## බදු ප්‍රතිපත්ති

- බදු ප්‍රතිපත්තියේ ඇති සංකීර්ණ බව හා විකෘතිතා ඉවත් කිරීමට සහ කාර්යක්ෂමතාව ඉහළ නැංවීමට පවතින බදු ප්‍රතිපත්ති සමාලෝචනය කර ප්‍රතිව්‍යුහගත කිරීම
- තීරණය කරනු ලබන අත්‍යවශ්‍ය පාරිභෝගික භාණ්ඩ සඳහා වැට් බදු නොපැනවීම
- බදු පරිපාලනයේ කාර්ක්ෂමතාවය වැඩිදියුණු කිරීම සඳහා සමායෝජන සුහුරු පාලන පද්ධති (Integrated Smart Governnace Systems) යොදාගැනීම
- ප්‍රගතිශීලී බදු අනුපාත යොදා ගනිමින් ඒ ඒ ආදායම් මට්ටම මත බදු බර (Tax Incidence) ගැලපීම හා අඛණ්ඩව බදු සීමාවන් සංශෝධනය කිරීම මගින් සාධාරණ බව තහවුරු කිරීම
- බදු ආදායමේ වක්‍ර බදු ප්‍රතිශතය අඩුවන පරිදි බදු ප්‍රතිපත්ති ව්‍යුහගත කිරීම
- අන්තර් ජාතික වෙළෙඳාම් කටයුතු කළමනාකරණය කිරීම සඳහා ආනයන මත උපායමාර්ගික තීරු බදු (Strategic Tariffs) හඳුන්වා දීම

# රාජ්‍ය ණය

- ණය තෝලනය (Leverage) මගින් ආර්ථිකයට ප්‍රතිලාභ ගෙන එම සඳහා තොරතුරු තාක්ෂණික පද්ධති (Platforms) උපයෝගි කරගනිමින් රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව ප්‍රතිව්‍යුහගත කිරීම
- දැනට පවතින සියලු රාජ්‍ය ණය ප්‍රතිලැයිස්තුගත කිරීම සඳහා ණය ලබාදුන් පාර්ශවයන් සමග සාකච්ඡා කිරීම
- ආර්ථිකයට වටිනාකම් එකතු කරනු ලබන උපායමාර්ගික හා සංවර්ධන ව්‍යාපෘති සඳහා ණය ලබාගන්නා අතර එම ණය භාවිතයේදී සමාන වත්කම් නිර්මාණය කිරීම හා ප්‍රතිලාභ ජනනය කිරීම සහතික වීම
- ණය ආපසු ගෙවීමේ හැකියාව, ආර්ථික සංවර්ධන අවශ්‍යතා, සමස්ත මුල්‍ය පිරිවැය හා අවදානම් මත පදනම්ව රාජ්‍ය ණය කාර්යක්ෂමව කළමනාකරණය කිරීම

# රැකියා නියුක්තිය සහ ශ්‍රම බලකාය

ජාතික ක්‍රියාකාරී ශ්‍රම බලකාය පුළුල් කිරීම, රැකියා වියුක්තිය හා ඌණ සේවා නියුක්තිය අවම කිරීම, ශ්‍රම ඵලදායීතාව වැඩි කිරීම සහ මානව සම්පත් සංචලතාව යන අරමුණු සාක්ෂාත් වන පරිදි ක්‍රමෝපායන් සකස්කිරීම

- රැකියා වෙළඳපොළට ප්‍රවේශ වීමට අපහසුතා ඇති හෝ ඒ සඳහා රුචිකත්වයක් නොදක්වන කාන්තාවන්, අර්ධ ආබාධ සහිත අය වැනි සමාජ කණ්ඩායම් උචිත පරිදි ඔවුන්ගේ අභිමතය මත නිෂ්පාදන ක්‍රියාවලියේ කොටස්කරුවන් බවට පත්කිරීම. ඒ අනුව;
  - ගෘහාශ්‍රිත කර්මාන්ත සඳහා අවශ්‍ය තාක්ෂණික පහසුකම් මූලික ප්‍රාග්ධනය ඇතුළු අනෙකුත් යටිතල පහසුකම් ලබා දීම
  - නිෂ්පාදන දාමයේ කිසියම් අවස්ථාවක ගෘහස්තව සිට දායක විය හැකි කර්මාන්ත හා සම්බන්ධ වීමට අවකාශ සලසා දීම
  - මාර්ගගත හා අර්ධකාලීන රැකියා ප්‍රවර්ධනය
  - ප්‍රජා මූල සංවිධාන ශක්තිමත් කරමින් ඒවාට දායකත්වය ලබා ගැනීම තුළින් නිෂ්පාදන ක්‍රියාවලියට සම්බන්ධ කර ගැනීම
  - විදේශයන්හි රැකියාවේ නියුතු සියලු වෘත්තිකයින් ශ්‍රම බලකායේ කොටසක් ලෙස නිල පිළිගැනීම ලබා දීම
- තරුණ සේවා නියුක්තිය ඉහළ දැමීමේ අරමුණින් වසරක කාලයක් තුළ අධ්‍යාපන මට්ටම් අනුව ශ්‍රම බලකාය වර්ගකොට හඳුනාගත් ක්ෂේත්‍ර සඳහා පුහුණු සැසි හා පාඨමාලා මගින් අඛණ්ඩ වෘත්තීය සංවර්ධනයක් ලබන සහතික ලත් පුහුණු ශ්‍රමිකයන් බිහිකිරීම
- සේවායෝජකයින් හා රැකියා වියුක්තිකයන් අතර තොරතුරු හුවමාරු කිරීමේ මධ්‍යස්ථානයක් ඇතිකර තොරතුරු තාක්ෂණික මෙවලම් හා ප්‍රාදේශීය පරිපාලන ඒකක භාවිත කරමින් සේවා වියුක්තිකයින් සුදුසු රැකියා සඳහා යොමු කිරීම
- වෘත්තීය ශ්‍රමිකයන් බිහිකිරීම මගින් සියලු රැකියා සඳහා පිළිගැනීමක් ඇතිකිරීම හා රැකියාවේ ගුණාත්මක බව වැඩිකිරීම

- දේශීය හා විදේශීය රැකියා අවස්ථාවලින් ප්‍රශස්ථ ප්‍රයෝජන ලබාගැනීමට ශ්‍රමිකයන් පුහුණු කිරීම සඳහා දීපව්‍යාප්ත වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කිරීම
- සෑම තෘතීයික අධ්‍යාපන ආයතනයකම ශිෂ්‍යයන් සහ සේවායෝජකයින් අතර අන්‍යෝන්‍ය සම්බන්ධතා පවත්වන විශේෂ සම්බන්ධීකරණ ඒකකයක් පිහිටුවීම
- සෑම වෘත්තිකයකුටම සිය ක්ෂේත්‍රයේ නව ප්‍රවණතා සහ අභියෝග පිළිබඳ අවබෝධය ලබා ගැනීම සඳහා අවස්ථා පුළුල් කිරීම
- ඒ ඒ වෘත්තීයට අදාළ නව තාක්ෂණික උපකරණ හා ඒවායේ භාවිතය පිළිබඳ දැනුම යාවත්කාලීන කිරීමට ක්‍රමවේදයක් සකස් කිරීම
- රැකියා අවස්ථා හා අවශ්‍ය සුදුසුකම් පිළිබඳ තොරතුරු ලබාගැනීමට හැකි තොරතුරු මධ්‍යස්ථානයක් පිහිටුවීම
- හැකි උපරිමයෙන් කෘත්‍රිම බුද්ධිය (AI) භාවිත කිරීම තුළින් මහජනතාවගේ වැඩකරන කාලය ක්‍රමිකව අඩුකිරීම හා ඉතිරි වන කාලය වෙනත් සමාජ, සංස්කෘතික හා පොදු වැඩකටයුතු සඳහා යෙදවීමට අවකාශය ලබාදීම
- අධ්‍යාපන සුදුසුකම්, දක්ෂතා හා නිපුණතා පදනම් කරගෙන රාජ්‍ය සංස්ථා, සංස්ථාපිත ආයතන සහ අනෙකුත් රාජ්‍ය අංශයේ ආයතන සඳහා දේශපාලන මැදිහත්වීම්වලින් තොරව සේවකයන් බඳවා ගැනීමේ යාන්ත්‍රණයක් ඇති කිරීම
- විද්‍යාත්මක පදනමක් මත පූර්ණ ශ්‍රම නියුක්තියට ළඟා වීම සඳහා මානව සම්පත් සැලසුම්කරණය, අධ්‍යාපන, සෞඛ්‍ය, තොරතුරු තාක්ෂණික ප්‍රතිපත්තීන් සමග සමායෝජනය කිරීම
- රැකියා අවස්ථා සඳහා තෝරාගැනීමේදී වෙනස්කම් නොකිරීමේ හා සැමට සම අවස්ථා ලබාදීමේ මූලධර්මය අනුගමනය කිරීම
- විශේෂ හේතූන් මත තවමත් ශ්‍රම බලකායට ඇතුළත් කරගැනීමට නොහැකි වූ සෑම අයෙකුටම මූලික අවශ්‍යතා සපුරා ගැනීමට අවශ්‍ය දීමනාවක් ලබාදීම
- වර්තමාන තත්වයට ගැලපෙන පරිදි හා ශ්‍රමය කාර්යක්ෂමව  ප්‍රයෝජනයට ගත හැකි පරිදි පවතින සියලු නීතිරීති හා අණපනත් සමාලෝචනය කිරීම හා නව නීති හඳුන්වාදීම
- පෞද්ගලික අංශයේ සියලු ස්ථරවල ශ්‍රමිකයන් ආවරණය වන පරිදි සෞඛ්‍ය/ ජීවිත රක්ෂණ ක්‍රමයක් හඳුන්වා දීම
- සියලු පුරවැසියන් අවරණය වන පරිදි සමාජ ආරක්ෂණ අරමුදලක් පිහිටුවීම
- දැනට පවතින විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමවල ඇති විෂමතාවන් ඉවත් කිරීම හා නව නීති හඳුන්වාදීම

# ඉදිකිරීම් ක්ෂේත්‍රය

- විද්‍යාත්මක හා අදේශපාලනික පදනමක පිහිටා ඉදිකිරීම් ව්‍යාපෘති ප්‍රමුඛතාකරණය කිරීම
- සමස්ත විශ්වවිද්‍යාල පද්ධතිය සම්බන්ධ කරමින් තිරසර ඉදිකිරීම් සංවර්ධනය සඳහා මධ්‍යම ඉදිකිරීම් පර්යේෂණ ආයතනයක් පිහිටුවීම
- රාජ්‍ය ඉදිකිරීම් ප්‍රසම්පාදනය තුළ දැනට සලකා බැලෙන පිරිවැය හා තාක්ෂණික කරුණුවලට අමතරව පරිසර හිතකාමී ලංසුවටද සම අගයක් ලබාදීම
- ඉදිකිරීම් හා තාක්ෂණ ආරවුල් විසඳීමේ විශේෂිත අධිකරණයක් පිහිටුවීම
- ඉදිකිරීම් කොන්ත්‍රාත්වලට අදාළව දින 90ක් ඇතුළත සියලු ගෙවීම් අවසන් කිරීමට අවශ්‍ය නීතිමය ප්‍රතිපාදන ගෙනවීම හා අවශ්‍ය ක්‍රමවේද හඳුන්වාදීම
- රාජ්‍ය ඉදිකිරීම් ප්‍රසම්පාදන ක්‍රියාවලිය තුළ අනාරාධිත ලංසු ලබා ගැනීම අධෛර්යමත් කිරීම හා දැනට පවතින රාජ්‍ය ප්‍රසම්පාදන ක්‍රියාවලිය තාක්ෂණය සමායෝජනය කිරීම තුළින් (Integration of Technology) තුළින් විධිමත් කිරීම
- දැනට ක්‍රියාත්මක සෙස් බද්ද ඉවත් කිරීම හා ඉදිකිරීම් ක්ෂේත්‍රයේ අසීමිතව ඉහළ ගොස් ඇති අමුද්‍රව්‍යවල මිල ගණන් පහත හෙළීමට ක්‍රියා කිරීම මගින් යොදන මුදලට උපරිම වටිනාකමක් ලබාගැනීමට හැකිවන පරිද්දෙන් සමස්ත සැපයුම් ජාලය නියාමනය කිරීම
- මහජන මත විමසුම අනිවාර්ය කොටගත් සැබෑ ශක්‍යතා අධ්‍යයන අත්‍යාවශ්‍ය ලෙස සැලකීම
- ජාතික ඉදිකිරීම් පුහුණු සංචිතයක් පිහිටුවීම හා එයින් නව තරුණ පුහුණු ශ්‍රමික පරපුරක් බිහිකිරීම හා සියලු දේශීය ඉදිකිරීම් සඳහා ඔවුන්ගේ පූර්ණ දායකත්වය ලබාගැනීම හා විදේශ වෙළඳපොළට පිවිසීමට අවශ්‍ය රාජ්‍ය මැදිහත්වීම ලබාදීම
- ඉදිකිරීම් ක්ෂේත්‍රයේ නියැලී සිටින සියලු පාර්ශවකරුවන් වෙනුවෙන් මධ්‍යගත ආරක්ෂණ හා විශ්‍රාම වැටුප් ක්‍රමයක් හඳුන්වා දීම

# සංචාරක කර්මාන්තය

- ආසියාවේ ආකර්ෂණීයම සංචාරක පාරාදීසය බවට ශ්‍රී ලංකාව පත්කිරීම
- ආර්ථික, සංස්කෘතික, පාරිසරික, හා සමාජීය ගැටලුවලින් තොර විශ්වාසවන්ත සංචාරක ව්‍යාපාරයක් ශ්‍රී ලංකාව තුළ නිර්මාණය කිරීම
- මානව සම්පත, සංචාරක ව්‍යාපාරයට සමායෝජනය කරගනිමින් ප්‍රජා කේන්ද්‍ර සංචාරක ව්‍යාපාරයක් නිර්මාණය කිරීම
- සංස්කෘතික, සමාජීය, පාරිසරික සහ පුරාවිද්‍යා වටිනාකම් ආරක්ෂා වන ආකාරයට රට තුළ සංචාරක කලාප වර්ග කිරීම සහ ප්‍රවර්ධනය කිරීම
- සංචාරක ව්‍යාපාරය  සංවර්ධනය කිරීම ඉලක්ක කර ගත් රාජ්‍ය උසස් අධ්‍යාපන ආයතනයක් ස්ථාපිත කිරීම

- සංචාරක මඟපෙන්වන්නන් ඇතුළු අනෙකුත් සේවා සපයන්නන් එකම ජාලයකට සම්බන්ධ කිරීම හා එම සේවා සැපයීම සඳහා පිළිගත් භාවිතයන් හා ආචාරධර්ම පද්ධතියක් සකස් කිරීම
- අධ්‍යාපන ක්ෂේත්‍රය සහ කාර්මික ක්ෂේත්‍රය සම්බන්ධ කරගනිමින් සංචාරක පර්යේෂණ හා සංවර්ධන ආයතනයක් ස්ථාපිත කිරීම
- සංචාරක කලාපයන්හි සාම්ප්‍රදායික වෛද්‍ය ක්‍රම, සම්භාහන ක්‍රම දේශීය කලා නිර්මාණ හා දේශීය ආහාර සංචාරකයින් අතර ජනප්‍රිය කරවීමට කටයුතු කිරීම
- සංචාරක කර්මාන්තයට අදාළව හෝටල් හිමියන්, සුපවේදීන් සහ අනෙකුත් කළමනාකරුවන්ට ලෝකයේ දියුණු සංචාරක කලාපවල දැනුම සහ අත්දැකීම් ලබාදීම
- පොලීසිය සහ ප්‍රජාව සම්බන්ධ කරගනිමින් හා සුහුරු පාලන පද්ධති උපයෝගී කරගනිමින් සංචාරකයන්ගේ ආරක්ෂාව තහවුරු වන පරිදි ආරක්ෂක වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කිරීම
- සංචාරකයන්ට පහසුවෙන් තොරතුරු ලබාගත හැකි වෙබ් අඩවියක් ඇතුළත්ව හෝටල් සහ ප්‍රවාහනකරුවන් සම්බන්ධ කරවන විශ්වාසවන්ත තොරතුරු යාන්ත්‍රණයක් නිර්මාණය කිරීම

# ශ්‍රී ලංකාවේ වැවිලි අංශය

තේ, රබර් සහ පොල් භෝග ප්‍රධාන ලෙසද, උක්, පාම් සහ කජු භෝග යම් ප්‍රමාණයකින්ද සමන්විත වූ වැවිලි ආර්ථිකය රටෙහි දළ දේශීය නිෂ්පාදිතයට 2% පමණ දායකත්වයක් ලබාදෙයි. වැවිලි භෝගයන් හෙක්ටයාර මිලියන 0.9ක් පමණ වූ වපසරියක වගා කරනු ලැබේ. සමස්ත ඉපයීම්වලින් දළ වශයෙන් 20% පමණ වැවිලි අංශයෙන් ලබාදෙන අතර එහි නිරපේක්ෂ වටිනාකම ඇමරිකානු ඩොලර් බිලියන 2.6ක් පමණ වේ. මෙම අංශය මගින් සෘජු හා වක්‍ර ලෙස ජනගහනයෙන් ආසන්න ලෙස මිලියන 1.5 ප්‍රමාණයකට රැකියා ලබාදේ. වැවිලි අංශයේ කොටසක් ලෙස වූ වතුකරයෙහි ජනතාවගේ පවුල් ආදායමෙහි සාමාන්‍යය, ගැමි සහ නාගරික ජනගහනයන්හි පවුල් ආදායමට සාපේක්ෂව ඉතාම අඩු අගයක් වාර්තා කරයි. එමගින් වැවිලි ආර්ථිකයෙහි දුගීභාවය පෙන්නුම් කරයි. මෙම ක්ෂේත්‍රයෙහි පාර්ශ්වකරුවන්ගේ සමාජ ආර්ථික ගැටලු වැවිලි කම්කරුවන් වැනි අඩුම ආදායම්කරුවන්ට පමණක් සීමා වී නැත. ඒවා ඉඩම් හිමියන්, වැවිලිකරුවන් වැනි ඉහළම ආදායම් ලබන්නන් හට මෙන්ම ක්ෂේත්‍රයට අදාළව පර්යේෂණයන්හි යෙදී සිටින මෙන්ම කාර්යාලීයව රැකියා කරනු ලබන මැදි ආදායම්ලාභීන්ටද බලපානු ලබයි. මෙම ගැටලු වසර ගණනාවක් පුරා පැවතෙනුයේ වත්මන් රජයද මීට පෙර පැවති රජයන්ගේද නොසලකා හැරීම මෙන්ම ඒවා ආමන්ත්‍රණය කිරීමට අපොහොසත්වීම පදනම් කරගෙනය.

## ප්‍රධාන වැවිලි ක්ෂේත්‍රයෙහි හඳුනාගත් ප්‍රධාන ගැටලු කිහිපයක්

- කුඩා තේ වතු ක්ෂේත්‍රයේ කම්කරු හිඟයක් ඇති අතර වතුකරයෙහි අඩු වැටුප් සහිතව කම්කරු අතිරික්තයක් ඇතිවන සේ පවතින අවිධිමත් කම්කරු ව්‍යාප්තිය

- අපනයන තේ වෙළඳපොලෙහි පහළ තරගකාරීත්වයක් පැවතීම
- ජාත්‍යන්තර වෙළඳපොළෙහි ස්වභාවික රබර් සඳහා ඇති ඉල්ලුම වැඩි වෙමින් ඇති පරිසරයක් තුළ විභවතාවන් සහිත වෙළඳපොළවල් සොයා ගැනීමට අපොහොසත් වීම
- නැවත වගා කිරීම පහළ අගයක පැවතීම, පොහොර භාවිතයේ මදකම සහ අතුරු භෝග ක්‍රියාකාරකම් අඩුවීම වැනි හේතු මත පදනම් වූ භූමි ඵලදායීතාව අඩුවීම
- ශ්‍රී ලංකා තේ යන නාමයට හානි අයුරින් සිදු වන තේ කුඩු අපනයනය හේතුවෙන් ජාත්‍යන්තර වෙළඳපොළෙහි තරගකාරීත්වයට බාධාවීම
- කාලගුණික විපර්යාසයන්ට එරෙහිව භාවිත කළ හැකි ශිල්පක්‍රම නොමැතිකම හමුවෙහි තේ නිෂ්පාදන ඵලදායීතාව අඩුවීම
- කම්කරු හිඟකම, තාක්ෂණික සහය මදකම, වගා ඉඩම් අහිමි වෙමින් තිබීම වැනි කරුණු ගණනාවක ප්‍රතිඵලයක් ලෙස පොල් නිෂ්පාදනය අඩු වීම

## ප්‍රතිපත්තිමය උපායමාර්ගයන්

වැවිලි ක්ෂේත්‍රයෙහි වූ සියලුම පාර්ශ්වකරුවන්ගේ ගැටලු සම්බන්ධීකරණය වන්නා වූ පොදු සාධකය ඵලදායීතාව වේ. එබැවින් ප්‍රතිපත්ති උපායමාර්ගයෙහි පොදු සාධකය වනුයේ රජය, කර්මාන්ත, පර්යේෂණ අංශ හා විශ්වවිද්‍යාල සමග දැඩි සමීන්ධතාවක් සමග වූ ඵලදායීතාව මත පදනම් වීම වේ. ඒ අනුව

- ජාත්‍යන්තර වෙළඳපළෙහි සාර්ථකවී ඇති තේ ආශ්‍රිත සහ ඒවා අවසන් නිෂ්පාදන ලෙස නිෂ්පාදනය කරන සමාගම් සඳහා දේශීය වෙළඳපොළෙහි තරග වාසි වැඩිකිරීමට කටයුතු කිරීම
- ඉහළ මටට්මක පවතින දේශීය තේ පරිභෝජනය උපයෝගී කරගෙන, තේ නිෂ්පාදනයෙහි එකතු කළ අගය වැඩි කරන නිෂ්පාදනයන් වැඩිකිරීම සඳහා පර්යේෂණ හා සංවර්ධනය සදහා තේ නිෂ්පාදනය කරන්නන් සහ පර්යේෂණ ආයතනයන් එක්ව කටයුතු කිරීමට අවශ්‍ය සහයෝගයන් ලබාදීම
- ඵලදායීතාව වැඩිකිරීමට මෙන්ම එකතු කළ අගය වැඩිකිරීම සඳහා මිශ්‍ර (Blender) කරන ලද තේ නිෂ්පාදනයට අවශ්‍ය උපකරණ සකස් කිරීමට විභවයන් සහිත වූ නිෂ්පාදනකරුවන් විශ්වවිද්‍යාල/පර්යේෂණ ආයතන හා එක්ව කටයුතු කිරීමට ඉඩප්‍රස්ථා සකස් කරදීම
- පොහොර සහනාධාර, නැවත වගා කිරීම, නව වගා ඇතිකිරීම්, සහ වගාවන්හි භෝග ප්‍රතිස්ථාපනය කිරීම සදහා සහනාධාර වැනි දැනටමත් ලබාදෙන සහනාධාර විමර්ශනය කිරීමෙන් පසු ක්‍රියාත්මක කිරීම හා නව සහනාධාර හඳුන්වා දීම
- ශ්‍රම ඵලදායීතාව වැඩිකිරීම සඳහා සියලුම වැවිලි ක්ෂේත්‍රයන්හි අවශ්‍යතාව හා විභවයන් හඳුනාගෙන නව සමාගම් සඳහා 4Ps ක්‍රමය හඳුන්වාදීම
- පර්යේෂණ ක්ෂේත්‍රයේ නියැලෙන්නන්ගේ වැටුප් වැඩිකිරීම සහ ඔවුන්ගේ ධාරිතාවන් පුළුල් කරමින් තත්වයෙන් උසස් පර්යේෂණ ප්‍රතිඵල ළඟාකර ගැනීම උදෙසා අවශ්‍ය සහ හැකියාව ඇති තැන්හි විශ්වවිද්‍යාල සහ පර්යේෂණ ආයතන ඒකාබද්ධ කළ හැකි වැඩපිළිවෙළක් හඳුන්වාදීම

- පොල් වගාව සඳහා හඳුනාගෙන ඇති සරු පස සහිත ඉඩම් වෙනත් කටයුතු සඳහා ලබා දීම සීමා කිරීම, පොල් වගාව සඳහා මෙතෙක් භාවිතා නොකළ සරු පස සහිත ඉඩම් හඳුනා ගැනීම, නව පොල් ප්‍රභේද හඳුනා ගැනීම සහ ඒවායෙහි තවන් කටයුතු සඳහා ඉඩම් ලබා දීම මෙන්ම පොහොර භාවිතය ක්‍රමවත් කිරීම වැනි ක්‍රියාමාර්ග මගින් ඵලදායීතාව වැඩි කිරීම
- සියලුම ක්ෂේත්‍රයන්හි ශ්‍රම ඵලදායීතාවය වැඩි කිරීම සඳහා නවීන තාක්ෂණික උපකරණ නිපදවීමට කටයුතු කිරීම

# කෘෂිකර්ම ප්‍රතිපත්තිය

රටක කෘෂිකාර්මික අංශය මගින් එම රටේ ජනතාවගේ ආහාර සුරක්ෂිතාවය තහවුරු කිරීමත් එම ක්ෂේත්‍රයේ නියැලී සිටින ජනතාවගේ ජීවන තත්වය උසස් කිරීමත් සිදුවිය යුතුය. එමෙන්ම රැකියා නියුක්තිය පුළුල් කිරීම, විදේශ විනිමය ඉපැයීම ආදිය මගින් ජාතික ආර්ථිකයට සැලකිය යුතු දායකත්වයක් සැපයීමද රටක කෘෂිකර්ම ක්ෂේත්‍රයෙන් ඉටු විය යුතුය. නමුත් ශ්‍රී ලංකාවේ පවතින කෘෂිකාර්මික ක්ෂේත්‍රය මගින් ඉහත අභියෝග ජයගැනීම අසීරු වී ඇත.

ශ්‍රී ලංකාව තවදුරටත් කෘෂිකාර්මික රටක් ලෙස සඳහන් කළද රටේ ආහාර අවශ්‍යතාවය ඉටු කර ගැනීම සඳහා වසරකට ඩොලර් බිලියන 1.8ක් එනම් සමස්ත ආනයන වියදමෙන් 10% පමණ වැය වේ. ආනයනය කරනු ලබන ඇතැම් ආහාර වර්ග එළවළු (වාර්ෂික වියදම ඩොලර් මිලියන 368) කිරි ආහාර (වාර්ෂික වියදම ඩොලර් මිලියන 315) වැනි දේශීයව නිපදවාගත හැකි ඒවා වීම කෘෂිකර්මාන්තයේ අකාර්යක්ෂමතාව පෙන්නුම් කරයි.

වසර ගණනාවක සිට දළ දේශීය නිෂ්පාදනයට කෘෂිකර්මාන්තයේ දායකත්වය ඉතා සීග්‍රයෙන් පහළ බසිමින් පවතී. වර්ෂ 1977 දී මෙහි ප්‍රතිශතය 31%ක් වූ අතර 2017 වනවිට එය 7.2%ක් දක්වා පහත වැටී ඇත. වසර 1977දී කෘෂිකර්මාන්තය මගින් සමස්ත අපනයන ආදායමෙන් 74%ක් වූ අතර එය 2017 දී 15%ක් දක්වා පහත වැටී ඇත.

රටේ ශ්‍රම බලකායෙන් 28.4%ක් කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ නියැලී සිටියෙදීත් එම සේවා නියුක්තිය මගින් රටේ දළ ජාතික නිෂ්පාදනයට දායක වන්නේ 7.1%ක් පමණක් වීමෙන් එම ක්ෂේත්‍රයේ ඇති දුර්වල ඵලදායීතාව පෙන්නුම් කරයි. මෙම අඩු ඵලදායීතාව නිසා එම අංශයේ සේවයේ නියුතු ජනතාවගේ ජීවන තත්වය ඉතාමත් පහත් අඩියකට වැටී ඇත. ග්‍රාමීය දරිද්‍රතාවයේ අතිබහුතරය ගොවීන් වීමෙන් එය මනාවට තහවුරු වේ.

## අරමුණු

- ජනතාවගේ ආහාර සුරක්ෂිතතාව ඇති කිරීම සඳහා කෘෂිකාර්මික ක්ෂේත්‍රය විධිමත් කර්මාන්තයක් බවට පත්කර ගැනීම
- කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ නියුතු ජනතාවගේ ජීවන තත්වය උසස් මට්ටමකට ගෙන ඒම සඳහා ඵලදායීතාව ඉහළ නැංවීම
- කෘෂිකාර්මික ක්ෂේත්‍රයෙන් ජාතික ආර්ථිකයට සැලකිය යුතු දායකත්වයක් දැක්වීම

- කෘෂි නිෂ්පාදන සඳහා සාධාරණ හා ස්ථාවර මිලක් ඇති කිරීම
- ජනතාවගේ පෝෂණ තත්වය ඉහළ මට්ටමක පවත්වාගෙන යාමට හැකිවන පරිදි ගුණාත්මක ආහාර නිෂ්පාදනයක් සහතික කිරීම
- තිරසාර කෘෂිකර්මාන්තයක් සඳහා වූ වගා සැලසුම් ඇති කිරීම, කෘෂි ක්ෂේත්‍රවල තිරසාර පැවැත්ම සහතික කිරීම

## ක්‍රියාමාර්ග

- පරිභෝජන සහ අපනයන අවශ්‍යතාවයන් සහ කෘෂිකාර්මික කලාපවල ශක්‍යතාවයන් සැලකිල්ලට ගනිමින් ජාතික කෘෂිකාර්මික සැලැස්මක් සකස් කිරීම
- නවීන තොරතුරු තාක්ෂණය භාවිතා කරමින් ජාතික කෘෂිකාර්මික සැලැස්ම ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය වන කෘෂිකාර්මික දත්ත පද්ධතියක් සකස් කොට එය යාවත්කාලීනව පවත්වාගෙන යාම
- ඉහත දත්ත පද්ධතිය භාවිතා කරමින් ඒ ඒ වගා කන්න සඳහා වන සැලස්ම සකස්කොට එය ප්‍රාදේශීය නිෂ්පාදන ඒකකය මගින් ක්‍රියාත්මක කිරීම

## නිෂ්පාදන වියදම අවම කර ඵලදායීතාවය ඉහළ නංවාගැනීම

### යාන්ත්‍රීකරණය

ශ්‍රම හිඟයට පිළියමක් සහ ඵලදායීතාව ඉහළ නැංවීම සඳහා  සෑම කෘෂිකාර්මික ක්ෂේත්‍රයක් සඳහා සෑම වඩාත් ගැලපෙන යාන්ත්‍රීකරණයක් හඳුන්වා දෙනු ලැබේ.

- වගාබිම් ඒකකය විශාල කිරීම සඳහා කැබලි වී ඇති කෘෂිකාර්මික ඉඩම් (ශ්‍රී ලංකාවේ ඒක පුද්ගල ගොවි ඉඩම් පරිභෝජනය හෙක්ටයාර් 0.5ට වඩා අඩුය) ඒකරාශි කර සාමූහික නිෂ්පාදන ඒකක ඇති කිරීම
- ගොවීන්ට අවශ්‍ය යන්ත්‍රෝපකරණ නොමිලේ ලබා දීම සඳහා ප්‍රාදේශීය යාන්ත්‍රෝපකරණ මධ්‍යස්ථාන සෑම ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයකම ඇතිකිරීම
- ආනයනය කරන කෘෂිකාර්මික යන්ත්‍ර සූත්‍ර සඳහා බදු සහන ලබාදීම
- ආනයනික යන්ත්‍ර සූත්‍ර සඳහා ක්ෂේත්‍ර ගැලපුම් සහ තත්ව පාලන ක්‍රමවේදයක් හඳුන්වාදීම
- විවිධ කෘෂිකාර්මික කලාප සහ බෝග සඳහා සුදුසු යාන්ත්‍රීකරණ ක්‍රම පිළිබඳ සහ කෘෂි යාන්ත්‍රෝපකරණ පිළිබඳ පර්යේෂණ කරන මධ්‍යස්ථාන සෑම දිස්ත්‍රික්කයකම ඇති කිරීම

## බීජ හා රෝපණ ද්‍රව්‍ය සුලභ කිරීම

- බීජ අවශ්‍යතාවයෙන් 15%ක් ලබාදීම ඉලක්ක කර ගනිමින් රජයේ බීජ නිෂ්පාදන ගොවිපළ නවීකරණය කිරීම
- අවශ්‍යතාවයෙන් 35%ක් ලබා ගැනීම සඳහා බීජ නිෂ්පාදන ගම්මාන ඇති කිරීම
- දේශීය පෞද්ගලික අංශයේ බීජ නිෂ්පාදනය දිරිමත් කිරීම

- බීජවල තත්වය නියාමනය සඳහා කිරීම හා වෙළඳපොළ හඳුන්වා දීම
- විශ්වවිද්‍යාල සමග ඒකාබද්ධව පර්යේෂණ කටයුතු කිරීම සඳහා සෑම දිස්ත්‍රික්කයකම බීජ පර්යේෂණ මධ්‍යස්ථාන ඇති කිරීම
- දෙමුහුන් එෆ්.01 බීජ නිෂ්පාදන සඳහා පර්යේෂණ දියුණු කිරීම
- දේශීය දෙමුහුන් බීජ නිෂ්පාදනය සිදුකිරීම

## පාංශු සංරක්ෂණය

- පාංශු පෝෂණ තත්වය වැඩි දියුණු කිරීම සඳහා කෘෂිකාර්මික කලාපවලට විශේෂ වූ පාංශු සංරක්ෂණ සැලැස්මක් හඳුන්වා දීම
- ක්ෂුද්‍ර පෝෂණ පොහොර භාවිතය ප්‍රචලිත කිරීම
- පාංශු පෝෂණය දියුණු කිරීම සඳහා කාබනික පොහොර භාවිතය දිරිගැන්වීම සඳහා තාක්ෂණය හා මුල්‍යමය ආධාර ලබාදීම
- ජංගම පාංශු පර්යේෂණ ඒකක මගින් කරනු ලබන පර්යේෂණ පදනම් කරගෙන අවශ්‍ය පොහොර වර්ග හා ප්‍රමාණ නිර්දේශ කිරීම
- පාංශු සංරක්ෂණ පනත යාවත්කාලීන කිරීම
- නිෂ්පාදන ඵලදායීතාව පදනම් කර ගනිමින් බෝග සඳහා නිෂ්පාදන දිරි දීමනා හඳුන්වාදීම
- පොහොර සඳහා විද්‍යාත්මක තත්ව පාලන ක්‍රමවේදයක් හඳුන්වාදීම
- දේශීය පොහොර නිෂ්පාදනය දිරිමත් කිරීම සඳහා බදු සහන හා අනෙකුත් මූල්‍ය ආධාර සමග තාක්ෂණික සහාය ලබාදීම
- පැලෑටි සංරක්ෂණය විධිමත්ව සිදුකිරීම
- පාරිසරික හානිය අවම වන පරිදි කෘෂි රසායන භාවිතය
- ඒකාබද්ධ පළිබෝධ පාලන ක්‍රම අනිවාර්ය කිරීම
- ශාඛ හා සජීවී ද්‍රව්‍ය ආනයනය හා අපනයනය විධිමත් කිරීම සඳහා පැලෑටි සංරක්ෂණ පනත හා පැලෑටි නිරෝධායන පනත යාවත්කාලීන කිරීම
- පාලනයෙන් තොරව රසායනික ද්‍රව්‍ය භාවිතය අවම කිරීම සඳහා තාක්ෂණික නිලධාරින්ගේ නිර්දේශ මත පමණක් ඒවා විකිණීම හා භාවිතය අනිවාර්ය කිරීම
- ක්ෂීරපායී පළිබෝධකයින් සහ කුරුල්ලන් පාලනය කිරීම හා විද්‍යානුකූලව මර්දනය කිරීම

## කෘෂි ව්‍යාප්ත සේවාව

- නිෂ්පාදන ඵලදායීතාවය වැඩිකිරීම පදනම් කරගත් සැලසුම් සහගත කෘෂි ව්‍යාප්ති සේවාව නැවත ස්ථාපනය කිරීම
- නිෂ්පාදන ඒකක පදනම් වූ මුහුණට මුහුණ හමුවීමේ ව්‍යාප්ති ක්‍රමවේදයක් හඳුන්වා දීම

- ගොවි පවුල් 400කට අවම වශයෙන් එක් ව්‍යාප්තිකාරකයෙකු පත්කිරීම
- ව්‍යාප්තිකාරකයන්ද සඳහා නව දැනුම, කුසලතා හා ආකල්ප යාවත්කාලීන කිරීම සඳහා සෑම මාසයකට වරක් ධාරිතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
- ප්‍රතිසංවිධානය කරනු ලබන ගොවි සංවිධාන ජාලය හා ව්‍යාප්ති ක්‍රමවේදය සම්බන්ධ කරමින් වඩා කාර්යක්ෂම ව්‍යාප්ති ක්‍රමවේදයක් දියත් කිරීම
- ජලය අපතේ යාම වැළැක්වීම සඳහා විද්‍යාත්මක ජල කළමනාකරණ හා වාරි සැලැස්මක් ඇති කිරීම
- බහුකාර්ය ජලාශ යෝජනා ක්‍රමවල ඇති ජලය කෘෂිකාර්මික ජල පරිභෝජනයට ප්‍රමුඛත්වය ලැබෙන සේ ජාතික ජල කළමනාකරණ ප්‍රතිපත්තියක් ඇති කිරීම
- එල්ලංගා පද්ධතීන් හා කුඩා වැව් පද්ධතිය වසර දෙකක් තුළ පුනරුත්ථාපනය හා සංවර්ධනය කිරීම
- ක්ෂුද්‍ර ජල සම්පාදන පද්ධති භාවිතය දිරිමත් කිරීම සඳහා ප්‍රදේශ හා බෝග රටා අනුව සහන සැලසීම
- කාර්යක්ෂම ජල පරිභෝජනයත් ජල සංරක්ෂණයත් අරමුණු කර ගනිමින් ගොවීන්, ක්ෂේත්‍ර නිලධාරින් හා ඒකාබද්ධ වූ ජල කළමනාකරණ කමිටු පිහිටුවීම
- වැසි ජලය එකතු කිරීම, සූර්ය බලයෙන් ක්‍රියාත්මක උස්සාන වාරිමාර්ග ක්‍රම හඳුන්වා දීම
- නළ ළිං සහ වගා ළිං ඇති කිරීම
- කෘෂිකර්ම ක්ෂේත්‍රයට අවශ්‍ය නැනෝ හා ජෛව තාක්ෂණය ප්‍රචලිත කිරීමට පර්යේෂණ මධ්‍යස්ථාන සෑම පළාතකම ඇති කිරීම
- කෘෂි දේශගුණික කලාප පදනම්ව දේශගුණික විපර්යාසවලට අනුකූල වගා ක්‍රම හා බෝග ප්‍රභේදයන් හඳුන්වා දීම
- ආරක්ෂිත ගෘහ තුළ බෝග වගාව (Green house Cultivation) සඳහා රුපියල් මිලියනයක් දක්වා පොලී රහිත ණය ලබා දීම
- කෘෂි නිෂ්පාදන සඳහා සහතික මිලක් නියම කොට එය නීතිගත කිරීම
- කෘෂි දේශගුණික කලාප හා නිෂ්පාදනය පදනම්ව කෘෂි ආර්ථික මධ්‍යස්ථාන අවම වශයෙන් 86ක් ඇතිකිරීම
- කෘෂි නිෂ්පාදන සඳහා ඉදිරි වෙළඳ ගිවිසුම් ප්‍රචලිත කිරීම
- ආනයන ආදේශන කෘෂි නිෂ්පාදන දිරිගැන්වීම

### පසු අස්වනු නාස්තිය වැළැක්වීම

- අස්වැන්නේ ගුණාත්මකභාවයට හානි නොවීම හා අපතේ යෑම අවම කිරීම සඳහා නවීන තාක්ෂණය යොදා ගැනීමට කරනු ලබන පර්යේෂණ දිරි ගැන්වීම
- පසු අස්වනු තාක්ෂණික ආයතනයේ පර්යේෂණ ප්‍රතිඵල මත නව කර්මාන්ත ඇති කිරීම සඳහා බදු සහන සහ සහනදායී ණය ලබා දීම

- තෝරාගත් බෝග සඳහා අස්වනු නෙළීම ගබඩාකරණය ඇසුරුම්කරණය හා ප්‍රවාහනය පිළිබඳ ප්‍රමිතීන් හඳුන්වාදී ඒවා නීති බවට පත් කිරීම
- තෝරාගත් බෝග සඳහා ගබඩාකරණ පහසුකම් ඇති කිරීම සඳහා ලියාපදිංචි ගොවි සංවිධානවලට පොලී රහිත ණය ලබා දීම
- වටිනාකම් එකතුකිරීමේ කුඩා හා මධ්‍ය පරිමාණ කර්මාන්ත සෑම දිස්ත්‍රිකයකම අවම වශයෙන් එක බැගින් පිහිටුවීම

### අපනයන කෘෂිකර්මාන්තය

- සුළු අපනයන කෘෂිකර්මාන්තය මුහුණ දෙන ගැටලු පිළිබඳ අධ්‍යයනය කිරීම සඳහා කමිටුවක් පිහිටුවීම
- නිෂ්පාදන මිලදී ගැනීම සඳහා තරගකාරී මධ්‍යස්ථාන ඇති කිරීම
- නව වගා ප්‍රදේශ සහ බෝග වර්ග හඳුනාගැනීම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
- නිෂ්පාදනවල ගුණාත්මකභාවය වැඩි කිරීම සහ තත්ව පාලනය සඳහා නව පර්යේෂණ ඇති කිරීම
- නිෂ්පාදන ජාත්‍යන්තර වශයෙන් ප්‍රචලිත කිරීමට එක් එක් කලාප සඳහා වෙළඳ ප්‍රචාරණ මධ්‍යස්ථාන ඇති කිරීම
- සුළු අපනයන බෝග සඳහා ව්‍යාප්ති සේවයක් ඇතිකිරීම
- නිෂ්පාදනයේ අගය එකතු කිරීමේ කර්මාන්තයට අවශ්‍ය යන්ත්‍ර සූත්‍ර සඳහා බදු සහන ලබා දීම
- ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූල ඇසුරුම්කරණය සඳහා නිෂ්පාදකයින් දිරි ගැන්වීම

# පශු සම්පත්

ජනතාවගේ අත්‍යවශ්‍ය පෝෂණය සැපයීමේදීත් ග්‍රාමීය ආර්ථිකය නැංවීමේදීත් පශු සම්පත් ක්ෂේත්‍රය ඉතා වැදගත් කාර්යක් ඉටු කරයි. විශේෂයෙන් සත්ව ප්‍රෝටීන් අවශ්‍යතාවය සපුරා ගැනීම සඳහා කිරි, මස්, බිත්තර සහ ඒවායේ අතුරු නිෂ්පාදනයන් පුළුල් කිරීමත් ඒ මගින් ග්‍රාමීය රැකියා අවස්ථාවන් සුලභ කිරීමත් මෙම අංශයේ ප්‍රධාන කාර්යයන් වේ. නමුත් ශ්‍රී ලංකාවේ කුකුල් මස් හා බිත්තර නිෂ්පාදනය හැර අනෙකුත් පශු සම්පත් අංශ කර්මාන්ත ලෙස වර්ධනය නොවීම නිසා පශු සම්පත් ක්ෂේත්‍රය තුළ මූලික ඉලක්ක සපුරා ගැනීම අසීරු වී තිබේ. රට තුළ වාර්ෂිකව පරිභෝජනය කරනු ලබන කිරි හා කිරි ආශ්‍රිත නිෂ්පාදනවලින් 65%ක් ආනයනය කරන අතර ඒ සඳහා වාර්ෂිකව රුපියල් බිලියන 49ක් වැයවේ. එය වාර්ෂිකව රටේ අධ්‍යාපනය සඳහා වැය කරන රුපියල් බිලියන 45ට වඩා වැඩි අගයකි. කිරි නිෂ්පාදන ක්ෂේත්‍රයේ ඉතා විශාල කොටසක් (90%) තවමත් සුළු පරිමාණ ගොවීන් අතර පැවතීමත් නිෂ්පාදන ඵලදායීතාව ඉතා පහළ මට්ටමක පැවතීමත්, කර්මාන්තයක් ලෙස සංවර්ධනය නොවීමත් නිසා පශු සම්පත් ක්ෂේත්‍රය තුළ කිරි නිෂ්පාදනය සඳහා වන ඉලක්කය සපුරා ගැනීම අසීරු වී ඇත.

## අරමුණු

- පශු සම්පත් ක්ෂේත්‍රයේ සියලු අංශ සංවිධිත කර්මාන්ත බවට පත්කරමින් ගුණාත්මක සත්ව හා කිරි අහාර නිෂ්පාදන ජනතාවට ලබා දීමට කටයුතු කිරීම
- ඵලදායීතාව ඉහළ නැංවීම සහ නිෂ්පාදන සඳහා ස්ථාවර වෙළඳපොළක් ලබාදීම මගින් පශු සම්පත් ක්ෂේත්‍රයේ නියලී සිටින කර්මාන්තකරුවන්ගේ ජීවන තත්වය ඉහළ නැංවීම
- සත්ව හා කිරි ආහාර ආනයනය සඳහා වාර්ෂිකව වැයකරන මුදල රට තුළ රඳවා ගැනීමට හැකිවන පරිදි හා අපනයනය ඉලක්ක කර ගනිමින් නිෂ්පාදන ධාරිතාව ප්‍රමාණාත්මකව ඉහළ නැංවීම සහ විවිධාංගීකරණයට ලක් කිරීම
- ග්‍රාමීය ආර්ථිකය ඉහළ නැංවීම සඳහා පශු සම්පත් ක්ෂේත්‍රය දායක කර ගැනීම

## කිරිගව ක්ෂේත්‍රය

### කිරි නිෂ්පාදන ගොවිපළ සංවර්ධනය

- දැනට පවතින සුළු පරිමාණ ගොවි ඒකක ආර්ථිකව වාසි ලබන මධ්‍ය මට්ටමේ වාණිජ ඒකක බවට පරිවර්තනය කිරීම
- මහා පරිමාණ වාණිජ ගොවිපළවල් ඇති කිරීම සඳහා දිරි ගැන්වීම සහ ගොවිපළවල් යාන්ත්‍රීකරණය කිරීම
- යන්ත්‍ර හා අදාළ යෙදවුම් සඳහා අඩු පොලී ණය, බදු සහන හා ආධාර ලබා දීම
- කිරි ගොවීන් සඳහා අවශ්‍ය වන උසස් තත්වයේ පැටවුන් ලබා ගැනීම සඳහා ආනයන කරන ලද සතුන් සහිත න්‍යෂ්ටික ගොවිපළ ඇති කිරීම
- ප්‍රාදේශීය පශු වෛද්‍ය කොට්ඨාස මූලිකත්වයෙන් ගොවිපළ පද්ධති කාර්යක්ෂමය (Farm System Efficiency) වැඩි කිරීම සඳහා ක්‍රමවේදයක් සකස් කිරීම
- දැනට ලංකාවේ බහුලව පවතින සත්ව රෝග මැඩපැවත්වීම හා තුරන් කිරීම සඳහා ජාතික වැඩපිළිවෙළක් සකස් කිරීම

### කිරි හා යෙදවුම් අලෙවිකරණය

- ප්‍රාදේශීය කිරි අලෙවි කරන මධ්‍යස්ථාන ඇති කිරීම මගින් දියර කිරි ශීත කිරීම පැස්චරීකරණය හා බෙදා හැරීමේ ජාලයක් සකස් කිරීම
- කිරිවල ගුණාත්මකභාවයට හා පරිමාව අනුව සකස් වුණු ගෙවීමේ ක්‍රමයක් සකස් කිරීම
- කිරි මගින් පිටිකිරි සකස් කිරීමට හා පිටිකිරි පරිභෝජනය අවම කිරීමටත් දියර කිරි පරිභෝජනය වැඩි කිරීමත් රාජ්‍ය හා පුද්ගලික අංශ මැදිහත් කිරීම
- වාණිජ තෘණ අලෙවිකරණ මධ්‍යස්ථාන සඳහා රාජ්‍ය පුද්ගලික අංශය දිරිමත් කිරීම

### කුකුල් මස් නිෂ්පාදනය

- උසස් ප්‍රමිතියෙන් යුත් මස් නිෂ්පාදනය කරන ආයතනවල අපනයන දිරිමත් කරන වැඩපිළිවෙළක් සකස් කිරීම
- කුකුල් නිෂ්පාදන සඳහා අවශ්‍ය යෙදවුම් අඩු මිලට ලබා ගැනීම සඳහා (දේශීය හෝ අන්තර් ජාතික) වැඩපිළිවෙළක් සකස් කිරීම
- කර්මාන්තය සඳහා අවශ්‍ය තාක්ෂණික සහය ලබා දීමට පර්යේෂණ හා ව්‍යාප්ති මධ්‍යස්ථාන ඇති කිරීම

# ධීවර හා ජලජ සම්පත් කර්මාන්තය

මානව සම්පතෙහි නිර්මාණාත්මක ධාරිතාව හා වර්ධනය රටක් වශයෙන් සංවර්ධනය වීම සඳහා අත්‍යවශ්‍ය වේ. ඒ සඳහා අවශ්‍ය මොළයේ ක්‍රියාකාරීත්වයට ඉවහල් වන අත්‍යවශ්‍ය ඇමයිනෝ අම්ල ලබාගත හැකි පහසුම මූලාශ්‍රය සත්ව ප්‍රෝටීන වේ. මෙරට සත්ව ප්‍රෝටීන අවශ්‍යතාවයෙන් 54%ක් ලබා දෙනු ලබන මත්ස්‍ය හා මත්ස්‍ය ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්තය ආහාර සුරක්ෂිතතාව, පෝෂණය හා ආර්ථික සංවර්ධනය යන කරුණු ත්‍රිත්වය කෙරෙහිම තදින් බලපායි.

ශ්‍රී ලංකාවේ ධීවර සම්පත් පදනම වර්ග කිලෝ මීටර් 517,500ක අනන්‍ය ආර්ථික කලාපයකින් යුක්තය. එමෙන්ම, වර්ග කිලෝ මීටර 21,500ක දේශීය ජල තීරයකින්ද, වර්ග කිලෝ මීටර 1,580ක කලපු හා ගං මෝයවල්වලින්ද, වර්ග කිලෝ මීටර 5,200ක මිනිසා විසින් සාදන ලද ජලාශවලින්ද සමන්විත වේ. බොකු, කලපු, ජලාශ සහ වෙරළබඩ මෙන්ම ජලාශ ආශ්‍රිතව පිහිටා ඇති ඉඩම්ද ජලජීවී වගා සංවර්ධනය සඳහා සම්පත් පදනමක් නිර්මාණය කරයි. වර්තමානයේ මෙරට කරදිය, කිවුල් දිය හා මිරිදිය මත්ස්‍ය නිෂ්පාදනය පිළිවෙළින් මෙට්‍රික් ටොන් 267,980ක්, 177,950ක් හා 66,910ක් වේ. මෙරට ස්වභාවික ජලජ සම්පතට සාපේක්ෂව මෙම නිෂ්පාදනය පහළ අගයකි. ලංකාවේ ඒක පුද්ගල මත්ස්‍ය පරිභෝජනය වාර්ෂිකව කි.ග්‍රෑ. 22ත් - 24ත් අතර අගයක් ගනී. ලෝක සෞඛ්‍ය සංවිධානයේ නිර්දේශ අනුව පුද්ගලයෙකු දෛනිකව පරිභෝජනය කළ යුතු අවම ප්‍රෝටීන ප්‍රමාණය ග්‍රෑම් 65ක් වත් විය යුතුය. එහෙත් මෙරට එම ප්‍රමාණය ග්‍රෑම් 38 - 45ත් පමණ ප්‍රමාණයක ඉතා පහළ අගයක් ගනී.

ධීවර හා ජලජීවී වගා ක්ෂේත්‍රය විසින් දළ දේශීය නිෂ්පාදිතයට ආසන්න වශයෙන් 1.4% ක දායකත්වයක් ලබා දෙයි. මෙමගින් පුද්ගලයන් 575,000කට (රටේ ශ්‍රම බලකායෙන් 3.7%) පමණ ඍජු හා වක්‍ර රැකියා අවස්ථා සපයනු ලැබේ. ඇ.ඩො.මි. 1,300කට වැඩි අගය එකතු කිරීමක් සහිත වර්තමාන (2017) වාර්ෂික මත්ස්‍ය නිෂ්පාදනය ටොන් 530,000කට අධික වේ. රටේ සමස්ත මත්ස්‍ය පරිභෝජන අවශ්‍යතාවයෙන් 65%ක් වර්තමානයේදී සපුරාලනු ලබන්නේ දේශීය මත්ස්‍ය සැපයුමෙන් වන අතර ඉතිරිය ආනයනය කරනු ලබන මසුන්ගෙන් සපයා ගනු ලැබේ.

**ශ්‍රී ලංකාවේ ධීවර ක්ෂේත්‍රය මුහුණ දෙන ගැටලු අතර පහත සඳහන් කරුණු ප්‍රධාන වේ.**

- සම්පත් අධික ලෙස නෙළා ගැනීම (Over Exploitation) තිරසර ලෙස කළමනාකරණය නොකිරීම හේතුවෙන් මත්ස්‍ය සම්පත ශීඝ්‍රයෙන් ක්ෂය වීම (Resource Depletion) සාගර දූෂණය පාලනය නොකිරීම
- පසු අස්වනු නාස්තිය (40% ඉක්මවයි)
- පර්යේෂණ හා සංවර්ධන ක්ෂේත්‍රයේ ගැටලු/දුර්වලතා
- ධීවර යටිතල පහසුකම් නොදියුණු මට්ටමේ පැවතීම
- ධීවර නොවන සාගර සම්පත් සම්බන්ධයෙන් වන අඩු අවධානය
- විදෙස් ධීවරයින් නීති විරෝධීව මෙරට මුහුදු සීමා උල්ලංඝනය හා සම්පත් විනාශ කිරීම
- ජලජ පරිසරය ශීඝ්‍රයෙන් දූෂණය වීම-ජලාශවලට කාබනික ද්‍රව්‍ය, රොන්මඩ, ලවණ එක්වීම, පොලිතීන් කෘෂි හා වෙනත් රසායන ද්‍රව්‍ය ජලයට එකතුවීම, අකාබනික දේ ජලයට එකතුවීම, නොගැඹුරු ජලයේ අහිතකර ක්‍රියාකාරකම් හා ශබ්ද දූෂණය, ස්වභාවික විපත්
- ජලජ ජීව සම්පත් කර්මාන්තය පිළිබඳ ඇති නිෂේධනීය ආකල්ප හා මෙම කර්මාන්තයේ සංවර්ධනයට අහිතකර අන්දමින් බලපාන ආගමික හා සංස්කෘතික විශ්වාසයන්
- මෙරට නිෂ්පාදනය කෙරෙන ඇතැම් උසස් තත්වයේ ආහාරමය හා විසිතුරු මසුන් සමස්ත වර්ෂය පුරාම අඛණ්ඩ සැපැයුමකින් වෙළඳපොළ වෙත ලබාදීමට හැකියාවක් නොමැති වීම

## අරමුණු

- ඒක පුද්ගල මත්ස්‍ය පරිභෝජනය ඉහළ නැංවීම තුළින් සෞඛ්‍ය සම්පන්න හා ඉහළ ඵලදායීතාවයකින් යුත් මානව සම්පතක් නිර්මාණය කිරීම
- සමුද්‍රීය ධීවර නිෂ්පාදනය, ජල ජීවී වගා සහ මිරිදිය ධීවර නිෂ්පාදනය ඉහළ නැංවීම
- ධීවර ආශ්‍රිත නිෂ්පාදනවල අපනයන ආදායම් ඉහළ නැංවීම තුළින් ජාතික ආර්ථිකයට සැලකිය යුතු දායකත්වයක් ලබාදීම
- ධීවර ප්‍රජාවගේ හා ඒ හා සම්බන්ධ සියලු පාර්ශ්වකරුවන්ගේ සමාජ - ආර්ථික ක්‍රියාකාරකම් වැඩිදියුණු කිරීම
- නවීන තොරතුරු තාක්ෂණය භාවිතා කරමින් ධීවර සම්පත තිරසර ලෙස කළමනාකරණය හා සංවර්ධනය කිරීම
- ඌන උපයෝජනයට ලක්ව ඇති සාගර සම්පත් ගවේෂණය හා ආර්ථික සංවර්ධනය සඳහා උපරිම ඵලදායීතාවකින් යොදා ගැනීම

## ක්‍රියාකාරකම්

### නිෂ්පාදනය ඉහළ නැංවීම

- අක් වෙරළ හා ගැඹුරු මුහුදේ මත්ස්‍ය සම්පත් නෙළා ගැනීමට උසස් තාක්ෂණයෙන් යුත් යාත්‍රා යෙදවීම
- නව මත්ස්‍ය බිම් හඳුනා ගැනීම හා සලකුණු කිරීම
- මිරිදිය, කිවුල්දිය හා මුහුදු ජලජීවී වගා ප්‍රවර්ධනය

  - ජලජීවී වගාව කෘෂිකර්මාන්තය හා ඒකාබද්ධ ප්‍රමුඛ කර්මාන්තයක් ලෙස හඳුනාගෙන වැඩිදියුණු කිරීම
  - වසර 05ක කාලයක් තුළ මිරිදිය ජලජීවී වගාව උපරිම ධාරිතාව තෙක් ඉහළ නැංවීම
  - කිවුල්දිය ජලජීවී වගාව සඳහා කළපු හා මෝය ආශ්‍රිත ප්‍රදේශ ප්‍රශස්තව යොදා ගැනීම
  - ජල ජීවී වගාවට සුදුසු වගාබිම් හඳුනාගෙන ඒවාට උචිත ජලජ ජීවීන් වගා කිරීම (උපරිම උදම් කලාපය - ඉස්සන් වේක්කයන්, අන්තර් උදම් කලාපය - මුහුදු කූඩැල්ලන්, අන්තර් උදම් කලාපයට පහත ප්‍රදේශ - බෙල්ලන්, කොස්සන්, මොදා)

- වගා පාදක ධීවර කර්මාන්තය සංවර්ධනය කිරීම

  - උසස් තාක්ෂණයෙන් යුත් මත්ස්‍ය අභිජනන මධ්‍යස්ථාන ඉදිකිරීම
  - ප්‍රජාපාදක ජලජීවී වගා සංවර්ධනය සඳහා කුඩු තුළ මත්ස්‍ය ඇඟිල්ලන් නිෂ්පාදන වැනි නවීන ක්‍රම භාවිත කරමින් ඇසිත්තන්-ඇඟිල්ලන් ඇතිකිරීමේ ව්‍යාපෘති ආරම්භ කිරීම
  - අභිජනනාගාර තුළ ඉහළ වටිනාකමක් සහිත මත්ස්‍ය ඇඟිල්ලන් නිෂ්පාදනය (මුහුදු කූඩැල්ලන්, මඩ කකුළුවන්, මොදා, කරදඬු අඬු ඉස්සා වැනි)

### තිරසර ධීවර කළමනාකරණය හා සංවර්ධනය

- ධීවර නිෂ්පාදනය හා රැකියා නියුක්තිය පදනම්ව කළමනාකරණ කලාප හඳුන්වාදීම
- විද්‍යාත්මක දත්ත මත පදනම්ව මත්ස්‍ය සම්පත නෙළා ගැනීමේ කන්න ක්‍රමයක් හඳුන්වාදීම
- ශ්‍රී ලාංක්‍ය මුහුදු සීමාව තුළ සාගර සම්පත් ප්‍රශස්තව කළමනාකරණය කිරීම
- ධීවර ප්‍රජා කමිටු ක්‍රමයක් හඳුන්වා දී කළමනාකරණය සඳහා ප්‍රජා දායකත්වය ලබා ගැනීම
- ආහාර පිණිස මත්ස්‍ය ආනයනය මෙරට සාගර කලාපය තුළ නොමැති මසුන් වර්ග හා සංචාරක කර්මාන්තය වැනි අත්‍යවශ්‍ය ක්ෂේත්‍ර සඳහා පමණක් සීමා කිරීම
- ඉන්දීය මුහුදු සීමා උල්ලංඝනය හා සාගර සම්පත් විනාශ කිරීම ශක්තිමත් රාජ්‍යතාන්ත්‍රික මැදිහත්වීමක් තුළින් ප්‍රශස්තව කළමනාකරණය කිරීම
- ජලජ පරිසරය දූෂණය වීම වැළැක්වීම හා සංරක්ෂණය

### පසු අස්වනු හානිය අවම කිරීම

- යාත්‍රා මෙහෙයුම්, මසුන් ගබඩා කිරීම, වෙන්දේසි කිරීම, පිරි සැකසුම් කිරීම, ප්‍රවාහනය හා අලෙවිය යන කාර්යයන් සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධනය මධ්‍යගත හා ඒකාබද්ධ සැලසුම්කරණ ක්‍රමවේදය භාවිත කරමින් ප්‍රධාන සැලසුමකට අනුව සිදුකිරීම
- උසස් තාක්ෂණයෙන් යුත් ධීවර වරාය ඇතුළු යටිතල පහසුකම් සංවර්ධනය
- මසුන් ගොඩබාන ප්‍රධාන ස්ථානවල ප්‍රමාණවත් තරම් ශීතාගාර ඉදිකිරීම
- සෑම ප්‍රධාන ධීවර වරායක් ආශ්‍රිතවම මත්ස්‍ය පසු අස්වනු සැකසුම් කර්මාන්ත පිහිටුවීම
- ශීතන පහසුකම් සහිත ප්‍රවාහන ජාලයක් ඇති කිරීම
- මාර්ගස්ථ ප්‍රවාහනය වෙනුවට ශීතන පහසුකම් සහිත වඩා කාර්යක්ෂම දුම්රිය හා මුහුදු ප්‍රවාහනය හඳුන්වා දීම
- උසස් මට්ටමේ අයිස් නිෂ්පාදන යන්ත්‍රාගාර ඉදිකිරීම හා දැරිය හැකි මිලකට අයිස් අලෙවි කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
- මසුන් ගොඩබාන ප්‍රධාන ස්ථානවල ප්‍රමාණවත් තරම් ශීතාගාර ඉදිකිරීම

### මත්ස්‍ය නිෂ්පාදන සඳහා අගය එකතු කිරීම

- උසස් තාක්ෂණයෙන් යුත් යාත්‍රා මිලදී ගැනීමට ධීවරයන්ට අවශ්‍ය මූල්‍ය පහසුකම් ලබාදීම
- යාත්‍රා තුළම ප්‍රාථමික මට්ටමේ පිරිසැකසුම් කාර්යයන් ප්‍රවර්ධනය
- මසුන් ඇල්ලීම, මෙහෙයුම් කටයුතු, ගබඩා කිරීම, ප්‍රවාහනය වැනි අගය දාමයේ හඳුනාගත් තීරණාත්මක අවස්ථාවලට අදාළ පුහුණුව, සංවර්ධනය හා තාක්ෂණික සහාය ලබාදීම
- තත්වයෙන් උසස් පසු අස්වනු නිෂ්පාදන සඳහා අවශ්‍ය දැනුම, කුසලතා (පුහුණුව තුළින්) හා තාක්ෂණය ලබාදීම
- ශ්‍රම සූක්ෂම මෙහෙයුම් කටයුතු (Manual Handling) වෙනුවට තාක්ෂණය ආදේශ කිරීම

### ධීවර ප්‍රජාවගේ ජීවන තත්වය ඉහළ නැංවීම

- ධීවර ප්‍රජාව ඇතුළු නිෂ්පාදන කර්මාන්තයන්ට දායක වන ප්‍රජාව සඳහා ශක්තිමත් සමාජ ආරක්ෂණ ක්‍රමයක් හදුන්වා දීම
- ධීවර ගම්මාන ආශ්‍රිතව වෛද්‍ය මධ්‍යස්ථාන, සායන, පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන වැනි කායික හා මානසික සෞඛ්‍ය යහපැවැත්මට අවශ්‍ය පහසුකම් සැලසීම
- විදුලිය, ජලය, මාර්ග, පොදු විනෝදාත්මක කටයුතු වැනි යටිතල පහසුකම් ලබාදීම
- සෑම ධීවර පවුලක් සඳහාම පහසුකම් සහිත ධීවර නිවාස ලබාදීම
- අතිරේක ආදායම් උත්පාදන අවස්ථා ලෙස සෘජු ධීවර නොවන ආර්ථික ක්‍රියාකාරකම් සඳහා අවස්ථා සැලසීම

### රැකියා අවස්ථා ඉහළ නැංවීම

- ප්‍රාථමික නිෂ්පාදනය වෙනුවට අගය එකතු කළ නිෂ්පාදන වැඩි දියුණු කිරීම
- ධීවර කර්මාන්තය සමාජයේ ගෞරවාන්විත රැකියාවක් ලෙස ප්‍රවර්ධනය කිරීම
- ධීවර කාර්මිකයින්ට නිරන්තරයෙන්ම නව දැනුම හා පුහුණුව ලබාදීම

### විදේශ විනිමය ඉහළ නැංවීම

- අගය එකතු කළ ධීවර නිෂ්පාදන අපනයනය දිරිගැන්වීම
- මසුන් ආනයන පිරි සැකසුම් කර ප්‍රති-අපනයන කර්මාන්තයට සීමා කිරීම මඟින් වෙළඳ ශේෂයේ වාසිය ඉහළ නැංවීම
- ප්‍රාථමික නිෂ්පාදන වෙනුවට අගය එකතු කළ නිෂ්පාදන අපනයනය
- ධීවර කර්මාන්තය ආශ්‍රිත විදේශ ශ්‍රම වෙළඳපොළ සඳහා පුහුණු ශ්‍රමය අපනයනය
- ආනයන ආදේශක හඳුන්වාදීම තුළ ආනයනය අඩු කිරීම හා එමඟින් වෙළඳ වාසියක් ලබා ගැනීම

### ඌන උපයෝජිත හෝ භාවිතයට නොගන්නා සාගර සම්පත් ප්‍රයෝජනයට ගැනීම

- සාගර සම්පත ප්‍රවාහන මාධ්‍යයක් ලෙස සංවර්ධනය කිරීම
- සංචාරක කර්මාන්තය හා විනෝදාස්වාදය සඳහා සාගරය හා ජලජ පරිසරය යොදා ගැනීම
- විකල්ප හා පුනර්ජනනීය බලශක්ති ප්‍රභවයක් (රළ, මුහුදු සුළඟ වැනි) වශයෙන් සංවර්ධනය කිරීම
- සමාජ හා සංස්කෘතික කාර්යයන් උදෙසා සාගර සම්පත යොදා ගැනීම
- මුහුදු පත්ල ගවේෂණය හා දුර්ලභ, ඉහළ වටිනාකමක් සහිත ඛනිජ සම්පත් ලබා ගැනීම
- සාගර සම්පත් සංවර්ධනය හා ප්‍රවර්ධනය සඳහා ජෛව තාක්ෂණය භාවිත කිරීම

# බලශක්තිය

රටක තිරසාර සංවර්ධනයත් ජනතාවගේ උසස් ජීවන තත්වයත් සහතික කිරීම සඳහා අඛණ්ඩ බලශක්ති සැපයුමක් තිබිය යුතුය. එම බලශක්ති සැපයුම ලාභදායී සහ පරිසර හිතකාමී වීමත් අනිවාර්ය වේ. ලංකාවේ මේ වන විට බරපතළ බලශක්ති ක්ෂේත්‍රයේ දැඩි අර්බුදයක් පවතින අතර එය දිනෙන් දින උග්‍ර වෙමින් පවතී. විදුලි මිල අධික වීම නව කර්මාන්ත ආරම්භ කිරීමට මෙන්ම තිබෙන කර්මාන්ත පවත්වාගෙන යාමටද ප්‍රබල බාධකයක් වී ඇත. අඛණ්ඩ විදුලි සැපයුමක් හා ඛනිජ තෙල් සැපයුමක් පවත්වාගෙන යාම අපොහොසත් වීමත් වැඩිවන විදුලි ඉල්ලුමට ප්‍රමාණවත් ජනන ධාරිතාව වර්ධනය කිරීමට අපොහොසත් වීමත් මෙහි දී කැපී පෙනේ.

ඉදිරි සංවර්ධන සැලසුම් අනුව 2020 වනවිට විදුලි පද්ධතියට අමතරව එක්විය යුතු අවම ධාරිතාවය මෙ.වො. 390ක් වන අතර 2025 වන විට එය මෙ.වො. 975ක් වේ නමුත් මෙම ධාරිතාවයන් වර්ධනයට සැලසුම් සහගත විධිමත් වැඩපිළිවෙළක් දක්නට නොමැත.

ජල විදුලි ප්‍රභව අවසන් වීම හා විකල්ප පුනර්ජනනීය විදුලි ප්‍රභව වෙත ප්‍රමාණාත්මකව යොමු නොවීම වැනි හේතු නිසා විදුලි අවශ්‍යතාවයෙන් 60% තාප බලාගාර මත යැපීමට සිදු වී ඇත. මේ තත්වය සහ ක්ෂේත්‍රයේ පවතින වංචාව සහ දූෂණය විදුලි ඒකකයක මිල අධික වීමට හේතු වී ඇත. මෙම තත්වය කර්මාන්ත ක්ෂේත්‍රයේ වර්ධනයට අහිතකර ලෙස බලපා ඇත.

රටේ සමස්ත ආනයන වියදමෙන් 28%ක් ඛනිජ තෙල් ආනයනය සඳහා වැයවීම අහිතකර තත්වයකි. බොරතෙල් තෙල් පිරිපහදුව යාවත් කාලීන නොකිරීම, තෙල් ගොඩබෑමේ නල පද්ධතීන් දිරායාම, ප්‍රමාණවත් ගබඩා පහසුකම් වර්ධනය නොකිරීම, පවතින ගබඩා නිසි ලෙස භාවිතා නොකිරීම ආදිය දේශීය තෙල් මිල වැඩිවීමටත් අඛණ්ඩ තෙල් සැපයුමක් පවත්වා යාමට නොහැකි වීමටත් හේතු වී ඇත.

## අරමුණ

- ගුණාත්මක හා ලාභදායී බලශක්ති සැපයුමක් මගින් ජනතාවට උසස් ජීවන තත්වයක් ලබා දීම
- අඛණ්ඩ හා ස්ථාවර බලශක්ති සැපයීමක් තුළින් වෙළඳ හා කර්මාන්ත ක්ෂේත්‍රවලට අවශ්‍ය යටිතල පහසුකම් සැපයීම
- පාරිසරික සම්මුතීන්ට අනුකූල ප්‍රමිතීන්වලට සහ ස්වාභාවික සම්පත් අධිපරිභෝජනය වළක්වාලන නිෂ්පාදන ක්‍රම මගින් බලශක්ති නිෂ්පාදනය කිරීම

## ක්‍රියාකාරකම්

### බලශක්ති සැලසුම් සහ පරිපාලනය

- රට තුළ පවතින සියලුම බලශක්ති උත්පාදන, බෙදාහැරීම, අලෙවිය, බලශක්ති ප්‍රභව පිළිබඳ කෙරෙන පර්යේෂණ හා, ගවේෂණය කිරීම් එකම පරිපාලන ඒකකයක් යටතට ගැනීම
- දේශීය බලශක්ති ඉල්ලුම අඛණ්ඩව සම්පූර්ණ කළ හැකි කෙටිකාලීන හා දිගුකාලීන ක්‍රියාකාරී සැලැස්මක් සකස් කිරීම සහ සෑම වසර පහකට වරක් නව ප්‍රවණතා, කර්මාන්ත අංශයේ වර්ධනයන් හා අනෙකුත් සාධකවලට ගැලපෙන පරිදි එය යාවත්කාලීන කිරීම

### විදුලි බල ක්ෂේත්‍රය

- ඉදිරි වසර 10 තුළ බලශක්ති අවශ්‍යතාවයෙන් අවම වශයෙන් 30%ක්වත් සූර්ය තාපයෙන් ලබා ගැනීමට හැකිවන පරිදි සැලසුමක් සකස්කොට ක්‍රියාත්මක කිරීම
- සූර්ය බල කට්ටල මෙරට නිපදවීමේ කර්මාන්තශලා පිහිටුවීම සහ වාණිජ මට්ටමෙන් සූර්ය කෝෂ තාක්ෂණය වර්ධනය සඳහා දේශීය විශ්වවිද්‍යාලවල පර්යේෂණ ආරම්භ කිරීම
- සුළං බලය, මුහුදු රළ, ජලමාර්ග වැනි පුනර්ජනනීය බලශක්ති නිෂ්පාදනය ප්‍රවර්ධනය කිරීම
- පුද්ගලික අංශයේ බලාගාරවලින් විදුලිය මිලදී ගැනීමට එළඹ ඇති සියලු ගිවිසුම් නැවත විමර්ශනයට භාජනය කිරීම

- තාක්ෂණය ලබා ගැනීමටත්, මූල්‍ය ආයෝජන ලබාගැනීමටත් විනිවිදභාවයෙන් යුතු තරගකාරී ටෙන්ඩර් පටිපාටි මඟින් දේශීය හා විදේශීය අංශවල සහයෝගය ලබා ගැනීම
- විදුලිය බෙදා හැරීමේදී වන අපතේ යාම් අවම කිරීමට විදුලිය පිරිමසන කාර්යක්ෂම විදුලි බල්බ හා උපකරණ භාවිතය දිරි ගැන්වීමත්, ඒවා නිපදවීම වෙනුවෙන් සහන ලබා දීමටත් නව පර්යේෂණ සඳහා දිරි දීමටත් කටයුතු කිරීම
- ගෘහ නිර්මාණයේදී බලශක්තිය අවම ලෙස භාවිත වන පරිදි සැලසුම් කිරීමට අවශ්‍ය නව නීති සම්පාදනය කර ක්‍රියාත්මක කිරීම
- මහල් දෙකට වැඩි නිවාස ඉදිකිරීමේදී සූර්ය කෝෂ පැනල් භාවිතය අනිවාර්ය කිරීම සහ ඒ සඳහා මූල්‍ය පහසුකම් ලබා දීම
- ජල විදුලිය නිපදවන ජලාශවල ජල ධාරිතාව වසර පුරා උපරිමව පවත්වා ගැනීමට ඉහළ ජලාධාර ප්‍රදේශවල වනගහනය වැඩි කිරීමටත්, එම ප්‍රදේශ තවදුරටත් ජනාවාස වීම වළක්වාලීමටත් අදාළ ආයතන සමඟ ඒකාබද්ධ වැඩපිළිවෙලක් සකස් කිරීම

## ඛනිජ තෙල්

- ලංකාව අවට මුහුදේ සොයාගෙන ඇති ඛනිජ තෙල් හා ස්වභාවික වායු වාණිජ මට්ටමෙන් ලබා ගැනීමේ වැඩපිළිවෙළ කාර්යක්ෂම කිරීම හා විනිවිදභාවයෙන් යුතු ප්‍රසම්පාදන ක්‍රියාවලියක් අනුගමනය කිරීම
- ලොව පුරාසිටින ශ්‍රී ලාංකේය විද්වතුන්ගේ සහායද ඇතිව දේශීය හා විදේශීය විශ්වවිද්‍යාල මඟින් ඛනිජ තෙල් ගවේෂණ ක්ෂේත්‍රයේ විද්‍යාර්ථයින් බිහිකිරීමේ වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කිරීම
- නව තාක්ෂණික පහසුකම් සහිත බොරතෙල් පිරිපහදු ඇති කිරීම සහ පවතින පිරිපහදු නවීකරණය කිරීම
- ත්‍රිකුණාමලය තෙල් ටැංකි උපායමාර්ගිකව ලබා ගනිමින් වසරක් තුළ මාස තුනක රක්ෂිත තොග පවත්වාගෙන යාමට අවශ්‍ය ගබඩා පහසුකම් පුළුල් කිරීම සහ එමඟින් ජාත්‍යන්තර වෙළඳපොළේ ඛනිජ තෙල් මිලෙහි විචලනයේ වාසිය ලබා ගැනීම
- ලංකාවේ පිහිටීමේ උපායමාර්ගික වැදගත්කම උපයෝගී කරගනිමින් නෞකා සඳහා තෙල් වෙළඳාම හා පිරිපහදු තෙල් වෙළඳාම පුළුල් කර විදේශ විනිමය ඉපයීමට කටයුතු කිරීම
- ඉන්ධන භාවිතය අවම කිරීමටත් කාබන් විමෝචනය අවම කිරීමටත් විදුලි මොටර් රථ සඳහා සහන ලබාදී ඒවා දිවාකාලයේදී සූර්ය තාපයෙන් ආරෝපණය කරගැනීමට අවශ්‍ය යටිතල පහසුකම් ප්‍රවර්ධනය කිරීම
- විදුලි මෝටර් රථවල ආනයනික බදු සම්පූර්ණයෙන්ම ඉවත් කිරීම

# විදේශ ප්‍රතිපත්තිය

වර්තමාන ලෝක දේශපාලනය සංක්‍රාන්තිමය අවධියකට අවතීර්ණ වෙමින් තිබේ. 1990න් පසු බිහිවූ ලෝක බල තුලනයට ආසියාතික රාජ්‍යන්ගේ නැගීම කිසියම් අභියෝගයක් එල්ල කරන ආකාරයක් පෙනී යන නමුත්, ලෝකයේ ආර්ථික හා දේශපාලන බලය මෙහෙය වන බලයන් අතර කිසියම් අසමතුලිතතාවයක් වර්තමානය වනවිට නිර්මාණය වී පවතී. අනෙක් අතට ගෝලීය ආයතන තුළින් ආණ්ඩුකරණය හා ආර්ථික ක්‍රියාවලිය සම්බන්ධ විශාල ප්‍රතිමාන සමූහයක් නිර්මාණය වී තිබෙන අතර එහි බලපෑම ශක්‍යතාවයන් අතින් පහළ රාජ්‍යයක් වශයෙන් ශ්‍රී ලංකාවට ප්‍රබලව දැනෙයි. නිදහසින් පසු යුගය ශ්‍රී ලංකාව ජාත්‍යන්තර පර්යාය තුළ දුබල රාජ්‍යයක් වශයෙන් මතුවීමට ප්‍රධානතම හේතුව මෙරට විදේශ දේශපාලන සහ ආර්ථික ප්‍රතිපත්තිය පරායත්ත ක්ෂේත්‍රයක් වශයෙන් වර්ධනය කිරීම හා රාජ්‍යතාන්ත්‍රික ක්‍රියාවලිය ජාතික අභිලාෂය වෙනුවට දේශපාලන රෙජීමයන්ගේ වුවමනාවන්ට යටත් කිරීමය.

ගෝලීයකරණය සහ ජාත්‍යන්තර ප්‍රාග්ධන හා දේශපාලන මැදිහත්වීම අතිශය තීව්‍ර යුගයකදී අපගේ විදේශ ප්‍රතිපත්තියේ පුළුල් අරමුණ වන්නේ ස්වාධීන වූ, ජාතික ජනතා අභිලාෂයෙන් මෙහෙයවෙන, ජාත්‍යන්තර සාමය හා සහජීවනයට අනුග්‍රහයක් වන සේම අපගේ රටේ ශක්‍යතා ඔප්නංවන හා ගෝලීය අවකාශය තුළ පිළිගැනීමට බඳුන් වන ලොව විශිෂ්ට රාජ්‍යයක් නිර්මාණය කර ගැනීමය.

## ක්‍රියාමාර්ග

### 1. නොබැඳිභාවය

ගෝලීයව පවත්නා බල දේශපාලනයේ ගොදුරක් බවට පත්වීමේ අනතුර අප හමුවේ නිරන්තරව පවතී. කලාපීයව සහ ජාත්‍යන්තරව පවතින දේශපාලන අර්බුදයන් හමුවේ අප ගත යුත්තේ යුක්තියේ මඟය. ලෝකයේ සියලු ප්‍රගතිශීලී රාජ්‍යයන් සමඟ බද්ධවෙමින් තරගය වෙනුවට සහයෝගය හා ජාත්‍යන්තර සමානාත්මතාවය ප්‍රවර්ධනය කරන, නිරවි ලෝකයක් උදාකරන නොබැඳි ප්‍රතිපත්තියක් අනුගමනය කිරීම

### 2. අදීනත්වය

කුඩා රාජ්‍යයක් වුව අපගේ දේශපාලනික ස්වාධීනත්වය සහ නිවහල්භාවය ප්‍රමුඛ අගයන් කොට සලකමු. අධිරාජ්‍යවාදයේ නව ස්වරූපය ප්‍රවේශමෙන් හඳුනාගෙන ජනප්‍රියවාදී නොවන ආකෘතියකින් යුත් ප්‍රජාතන්ත්‍රවාදය ඉලක්ක කොටගත් ප්‍රතිපත්තියකින් එම නව අධිරාජ්‍ය යුගයට මුහුණ දීමට අවශ්‍ය ජාතික මනෝභාවය සහ ජාත්‍යන්තර ක්‍රියාමාර්ග නිර්මාණය කිරීම.

### 3. ජාත්‍යන්තර සාමය, සහජීවනය සහ යුක්තිය

ජාත්‍යන්තර දේශපාලනය යනු මානව වර්ගයා අතර වන අවබෝධය හා ගෞරවය සුරැකෙන ක්‍රියාවලියක් බව පිළිගනිමින් අන්තර් ජාතික සාමය ප්‍රවර්ධනය කරමින්, ගෝලීය ගැටලු සඳහා සහජීවනයෙන් යුක්තව ක්‍රියාත්මක වීමට ජාත්‍යන්තර සහ කලාපීය ආයතන තුළ අපගේ අනන්‍යතාව තහවුරු කිරීම

### 4. ගෝලීය දැක්ම සහ දේශීය ක්‍රියාමාර්ග

පටු ප්‍රාදේශීය චින්තනයකින් යුක්තව නව ලෝක රටාවට මුහුණ දිය නොහැකි බැවින් ගෝලීය ආර්ථික, සංස්කෘතික, හා තාක්ෂණික ප්‍රවණතා දේශීයව අනුවර්තනය කර ගනිමින් ගෝලීය ලෝකය තුළ ක්‍රියාත්මක වීම

### 5. අන්තර්-විෂයිකත්වය පිළිගන්නා ලෝක පර්යායක් වෙනුවෙන් පෙනී සිටීම

ලෝක දේශපාලනය බලවතුන්ගේ අරගලයක් හෝ කලාපීය අණසක ක්‍රියාත්මක විය යුතු භූමියක් නොවේ. නමුත් ගෝලීය හා කලාපීය වශයෙන් තීරණ ගැනීමේ ක්‍රියාවලිය අන්තර් විෂයික යථාර්ථයකි. එබැවින් ගෝලීය දේශපාලනය තුළ ප්‍රජාතාන්ත්‍රීය ප්‍රවාහය පුළුල් කිරීමට අවශ්‍ය ජාත්‍යන්තර සහයෝගය ගොඩනැගීමට කටයුතු කිරීම

# ජාතික ආරක්ෂාව

ජාතික ආරක්ෂාව සම්බන්ධයෙන් දැනට පවතින සීමිත හා පටු සංකල්පීයකරණය පෘථුල කරගැනීමේ අවශ්‍යතාවය අප හමුවේ පවතී. ජාතික ආරක්ෂාව යන යෙදුම යුද්ධයත් සමඟ මෙරට ජනතාව අතර වඩාත් ප්‍රචලිත විය. නමුත් සැබෑ ලෙසටම මෙරට රාජ්‍යය නැතිනම් එහි ජනතාව අනතුරට හෙළන ගැටලු මොනවාද? එය ත්‍රස්තවාදයට හෝ කැරලිකාරීත්වයට පමණක් සීමා කළ හැකිද යන පැනය පවතී. එබැවින් අපගේ ප්‍රතිපත්තිය තුළින් මෙරට ජනතාවගේ ජීවිතයට තර්ජනය කරන්නා වූ බහුවිධ තර්ජනයන් වළක්වා ගතහැකි හැකි ජාතික ආරක්ෂාව යන පුළුල් ක්ෂේත්‍රය ක්‍රියාත්මක වනු ඇත.

- මෙරට පුරවැසියන්ගේ නිදහස හා ජීවිත ආරක්ෂාව, ස්වෛරීභාවය, භෞමික අඛණ්ඩතාව, ස්වාධිපත්‍ය සහ අභිමානය ආරක්ෂා කළ හැකි යාන්ත්‍රණයක් ක්‍රියාත්මක කිරීම
- රාජ්‍ය ආරක්ෂාවට එරෙහිව සිදුවන අභ්‍යන්තර යුදමය, දේශපාලනමය, ආර්ථිකමය, සංස්කෘතිකමය තර්ජනයන් සහ අන්තර්ජාතික පීඩනයන්ට මුහුණ දීමට හා ඒවා ජය ගැනීමට අවශ්‍ය රාජ්‍යතාන්ත්‍රික යාන්ත්‍රණයක් හා ගැටුම් නිරාකරණ ක්‍රියාවලියක් අඛණ්ඩව පවත්වා ගැනීම
- ස්වභාවික ව්‍යසන, වසංගත රෝග, සහ සාගත සේම කාර්මික හා පරිසර දූෂණය නිසා ජනතාවගේ ආරක්ෂාවට සිදුවන තර්ජන කල් තබා හඳුනා ගැනීම, වැළැක්වීම සඳහා වන යාන්ත්‍රණයන් පිහිටුවීම හා නිසි පරිදි ක්‍රියාත්මක කිරීම
- විවිධ ජනකොටස් අතර ආගමික හා සංස්කෘතික ගැටුම් වැළැක්වීම සහ ජනතාව අතර සමාදානය ඇතිකිරීම තුළින් අභ්‍යන්තර සහජීවනය පිළිබඳ ස්ථායීතාවක් තහවුරු කිරීම
- ජාත්‍යන්තර මත්ද්‍රව්‍ය ජාවාරම, මිනිස් ජාවාරම සහ අනෙකුත් නීතිවිරෝධී කටයුතු මැඩපැවැත්වීමට අවශ්‍ය නීති පද්ධතිය ශක්තිමත් කිරීම

- කාන්තාවන්, ළමුන්, වැඩිහිටියන්, සහ ආබාධිත ජනගහනයට සිදුවන හිංසනයන් හා ප්‍රචණ්ඩත්වය වැළැක්වීම
- තාක්ෂණික තර්ජනයන්ගෙන් ජාතික ආරක්ෂාවට සිදුවන බලපෑම වැළැක්වීම, සයිබර් ආරක්ෂණය පුළුල් කිරීම හා තාක්ෂණික අනතුරු වැළැක්වීම
- රාජ්‍ය සම්පත් ආරක්ෂාව, දේශීය උරුමයන්ගේ සුරක්ෂිතභාවය සහ ධරණීයභාවය තහවුරු කරමින් අනාගත පරපුරටද එම සම්පත් දායාද කිරීම
- ත්‍රිවිධ හමුදාව හා පොලීසිය නිර්දේශපාලනික කිරීම සහ ආරක්ෂක සේවය කාර්යක්ෂම කිරීමට අවශ්‍ය නව තාක්ෂණයන් හඳුන්වාදීම
- රාජ්‍ය ආරක්ෂාව සහ සාමය ආරක්ෂා කරන සියලුම සේවකයන් සහ ඔවුන්ගේ පවුල්වල ජීවන තත්වයන් උසස් කිරීමට අවශ්‍ය නිවාස, සෞඛ්‍ය සහ අනෙකුත් යටිතල පහසුකම් සම්පාදනය කිරීම

# ආචාරධාර්මික ශ්‍රී ලංකාවක්

යහපත් සමාජ පැවැත්මක අත්‍යවශ්‍ය සාධකයක් ලෙස එම සමාජයේ ආචාරධාර්මික බව වැදගත් තැනක් ගනී. ආචාර ධර්මවල බිඳවැටුම විටෙක බරපතළ ලෙස ගණනය නොවුවද එහි අනිවාර්ය ප්‍රතිඵලයක් ලෙස සමාජ සංස්ථා රැසක කඩා වැටීමට එය ප්‍රවේශය සපයයි. සියලු ප්‍රජාවන් සමාන ලෙස සලකන නීතිය සහ ප්‍රජාතන්ත්‍රවාදය රකින, ව්‍යවස්ථාවට ගරු කරන, සියලු ප්‍රජාවන්ගේ පැවත්ම පිළිගනිමින් ඔවුන්ගේ අයිතීන් ආරක්ෂා කරන, විශේෂ අවධානයට ලක්විය යුතු කණ්ඩායම් ලෙස සැලකෙන ළමා, කාන්තා, වැඩිහිටි හා ආබාධ සහිත වූවන්ගේ අයිතීන් හා වගකීම් ඉහළින්ම පිළිගෙන ඒවා සුරකින සමාජයක් ආචාරධාර්මික ශ්‍රී ලංකාවක් ගොඩනැගීමට අපි අපේක්ෂා කරමු. එසේම රාජ්‍යය තම ජනතාව වෙත වගවීමට ප්‍රතිචාර ලෙස යුතුකම හා වගකීම වටහාගත් පුරවැසි සමාජයක්ද මේ මගින් පෙරළා අපේක්ෂා කරමු.

# නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක්

වත්මන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව පූර්ණ වශයෙන් සංශෝධනය කළ යුතු බවට වන පොදු එකඟතාවක් පවතී. නව ව්‍යවස්ථාවක් මඟින් මූලිකවම ආමන්ත්‍රණය කළ යුතු ක්ෂේත්‍ර වශයෙන් ප්‍රජාතන්ත්‍රවාදය, මූලික මිනිස් අයිතීන්, ජන කොටස් අතර සාමය, ආර්ථික සහ සමාජීය අයිතීන් තහවුරු කිරීමත් විවිධ ජාතිකත්වයන්හි අනන්‍යතාවයන් හා සමාන අයිතීන් තහවුරු වන පරිදි ශ්‍රී ලාංකේය ජාතිකත්වය නිර්මාණය කිරීම හඳුනාගෙන ඇත.

විධායක ජනපති ක්‍රමය අහෝසි කොට එම බලය ව්‍යවස්ථාදායක හා අධිකරණ බලයන් මඟින් සංවරණයට හා තුලනයට ලක් කෙරෙනු ඇත.

**මූලික අයිතිවාසිකම් ක්ෂේත්‍රය පුළුල් කිරීම:** ඒ යටතේ සමාජ අයිතිවාසිකම් මූලික අයිතිවාසිකම් ලෙස පිළිගනු ලැබේ. මෙහිදී පූර්ව ළමාවිය සංවර්ධනය, අධ්‍යාපනය ලබා ගැනීම, පෞද්ගලික සෞඛ්‍යාරක්ෂාව, රැකියාවක් ලබා ගැනීම, නිවාස, පිරිසිදු ජලය, සනීපාරක්ෂාව, ප්‍රමාණවත් ආහාර සහ පෝෂණය මූලික අයිතීන් වශයෙන් පිළිගැනේ.

- ජාතිකත්වයන් අතර අසමගිය සහ ආගමික වෛරය ඇති නොකරන, ස්ත්‍රී පුරුෂභාවය හෝ වෙනත් කරුණු මත වෙනස් කොට නොසැලකීම යන කොන්දේසිවලට යටත්ව භාෂණයේ නිදහස තහවුරු කළ යුතුය.
- පවතින මැතිවරණ ක්‍රමය වෙනස් කොට ජනතාවගේ කැමැත්ත සාධාරණ ලෙස නිරූපණය වන නව මැතිවරණ ක්‍රමයක් හඳුන්වාදීම
- ජනතා නියෝජිත ආයතනවල කාන්තා හා තරුණ නියෝජනය අවමය 25%ක් වීම සහතික කිරීම
- වයස අවුරුදු 70 ඉක්ම වූ පුද්ගලයකු කිසිදු මැතිවරණයකට ඉදිරිපත් විය නොහැකි වන පරිදි නීති සකස් කිරීම
- කැබිනට් මණ්ඩලය විසිපස් දෙනෙකුගෙන් සමන්විතය. එහි ප්‍රධානියා අග්‍රාමාත්‍යවරයා විය යුතුය. කැබිනට් හා නියෝජ්‍ය ඇමතිවරු හැර වෙනත් කිසිදු ආකාරයේ අමාත්‍යවරු පත් නොකිරීම
- අධිකරණය ස්වාධීන විය යුතු අතර එයට අවශ්‍ය අවස්ථාවලදී විමර්ශන බලයද ක්‍රියාත්මක කිරීමට හැකිවන පරිදි නීති සකස් කිරීම
- ළමා, කාන්තා සහ විශේෂ අවශ්‍යතා සහිත ප්‍රජාවගේ අයිතිවාසිකම් පිළිබඳ ආණ්ඩුක්‍රම නීතිය ජාත්‍යන්තර ප්‍රඥප්තීන්ට අනුකූල වන ලෙස පුළුල් කිරීම
- දැනට ස්ථාපිත කොට ඇති කොමිසන් සභාවලට අමතරව අධ්‍යාපනය, අර්ධ රාජ්‍ය සේවය, සහ ජනමාධ්‍ය යන ක්ෂේත්‍ර සඳහා ස්වාධීන කොමිෂන් සභා ස්ථාපිත කොට එම අංශයන් දේශපාලන බලපෑම්වලින් මුදා ගැනීම

# සියලු ජාතිකත්වයන්ගේ අනන්‍යතා හා සම අයිතිය සුරකින ශ්‍රී ලාංකේය ජාතියක්

## ව්‍යවස්ථාමය ක්‍රියාමාර්ග

ජාතිකත්වයන් අතර අන්‍යෝන්‍ය විශ්වාසය බිඳ දැමීම, දේශපාලන තීන්දු තීරණ ගැනීමේදී පුළුල් ලෙස සියලු ජාතිකත්වයන් අතර සහයෝගීතාවක් ඇතිකර ගැනීමට මෙතෙක් අසමත් වීම, ආර්ථික අසමානකම් මෙන්ම රාජ්‍ය පරිපාලනයේ පවතින මධ්‍යගත ස්වභාවය යන කරුණු ශ්‍රී ලංකාවේ ජාතික ගැටලුව පැනනැගීමට බලපෑ මූලික හේතු වේ.

- ජාතිකත්වයන්ට වෙනස් ලෙස සැලකීමත්, සියලුම ජාතිවාදී යොමුවීම් හා ආගම් අතර ගැටුම් නිර්මාණය වීමට හේතුවන ක්‍රියාවනුත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන්ම තහනම් කිරීම
- සියලු ජාතිකත්වයන්ගේ සමාජ, සංස්කෘතික, ආගමික, ආර්ථික, භාෂාමය හා දේශපාලනික අයිතීන් හුදෙක් වචනයට පමණක් සීමා නොකොට ඒවා ප්‍රායෝගිකව ක්‍රියාත්මක කිරීම ව්‍යවස්ථාව මඟින් තහවුරු කිරීම
- රටේ සියලු ජාතිකත්වයන්ගේ ශ්‍රී ලාංකේය අනන්‍යතාව තහවුරු වන දේශපාලනමය හා පරිපාලනමය වශයෙන් බලය විමධ්‍යගත කිරීමේ නව ක්‍රමවේදයක් සහිත පාලන ව්‍යුහයක් හඳුන්වාදීමට කටයුතු කිරීම හා එමඟින් බෙදී වෙන්වීමේ මනෝභාවය තුරන් කිරීම

## භාෂා ප්‍රතිපත්තිය

- 16වැනි ව්‍යවස්ථා සංශෝධනය යටතේ 1988 වසරේ සිට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් පිළිගත් ජාතික භාෂා ප්‍රතිපත්තිය නිසි පරිදි ක්‍රියාත්මක කිරීම
- භාෂාව මුල්කරගනිමින් ඇතිවන පීඩාවන් අහෝසි කිරීම සඳහා ලංකාවේ පුරවැසියන් භාවිත කරන සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා ජාතික භාෂා ලෙස ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මඟින් ස්ථාපිත කර, එකී ඕනෑම භාෂාවකින් කටයුතු කිරීමට පුරවැසියන්ට ඇති අයිතිය පිළිගනිමින් ඒ අනුව කටයුතු කිරීම සහ භාෂාව හේතුකොටගෙන දැනට පවතින දුෂ්කරතා මුළුමනින්ම අහෝසි කිරීම
- ශ්‍රී ලංකාවේ සියලු ජාතිකත්වයන්ගේ සිවිල් පරිපාලනයට අදාළ අවශ්‍යතා තමන්ගේ මව් භාෂාවන්ගෙන් එනම් තමන්ට අදහස් ප්‍රකාශ කිරීමට හැකි පහසුම භාෂාවෙන් ඉටුකර ගැනීමට උපරිම පහසුකම් සැලසීම
- සිංහල, දෙමළ හා ඉංග්‍රීසි යන භාෂාවන් සාමාන්‍ය පෙළ දක්වා ඉගෙනීම අනිවාර්ය කිරීම හා ඒ සඳහා ප්‍රතිපාදන සැපයීම
- දෙමළ හා මුස්ලිම් ජනතාව වැඩි වශයෙන් ජීවත්වන උතුරු හා නැගෙනහිර ප්‍රදේශවල පවතින පොලිස් ස්ථාන, රජයේ කාර්යාල වැනි සිවිල් සේවාවල දෙමළ භාෂාවෙන් කටයුතු කළ හැකි පොලිස් නිලධාරීන්, භාෂා පරිවර්තකයන් හා රජයේ සේවකයින් පත් කිරීමට පියවර ගත යුතුය. ඒ සඳහා,

- පොලිසියේ, ආරක්ෂක හමුදා හා රාජ්‍ය අංශයේ සේවය කරන සියලු දෙනාට මව් භාෂාවට අමතරව රාජ්‍ය භාෂා ඉගැන්වීම හා භාෂාවන් ඉගෙන ගැනීමට දිරිමත් කරවීම
- නඩු විභාගවලදී කුමන අධිකරණයකදී වුවත් සියලු චූදිතයන් සඳහා තමන්ගේ මව් භාෂාවෙන් කටයුතු කිරීමේ අයිතිය පිළිගනිමින් ඔවුන්ට මව් භාෂා පරිවර්තකයන් ලබා දීම
- මේ සඳහා අවශ්‍ය සියලු පහසුකම් ලබා දෙමින් ප්‍රායෝගිකව ක්‍රියාත්මක කිරීම
- උතුරු හා නැගෙනහිර සෑම පොලිස් ස්ථානයකටම දෙමළ භාෂාවෙන් අධ්‍යාපනය ලැබූ උපාධිධාරීන් ප්‍රමාණවත් සංඛ්‍යාවක් බඳවාගෙන බලතල සහිත මහජන සම්බන්ධීකරණ ඒකක පිහිටුවීමට පියවර ගැනීම
- එම ඒකක පොලිස් ස්ථාන යටතේ පැවතුණද මහජන සම්බන්ධතා ප්‍රවර්ධනය කරන ආයතන ලෙස ක්‍රියාත්මක කරවීම

- රටේ සියලුම දරුවන්ට සිංහල, දෙමළ හා ඉංග්‍රීසි යන භාෂා තුනම ඉගැන්වීම සඳහා දැනට පවතින තත්වයට වඩා ප්‍රායෝගික වැඩපිළිවෙළක් සකස් කළ යුතු අතර ඒ සඳහා අවශ්‍ය ගුරුවරු විධිමත්ව පුහුණු කිරීමේ ක්‍රමවේද ආරම්භ කිරීම
- සෑම විශ්වවිද්‍යාලයකම සිංහල, දෙමළ හා ඉංග්‍රීසි යන භාෂාවන් සඳහා භාෂා අධ්‍යයන අංශයන් ස්ථාපිත කිරීම
- දෙවැනි භාෂාවක් ඉගෙන ගැනීමට කැමති වැඩිහිටියන් සඳහා සිංහල හා දෙමළ භාෂා පුහුණුව ලබාදෙන වැඩිහිටි අධ්‍යාපන වැඩපිළිවෙළක් ආරම්භ කිරීම
- රැකියා අවස්ථා ලබාදීමේදී දේශපාලනික බලපෑම්වලින් තොරව සියලු ජාතිකත්වයන්ට සාධාරණත්වය ඉටුවන පරිදි සුදුසුකම් අනුව කටයුතු කිරීම

## ජනතාවගේ ඉඩම් ගැටලු

- උතුරු හා නැගෙනහිර මතුව ඇති ඉඩම් ප්‍රශ්නය ඉතාම බරපතළ හා සංවේදී ප්‍රශ්නයක්ව ඇති නිසා එය විසඳීමට කඩිනම් පියවර ගැනීම
- සිවිල් යුද්ධය හේතුවෙන් ගම් බිම් අතහැර පලාගිය දෙමළ, සිංහල හා මුස්ලිම් ජනතාවට යළිත් තම මුල් පදිංචි ගම්මානවල ඉඩම් ලබා ගැනීමට තිබෙන අයිතිය මානව අයිතියක් සේ පිළිගැනීම
- එලෙස ඉඩම් අහිමි වූ සමස්ත ජනතාවට ඉඩම් ලබා දීමට පියවර ගැනීම
- අධිආරක්ෂිත කලාප වෙනුවෙන් ඉඩම් පවරා ගැනීම නිසා පුරවැසියන් විශාල සංඛ්‍යාවකට ඉඩම් අහිමි වී තිබෙන බව පිළිගැනීම
- මේ දෙපළාතේම ඉඩම් අහිමි වුවන්ගේ ගැටලුව හඳුනාගැනීම සඳහාත් ඉඩම්වල මුල් අයිතිකරුවන් හඳුනාගෙන තහවුරු කොට එම ඉඩම් ඔවුනට භාර දීම සඳහාත් අත්‍යවශ්‍ය හේතූන් මත දැනටමත් රජයට පවරා ගෙන ඇති ඉඩම් සඳහා ප්‍රමාණවත් වන්දි මුදලක් ලබා දීම හෝ අයිතිකරුවන්ගේ කැමැත්ත අනුව විකල්ප ඉඩම් ලබා දීම සඳහාත් ජනතා නියෝජිතයින්, දිස්ත්‍රික් ලේකම්වරුන් හා ඉඩම් අමාත්‍යාංශ නිලධාරීන්ගෙන් සමන්විත වන පූර්ණ බලැති ජාතික ඉඩම් කොමිසමක් පිහිටුවා ඒ මගින් ගැටලු විසඳීමට කඩිනම් පියවර ගැනීම

- විදේශ බහුජාතික සමාගම්වලට හා විදෙස් රටවලට සින්නක්කරයට හා දිගුකාලීනව ඉඩම් ලබා දීම වහා අහෝසි කිරීම
- ආණ්ඩුවේ දේශපාලන හිතවතුන්ට ජනතාවගේ ඉඩම් බලහත්කාරයෙන් පවරා ගැනීම සඳහා ආණ්ඩුව කරන මැදිහත් වීම වහා නවතා දැමීම
- මෙම කොමිසම් සභාව මගින් ඉඩම් පිළිබඳ ගැටලුව නිරාකරණය කරන තෙක් නව පදිංචි කිරීම් නතර කිරීම
- රටේ ඕනෑම ප්‍රදේශයක ජන සංයුතිය වෙනස් කිරීමට ආණ්ඩුව මැදිහත් වීමෙන් කරන ජනපදකරණය වහා නතර කිරීම
- ආණ්ඩුව විසින් ඉඩම් ලබාදීමේදී අතීතයේ සිට එම ප්‍රදේශයේ පදිංචිව සිටි ඉඩම් නොමැති ජනතාවට ප්‍රමුඛත්වය ලබා දීම

## දේශපාලන සිරකරුවන්

- උතුරේ යුද්ධයේ විවිධ අවස්ථාවල අත්අඩංගුවට පත් හා භාර වූ තරුණ තරුණියන් පුනරුත්ථාපනය කර නිදහස් වූ අයට ජීවනෝපායක් ඇති කිරීමට රජය මැදිහත් වී කටයුතු කිරීම
- දේශපාලන සිරකරුවන් සියලු දෙනා නිදහස් කිරීම
- ඔවුන්ට නීතිමය හො වෙනත් බාධාවකින් තොරව නිදහසේ සමාජගත වීම සඳහා පූර්ණ රැකවරණය හා සහයෝගය ලබා දීම
- ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත අහෝසි කිරීම සහ ඕනෑම ආකාරයක ත්‍රස්තවාදයක් ඇතිවීමට බලපාන හේතුසාධක අහෝසි කිරීම
- අතුරුදහන් වූවන් සම්බන්ධයෙන් සාධාරණත්වය ඉටුකිරීමට කඩිනම් පියවර ගැනීම

## පීඩාවට පත් පාර්ශවයන්ට සහන සැලසීම

- සිවිල් යුද තත්වයන් හේතු කොටගෙන විවිධාකාරයෙන් පීඩාවට පත්වූ හා හානි සිදු වූ සැමට තම දුක්ගැනවිලි ඉදිරිපත් කිරීමටත් ඒවා පිළිබඳ සත්‍යය සොයා බලා පීඩාවට පත්වූවන්ට සහන ලබාදීමටත් ජාතික සමගිය ප්‍රවර්ධනය කිරීමේ හා ප්‍රතිසන්ධානගත කිරීමේ පනතක් මගින් ජාතිකත්වයන් අතර සහජීවනය ශක්තිමත් කිරීමේ අරමුණ සඳහා සත්‍ය විමර්ශන කොමිසමක් පත්කිරීම
- පීඩාවට පත් ජනතාව අතර පවතින මානසික වේදනාවන් සුවපත් කිරීම සඳහා උපදේශන වැඩසටහන් ක්‍රමවත්ව ක්‍රියාත්මක කිරීම

## ප්‍රජාතන්ත්‍රවාදය හා නිදහස තහවුරු කිරීම

- සියලු පළාත් තුළ දේශපාලන ක්‍රියාකාරකම්වලට අවශ්‍ය මත දැක්වීමේ, සංවිධානය වීමේ හා රැස්වීමේ නිදහස තහවුරු කිරීම
- නිල නොවන සන්නද්ධ කණ්ඩායම් නිරායුද කිරීම
- සියලු පළාත් තුළ ජනතාවට ගමන් බිමන් යෑමට, එදිනෙදා කටයුතුවල යෙදීමට හා නිදහසේ ජීවත්වීමට ඇති අයිතිය තහවුරු කිරීම
- පොලිස් සේවාව ආරක්ෂක අමාත්‍යංශයෙන් ඉවත් කිරීම
- ජන ජීවිතය හා බැඳී පවතින සිවිල් ආයතනවලට ආරක්ෂක අංශ නිලධාරීන් පත් නොකිරීම
- සියලුම ජනමාධ්‍ය ආයතනවලට හා මාධ්‍යවේදීන්ට පොදුවේ රටේ සියලුම ප්‍රදේශවලද විශේෂයෙන් උතුරේද බාධාවකින් තොරව තම මාධ්‍ය කටයුතු කරගෙන යාමට අවශ්‍ය නිදහස තහවුරු කිරීම
- උතුරේ ජනතාවගේ අධිකරණ සේවා කටයුතු කඩිනම් කිරීම හා පහසු කිරීම සඳහා අවශ්‍ය කටයුතු කිරීම හා නීති ආධාර සේවාවන් මැනවින් ක්‍රියාත්මක කිරීම
- උතුරු හා නැගෙනහිර ප්‍රදේශවල සිවිල් යුද්ධයෙන් පසු ආරම්භ වූ ආගමික ස්ථානවල නිත්‍යානුකූල බව සොයා බැලීමට ස්වාධීන කොමිසමක් පත්කිරීම
- පුරාවිද්‍යා දෙපාර්තුමේන්තුවේ ක්‍රියාකාරිත්වය ස්වාධීන හා අපක්ෂපාතී කිරීම
- ජාතික සමගියට බාධා වන කරමින් සිදුවන ආගමිකකරණය නැවැත්වීම

## යුද්ධයෙන් පීඩාවට පත් ප්‍රදේශ යථාවත් කිරීම

- උතුරු පළාතේ කලක් පැවති කර්මාන්ත ශාලා නැවත ආරම්භ කිරීම (උදාහරණ: පරන්තන් රසායන ද්‍රව්‍ය කම්හල)
- කිලිනොච්චිය හා මුලතිව් දිස්ත්‍රික්කවල විශාල වශයෙන් සත්ව පාලන කටයුතු ක්‍රියාත්මක කළ හැකිය. දැනටමත් එම දිස්ත්‍රික්කවල සත්ව පාලන කටයුතු සිදුවන බැවින් කිලිනොච්චි හා වව්නියා දිස්ත්‍රික්කවල කිරි කර්මාන්ත ශාලා පිහිටුවීම
- උතුරු පළාතේ ඇති රජයේ ගොවිපොළ යළි ක්‍රියාත්මක කිරීම හා ගොවි ජනයා සඳහා අවශ්‍ය පහසුකම් හා සහන ලබා දීම
- උතුරු පළාතේ සියලු වැව් අමුණු වසර දෙකක් තුළ ප්‍රතිසංස්කරණය කිරීම
- ධීවර කටයුතු විශාල වශයෙන් කෙරෙන මුලතිව් දිස්ත්‍රික්කයේ ජනතාවට ඒ සඳහා අවශ්‍ය යටිතල පහසුකම් ලබා දීම
- ඉන්දියානු ධීවර ආක්‍රමණය නතර කර ලංකාවේ ධීවර ජනයාට තම මුහුදු තීරයේ තර්ජනයකින් තොරව ධීවර කර්මාන්තය කරගෙන යෑමට හැකිවන පරිදි කටයුතු සැලැස්වීම
- ධීවර කර්මාන්තය නවීන තාක්ෂණය හඳුන්වාදීම සඳහා තුන් අවුරුදු වැඩපිළිවෙළක් ක්‍රියාවට නැංවීම
- උතුරු ජනතාවගේ ජීවනෝපාය වැඩි දියුණු කිරීම සඳහා ස්වයං රැකියා වැඩපිළිවෙළක් හඳුන්වාදීම

- ඒ වෙනුවෙන් වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන දිස්ත්‍රික් මට්ටමෙන් ආරම්භ කිරීම
- යුද්ධයෙන් විනාශ වූ සියලු ආගමික ස්ථාන යළි ගොඩනගා දීම
- පුරාවිද්‍යා වටිනාකමක් ඇති ස්ථාන ආරක්ෂා කිරීම රජයේ වගකීමක් ලෙස සලකා අපක්ෂපාතීව ක්‍රියා කිරීම
- සිවිල් යුද්ධයේ වින්දිතයන් ලෙස ඉමහත් පීඩාවකට පත්ව සිටින උතුරේ හා නැගෙනහිර වැන්දඹු මෙන් ආබාධිත සියලු දෙනාට සාධාරණත්වය ඉටු කිරීම
- උතුරු පළාතේ ව්‍යාපාර හා කෘෂිකර්මාන්තයේ යෙදෙන ජනතාවට රාජ්‍ය බැංකු මගින් සහන ණය ලබා දීමේ ක්‍රමවත් වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම
- ආදායම් උපයන පවුලේ සාමාජිකයෙකු අතුරුදහන්වීම නිසා අසරණභාවයට පත්වී ඇති පවුල් සඳහා මාසිකව රු. 10,000.00ක දීමනාවක් ලබා දීම

# ජාතික සමගිය

- ජාතිවාදය, ආගම්වාදය හා කුලවාදය යනාදී ජනතාව භේද කරන සියලු මානව විරෝධී හා සමාජ විරෝධී මතවාද පැතිරවීම හා ඒවා ඉස්මතු කිරීම, ඒ සඳහා අන් අය පෙළඹවීම හා අනුබල දීම නැවැත්වීමට නෛතික පියවර ගැනීම
- ජාතිකත්ව, ආගමික හෝ වෙනත් කිසිදු වෙනස්කමක් මත කිසිදු පුරවැසියකු නින්දාවට, අපහසයට, අපහසුතාවයට, අසාධාරණයට පත්කිරීම සපුරා තහනම් කළ යුතු අතර එවැනි තත්වයන්ට පාත්‍රවන සියලු දෙනාගේ පැමිණිලි භාරගැනීමට, එවා පරීක්ෂණය කිරීමට හා ඒ පිළිබඳ චූදිතයන් අධිකරණයට පැමිණවීමට බලය ඇති වෙනස් කොට සැලකීම වැළැක්වීමේ කොමිසම් සභාවක් (Commission Against Discrimination) ස්ථාපිත කිරීම
- ජාතික සමගිය වෙනුවෙන් අවංකව කැපවූ සිංහල, දෙමළ, මුස්ලිම්, මැලේ, බර්ගර් හා වෙනත් පුද්ගල චරිත හා ඔවුන්ගේ ක්‍රියා පිළිවෙත් පිළිබඳ කතිකාවන් අරම්භ කිරීම

## ආගමික සහජීවනය

- ප්‍රධාන ආගම් සියල්ලේම අඩංගු විමුක්තිදායක දැක්ම පිළිබඳ කතිකාවන් ඇසුරින් ජාතික සමගියට ප්‍රායෝගික ක්‍රියාමාර්ගයක් සැකසීම
- ප්‍රධාන ආගම්වල ප්‍රාරම්භකයන්ගේ මුල් ධර්මය පසුකාලීනව විකෘති වීමෙන් ජාතික සමගියට ආයතනික ආගම් බාධාවන්නේ කෙසේද යන්න පිළිබඳ සමාජ කතිකාවක් ඇති කිරීම
- බුදු දහමේ හා කිතු දහමේ මෙන්ම හින්දු, ඉස්ලාම් හා අන් ආගම්වල අඩංගු විමුක්තිදායක පණිවිඩය වැදගත් වන්නේ කෙසේද යන්න පිළිබඳ අන්තර් ආගමික සංවාද ආරම්භ කිරීම

# කාන්තා අයිතිවාසිකම්

ඓතිහාසික සමාජ සංවර්ධනයේ කාන්තාවගේ භූමිකාව ඉතා සාධනීය සහ වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. ශ්‍රී ලාංකේය කාන්තාවට නිසි තැන දැනටමත් ලැබී ඇතැයි විවිධ අවස්ථාවල විවිධ පුද්ගලයන් විසින් අප සමාජය තුළ ආඩම්බරයෙන් පවසා ඇත. විශේෂයෙන්ම අධ්‍යාපන සහ සෞඛ්‍ය දර්ශක තුළ කාන්තාවන් අන් රටවලට සාපේක්ෂව ඉහළ තැනක සිටින නිසාත් වෙනත් සමාජ හා සසඳන කල කාන්තාවට බරපතළ අන්දමේ සම්ප්‍රදායික භාවිතයන් (Traditional Methods) අවම වීමත් මෙම මතය ජනප්‍රිය වීමට හේතු වී ඇත.

නමුත් ලාංකේය කාන්තාවගේ තත්වය බැරෑරුම් ලෙස අධ්‍යයනය කළ විට සෑහීමකට පත්විය නොහැකි කාරණා බොහොමයක් ඇත. අධ්‍යාපන ක්ෂේත්‍රයේ කාන්තාවන්ගේ සහභාගිත්වය සහ ප්‍රතිඵල ඉහළ මට්ටමක ඇති නමුත් අනෙකුත් ක්ෂේත්‍රවල කාන්තාවෝ අර්බුද රැසකට මුහුණ දෙති. රැකියා ක්ෂෙත්‍රය තුළ වෙනස්කොට සැලකීම්, දේශපාලන සහ වෙනත් සමාජ සහභාගිත්වය සහ නායකත්වය ගැනීම් අවම මට්ටමක පැවතීම, කාන්තාවන්ට එරෙහිව හිංසනය, ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය, සියදිවි නසා ගැනීම් හා තැත් කිරීම පිළිබඳ ඉහළ වාර්තා ආදිය අපේ සමාජය තුළ කාන්තාව මුහුණ දෙන අභියෝග අතර ප්‍රධාන තැනක් ගනී.

ආර්ථික ක්ෂේත්‍රයේ විශේෂයෙන්ම දැනට පවතින ධනවාදී ආර්ථික ක්‍රමය තුළ වඩාත්ම සුරාකෑමට ලක්වන අවදානම් ඉහළ නමුත් නිසි ඇගැයීමකට ලක් නොවන ක්ෂේත්‍රවල (වතු, ඇඟලුම්, පිටරට රැකියා, අවිධිමත් ක්ෂේත්‍රය) වැඩිම සංඛ්‍යාවක් සේවා සපයන්නේ කාන්තාවය. සමාජ ආරක්ෂණ සහ ආර්ථික කඩා වැටීම වල පළමු ගොදුර වන්නේද කාන්තාවය.

කාන්තාව සංස්කෘතිමය වශයෙන් පීඩනයට ලක්වීම අතිශය බරපතළ තත්වයකි. කාන්තාවන්ට විවිධ පසුගාමී සංස්කෘතික සම්ප්‍රදායන්ට හා රාමුවලට සිරවී සිටීමට බල කරනු ලැබ ඇත. මේ නිසා අප සමාජය තුළ ස්ත්‍රී පුරුෂ සම්බන්ධතා, ලිංගිකත්වය හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය වැනි දේ සම්බන්ධයෙන් ඇත්තේ පටු සාම්ප්‍රදායික සහ පසුගාමී අදහස්ය. කාන්තාවන් මුහුණදෙන මෙම සමාජ තත්වය වෙනස් කිරීමට නම් පවුල් සංස්ථාවන් තුළ මෙන්ම අනෙකුත් ආර්ථික, දේශපාලන හා සංස්කෘතික ආයතනවල කාන්තාව පිළිබඳ ආකල්පමය වෙනසක් ඇති කරමින් සම පිළිගැනීමට ලක්වීමත් අනිවාර්ය විය යුතුය. මෙම දීර්ඝකාලීන පරිවර්තනය සඳහා පසුබිම සැකසීම සඳහා පහත අන්තර්කාලීන යෝජනා ඉදිරිපත් කරමු.

- කාන්තාවන්ට පවුල සහ පොදු ස්ථානවල වෙනස් කොට සලකන සාම්ප්‍රදායික නීති හා සමාජ රීති ඉවත් කිරීම
- තීරණ ගන්නා සෑම මට්ටමක සහ ආයතන තුළ කාන්තා සහභාගිත්වය වර්ධනය කිරීමට පියවර ගැනීම
- කාන්තාවන් විවිධ ක්ෂේත්‍රයන්හි මුහුණ දෙන අනාරක්ෂිත බව හිංසනයන් පිටු දැක ඔවුනගේ රැකවරණය සැලසීම සඳහා සමාජ ආරක්ෂණ ව්‍යුහයක් ස්ථාපනය කිරීම
- ස්ත්‍රී පුරුෂ සමාජභාවය සංවේදීතාවය දියුණු කිරීමට ස්ත්‍රී පුරුෂ දෙපාර්ශවය සඳහාම පාසල් විශ්වවිද්‍යාල වැනි අධ්‍යාපනික ආයතන තුළ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
- නිවස හා පොදු ස්ථානවල හිංසනයෙන් තොරව ජීවත් වීමේ අයිතිය තහවුරු කිරීමට අදාළ නීති ආරක්ෂක සහ සමාජ ආධාරක ව්‍යුහයන් ශක්තිමත් කිරීම
- කාන්තා සෞඛ්‍යය පිළිබඳව අවධානය යොමු කරන පර්යේෂණ, දැනුවත් කිරීම් සහ සේවාවන් ශක්තිමත් කිරීම

# ළමා පරපුර හා තාරුණ්‍යය

ඕනෑම සමාජයක අනාගතය රඳාපවතින්නේ, එහි තරුණ සහ ළමා පරපුරෙහි ගුණාත්මක සංවර්ධනයයි. අධ්‍යාපන වැනි සමාජ සුරක්ෂිත ව්‍යුහයන් පිළිබඳ බලාපොරොත්තු බිඳවැටීම නිසා ළමා පරපුර සහ තාරුණ්‍යය තමන්ගේ අනාගතය සහ සමාජ ආයතන ගැන ඇති විශ්වාසය අහිමි කර ගනිමින් විනාශකාරී භාවිතයන්ට පෙළඹේ. සමාජ සුරක්ෂිතභාවය සහ ආධාරක පද්ධති කඩා වැටීම නිසා හිංසනයට සුරාකෑමට, ප්‍රචණ්ඩත්වයට සහ නොසලකා හැරීමට ලක් වෙති. වැඩිහිටි ලෝකයට පිවිසීමට අවශ්‍ය දැනුම ආකල්ප සහ ආත්ම විශ්වාසය නොලබති. මෙම තත්වය වළක්වා ගැනීම සඳහා අධ්‍යාපන, සෞඛ්‍ය ආර්ථික පද්ධති තුළ මෙන්ම ඔවුන්ගේ රැකවරණය සඳහා සාධනීය පොදු වෙනස්කම්ද ඇතිවිය යුතුය.

- ළමා සහ යෞවනයන් පිළිබඳ රාජ්‍ය ආයතන තුළ වගකීම සහ කාර්යභාරය වෙන් වෙන් වශයෙන් හඳුනාගෙන ප්‍රතිසංවිධානය කර ශක්තිමත් කිරීම
- හිංසනය, නොසලකා හැරීම, ප්‍රචණ්ඩත්වය සහ නීතිය සමග ගැටීමට හසුවන ළමුන් සහ යෞවනයන් පවුල සහ ප්‍රජාව තුළ රැක ගැනීමට හා පුනරුත්ථාපනය කිරීමට ප්‍රමුඛතාවය දෙමින් පවුල සහ ප්‍රජාව තුළ රැක බලා ගැනීමේ ව්‍යුහයන් ශක්තිමත් කිරීමට පියවර ගැනීම
- අත්‍යවශ්‍ය හේතූන් මත පමණක් පවුල හෝ ප්‍රජාව තුළින් වෙන් කරන ළමුන් ආයතනගත කිරීමට සිදු වුවහොත් එම ආයතන තුළ තිබිය යුතු අවම ප්‍රමිතීන් හඳුනාගෙන නිතිගත කර එම ප්‍රමිතීන් පවත්වා ගෙන යාමට අවශ්‍ය සහය තහවුරු කරමින් එම ආයතන තුළ එම ප්‍රමිතීන් නිරන්තර අධීක්ෂණයට භාජනය කිරීම
- විවිධ හේතූන් මත නීතිය සමග ගැටෙන හෝ නීතිය ඉදිරියට එන ළමුන් සහ යෞවනයන් සඳහා නීතිමය රැකවරණය ලබා දීම
- වීදි දරුවන්ට අධ්‍යාපන හා සෞඛ්‍ය හා අනෙකුත් සේවාවන්වල සමාන ප්‍රවේශ අවස්ථාවන් ලබා දෙමින් ඔවුන් සමාජගත කිරීම සඳහා විශේෂ වැඩසටහන් සකස් කිරීම

# වැඩිහිටි ජනගහනය

සිය ජීවිතයේ වැඩි කාලයක් සිය පවුල ඇතුළු සමාජ ආර්ථික සංවර්ධනට දායක වූ වැඩිහිටියන් ඔවුනගේ සැඳෑ සමය තුළ රැක බලා ගැනීම සමාජ වගකීමකි. සමහර ප්‍රතිපත්ති සම්පාදකයින් සමස්ත ජනගහනය තුළ වැඩිහිටි ජනගහනය වැඩිවීම ගැටලුවක් ලෙස හඳුනා ගත්තද වගකීම් සහගතව එම තත්වය අවබෝධය කර ගනිමින් වැඩිහිටියන් වෙනුවෙන් විශේෂ අවධානයකින් කටයුතු කිරීම සමාජ වගකීමක් වේ. 2012 පැවති ජන සංගණනයේදී වැඩිහිටි ජනගහනය (වයස 60ට වැඩි) පමණක් මිලියන 2.5කි. එය වර්තමානයේ සමස්ත ජනගහනයෙන් 12.4%කි. ශ්‍රී ලංකාවේ ජන සමාජයේ පවතින සංස්කෘතික ලක්ෂණ අනුව වයස්ගත වැඩිහිටියන් රැක බලා ගැනීම පවුලේ දූ දරුවන් හා නෑදෑයින් විසින් විවිධ දුෂ්කරතා මැද සිදු කළද එම සංස්කෘතික වටිනාකම් පවත්වාගෙන යමින් එම වැඩිහිටියන් රැකබලා ගැනීම මුළුමහත් සමාජයේම වගකීමක් බව අපගේ විශ්වාසයයි.

## ක්‍රියාමාර්ග

- නිවෙස් තුළ වැඩිහිටියන් රැක බලා ගැනීමේ කටයුතු කරන අවස්ථාවල ඊට අවශ්‍ය මූලික පහසුකම් නොමිලේ සැපයීම
- නිවෙස් තුළ සිටින වැඩිහිටියන්ගේ සෞඛ්‍ය කටයුතු මාසිකව සොයා බැලීම සඳහා සෞඛ්‍ය කණ්ඩායම් යෙදවීම
- වැඩිහිටි සුරැකීමේ මධ්‍යස්ථානවල තිබිය යුතු අවම පහසුකම් නිර්ණය කොට සෑම පළාත් පාලන බල ප්‍රදේශයක්ම ආවරණය වන පරිදි ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූල වැඩිහිටි සුරැකුම් මධ්‍යස්ථාන පද්ධතියක් ඇති කිරීම
- රජය මගින් වැඩිහිටි ජනතා සෞඛ්‍යය සඳහා විශේෂ ක්‍රමවේදයක් සකස් කිරීම
- යහපත් මානසික තත්වයක් පවත්වාගෙන යාම සහ සමාජ සම්භාෂණය ඇති කිරීම සඳහා වැඩිහිටි අය නිර්මාණාත්මක ආර්ථික කටයුතුවලට සම්බන්ධ කරන වැඩසටහනක් සකස් කිරීම
- දේශපාලන හෝ වෙනත් හිතවත්කම්වලින් තොරව වැඩිහිටි අයගේ අත්දැකීම් සහ දැනුම උපදේශාත්මක ලෙස ලබා ගැනිම සඳහා විධිමත් ක්‍රමවේදයක් සකස් කිරීම
- පෞද්ගලික අංශයේ හා අවිධිමත් රැකියා අංශවල නියුතු අය සඳහා සමාජ ආරක්ෂණ වැඩපිළිවෙළක් ක්‍රියාවට නැංවීම
- සියලු වැඩිහිටියන්ට රැකවරණය ලැබෙන රක්ෂණාවරණයක් ක්‍රියාත්මක කිරීම සඳහා අරමුදලක් ස්ථාපිත කිරීම
- වැඩිහිටියන්ගේ එදිනෙදා ජීවිතය නිදහස් පරිසරයක් තුළ සතුටින් ගත කිරීම සඳහා ඇවිදින මංතීරු, ආගමික සිද්ධස්ථාන අසල නිවාඩු නිකේතන ඇතිකිරීමට දිරිගැන්වීම සහ රජයේ මැදිහත්වීමෙන් ඉදි කිරීම
- වැඩිහිටි හා ආබාධිත පුද්ගලයින්ට පොදු ප්‍රවාහන සේවා නොමිලේ ලබා දීම
- පොදු සේවා සපයන ස්ථානවල වැඩිහිටි අය වෙනුවෙන් ප්‍රමුඛතා වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම

- දුෂ්කරතා ඇති වැඩිහිටි අය සඳහා ජීවන අංකයට සරිලන මූල්‍ය දීමනාවක් ලබා දීම
- වැඩිහිටි හා ආබාධිත පුද්ගලයන් රැකබලා ගැනීම පිළිබඳ වෘත්තීය පාඨමාලා ඇතිකිරීම
- වැඩිහිටි ජනගහනයේ සුභසාධනය, රැකබලා ගැනීම යනාදිය වෙනුවෙන් රාජ්‍ය ආයතනයක් ස්ථාපිත කිරීම

# සිරකරු සුභසාධනය

පසුගිය කාලයේ විවිධ බන්ධනාගාරවල සිරකරුවන් ඝාතනය කිරීම් සහ අමානුෂික ලෙස හිංසා කිරීම් පිළිබඳ සිදුවීම් වාර්තා වීමෙන් පෙනීයන්නේ, 'සිරුකරුවෝද මනුෂ්‍යයෝය' යන්න වර්තමානය වන විට හුදෙක් තේමා පාඨයකට පමණක් සීමා වෙමින් පවතින බවයි. තදබදය සහ සිරකරුවන්ට අවශ්‍ය මූලික පහසුකම් නොමැතිවීම බන්ධනාගාර මුහුණ දෙන බරපතළ ගැටලු වේ. බන්ධනාගාරය සිරකරුවන් ප්‍රතිශෝධන කරන ස්ථානයකට වඩා ඔවුන්ට දඬුවම් දීම අරමුණ කරගත් ස්ථානයක් බවට පත් වී ඇත. බන්ධනාගාර තුළ සිදුවන මත්ද්‍රව්‍ය ජාවාරම් සහ පාතාල ක්‍රියාකාරකම් නිසා වර්තමානය වන විට ඒවා අපරාධ ඉගෙනුම් මධ්‍යස්ථාන බවට පත්වී යහපත් කල් ක්‍රියාවෙන් සිර ජීවිතය ගෙවන පිරිස්වලට බාධා පමුණුවා ඇත. නීති කටයුතු අවසන් වීමට දීර්ඝ කාලයක් ගතවීම නිසා රිමාන්ඩ් සිරකරු ගහනය වැඩිවීම බන්ධනාගාර තදබදයට ප්‍රධාන හේතුවකි. 2017 වසරේ රිමාන්ඩ් සිරකරුවන් 99,036ක්ද (Unconvicted) වරදකරුවන් කරන ලද සිරකරුවන් (Convicted) 22,833ක්ද සිටි අතර ඔවුන් සියලු දෙනා මනුෂ්‍යයන් ලෙස සලකමින් කටයුතු කිරීම සඳහා වූ ක්‍රමවේදයක් කෙරේ අවධානය යොමු කළ යුතුය.

## ක්‍රියාමාර්ග

- බන්ධනාගාර තුළ සිදුවන සියලුම ආකාරයේ හිංසනයන් වැළැක්වීම සඳහා ක්‍රමවත් වැඩපිළිවෙළක් සකස් කිරීම
- මානසික මට්ටම් පිළිබදව විශ්ලේෂණයක් කොට ඒ අනුව රැඳවියන් කාණ්ඩ ගත කොට රඳවා තැබීම
- ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූල වන පරිදි බන්ධනාගාරවල ඉඩ පහසුකම් ඇතුළු අනෙකුත් පහසුකම් පුළුල් කිරීම
- ප්‍රජා විශෝධන පනත විධිමත්ව ක්‍රියාත්මක කොට සුළු වැරදිවලට දඬුවම් ලබන අය බන්ධනාගාර ගත නොකොට ප්‍රජා වැඩසටහන් සඳහා යොමු කිරීම
- රැඳවියන් කුඩා කණ්ඩායම් වශයෙන් ගෙන ඔවුන් ප්‍රතිශෝධනය කිරීම සඳහා උපදේශන සහ අධ්‍යාපනික වැඩසටහන් ක්‍රියාවට නැංවීම
- රැඳවියන්ගේ ශාරීරික සෞඛ්‍යය පවත්වාගෙන යාම සඳහා විධිමත් අභ්‍යාස වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
- දීර්ඝ කාලීනව සිරදඬුවම් විඳින සිරකරුවන් විවිධ නිෂ්පාදන හා සේවා සඳහා යොදා ගැනීමේ වැඩසටහනක් හඳුන්වා ගැනීම

- යහපත් කල් ක්‍රියාවෙන් යුත් සිරකරුවන් එළිමහන් සිරකඳවුරුවල රඳවා තැබීම හා බලපත්‍ර යටතේ නිවෙස් වෙත යාම සඳහා වූ ක්‍රමවේදය විධිමත් කොට ස්ථාපිත කිරීම
- සෑම බන්ධනාගාරයකම අධ්‍යාපනික හා වෘත්තිය පුහුණු මාර්ගෝපදේශන පාඨමාලා ක්‍රියාත්මක කිරීම
- රිමාන්ඩ් සිරකරුවන් ලෙස දීර්ඝකාලීනව රඳවා තැබීම වැළැක්වෙන පරිදි අපරාධ යුක්ති ක්‍රමයට සම්බන්ධ ආයතනවල කාර්යක්ෂමතාව ඉහළ නැංවීම

# ආබාධ සහිත පුද්ගලයන්ගේ සුබසාධනය

ශ්‍රී ලංකාවේ ජනගහනයෙන් 8%ක් පමණ ආබාධ සහිත පුද්ගලයින් වන අතර එයින් 57%ක් ආබාධ සහිත කාන්තාවෝ වෙති. මෙම පිරිසෙන් වයස අවුරුදු 15-19 අතර පසුවන පුද්ගලයෝ 30,308ක් කිසිදු අධ්‍යාපන කාර්යයක නිරත නොවෙති. වයස අවුරුදු 16 දක්වා වූ ළමයින්ට අනිවාර්ය අධ්‍යාපනය හිමි විය යුතු වුවත් මෙම පිරිස අතරින් වයස 5-9 අතර සිටින ළමයින් 31,545න් 6,404 (20%)ක් අධ්‍යාපනය නොලබති. කිසිදු ආර්ථික කටයුත්තක නොයෙදෙන ආබාධ සහිත පුද්ගල සංඛ්‍යාව 71%ක් වන තරම් විශාල ප්‍රමාණයකි. ආබාධ සහිත පුද්ගලයින්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා සම්මත කරන ලද කොතෙකුත් නීති සහ රෙගුලාසි ඇතත් අප රට තුළ ආබාධ සහිත පුද්ගලයින් සඳහා අවශ්‍ය මූලික පහසුකම්වත් ගොඩනැගී නොමැත. ආබාධ සහිත පුද්ගලයින්ට තමන්ට අවශ්‍ය සෞඛ්‍ය පහසුකම් ලබාගැනීම, අධ්‍යාපන අවස්ථා ලබාගැනීම මෙන්ම රැකියාවක් ලබාගැනීම ඇතුළු ස්වාධීනව දිවි පැවැත්මක් ගත කිරීම සඳහා දරන උත්සාහයන්හිදී අනේකවිධ වූ ආකල්පමය, සංස්කෘතික, සමාජීය සහ දේශපාලන ගැටලු සහ අභියෝගවලට මුහුණ පෑමට සිදු වේ.

## මූලධර්ම

- ආබාධ සහිත තැනැත්තන්ටද අනෙකුත් පුරවැසියන්ට හිමි අවස්ථා, වරප්‍රසාද සහ අයිතිවාසිකම් සමව භුක්ති විඳීමට ඇති අයිතිය පිළිගැනීම
- සෞඛ්‍ය, අධ්‍යාපන, ප්‍රවාහන වැනි සේවාවන් සැපයීමේදී ආබාධ සහිත පුද්ගලයින්ගේ සුවිශේෂී අවශ්‍යතාවයන් අවධානයට යොමු කරමින් ඔවුන් සඳහා විශේෂ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
- ආබාධ සහිත පුද්ගලයින් සමාජයේ සුවිශේෂ අවශ්‍යතා ඇති පුද්ගලයින් ලෙස සලකා ඔවුන්ගේ සුබසාධනය ආරක්ෂාව සහ රැකවරණය රජයේ වගකීමක් ලෙස සැලකීම

## විසඳුම් ක්‍රියාමාර්ග

### නෛතික රාමුව

- ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා කෙටුම්පත් කර ඇති පනත ආබාධ සහිත ප්‍රජාවට හිතකර ලෙස සහ ඔවුන්ගේ මූලික අයිතිවාසිකම් සුරැකෙන ලෙස යළි සකස් කර පාර්ලිමේන්තුවේ සම්මත කිරීම

- එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තියේ (UNCPRD) 33 වගන්තියේ (i) අනු වගන්තියට අනුකූලව රජයේ ඉහළම දේශපාලන නායකත්වයෙන් මෙහෙයවන සම්බන්ධීකරණ යාන්ත්‍රණයක් මෙන්ම එම ප්‍රඥප්තියේ (ii) අනු වගන්තියට අනුකූලව රජයේ මැදිහත්වීම්වලින් පරිබාහිර ස්වාධීන අධීක්ෂණ යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම
- ආබාධ සහිත පුද්ගලයින්ගේ අයිතිවාසිකම් පිළිබඳව අධිකරණ පද්ධතියේ සියලුම අංශ දැනුවත් කිරීමත් සමානාත්මතාවය නිසි අයුරින් ක්‍රියාත්මක වන බවට සහතික කිරීමත් ඒ සඳහා යෝග්‍ය ක්‍රියාමාර්ග ගැනීමත් එය අඛණ්ඩව අධීක්ෂණය කිරීමත් රජය විසින් සිදු කිරීම

## අධ්‍යාපන සහ පුහුණු අවස්ථා

- පාසැල් යා යුතු වයසේ පසුවන සියලුම ආබාධ සහිත ළමුන්ට අධ්‍යාපනය ලැබීමට ඇති අයිතිය පිළිගනිමින් අන්තර්කරණ අධ්‍යාපන විධික්‍රම පාසැල් අධ්‍යාපනයට ඇතුළත් කිරීම
- තමන් කැමති ඕනෑම විෂය ධාරාවකින් උසස් අධ්‍යාපනය හැදෑරීමේ අවස්ථාව ආබාධ සහිත පුද්ගලයින්ටද ලබාදෙන අතර ඒ සඳහා පහසුකම් සැලසීමට විශේෂ ශිෂ්‍යත්ව ක්‍රමයක් හඳුන්වා දීම
- ආබාධ සහිත පුද්ගලයින්ට ඔවුන්ගේ ආබාධයේ ස්වභාවය අනුව නිරත විය හැකි රැකියා ක්ෂේත්‍ර හඳුනා ගනිමින් ඒ සඳහා අවශ්‍ය වන වෘත්තීය පුහුණු ලබාදීම සහ ඒ සඳහා විශේෂ පුහුණු මධ්‍යස්ථාන පිහිටුවීම
- ආබාධ සහිත ළමුන්ට අධ්‍යාපන අවස්ථා ලබා දෙන විශේෂ නේවාසික අධ්‍යාපන ආයතනවල ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීමට කටයුතු කිරීම

## රැකියා අවස්ථා

- රජයේ මෙන්ම පෞද්ගලික අංශයේද රැකියාවලට බඳවා ගැනීමේදී ආබාධ සහිත පුද්ගලයින්ට සම අවස්ථා ලබා දෙන අතර රාජ්‍ය අංශයේ රැකියා ලබාදීමේදී දැනට පවතින කෝටාව 3% සිට 5% දක්වා ඉහළ නංවන අතර එම කෝටා ක්‍රමය පෞද්ගලික අංශයටද හදුන්වා දීම

## ප්‍රවේශ පහසුකම්

- ආබාධ සහිත පුද්ගලයින්ට පොදු ස්ථානවලට සහ පොදු ගොඩනැගිලිවලට ප්‍රවේශ පහසුකම් ලබාදීම සඳහා පනවනු ලැබූ 2006 අංක 1 දරන ප්‍රවේශ පහසුකම් රෙගුලාසි බලාත්මක කරන අතර එම රෙගුලාසි ක්‍රියාත්මක කිරීම අනිවාර්ය කිරීම
- ආබාධ සහිත පුද්ගලයින්ගේ ඡන්ද අයිතිය තහවුරු කිරීමට අවශ්‍ය පහසුකම් රජයේ මැදිහත්වීමෙන් ලබා දීම

### සෞඛ්‍ය සේවා

- ආබාධ සහිත තැනැත්තන් හට රෝහල් තුළදී සිදුවන අපහසුතාවයන් අවම කිරීමටත් ඔවුන්ට අවශ්‍ය සේවාවන් ප්‍රමාදයකින් තොරව ලබාදීම සඳහා සෑම රෝහලකම කේන්ද්‍රීය ස්ථානයක් සහ/ හෝ සහාය කවුළු හඳුන්වාදීම
- රජයේ රෝහල්වල සේවා පිළිබඳ ශ්‍රව්‍ය දෘෂ්‍ය සන්නිවේදන පුවරු පිහිටුවීමට මෙන්ම භෞතික ප්‍රවේශ පහසුකම් වැඩි දියුණු කිරීමටත් සංඥා භාෂා පරිවර්තකයින්ගේ සේවා ලබා දීමටත් කටයුතු කිරීම

### සමාජ ආරක්ෂණය

- දෙමාපිය ඇවෑමෙන් පසු තම ආරක්ෂාව සහ රැකවරණය අහිමිවීම නිසා බුද්ධිමය ඌණතා සහ බහු ආබාධ සහිත තැනැත්තන්ට බරපතළ නීතිමය සහ වෙනත් ගැටලුකාරී තත්වයන්ට මුහුණ දීමට සිදුවන බැවින් ඔවුන් සඳහා විශේෂ සමාජ ආරක්ෂණ සහ විශේෂ සමාජ රක්ෂණ වැඩසටහන් ක්‍රියාත්මක කරන අතර විශේෂයෙන්ම දෙමාපියන්ගෙන් පසුව භාරකාරත්වය පැවැරීමේ නීතිමය ප්‍රතිපාදන ඇති කිරීම
- විකල්ප මාධ්‍යවලින් සන්නිවේදනය කිරීමේ පහසුකම් අධිකරණ පද්ධතිය තුළ නොමැති නිසා ආබාධ සහිත තැනැත්තන් (විශේෂයෙන්ම බිහිරි තැනැත්තන් සහ බුද්ධිය ඌනතා සහිත තැනැත්තන්) වින්දිතයන් වූ විට මෙන්ම චූදිතයින් වූ විටද නීතියේ පිළිසරණ නොමැතිව නොයෙකුත් ආකාරයේ වෙනස්කොට සැලකීම්වලට මුහුණ දීම වැළැක්වීම සඳහා අධිකරණ පද්ධතියේ සියලුම අංශ දැනුවත් කිරීමත්, සමානාත්මතාවය නිසි අයුරින් ක්‍රියාත්මක වන බවට සහතික කිරීමත් ඒ සඳහා යෝග්‍ය ක්‍රියාමාර්ග ගැනීමත් එය අඛණ්ඩව අධීක්ෂණය කිරීමත් සිදු කිරීම
- ආබාධ සහිත කාන්තාවන් මුහුණ දෙන ගැටලුවලට විසඳුම් යෝජනා කිරීම සඳහා ආබාධ සහිත කාන්තාවන්ගේ නියෝජනයක් සහිත පූර්ණ බලැති කමිටුවක් පිහිටුවීම

# සමරිසි ප්‍රජාව

ඇතැම් ගතානුගතික හා පසුගාමී සමාජ සංස්කෘතික ආකල්ප නිසා සමරිසි ප්‍රජාව වෙනස් කොට සැලකීමට ලක්වී ඇති අතර එම පිරිස් පීඩනයට ලක්කරන යටත්විජිත නෛතික රාමු තවදුරටත් පවත්වා ගෙන යාම මෙම තත්වය තවත් බරපතළ කරයි. මෙම ජන කොටස්වල ජීවවිද්‍යාත්මක වෙනස්කම් පිළිගනිමින් ඔවුන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමටත් ප්‍රධාන සමාජ ප්‍රවාහය තුළ ආන්තිකරණයට ලක් වීමට ඉඩ නොදී කටයුතු කිරීමත් අත්‍යවශ්‍ය වේ.

### ක්‍රියාමාර්ග

- ලංකා දණ්ඩ නීති සංග්‍රහයේ 365 සහ 365 A වගන්ති සමරිසි ප්‍රජාවට අදාළ නොවන පරිදි සංශෝධනය කොට ඒවා වැඩිහිටි තැනැත්තන් අතර ස්වකැමැත්තෙන් පෞද්ගලික අවකාශයේ සිදුවන ලිංගික ක්‍රියාවන් ලෙස පිළිගැනීම

- සමරිසි ප්‍රජාව වෙනස් කොට සලකා අත්තනෝමතිකව අත්අඩංගුවට ගෙන දඬුවම් පැමිණීම වැළැක්වීම සඳහා අදාළ ආඥා පනත සංශෝධනය කිරීම
- සමරිසි ප්‍රජාව නීතිය ඉදිරියේ සමානව සැලකුම් ලැබීම තහවුරු කරන අතරම සමරිසි ප්‍රජාවට සුවිශේෂී වූ  අයිතීන් හඳුනාගෙන ඒවා බලාත්මක කිරීමට කටයුතු කිරීම
- සමරිසි ප්‍රජාවට එරෙහි වෛරී ප්‍රකාශන සහ ප්‍රචණ්ඩත්වය වැළැක්වීම සඳහා විශේෂ පනතක් සම්මත කිරීම
- සමරිසි ප්‍රජාවගේ ආරක්ෂාව තහවුරු කිරීමට සහ එම ප්‍රජාවගේ දුක් ගැනවිලි අමන්ත්‍රණය කළ හැකි නිසි බලය ලත් ලේකම් කාර්යාලයක් පිහිටුවීම

# ශ්‍රමයේ ගෞරවය

සමාජ සංවර්ධනයේ ගාමක බලය ශ්‍රමයයි. නමුත් වත්මන් අර්ථක්‍රමය තුළ ශ්‍රමිකයාට හිමිවිය යුතු සමාජීය ස්ථානය හා වැදගත්භාවය පිළිබඳ පවතින්නේ අවතක්සේරුවකි. මෙරට ප්‍රධාන පෙළේ කර්මාන්ත සියල්ලක්ම අතිශය ලාභ ශ්‍රමය මත පදනම් වෙයි. නමුත් බහුතරයක් වන ශ්‍රමික ජනයාට ඔවුන්ගේ ආර්ථික, සමාජීය හා සංස්කෘතික ජීවිතය පිළිබඳ පවතින්නේ කඨෝර අත්දැකීමකි. එහෙයින් ශ්‍රමයට නිසි ගෞරවය හා පිළිගැනීම ලැබෙන ලෙසත් සියලුම ශ්‍රේණීන්ගේ ශ්‍රමිකයන්ට සමානාත්මතා මූලධර්මය මත සැලකීමටත් හැකිවන ආකාරයේ ප්‍රතිමාන ව්‍යුහයක් නිර්මාණය කොට සේව්‍යයා හා සේවකයාද, රජය හා ශ්‍රම බලකායද, සමාජය හා ශ්‍රමිකයාද අතර වන සම්බන්ධතා ජාලය මානුෂීයකරණය කිරීමට ක්‍රියා කිරීම අතිශය වැදගත් වෙයි.

- සියලුම ස්වරූපයේ ශ්‍රමයයන්, කායික හා මානසික අතර වන සමාජීය විභේදනයන් හා වෙනස් කොට සැලකීම් අහෝසි කිරීම සඳහා අධ්‍යාපන යාන්ත්‍රණය මගින් ශ්‍රමයේ සමානාත්මතාව පිළිබඳ දර්ශනය ජනතාවට ලබාදීමේ ක්‍රියාවලියක් නිර්මාණය කිරීම
- නෛතික ප්‍රතිමානයන් මගින් ශ්‍රමයට සිදුකරන වෙනස්කොට සැලකීම, අයිතීන් කප්පාදුව හා මානව ගෞරවය හා අයිතිවාසිකම් ලබා නොදීමට එරෙහි නීති රාමුව ශක්තිමත් කොට නිර්මාණය කිරීම
- රාජ්‍යය මැදිහත් වී පෞද්ගලික අංශයේ ශ්‍රම බලකායට ලැබිය යුතු සුභසාධනය සහ වැටුප් මට්ටම් පිළිබඳව අවම ප්‍රමිතීන් තීරණය කිරීම
- ජාත්‍යන්තර කම්කරු ප්‍රඥප්තියට ගරු කරමින් එම ප්‍රතිමානයන් දේශීයව වැඩි වශයෙන් අනුගත කර ගනිමින් ශ්‍රමිකයාගේ අයිතීන් සුරැකෙන වැඩබිමක් ඇති කිරීම
- ශ්‍රමිකයා හා සේවකයා අතර පවතින කම්කරු ආරාවුල් විසඳීමේ යාන්ත්‍රණ ශක්තිමත් කිරීම හා කම්කරු ප්‍රඥප්තියක් නිර්මාණය කොට ක්‍රියාත්මක කිරීම
- ශ්‍රම අධ්‍යයන පිළිබඳ පාඨමාලා විශ්වවිද්‍යාල මට්ටමින් ඇති කිරීම හා කම්කරුවන්ට තම අධ්‍යාපනය ඉදිරියට ගෙනයාම සඳහා රාජ්‍ය අධ්‍යාපන ආයතන නොමිලේ ඇති කිරීම
- ශ්‍රමිකයාට නිෂ්පාදනයේ ප්‍රතිලාභ ලැබිය හැකි විය යුතුය යන මූලධර්මය පිළිගනිමින් සියලු සමාගම්වල අයිතියෙන් පංගුවක් ශ්‍රමිකයින්ට නොමිලේ පැවරෙන ක්‍රමවේදයක් ඇති කිරීම

# ජනමාධ්‍ය නිදහස සහ ප්‍රජාතන්ත්‍රවාදය

ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක එහි යහපැවැත්ම උදෙසා ජනමාධ්‍යයට විශාල බලපෑමක් කළ හැක. එහෙත් පොදුවේ ලෝකය පුරාමත් ශ්‍රී ලංකාව තුළත් ජනමාධ්‍ය සතු මෙම බලය පොදුවේ සමාජයේ යහපත සහ ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවෙන් භාවිතා කරනු වෙනුවට මාධ්‍ය ආයතන හිමි ප්‍රාග්ධනයේ හෝ රජයේ දේශපාලන අභිලාෂයන් වෙනුවෙන් භාවිතා වන බව දක්නට ලැබේ. එය වර්තමානයේ රට මුහුණදී ඇති සමාජ ආර්ථික හා දේශපාලන අර්බුද රැසකට සෘජුව බලපායි. ජනමාධ්‍ය විසින් ජන විඥානය කෙරෙහි ඇතිකරන සදාචාර විරෝධී බලපෑම නිසි විමර්ශනයකට ලක්විය යුතුය. වඩා යහපත් මාධ්‍ය සංස්කෘතියක් රට තුළ නිර්මාණය කිරීම මගින් විකෘති කිරීමකින් තොරව ජනතාවට තොරතුරු දැනගැනීමේ අයිතිය තහවුරු කළ හැක.

## දැක්ම

- රාජ්‍ය ජනමාධ්‍ය පොදු මහජන දේපළක් ලෙස සලකා කටයුතු කිරීම
- ගුවන්විදුලි සහ රූපවාහිනී සංඛ්‍යාත භාවිතා කරන රාජ්‍ය හා පෞද්ගලික මාධ්‍ය ආයතන එම සංඛ්‍යාත පොදු දේපළ ලෙස සලකා කටයුතු කිරීම
- ජනමාධ්‍ය නිදහසට ගරු කරමින් හා ඒවායේ ස්වාධීන භාවිතයට ඉඩ සලසමින් ජනමාධ්‍ය ප්‍රකාශනයේ අයිතියත් ජනතාවගේ නිවැරදි තොරතුරු දැනගැනීමේ අයිතියත් සමාන ලෙස තහවුරු කිරීම
- මාධ්‍ය ආයතන හිමියන්ගෙන් හෝ වෙනත් බලපෑම්වලින් තොරව කටයුතු කළ හැකි වන පරිදි ජනමාධ්‍යවේදීන්ගේ වෘත්තීය අයිතීන් සහ නිදහස තහවුරු කිරීම

## ක්‍රියාමාර්ග

- මාධ්‍ය ආයතනවලට අදාළ භාණ්ඩ සහ සේවා ආදායම් බද්දෙන් නිදහස් කිරීම
- මාධ්‍ය ආයතනවලට සහ මාධ්‍යවේදීන් සඳහා ආචාරධර්ම පද්ධතියක් හඳුන්වා දීම
- මාධ්‍යවේදීන් සඳහා රැකවරණය සැලසෙන රක්ෂණ ක්‍රමයක් හඳුන්වා දීම
- ජනමාධ්‍ය වෘත්තිකයින්ට උසස් අධ්‍යාපන කටයුතු කිරීම සඳහා ජනමාධ්‍ය විශ්වවිද්‍යාලයක් ආරම්භ කිරීම
- ජනමාධ්‍ය අතර නිදහස් තරගකාරීත්වයට වඩා යහපත් මාධ්‍ය භාවිතයක් ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් හොඳ පුවත්පත්, රූපවාහිනී සහ ගුවන්විදුලි නාලිකා, මාධ්‍යවේදීන්, වැඩසටහන්, ලිපි, ජයාරූප වැනි අංග ඇගයීමට ලක් කෙරෙන වැඩසටහන් හඳුන්වාදීම
- ජනමාධ්‍ය මගින් පුද්ගල නිදහසට සහ සමාජයේ යහ පැවැත්මට එල්ල වන බලපෑම්වලට එරෙහිව අගතියට පත් පුරවැසියන්ට පැමිණිලි කිරීම සහ සාධාරණය ඉටුකර ගැනීම සඳහා ස්වාධීන මාධ්‍ය පැමිණිලි කොමිසමක් ස්ථාපිත කිරීම
- මාධ්‍ය ආයතනයක් කිසියම් දේශපාලන මතවාදයක් හෝ කණ්ඩායමක් වෙනුවෙන් සිය මාධ්‍යය භාවිතා කරන්නේ නම් ඒ බව මහජනයාට ප්‍රකාශ කිරීම අනිවාර්ය කිරීම

- ස්වාධීන මාධ්‍ය පැමිණිලි කොමිසම මගින් වරින්වර කෙරෙන මහජන මත විමසුම් මගින් සියලු රාජ්‍ය හා පුද්ගලික මාධ්‍ය ආයතනවල භාවිතය පිළිබඳ වාර්තාවක් ඉදිරිපත් කිරීම
- මාධ්‍යය තුළින් ජාතීන් සහ ආගමික කණ්ඩායම් අතර වෛරය වැපිරීම වළක්වන නීති සම්පාදනය කිරීම
- මහජන නියෝජිතයින්ට සහ දේශපාලන පක්ෂවල නිලධාරීන්ට හා ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින්ට ජනමාධ්‍ය ආයතනවල පූර්ණ හෝ කොටස් හිමිකාරිත්වය ලබා ගැනීම තහනම් කිරීම
- ඒ ඒ ජනමාධ්‍ය ආයතන සඳහා විවිධ රාජ්‍ය ආයතනවලින් ලබා දෙන වෙළඳ දැන්වීම් සහ අනෙකුත් මුල්‍ය ගනුදෙනු වාර්ෂිකව ප්‍රකාශයට පත් කිරීම

# නීතිගරුක ශ්‍රී ලංකාවක්

නීතියේ පාලනයට ගරු නොකිරීම නිසා උද්ගතවී ඇති තත්වය තුළ සමස්ත ශ්‍රී ලාංකේය රාජ්‍යයේ සමාජීය පවුරු පදනම් මහත් ව්‍යසනයකට ලක්ව තිබේ. මෙම තත්වය වහා නිවරදි කර නොගත හොත් රාජ්‍යයක් ලෙස අත්පත් කරගත හැකි කිසිදු සාධනීය තත්වයක් ශේෂ නොවනු ඇත.

අපරාධ, මංකොල්ල, පාතාලය, මත්කුඩු ජාවාරම, අල්ලස හා දූෂණය ආදිය අප රටෙහි තිර පැවැත්ම සොලවා දමන තරමට ව්‍යසනකාරී වී ඇති බැවින් එවන් තත්වයකින් මිදුණු නීතිගරුක ශ්‍රී ලංකාවක් බිහි කර ගැනීම මේ මැදිහත්වීමේ අභිලාෂය වී ඇත.

# අල්ලස් හා දූෂණ

නිදහසින් පසු වසර 70ක් පමණ මෙරට පාලනය කළ පාලකයින් විසින් ජනතාවට අත්පත් කර දී ඇත්තේ, අන්ත දූෂිත රාජ්‍යයකි. දූෂණ සංජානන දර්ශකයට අනුව ලෝකයේ රටවල් අතුරින් ඩෙන්මාර්කය සහ නවසීලන්තය මෙම දර්ශකයේ අංක 01 හා 02 හිමිකරගෙන සිටින අතර ශ්‍රී ලංකාව පසුවන්නේ 89වැනි ස්ථානයේය. දූෂණයට එරෙහි ගෝලීය එකමුතුව වන ට්‍රාන්ස්පේරන්සි ඉන්ටර්නැෂනල් ආයතනය විසින් වාර්ෂිකව එළිදක්වන දූෂණ සංජානන දර්ශකයට අනුව 2018 වසරේදීද ශ්‍රී ලංකාව පැහැදිලි ප්‍රගතියක් පෙන්වීමට අසමත් වී ඇත.

2016 විගණන වාර්තාවට අනුව ලබාගෙන ඇති සමස්ත ණය ප්‍රමාණය රුපියල් ට්‍රිලියන 11කට ආසන්න වුවද වත්කම් වශයෙන් පවතින්නේ රුපියල් ට්‍රිලියන 1.1ක් බව හෙළි වී තිබේ. මෙමගින්ද පැහැදිලි වන්නේ, රට තුළ නිර්මාණය වී ඇති දූෂිතභාවයේ හරස්කඩකි. ඒත් සමගම මිග් යානා ගනුදෙනුව, ඇවන්ගාඩ්, එයාර් ලංකා ගනුදෙනුව, මහ බැංකු බැඳුම්කර වංචාව වැනි මහා පරිමාණ මූල්‍ය අපරාධ දිගින් දිගටම සිදුවෙමින් පවතී. දූෂණයට එරෙහිව සටන් වදින බවට පොරොන්දු වී බලය ලබාගත් වත්මන් ආණ්ඩුවද ජන වරමට හා බලයට පැමිණීමට පෙර ඉදිරිපත් කරන ලද දූෂණ විරෝධී ප්‍රතිපත්තිවලට පටහැණිව ක්‍රියාකරන නිසා ශ්‍රී ලංකාවේ දූෂණ විරෝධී යාන්ත්‍රණය අසාර්ථකත්වයට පත්ව ඇත. එබැවින් වහා වහා පිළියම් යෙදිය යුතු බරපතළ අර්බුදයක් ලෙස දූෂිතභාවය සමාජගත වී තිබේ.

## ක්‍රියාමාර්ග

- නාස්තිය, දූෂණ, අල්ලස, වංචාව, ඇතුළු සියලු මූල්‍ය අපරාධ පිටුදැකීම සඳහා පාර්ලිමේන්තුවට පමණක් වගකියන සියලු විමර්ශන ආයතන සම්බන්ධීකරණය කෙරෙන මධ්‍යම කාර්යාංශයක් ස්ථාපිත කිරීම
- දැනට වාර්තාවී ඇති සියලු වංචා, දූෂණ කඩිනමින් පරීක්ෂා කර චූදිතයන්ට තරාතිරම නොබලා දඬුවම් ලබාදීම සඳහා සහ රජයට වූ පාඩුව අයකරගැනීම සඳහා විමර්ශන හා අධිකරණ ක්‍රියාවලිය වඩාත් කාර්යක්ෂම කිරීම
- දැනට පවතින සියලු විමර්ශන ආයතන ස්වාධීන ආයතන බවට පත් කිරීම
- චූදිතයන්ට දේශපාලන රැකවරණ ලබාදෙන්නන්ද අදාළ වැරැද්දට සම්බන්ධ අයෙකු ලෙස සලකා නීතිය ඉදිරියට ගෙන ඒම සඳහා අවශ්‍ය නීති සකස් කිරීම
- රාජ්‍ය සම්පත් අවභාවිත කිරීමෙන් රටට අහිමි වූ මහජන ධනය ආපසු අයකර ගැනීම සඳහා නීතිරීති සකස් කිරීම සහ ඒවා ක්‍රියාවේ යෙදවීම
- මූල්‍ය අවභාවිතාවන්, අල්ලස්, කොමිස් වැනි දූෂිත ක්‍රියාවන් වැළැක්වීම අරමුණු කරගනිමින් නීතිරීති සම්පාදනය කිරීම ප්‍රමුඛ කාර්යයක් ලෙස සලකා කටයුතු කිරීම
- දූෂණ, වංචා, අල්ලස් වැනි දෑ පිළිබඳ මහජනතාව දැනුවත් කිරීමට හා ඒවාට එරෙහිව මහජනතාව බලගැන්වීමේ ව්‍යාපාරයක් රාජ්‍ය අනුග්‍රහයෙන් ස්ථාපිත කිරීම

# මත්ද්‍රව්‍ය භාවිතය

අද වන විට විෂ මත්ද්‍රව්‍ය භාවිතය විශාල සමාජ ව්‍යසනයක් බවට පත් වී ඇත. අන්තරායකර ඖෂධ පාලක මණ්ඩලයේ 2017 වාර්තාවට අනුව විෂ මත්ද්‍රව්‍ය වැරදි සඳහා පුද්ගලයෝ 34,970ක් අත්අඩංගුවට ගනු ලැබ සිටිති. ඒ අතර වයස අවුරුදු 20-24 වයස් කාණ්ඩයෙන් 24%ක්ද පිරිමි 97% ක් හා ගැහැණු 3%ක්ද වෙති. විවාහකයන් 53%ක් වන අතර 4654ක් අවිවාහක අය වෙති. අධ්‍යාපනය අනුව ගත් විට 5-10 ශ්‍රේණිය අතර උගත් සංඛ්‍යාව 45% කි. 2018 වසරේ විෂ මත්ද්‍රව්‍ය වෙනුවෙන් අත් අඩංගුවට ගනු ලැබ ඇති සංඛ්‍යාව 95,679කි.

මෙලෙස සංඛ්‍යාත්මකව දැක්විය හැකි වුවද අත්අඩංගුවට පත් නොවූ විෂ මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වූවෝ විශාල සංඛ්‍යාවක් සමාජයේ හැසිරෙති. මෑත කාලීනව පාසල් ළමුන් අතර විශාල වශයෙන් විවිධ විෂ මත්ද්‍රව්‍ය ව්‍යවසනයක් ලෙස ව්‍යාප්ත වෙමින් පවතී.

වර්තමානය වන විට දේශපාලනික හා වෙනත් බලවේගවල ආරක්ෂාව යටතේ ශ්‍රී ලංකාව කලාපයේ මත්ද්‍රව්‍ය හුවමාරු මධ්‍යස්ථානයක් බවට පත්වී ඇති අතර එය සංවිධානාත්මක අපරාධ වර්ධනය වීම කෙරෙහිද බලපා ඇත.

### අරමුණු

විෂ මත්ද්‍රව්‍ය භාවිතය අලෙවිය හා බෙදාහැරීම හා අනෙකුත් බලපෑම්වලින් තොර රටක් බවට පත් කිරීම හා මත්ද්‍රව්‍යවලට ඇබ්බැහිවූවන්ගෙන් තොර රටක් නිර්මාණය කිරීම

### ක්‍රියාමාර්ග

- මත්ද්‍රව්‍ය වැරදිවලට දඬුවම් දීම දැඩි කිරීමත්, ඒ සම්බන්ධ නඩු කටයුතු කඩිනම් කිරීමටත් අවශ්‍ය නීති සංශෝධනය කිරීම
- මත්ද්‍රව්‍ය රට තුළට පැමිණෙන ප්‍රධානම ක්‍රම දෙක වන ගුවන් හා නාවික යන මාර්ග පරීක්ෂා කිරීමට ඇති පහසුකම් වර්ධනය කිරීම, නවීන පරීක්ෂා කිරීමේ උපකරණ හඳුන්වා දීම හා නිලධාරීන් පුහුණු කිරීම
- අන්තරායකාරක ඖෂධ පාලක මණ්ඩලයේ කාර්යයන් පුළුල් කරමින් පාසැල ළමුන්, දෙමාපියන් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් අනවරතව සිදුකිරීමෙන් අලුතින් ඇබ්බැහි වන පිරිස් අවම කිරීම
- මත් උවදුර ගම තුළට එන ජාලය පිළිබඳ තොරතුරු එකතු කර විශ්ලේෂණය කර සම්බන්ධ පුද්ගලයන්ට සමාජීය වශයෙන් බලපෑමක් කළ හැකි සංවිධානාත්මක ප්‍රජා මූල කණ්ඩායමක් ගම තුළ ඇතිකිරීම හා අවශ්‍ය පහසුකම් ලබා දෙමින් එය නිසි පරිදි මෙහෙය විය හැකි රාජ්‍ය යාන්ත්‍රණයක් ඇති කිරීම
- රට වටා ඇති මුහුදු බඩ ප්‍රදේශවල පොලීසිය හා ප්‍රජාව සම්බන්ධ කරමින් නිරීක්ෂණ කමිටු පිහිටුවීම

# අපරාධ

වර්තමාන ශ්‍රී ලංකාවේ පවතින සමාජ දේශපාලන ආර්ථික අර්බුදයේ ප්‍රකාශනයක් ලෙස නිර්මාණය වී ඇති පාතාලයක් සහ ඒ ආශ්‍රිතව සිදුවන සංවිධානාත්මක අපරාධ හේතු කොටගෙන සාමාන්‍ය ජන ජීවිතය අනාරක්ෂිත තත්වයට පත් වී ඇත. මත්ද්‍රව්‍ය හේතුවෙන් සිදුවන අපරාධ ප්‍රමාණාත්මකව හා ක්‍රෑරත්වයෙන් ඉහළ යමින් පවතී. 2018 වන විට ලියාපදිංචි අපරාධකරුවන් (IRC) සංඛ්‍යාව 43,000ක් වන අතර මෙයින් කාන්තාවන් 1200ක්ද වයස 11-20 අතර වයසේ පසුවන ළමුන් 608ක්ද සිටීම මගින් මෙහි බරපතළ තත්වය වඩාත් හොඳින් පැහැදිලි වේ.

## ක්‍රියාමාර්ග

- විද්‍යාත්මක අපරාධ විමර්ශන ක්‍රමවේදයන් සහ ඊට අදාළ දැනුම විමර්ශන නිලධාරීන්ට ලබාදීම සඳහා විශේෂිත පුහුණු ආයතනයක් පිහිටුවීම
- ශ්‍රී ලංකාවේ අපරාධ යුක්ති ක්‍රමය තුළ (පොලීසිය, බන්ධනාගාර, අධිකරණ, නීතිපති දෙපාර්තමේන්තුව) පවත්නා අකාර්යක්ෂමතාව ඉවත් කිරීම තුළින් අපරාධ අවම කිරීමේ වැඩසටහන් ක්‍රියාවට නැංවීම
- පොලීසිය ඇතුළු අපරාධ විමර්ශන ආයතනවලට ලැබෙන පැමිණිලි මාස 06කට අඩු කාලසීමාවක් තුළ විසඳා අවසන් කිරීමේ ක්‍රමවේදයක් ක්‍රියාවට නැංවීම
- අපරාධ සඳහා වූ අධිකරණ ක්‍රියාමාර්ග කෙටි කාලයක් තුළ අවසන් කිරීමේ වැඩසටහනක් හා අපරාධකරුවන් නැවත නැවත අපරාධ සිදු කිරීම අවම කිරීමේ වැඩසටහනක් ක්‍රියාවට නැංවීම
- නවීන තාක්ෂණය අපරාධ නිවාරණ සඳහාද අපරාධකරුවන් හසු කර ගැනීම සඳහාද යොදා ගැනීමේ වැඩසටහන් ක්‍රියාවට නැංවීම
- අපරාධකරුවන්ට දඬුවම් ලබාදී බන්ධනාගාර ගත කිරීමට අමතරව ඔවුන් සැබෑ ලෙසම පුනරුත්ථාපනය කිරීමේ වැඩසටහන් සඳහා යොමු කිරීම
- අපරාධ මැඩලීම සඳහා ශක්තිමත් නීති පද්ධතියක් ස්ථාපිත කිරීම සඳහා පියවර ගැනීම
- අපරාධ විමර්ශන ආයතන හා නීතිය පසිඳලීමේ ආයතන නිර්දේශපාලනීකරණය කිරීම
- බන්ධනාගාර තුළ සිටිමින් මත්ද්‍රව්‍ය ජාවාරම් මෙහෙයවීම පාතාල ක්‍රියාකාරකම් මෙහෙයවීම සහ අනෙකුත් නීතිවිරෝධී ක්‍රියාකාරකම්වලට සම්බන්ධ වන්නන්ට එරෙහි නීතිය දැඩි ලෙස ක්‍රියාවට නැංවීම